රඹුක්කන සංවර්ධන සැලැස්ම
2023 - 2033

"ශ්‍රී ලංකා කඳුරට පිවිසුමේ උද්දීපිත කෘෂි මධ්‍යස්ථානය"



නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

රඹුක්කන සංවර්ධන සැලැස්ම

2023-2033

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

රඹුක්කන සංවර්ධන සැලැස්ම 2023-2033

©නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව 2023

සියළුම හිමිකම් ඇවිරිණි

මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා පටිගත කිරීම බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශය

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන 7වන හා 9 වන මහල, සෙත්සිරිපාය අදියර 1
බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය- www.uda.gov.lk
විද්‍යුත් තැපෑල- infa@uda.gov.lk
දුරකථන අංක- +94112 873 637

ප්‍රකාශනය 2023

රඹුක්කන සංවර්ධන සැලැස්ම 2023-2033 පළමු කොටස, දෙවන කොටස හා තුන්වන කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමු කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යනය, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, ශක්‍යතා (SWOT) විශ්ලේෂණය, සංවර්ධන සැලැස්ම යන කොටස් වලිනි. දෙවන කොටස ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපාය මාර්ග නියාමනය, කලාපීකරණ නියමතා, යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා හා රක්ෂිත වලින් සමන්විතය. තුන්වන කොටස කලාප සීමා මායිම් බඳ්ධාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

රඹුක්කන සංවර්ධන සැලැස්ම 2023-2033 සකස් කර ඇත්තේ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය, සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය විසිනි.

අධීක්ෂණය

නිමේෂ් හේරත් සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය, නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර අධ්‍යක්ෂ ජනරාල්, නා.සං.අ.ගෘහ නිර්මාණ ශිල්පී මහින්ද විනානාරච්චි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නා.සං.අ. නගර නිර්මාණ ශිල්පී එම්.පී රණතුංග නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්-කලාප I), නා.සං.අ. නගර නිර්මාණ ශිල්පී එච්.එම්. සුගත් පේමසිරි, සබරගමුව පළාත් අධ්‍යක්ෂ, නා.සං.අ. නීතිඥ ඩී. එම් කිරිවත්නුඩුව, අධ්‍යක්ෂ (නීති) නාගරික සංවර්ධන අධිකාරිය, නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න, ඕටපු අධ්‍යක්ෂ (උපාය මාර්ගික සැලසුම්), නාගරික සංවර්ධන අධිකාරිය විසිනි.

සැලසුම් කණ්ඩායම

එච්.එම්. සුගත් පේමසිරි,අධ්‍යක්ෂ (සබරගමුව),නා.සං.අ., එම්.වී.ඩී.කේ. විජේනායක, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ. ඕටපු අධ්‍යක්ෂ (සබරගමුව) සිසිර දිසානායක, ඕටපු අධ්‍යක්ෂ (සබරගමුව) අනුර මැදවල, ඕටපු අධ්‍යක්ෂ (සබරගමුව) ඒ.නූනානි ද අල්විස්, නගර නිර්මාණ ශිල්පී මහේෂි විජයරත්න, නගර නිර්මාණ ශිල්පී රෙහාන් වික්‍රමසිංහ, බලාත්මක සැලසුම්කරු එස්.කේ. දොඩම්වල, බලාත්මක සැලසුම්කරු ඩබ්ලිව්.පී.එස්.පී. විජයන්ති, බලාත්මක සැලසුම්කරු පී.ආර්.එම්.සී.කේ. පල්ලෙපොල.

සහාය කණ්ඩායම්, නාගරික සංවර්ධන අධිකාරිය

උපාය මාර්ගික සැලසුම් අංශය, නා.සං.අ. (අධීක්ෂණය, නියාමනය සහ ගැසට් කිරීම)
පාරිසරික හා භූ දර්ශනය අංශය, නා.සං.අ. (PORS DRR සංරක්ෂණ සැලසුම් සකස් කිරීම)
භූගෝලීය තොරතුරු පද්ධතිය, නා.සං.අ. (භූගෝලීය තොරතුරු දත්ත සැපයීම සහ තාක්ෂණික සහාය සැපයීම)
පර්යේෂණ හා සංවර්ධන අංශය, නා.සං.අ. (නව තාක්ෂණික ක්‍රම භඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්)

ප්‍රණාමය

රඹුක්කන සංවර්ධන සැලැස්ම 2023-2033 සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය යටතේ සිදු විය. මෙම සැලැස්මේ අරමුණ වන්නේ රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවතින කෘෂිකාර්මික ආර්ථිකය තවදුරටත් ශක්තිමත් කරමින් පවතින ස්වභාවික පරිසරය හා බැඳි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, නේවාසික ජන ප්‍රජාව උදෙසා අවශ්‍ය නාගරික යටිතල පහසුකම් විධිමත් කිරීම සඟ ප්‍රදේශයේ අධිසංවේදී වනාන්තර සඟ ජල පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමත්ය.

මෙහිදී 1982 අංක 04 දරණ පනත මඟින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධි විධාන යටතේ රඹුක්කන සංවර්ධන සැලැස්ම 2023-2033 සඳහා අනුමැතිය ලබාදීම සිදු කරන ලද නාගරික සංවර්ධන හා නිවාස විෂය භාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා සඟ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.එස් සත්‍යානන්ද මහතා වෙත අධිකාරියේ ස්තුතිය පුදකොට සිටිමු.

රඹුක්කන ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමන් වන අතුල ඉඳගම මහතා ඇතුළු මහජන නියෝජිතයින් හා එම කාර්යාලයේ නිලධාරීන්, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් හා එම කාර්යාලයේ සියලුම නිලධාරීන් වෙත මෙහිදී සැලසුම් කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරමු.

විශේෂයෙන් මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්යය හා මඟපෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති නිමේෂ හේරත් මහතාට, අධ්‍යක්ෂ ජනරාල් නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ. රණවීර මහතාට, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ගෘහ නිර්මාණ ශිල්පී මහින්ද විතානාරච්චි මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්- කලාප I), නගර නිර්මාණ ශිල්පී එම්.පී රණතුංග මහතාට, සබරගමුව පළාත් අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී එච්.එම්. සුගත් ජේමසිරි මහතාට, අධ්‍යක්ෂ (නීති) නීතිඥ ඩී. එම් කිරිවත්තුඩුව මහත්මියට හා උපාය මාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න මහත්මියට අධිකාරියේ ස්තුතිය පුදකර සිටිමු.

අවසාන වශයෙන් පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ.ඊ කළුපහන මහත්මියට හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂ, නගර නිර්මාණ ශිල්පී ජේ.පී.එස්. සෝමසේකර මෙනවිය හා එම අංශයේ සියළුම නිලධාරීන්ටත්, සබරගමුව පළාත් හිටපු අධ්‍යක්ෂ සිසිර එම්.දිසානායක මහතා, අනුර මැදවල මහතා, ඒ. තුෂානි ද අල්විස් මහත්මියටත් හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) ඩබ් .එම්. ජයවර්ධන මහතාටත්, වත්මන් කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), එම්.වී.ඩී.කේ. විජේනායක මෙනවියටත්, සෙසු කාර්ය මණ්ඩලය ඇතුළු සියලුම නිලධාරීන්ටත් සැලසුම් කණ්ඩායම වෙනුවෙන් ස්තුතිය පුදකර සිටිමු.

ගරු අමාත්‍යතුමාගේ පෙරවදන



“රඹුක්කන” නගර සංවර්ධනය යථාර්ථයක් කරා....

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම උදෙසා වන සියලු අරමුණු සහ ඉලක්ක කාර්යක්ෂමව හා සඵලදායී ලෙස ඉටුකර ගැනීම පිණිස නිවැරැදි දිශානතියක් කරා රාජ්‍යය යොමු කිරීම යටතේ නව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යය.

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන්ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය හදුනාගත් නගර 30 ක් සඳහා කඩිනම් නගර සංවර්ධන සැලැසුම් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබෙන අතර තවත් නගර 50 ක් සඳහා සංවර්ධන සැලසුම් මෙම වසර තුල සකස්කර නීතිගත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. “රඹුක්කන” සංවර්ධන සැලැස්ම ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වන විට මෙවැනි සංවර්ධන සැලසුම් වැඩි ප්‍රමාණයක් සැකසීම සඳහා සැලසුම්කර ඇත.

රඹුක්කන සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රමුඛත්වය හිමි වන්නේ රඹුක්කන නගරයෙන් සේවා ලබාගන්නා සහ එහි නේවාසික ජනතාව සඳහා වන අතර එය තවදුරටත් සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතී. එසේම කලාපයේ පවතින විශාලම සංචාරක ආකර්ෂණීය ප්‍රදේශය ලෙස, පවතින ස්වාභාවික පරිසර පද්ධතිය ආරක්ෂාකර ගනිමින් සංචාරක ආකර්ෂණය වැඩි කිරීමටත් එමඟින් පිබිදෙන ආර්ථික සංවර්ධනයක් කරා ප්‍රදේශයේ විභවතා ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමටත් මෙම සැලැස්ම තුළින් හඳුනාගෙන ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදී වෘත්තීයවේදීන්, විශේෂඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර එය නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් ඔරහා මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවේශයන් ලබාගන්නා ලදී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුළින් රඹුක්කන සංවර්ධන සැලසුම (2023-2033) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

ප්‍රසන්න රණතුංග
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

ගරු සභාපතිතුමාගේ පෙරවදන- නාගරික සංවර්ධන අධිකාරිය



නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමේ මූලික පරමාර්ථය වී ඇත්තේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය හා නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමයි.

ඒ අනුව, 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරී සංශෝධිත පනතේ (II අ කොටස) 8 අ(I) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කළ නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව, ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සාමාජීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන රඹුක්කන සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් ක්‍රමෝපායන් උපයෝගීකර ගනිමින් රඹුක්කන සංවර්ධන සැලැස්ම 2023-2033 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. රඹුක්කන සංවර්ධන සැලැස්ම, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු හඳුනාගැනීම තුළින් ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීම හා ඒ හරහා උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර නවදුරටත් සංවර්ධන සැලසුම තුලින් සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා නියාමනය කර ඇත. එබැවින්, මහජන අවශ්‍යතා ඉටු කරනු වස් මෙම සැලැස්ම බලාත්මක කිරීම තුළින් එහි දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන්ගෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටිමි.

රඹුක්කන සංවර්ධන සැලැස්ම නියමිත කාලය තුල සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. තවද, මෙම කර්තව්‍යය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර, සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබාදෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

නිමේෂ් ඡේරත්
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය.

පූර්විකාව

1991 සැප්තැම්බර් මස 02 වන දින අංක 678/03 අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ ප්‍රකාශිත රඹුක්කන නාගරික ප්‍රදේශය, 2000 ජූනි 28 අංක 1138/18 අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ ප්‍රකාශිත රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සහ 2000 අගෝස්තු 11 දින අංක 1144/25 අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ ප්‍රකාශිත සංචාරක ප්‍රදේශය යන මුළු මහත් ප්‍රදේශය සැලසුම්කරණ මැදිහත්වීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට අවධානය යොමු විය.

සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී 2018-2022 වර්ෂවලට අදාල දත්ත එකතු කිරීම සහ සිදු කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ වලින් ලබාගත් දත්ත පදනම් කරගත් අතර, ඒ හරහා දත්ත විශ්ලේෂණය, විවිධ විද්‍යාත්මක ක්‍රම උපයෝගී කරගනිමින් ඒවා පිළිබඳ නිගමන වලට එළඹීම සිදු විය. ඒ අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය උදෙසා 2023-2033 පරිවිඡේදය සඳහා වලංගු වන නව සංවර්ධන සැලැස්මක් සකස් කර ඇති අතර, එය සංවර්ධන සැලසුම් ක්‍රියාවලියේදී විවිධ අවස්ථා වලදී ලබාගත් තීරණ, ප්‍රායෝගික ක්‍රියාවලි හරහා අවබෝධ කරගත් කරුණු සහ එම ක්‍රියාවලින් දෙකොහිම ප්‍රතිඵලයක් වේ.

ඒ අනුව 2023-2033 කාල සීමාව සඳහා සකස් කරන ලද රඹුක්කන සංවර්ධන සැලැස්ම කොටස් නුනකින් සමන්විත වේ. එහි පළමු වන කොටස සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව, SWOT විශ්ලේෂණය සහ සංවර්ධන සැලැස්ම යන කොටස් අන්තර්ගත කොට ඇත. දෙවන කොටස 2023-2033 කාල පරිවිඡේදය සඳහා සැලසුම් කිරීමේ සීමාවට අදාළ සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා වලින් සමන්විත වේ.නුන්වන කොටස සිතියම්,රූප සටහන්,වගු සහ ඇමුණුම් ඇතුළත් ලේඛන වලින් සමන්විත වේ.

සංවර්ධන සැලැස්මේ පසුබිම වන පළමු පරිවිඡේදය තුළ හැදින්වීම, සංවර්ධන සැලසුම් කණ්ඩායම, විෂයපථය සහ අනුගමනය කරන ලද සැලසුම් ක්‍රියාවලිය විස්තරාත්මකව ඉදිරිපත් කෙරේ. මූලික අධ්‍යයනය වන දෙවන පරිවිඡේදය මඟින් අධ්‍යයන ප්‍රදේශය, සැලසුම් සහ තත්ත්ව සන්දර්භය මෙන්ම සැලසුම් බලප්‍රදේශය නිර්මාණය කිරීම පිළිබඳ විස්තර කෙරේ. පරිවිඡේදය තුන මඟින් රඹුක්කන නාගරික බලප්‍රදේශය සඳහා නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය විද්‍යාත්මක විශ්ලේෂණයන් පදනම් කර සිදු කළ අධ්‍යයනයන්ට අනුකූලව තාර්කික පදනමක් යටතේ ප්‍රධාන ගැටළු නුනකට ගොනු කරමින් සාකච්ඡා කොට ඇත. එහි සංවර්ධන සැලසුම් රාමුව ලෙස පරිවිඡේද හතර මඟින් ආරම්භ වන රඹුක්කන සංවර්ධන සැලැස්ම කලාපීය වශයෙන් වැදගත් කෘෂි මධ්‍යස්ථානයක්, සංචාරක පුරවරයක් ලෙස ආර්ථික වශයෙන් උද්දීප්ත වූත් ප්‍රමාණවත් යටිතල පහසුකම් වලින් සමන්විත වූත් සියලු ජනතාව සඳහා සුමට යාන්ත්‍රණයක් සහිත බහු කේන්ද්‍රීගතව ව්‍යාප්ත වූ නේවාසික හා නාගරික ප්‍රදේශයක් ස්ථාපිත කිරීම යන අනාගත දැක්ම, එහි ප්‍රකාශනය, අරමුණු හා පරමාර්ථ අඩංගු කොට ඇත. මෙහි ප්‍රධාන අරමුණු නුන පදනම් කරගෙන සාරාංශගත SWOT විශ්ලේෂණය ඇතුළත් කොට පස්වන පරිවිඡේදය සකස් කොට ඇත.

2033 වසර සඳහා වන අපේක්ෂිත දැක්ම සාක්ෂාත් කරලීම උදෙසා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම ඔයවන පරිවිඡේදය මඟින් විස්තර කෙරෙන අතර, එහි සංකල්පිත සැලැස්ම, යෝජිත භූමි පරිහරණ සැලැස්ම සහ උපාය මාර්ගික සැලසුම් අන්තර්ගත කර ඇත. මෙහිදී අවකාශීය සංවර්ධන උපායමාර්ගය, අපරවයුහ පහසුකම් සංවර්ධන උපායමාර්ගය ආර්ථික හා පාරිසරික සංවර්ධන උපායමාර්ගය වශයෙන් ප්‍රධාන උපායමාර්ගික සැලසුම් හතරක් ලෙස දක්වා ඇති අතර ඒ යටතේ යෝජිත උපායමාර්ගික ව්‍යාපෘති සහ වගකිවයුතු ආයතනික රාමුවද විස්තර කෙරේ.

එමෙන්ම රඹුක්කන සංවර්ධන සැලැස්මේ දෙවන කොටස හත්වන පරිවිඡේදය හරහා සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා විස්තර වන අතර, අටවන පරිවිඡේදයේ යෝජිත කලාපීකරණ නියමතා විස්තර කෙරේ. නව වන පරිවිඡේදයේ යෝජිත මාර්ග පළල ගොඩනැගිලි සීමා සහ රක්ෂිත ඇතුළත් වේ. මේ අනුව මෙම අධිකාරියේ සහ ශ්‍රී ලංකා රජයේ අභිප්‍රාය වන්නේ 2023-2033 රඹුක්කන සංවර්ධන සැලැස්ම සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමයි.

ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2023 මාර්තු මස 23 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,

17 හා 18 මහල,

"සුහුරුපාය",

සුහුතිපුර පාර,

බත්තරමුල්ල.

2023 ෙ4 **මස** 26 **වන දින.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2330/04 - 2023 මැයි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2023.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2023 මාර්තු මස 23 වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 අප්‍රේල් මස 28 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'',
සුහුතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0004/1

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම 2023 අප්‍රේල් මස 28 වැනි දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන

1A - PG 6314 — 46 (2023/05)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 මැයි මස 03 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0004/2

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 අප්‍රේල් මස 28 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

නිමේෂ හේරත්,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2023 මැයි මස 03 වැනි දින.

EOG 05 - 0004/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ප්‍රණාමය	ii
ගරු අමාත්‍යතුමාගේ පෙරවදන	iii
ගරු සභාපතිතුමාගේ පෙරවදන -නාගරික සංවර්ධන අධිකාරිය	iv
පූර්විකාව	v
රඹුක්කන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය සඳහා වූ සැලැස්ම අනුමත කිරීම (2023-2033)	vi
ගැසට් නිවේදනය	vii
පටුන	ix

පළමුවන කොටස

01 වන පරිච්ඡේදය:
සංවර්ධන සැලසුමේ පසුබිම 1 - 8

1.1 හැඳින්වීම 1
1.2 සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් 2
1.3 සංවර්ධන සැලැස්මේ විෂයපථය 3
1.4 සැලසුම් ක්‍රියාවලිය 5

02 වන පරිච්ඡේදය
මූලික අධ්‍යයනය 9 - 59

2.1 අධ්‍යයන ප්‍රදේශය 11
2.2 සැලසුම් හා නත්ත්ව සන්දර්භය 14
2.2.1 ඓතිහාසික පසුබිම හා විකාශනය 12
2.2.2 වර්තමාන රඹුක්කන 16
2.2.2.1 භෞතික අංශය 16
2.2.2.2 ආර්ථික අංශය 26
2.2.2.3 සාමාජීය අංශය 33
2.2.2.4 පාරිසරික අංශය 44
2.2.3 පූර්ව සැලසුම් ප්‍රයත්න 49
2.3 සැලසුම් ප්‍රදේශයේ නීර්ණය කිරීම 54
2.3.1 සැලසුම් සීමාව 58

03 වන පරිච්ඡේදය:
සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය 60 - 69

3.1 හැඳින්වීම 61
3.2 ගැටලු හඳුනා ගැනීම 61
3.2.1 ප්‍රදේශයේ ප්‍රධාන කෘෂි බෝග සීග්‍රයෙන් අඩු වී යාම
3.2.2 මා-ඔය ජල සම්පතෙන් උපරිම ප්‍රයෝජන නොගැනීම
3.2.3 සංචාරක කලාපයේ ඇති පොදු පහසුකම් ප්‍රමාණවත් නොවීම හා අවිධිමත් සංවර්ධනය

04 වන පරිච්ඡේදය:
සංවර්ධන සැලසුම් රාමුව 70 - 75

4.1 සංවර්ධන සැලැස්මේ දැක්ම 71
4.2 දැක්මෙහි ප්‍රකාශනය 71
4.3 සංවර්ධන සැලැස්මේ අරමුණු හා පරමාර්ථ 73

05 වන පරිච්ඡේදය:
ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන
විශ්ලේෂණය(ශ.දු.අ.ත විශ්ලේෂණය) 76 - 79
5.1 සාරාංශගත SWOT විශ්ලේෂණය 77

06 වන පරිච්ඡේදය:
සංවර්ධන සැලැස්ම 80 - 181

6.1 සංකල්පිත සැලැස්ම 81
6.2 යෝජිත භූමි පරිහරණය සැලැස්ම 83
6.2.1 අපේක්ෂිත නාගරික ආකෘතිය 84
6.3 අවකාශීය සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 88
6.4 අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම 97
6.4.1 සාමාජීය අපරවයුහ පහසුකම් සංවර්ධනය 97
- නිවාස
- සෞඛ්‍ය
- අධ්‍යාපනික
- ප්‍රවාහනය
6.4.2 භෞතික අපරවයුහ පහසුකම් සංවර්ධනය 106
- මාර්ග හා ගමනාගමනය

- ජල සැපයුම් සැලැස්ම
- විදුලි හා දන්ත රැහැන් සැපයුම් සැලැස්ම
- අපජල හා මළාපවාහන කළමනාකරණ සැලැස්ම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

6.5 ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 122
6.6 තිරසර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 139
6.5.1 පාරිසරික සංරක්ෂණ සැලැස්ම 139
6.5.2 පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (PORS) 140
6.5.3 සංස්කෘතික හා උරුම කළමනාකරණ සැලැස්ම 146
6.5.4 ආපදා කළමනාකරණ සැලැස්ම 148

6.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම 151

දෙවන කොටස

07 වන පරිච්ඡේදය:
ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග නියාමනය 182 - 195

7.1 හැඳින්වීම 183
7.2 සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා 184
7.2.1 සංවර්ධන කලාප
7.2.2 කලාපීකරණ සැලසුම

7.3 කලාප සංඝණකය 186
7.4 සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා 187
7.5 ජලාශ්‍රිත ප්‍රදේශ සඳහා පොදු නියමතා 195

08 වන පරිච්ඡේදය:
කලාපීකරණ නියමතා 196 - 219

8.1 අධි ඝණත්ව නේවාසික කලාපය 197
8.2 මධ්‍ය ඝණත්ව නේවාසික කලාපය 199
8.3 අඩු ඝණත්ව නේවාසික කලාපය 201
8.4 අධි ඝණත්ව වාණිජ කලාපය 203
8.5 මධ්‍ය ඝණත්ව වාණිජ කලාපය 205
8.6 මධ්‍ය ඝණත්ව සංචාරක කලාපය 207
8.7 අඩු ඝණත්ව සංචාරක කලාපය 209
8.8 මධ්‍ය ඝණත්ව කර්මාන්ත කලාපය 211
8.9 කෘෂිකාර්මික කලාපය -I (කුඹුරු) 213
8.10 අධි සංවේදී සංරක්ෂණ කලාපය -වනාන්තර 218

උපලේඛන 220 - 237

09 වන පරිච්ඡේදය:
යෝජිත මාර්ග පළල ගොඩනැගිලි සීමා හා රක්ෂිත 238 - 278

9.1 යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා හා රක්ෂිත 239
9.3 ඇළ මාර්ග සඳහා පවත්වා ගත යුතු රක්ෂිත 277

නුන්වන කොටස

සිතියම් ලේඛනය 280
රූප සටහන් ලේඛනය 281
වගු ලේඛනය 284
ඇමුණුම් ලේඛනය 286
කෙටි යෙදුම් 422
පරිශීලිත මූලාශ්‍ර 422

I වන කොටස

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

01 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මේ පසුබිම

1.1 හැඳින්වීම

ඖ්‍රී ලංකාව තුල ජාතික මට්ටමින් නාගරික සංවර්ධනය නියාමනය කරන ආයතනය වශයෙන් වර්ෂ 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපනය කෙරේ. ඒ අනුව 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත ප්‍රකාරව මුළු දිවයිනටම බල පැවැත්වෙන පරිදි සංවර්ධනයට සුදුසු යැයි විෂය භාර අමාත්‍යවරයාගේ නියමයකින් වෙන් කොට ප්‍රකාශයට පත් කරන ලද සංවර්ධන බල ප්‍රදේශ භෞතික, සාමාජිය, ආර්ථික හා පාරිසරික වශයෙන් සංවර්ධනය කිරීමට අවශ්‍ය ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම මෙම ආයතනයේ ප්‍රමුඛතම කාර්යභාරය වේ.

ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයන්හි වෙසෙන ජනතාවගේ යහපැවැත්ම උදෙසා නව සංවර්ධන ව්‍යාපෘතීන් තුළින් සංවර්ධන ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව සලසා දෙමින් “සුසැදි, සුරැකි, සොදුරු නාගරිකකරණයක් කරා” යන දැක්ම ළඟා කරගැනීම නාගරික සංවර්ධන අධිකාරියේ ඉලක්කය වී ඇත.

රඹුක්කන නාගරික බලප්‍රදේශය, 1991 සැප්තැම්බර් මස 02 වන දින ගැසට් අංක 678/3 මගින් නාගරික සංවර්ධන අධිකාරියේ බලප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති අතර, වර්ෂ 2000 ජූනි මස 28 වන දින ගැසට් අංක 1438/ 18 මගින් සංචාරක කලාපයක් නම් කර ඇත. මෙය සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගැසට් කරන ලද එකම සංචාරක කලාපයද වේ. ඉන් අනතුරුව 2000 වසරේ අගෝස්තු මස 11 වන දින සමස්ත රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශයක් වශයෙන් ගැසට් අංක 1144/ 25 මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

ඉහත කී නාගරික සංවර්ධන බල ප්‍රදේශ අතුරින් නාගරික සංවර්ධන අධිකාරියේ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය මගින් වර්ග කිලෝමීටර් 3.8 කින් යුක්ත රඹුක්කන නාගරික බල ප්‍රදේශයට පමණක් සංවර්ධන සැලසුම සකස් කර ඇති අතර, එය 2012- 2020 දක්වා බලපැවැත්වුණි. එහෙත් මෙම සැලැස්ම රඹුක්කන නාගරික බල ප්‍රදේශයට පමණක් සීමා වීමත් සංවර්ධන විභවතා මනාව භාවිත නොවීමත් හේතු කොට ගෙන සමස්ත රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදී නව සංවර්ධන සැලසුම සකස් කිරීම ආරම්භ කරන ලදී .

2023-2033 කාල පරාසය තුළ බලාත්මක වන මෙම සැලැසුම මගින් ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථිකමය විභවතාවයන් වන කෘෂිකර්මාන්තය සහ සංචාරක ක්ෂේත්‍රය තව දුරටත් සංවර්ධනය කිරීමටත්, එමගින් ප්‍රදේශයේ ජනතාව ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීමටත්, ස්වභාවික පරිසරය විධිමත් සංරක්ෂණ ක්‍රියාමාර්ග මගින් සංවර්ධනය සඳහා උපයෝගී කර ගැනීමටත් හැකි වන පරිදි සංවර්ධන උපාය මාර්ග හා මාර්ගෝපදේශනයන් හඳුන්වා දී ඇත.

1.2 සංවර්ධන සැලසුමේ පාර්ශවකරුවන්

රඹුක්කන සංවර්ධන සැලසුම 2023 – 2033 සකස් කිරීමේදී මේ සඳහා සෘජු සහ වක්‍ර සම්බන්ධතාවයක් ඇති සියලුම රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි බලයලත් නිලධාරීන් හා ප්‍රාදේශීය ප්‍රජාවගේ අදහස්, උපදේශ හා යෝජනා ලබා ගැනීම මගින් පොදු ප්‍රජාවගේ සහභාගීත්වයෙන් යුතු සර්වග්‍රාහී ප්‍රතිදානයක් ලබා ගැනීම අපේක්ෂාව විය.

ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ආයතන

1. රඹුක්කන ප්‍රාදේශීය සභාව

මූලික උපදේශක ආයතන

1 රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2 පින්නවල අලිඅනාථාගාරය
3 පින්නවල සත්වෝද්‍යානය
4 මධ්‍යම පරිසර අධිකාරිය, කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය
5 සංචාරක අමාත්‍යාංශය, සබරගමුව පළාත
6 දිස්ත්‍රික් කෘෂිකර්ම ප්‍රහුණු මධ්‍යස්ථානය, වාගොල්ල
7 පොල් සංවර්ධන මණ්ඩලය, කෑගල්ල
8 රබර් සංවර්ධන මණ්ඩලය, කෑගල්ල
9 ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, කෑගල්ල
10 මාර්ග සංවර්ධන අධිකාරිය, කෑගල්ල
11 අඩවි වන කාර්යාලය, රඹුක්කන
12 වනජීවී දෙපාර්තමේන්තුව
13 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, කෑගල්ල
14 දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය, කෑගල්ල
15 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, අවිස්සාවේල්ල
16 රඹුක්කන දුම්රිය ස්ථානය
17 ලංකා විදුලිබල මණ්ඩලය, කෑගල්ල
18 කලාප අධ්‍යාපන කාර්යාලය, මාවනැල්ල
19 ශ්‍රී ලංකා පොලිසිය, රඹුක්කන
20 පශු වෛද්‍ය කාර්යාලය, රඹුක්කන
21 ආයුර්වේද පංචකර්ම ආයතනය, රඹුක්කන
22 රඹුක්කන දිසා රෝහල
23 ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, කෑගල්ල

අනෙකුත් පාර්ශවකරුවන්වන්ගේ කණ්ඩායම්

1 රඹුක්කන වෙළඳ සංගමය
2 ත්‍රීරෝද රථ සංගමය
3 හෝටල් සංගමය

1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

ග්‍රාම නිලධාරී වසම් 89කින් සමන්විත රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළුව ඒ වටා ඇති කෑගල්ල, මාවනැල්ල, ගලිගමුව, පොල්ගහවෙල, කුරුණෑගල, මල්ලවපිටිය, මාවතගම හා හතරලියද්ද යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 8 කට අයත්, ග්‍රාම නිලධාරීන් වසම් 598 කින් සමන්විත ව මී.කි.938 ක් වූ කලාපය ආවරණය වන පරිදි මූලික සැලසුම් අධ්‍යයනයන් හා විශ්ලේෂණයන් සිදු කර රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත .

රඹුක්කන ප්‍රදේශය සඳහා මීට පෙර සකස් කර ඇති සංවර්ධන සැලසුම ග්‍රාම නිලධාරී වසම් 7කින් සමන්විත වූ නාගරික බල ප්‍රදේශයට පමණක් සීමා වේ. 2012 - 2020 කාලය සඳහා බල පැවැත්වුණු එකී සැලැස්ම මඟින්, නගර සීමාවේ ඇති සීමිත ඉඩම් සම්පත කාර්යක්ෂම භාවිතයකට යොදා ගැනීමත්, නගරයේ වාණිජ කටයුතු සඳහා ඉඩ ප්‍රස්ථා වැඩි කිරීමත් හා නගරයේ පොදු පහසුකම් සංවර්ධනය කිරීමත් පිළිබඳව අවධානය යොමු කර ඇත .

වසර 2020 දක්වා බලාත්මක වූ මුල් නගර සංවර්ධන සැලැස්මෙහි සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳව අවධානය යොමු කර ඇති නමුත් එමඟින් සංචාරක කලාපයේ සංවර්ධනයට පැවති සෘජු හා ධනාත්මක බලපෑම තව දුරටත් වැඩිදියුණු කළහැකි මට්ටමක පවතින බව පෙනී යයි. ඒ අනුව සබරගමුව පළාත තුල ගැසට් නිවේදනයකින් සීමා නිර්ණය කරන ලද ජාතික මට්ටමේ එකම සංචාරක ආකර්ෂණ මධ්‍යස්ථානය වන පින්නවල අලි අනාථාගාරය හා එළිමහන් සත්වෝද්‍යානය නිසා දෙස් විදෙස් සංචාරකයන්ගේ ඉහල ආකර්ෂණයක් සහිත මෙම ප්‍රදේශය තව දුරටත් ඒ සඳහා ප්‍රවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් පොදු පහසුකම් සංවර්ධනය කිරීම, සංචාරක නේවාසික පහසුකම් ලබාදීම, විවිධත්වයකින් යුතු ආකර්ෂණීය ස්ථාන හා ක්‍රියාකාරකම් ඇති කිරීම, දැනුම හා අධ්‍යාපනය ලබාදීම යන ක්ෂේත්‍රයන් කෙරෙහි මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී වැඩි අවධානයක් යොමු කොට ඇත.

පින්නවල හා බැදුණු සංචාරක ආර්ථිකය හැරුණු විට සමස්ත රඹුක්කන ප්‍රදේශය තුල මූලික වශයෙන් ග්‍රාමීය කෘෂිකර්මාන්තය හා කුඩා කර්මාන්ත මූලික කරගත් ආර්ථික-ජීවන රටාවක් ස්ථාපනය වී ඇත. ඒ අනුව එකී විභවතාවයන් පදනම් කරගනිමින් ව්‍යවසාය සංවර්ධනය, ජීවනෝපාය ඉහළ නැංවීම හා ප්‍රාදේශීය ආර්ථිකය දියුණු කිරීමේ සංවර්ධන ක්‍රියාදාමයන් කෙරෙහිද මූලික අවධානයක් මෙම සැලැස්ම සකස් කිරීමේදී යොමුකර ඇත.

තවද, සබරගමුව පළාතේ ඓතිහාසික නගරයක් වශයෙන් වැදගත් වන රඹුක්කන ප්‍රදේශයේ පවතින පුරාවිද්‍යාත්මක වටිනාකම් ආරක්ෂා වන පරිදී සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමටත් පාරිසරික සංවේදී කලාප ආරක්ෂණය සහ සංරක්ෂණය සඳහා අවශ්‍ය වන නීති, රෙගුලාසි ඇඳුන්වා දීමත් මඟින් සැලසුම් සහගත නගරයක් ගොඩ නැගීම මෙම සංවර්ධන සැලැස්ම තුළින් අපේක්ෂා කෙරේ.

ඒ අනුව වසර 2033 වන විට කෘෂි හා සංචාරක කර්මාන්තය මූලික කොටගත් ආර්ථිකයක් සහිත නේවාසික ජනතාවට වඩාත් හිතකර පහසුකම් වලින් යුතු භෞතික, සාමාජීය, ආර්ථික, හා පාරිසරික සාධක ඒකාබද්ධ කොටගත් සංවර්ධන ඉලක්කයක් කරා පවතින විභවතාවයන් දිශාගත කිරීම සිදු කෙරෙනු ඇත.

අනාගත සංවර්ධන විභවතා පිළිබඳව අවධානය යොමු කිරීමේදී මේ වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති මධ්‍යම අධිවේගී මාර්ගයේ රඹුක්කන හුවමාරුවෙන් රඹුක්කන- කටුපිටිය ප්‍රධාන මාර්ගය සමඟ සම්බන්ධ වන අතර මෙම හුවමාරුවේ සිට කි.මී.5ක දුරින් රඹුක්කන නගරය හමුවේ. මෙසේ ජාතික අධිවේගී මාර්ග පද්ධතිය හා සම්බන්ධ වීම මඟින් ජාතික භෞතික සැලසුම 2050 මඟින් හඳුනාගත් කුරුණෑගල , මහනුවර යන ජාතික මට්ටමේ නගර සමඟ කාර්යක්ෂම සම්බන්ධතාවයක් ඇති වීම සිදු වන අතර එය රඹුක්කන ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ දියුණුවට සහ නේවාසික ජනතාවගේ අනාගත සංවර්ධනය සඳහා දිශා ගත කර ගන්නා ආකාරයද මෙම සැලසුම සකස් කිරීමේදී අවධානය යොමුකර ඇත. යෝජිත එකී ජාතික භෞතික සැලසුමෙහි සංකල්පිතයට අනුව සැලසුම් ප්‍රදේශය මධ්‍යම පාරිසරික සංවේදී කලාපයට අයත්වන අතර මෙම සංවර්ධන සැලසුම සකස් කිරීමේදී එම මාර්ගෝපදේශයන්ට යටත්ව සීමාකාරී සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීමට ද අවධානය යොමුකර ඇත.

ජාතික මට්ටමේ සංචාරක ආකර්ෂණ ස්ථානයක් වශයෙන් රඹුක්කන හඳුනාගත හැකි වුවත් ප්‍රදේශයේ පවතින සාමාජීය සන්දර්භයන් මත සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනයන් සිදු කිරීමේදී යම් යම් සීමාවන් වලට යටත්ව අදාල යෝජනා ඉදිරිපත් කිරීමට සිදු වීම ප්‍රධාන සීමාකාරී තත්වයක් ලෙස දැක්විය හැකිය. එසේම සංචාරක කලාපය තුල මෙන්ම සමස්තයක් වශයෙන් සැලසුම් සීමාව තුල සංවර්ධනය සඳහා යොදාගත හැකි රජයේ ඉඩම් ප්‍රතිශතාන්මකව අඩු වීමද භෞතික සංවර්ධනය සීමා කිරීමට හේතු සාධක වී ඇත.

1.4 සැලසුම් ක්‍රියාවලිය

රූප සටහන 1.1 : නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය



රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාව සඳහා වන සැලසුම සකස් කිරීමේ සමස්ත ක්‍රියාවලිය රූප සටහන් අංක 1.1 හි දැක්වෙන පරිදි මූලික අදියර තුනක් යටතේ සිදු කෙරිණි. එහි මූලික අදියර 'අප සිටින්නේ කොහිද ?' (Where are we now ?) යටතේ සැලසුම් සීමාවේ පවතින ගැටළු හා විභවතා හඳුනාගැනීමත් දෙවන අදියර වන 'අප යා යුත්තේ කොහිද ?' (Where do we want to go ?) යටතේ අනාගත සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීමත් සහ තෙවන අදියර වන 'අප එහි යන්නේ කෙසේද?' (How do we go there?) යන්න යටතේ අනාගත ඉලක්ක ළඟා කරගැනීම සඳහා අනුගමනය කළ යුතු උපායමාර්ගික සැලසුමත් අන්තර්ගත වේ.

1. පසුබිම් අධ්‍යයනය

රඹුක්කන සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික යන බහුවිධ අංශයන් ආවරණය වන පරිදි ප්‍රාථමික සහ ද්විතීක දත්ත මගින් විශ්ලේෂණය කරන ලදී. මේ සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ජාතික විදුලිබල මණ්ඩලය, රඹුක්කන දිසා රෝහල, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, ගොවිජන සේවා මධ්‍යස්ථානය, පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාලය යන ආයතන වලින් ලබාගත් දත්ත විශ්ලේෂණය කරන ලදී. එමෙන්ම ලබාගත් දත්ත විශ්ලේෂණය කර සකස් කරන ලද සිතියම් මගින්ද රඹුක්කන ප්‍රදේශය පිළිබඳව මූලික අධ්‍යයන කටයුතු සිදු කරන ලදී. මීට අමතරව නගරයේ සැබෑ තත්ත්වය පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු මගින්ද හඳුනා ගන්නා ලදී.

2. විෂය පථය හඳුනා ගැනීම

ජාතික හා කලාපීය වශයෙන් රඹුක්කන ප්‍රදේශයේ පවතින ස්වභාවය මේ අදියරේදී හඳුනාගන්නා ලදී. මෙහිදී 2030 ජාතික භෞතික සැලසුම හා 2050 කෙටුම්පත් ජාතික භෞතික සැලසුම අනුව මධ්‍යම පාරිසරික සංවේදී කලාපයේ පවතින රඹුක්කන ප්‍රදේශයට පෙන්වා දී ඇති සංවර්ධන තත්ත්වයන් හා සබරගමුව පළාතේ කලාපීකරණ සැලැස්ම හරහා යෝජිතව ඇති සංවර්ධන ව්‍යාපෘති හඳුනාගන්නා ලදී. එමෙන්ම පසුබිම් අධ්‍යයනයන් මගින් ලබා ගත් තොරතුරු හා විශ්ලේෂණයන් හරහා රඹුක්කන නාගරික බල ප්‍රදේශය අතීතයේ සිට විකාශනය වූ ආකාරයත් ප්‍රදේශයට සකස් කළ පූර්ව සැලසුම්වල මැදිහත් වීම් මගින් හා යෝජිත ව්‍යාපෘති තුළින් මෙම ප්‍රදේශයේ සංවර්ධන දිශානතිය සකස් වූ ආකාරයත් මෙහිදී හඳුනා ගන්නා ලදී.

3. ගැටළු හා විභවතා හඳුනාගැනීම

ප්‍රාථමික හා ද්විතීයික දත්ත විශ්ලේෂණය කිරීමේදී හඳුනාගත් ගැටලු වලට අමතරව පරිපාලන ආයතන හා විවිධ සංවිධාන රැස්කොට පාර්ශවකරුවන්ගේ රැස්වීම (Stakeholder meeting) 2018 පෙබරවාරි මස 20 වන දින පවත්වා ප්‍රදේශයේ පවතින ගැටලු සහ විභවතා හඳුනා ගන්නා ලදී. මීට අමතරව කුඩා කණ්ඩායම් ලෙස රැස් කොට විධිමත් රැස්වීම් කිහිපයක්ද අවිධිමත් ක්‍රමවේද භරහා නේවාසික හා සංක්‍රමණික ප්‍රජාව සමඟද ප්‍රශ්නාවලි වැනි ක්‍රම උපයෝගී කරගනිමින් සාකච්ඡා කොට රඹුක්කන ප්‍රදේශයේ පවතින ගැටළු හා විභවතා හඳුනා ගන්නා ලදී. (ඇමුණුම 01,02)

4. දැක්ම හා අරමුණු හා පරමාර්ථ හඳුනා ගැනීම

හඳුනාගත් ගැටලු හා විභවතා සඳහා සංවර්ධන සැලසුම් භරහා විසඳුම් සෙවීමට එම ගැටලු හා විභවතාවන්හි පවතින සුවිශේෂිතාවය (significant) ඒවායේ සන්දර්භය (context) අනෙකුත් ගැටලු හා විභවතා සමඟ ඒවායේ ප්‍රමාණාත්මක ස්වභාවය (magnitude) මත විශ්ලේෂණය සිදු කර රඹුක්කන ප්‍රදේශය සඳහා 2023-2033 කාල පරාසය සඳහා ළඟාකර ගැනීමට අපේක්ෂිත සංවර්ධනය සඳහා දැක්ම හා පරමාර්ථ සකස් කරන ලදී.

5. සවිස්තරාත්මක විශ්ලේෂණය

රඹුක්කන සංවර්ධන සැලැස්ම 2033 දැක්මට අනුව සකස් කරන ලද අරමුණු අනුව ඒ ඒ අරමුණු ළඟා කර ගැනීමට පවතින ශක්තීන්, අවස්ථා හා දුර්වලතා, බාධක හඳුනාගනිමින් ශෘදුඅත (SWOT Analysis) කරන ලදී. මීට අමතරව සංවර්ධන පීඩක අධ්‍යයනය (Development Pressure analysis), පරිසර සංවේදීතා අධ්‍යයනය (Enivironemntal sensitivity analysis) විභවතා අධ්‍යයනය (Potential analysis) ජීවත් වීමට සුදුසු පරිසර කලාප විශ්ලේෂණය (Livablility analysis) සිදු කරන ලදී. (ඇමුණුම 03)

6. සැලැස්ම සහ උපායමාර්ග හඳුනා ගැනීම

හඳුනාගත් දැක්ම, අරමුණු හා පරමාර්ථ වලට අනුව කලාපීකරණ සැලැස්ම, අවකාශීය සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, ආර්ථික සැලැස්ම, අපරවයුහ පහසුකම් සේවා සැලැස්ම, පාරිසරික නිරසාර සංවර්ධන සැලැස්ම හා පුරාවිද්‍යා හා උරුමයන් සංරක්ෂණය කිරීමේ සැලැස්ම තුළින් උපාය මාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සකස් කරන ලදී. එහිදී හඳුනාගත් ගැටලු හා විභවතාවන්ගේ බලපෑමේ ප්‍රමුඛත්වය මත උපායමාර්ගික ව්‍යාපෘති පෙලගස්වා ඇත.

7. නීති රෙගුලාසි සකස් කිරීම

සකස් කරන ලද සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි ඉදිකිරීම හා ඉඩම් පරිහරණයන් සඳහා වන නීති හා රෙගුලාසි සකස් කිරීම මෙහිදී සිදු කරන ලදි. මේ සඳහා දැනට පවත්නා සංවර්ධන සැලැස්මේ භාවිතයේ යෙදවිය නොහැකි රෙගුලාසි වෙනස් කිරීමත්, තැනිතලා හා බෑවුම් ප්‍රදේශවල ඉදිකිරීම් හා භූමි පරිහරණයන්හිදී විමසා බැලිය යුතු අත්‍යවශ්‍ය තත්ත්වයන් සවිස්තරාත්මකව විශ්ලේෂණය කරමින් හා සාකච්ඡා කරමින් රෙගුලාසි සම්පාදනය කරන ලදී.

8. අදහස්, යෝජනා සහ එකඟතාවය ලබා ගැනීම

රඹුක්කන සංවර්ධන සැලසුම සඳහා අනුමැතිය ලබා ගැනීමේ පියවර යටතේ කෙටුම්පත් සංවර්ධන සැලැස්ම 2022 දෙසැම්බර් මස 13 වන දින රඹුක්කන ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව මහජන අදහස් ලබා ගැනීම සඳහා දින 60ක් එහි තබන ලදී. ඒ හා සමගාමීව නාගරික සංවර්ධන අධිකාරියේ නිල වෙබ් අඩවියේද පළ කිරීමෙන් අදහස් ලබා ගන්නා ලදී. එම අදහස් හා යෝජනා සමඟ 2023.02.08 වන දින පාර්ශවකරුවන්ගේ රැස්වීම II පවත්වමින් තවදුරටත් අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී. (ඇමුණුම 04)

9. දළ සැලසුම් වාර්තාව සකස් කිරීම හා භාර දීම

සියලු අදහස් හා යෝජනා මත අදාළ සංශෝධනයන් සිදු කර අවසන් කෙටුම්පත් සංවර්ධන සැලසුම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කර එහි අදාළ හා යෝජනාද ඇතුළත් කර උපායමාර්ගික සැලසුම් අංශය වෙත භාර දෙන ලදී.

10. අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම

ප්‍රධාන සැලසුම් කමිටුවේ අනුමැතියෙන් පසු ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම හා ගැසට් පත්‍රයේ පළ කොට නීතිගත කිරීම.

.

02 වන පරිච්ඡේදය

මූලික අධ්‍යයනය

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

2.1 අධ්‍යයන ප්‍රදේශය

අධ්‍යයන ප්‍රදේශය

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ උතුරු දෙසින් පිහිටා ඇති රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ව.කි.මී. 131 ක් හෙවත් හෙක්ටයාර 13,100 ක් පුරා පැතිර පවතී. කෑගල්ල නගරයේ සිට කි.මී 13ක් සහ කුරුණෑගල නගරයට කි.මී 24 දුරින් පිහිටා ඇති රඹුක්කන නගරය තුල උඩරට දුම්රිය මාර්ගයට සම්බන්ධ ප්‍රධාන දුම්රිය ස්ථානයක් පිහිටීම නිසා දුම්රිය ගමනාගමනය සඳහා ප්‍රමුඛත්වයක් දක්වන නගරයක් ලෙස හඳුනා ගත හැක. වර්තමාන තත්වය අනුව කොළඹ- නුවර ප්‍රධාන මාර්ගයේ සිට කි.මී 9ක් පමණ දුරින් පිහිටි රඹුක්කන නගරය පවතින ප්‍රවේශ මාර්ග රටාව හා භූමි පරිභෝජනය අනුව හුදෙකලාව ස්ථාපනය වූ නගරයක් ලෙස හඳුනාගත හැකිය.(සිතියම 2.1)

භූගෝලීය වශයෙන් උතුරු අක්ෂාංශ 70° 14' - 70° 24'ත් නැගෙනහිර දේශාංශ 80° 18' - 80° 28'ත් අතර මුහුදු මට්ටමේ සිට උස අඩි 100 - 900 පමණ උසකින් පිහිටා ඇති රඹුක්කන ප්‍රදේශය නිරිතදිග තෙත් කලාපයේ මධ්‍යම කඳුකරයේ බටහිර සානුව ආසන්නයේ පිහිටා ඇති බැවින් ඉහළ වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශයක් ලෙස වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1500-3000 පමණ වන අතර සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 20-25 අතර පවතී. උතුරු දෙසින් කුරුණෑගල දිස්ත්‍රික්කයට මායිම්ව පිහිටා ඇති නිසා අතරමැදි කලාපීය දේශගුණික ලක්ෂණද තරමක් දුරට පෙන්නුම් කරයි. භූ විෂමතාවය සලකා බලන විට ප්‍රදේශයේ මධ්‍ය කොටස තැනිතලා ස්වභාවයක් ගන්නා අතර සමස්ථ ප්‍රදේශයෙන් 90%ක්ම තැනිතලා ස්වභාවයක් පෙන්නුම් කරයි. එහෙත් ප්‍රදේශයේ රිඝාන- නැගෙනහිර කලාපයේ අලගල්ල කන්ද, ගබ්බල කන්ද හා පරපේ කන්ද වැනි උස් කඳුකර ප්‍රදේශ පවතින බැවින් ඒවා උස අඩි 100 - 900 අතර පරාසයකින් යුක්ත වේ. ප්‍රදේශයේ ප්‍රධාන ජල මූලාශ්‍ර ලෙස මා-ඔය සහ රඹුක්කන් ඔය හැදින්විය හැකි අතර ප්‍රධාන පානීය ජල ප්‍රභවය වන්නේ මා ඔයයි. මෙම ජල මූලාශ්‍ර මුල් කරගෙන ප්‍රධාන වශයෙන් වී වගාව සිදු කෙරෙන අතර ප්‍රදේශයේ ජනතාවගේ අනෙකුත් ජල අවශ්‍යතා සපුරාලීමට මහඟු දායකත්වයක් සිදු කරයි.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී අධ්‍යයන කලාපය ලෙස රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සහ ඒ වටා පිහිටි කෑගල්ල, මාවනැල්ල, ගලිගමුව, පොල්ගහවෙල, කුරුණෑගල, මල්ලවපිටිය, මාවතගම හා හතරලියද්ද යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 8 කින් ආවරණය වන ග්‍රාම නිලධාරීන් වසම් 598 කින් සමන්විත ව.කි.මී 938 ක් වූ කලාපය සඳහා මූලික සැලසුම් අධ්‍යයනයයන් සිදු කරන ලදී. පරිපාලන මායිම් පිළිබඳව සැලකීමේදී රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට උතුරු දෙසින් වයඹ පළාතට අයත් කුරුණෑගල, මල්ලවපිටිය, මාවතගම යන ප්‍රදේශීය සභා බල ප්‍රදේශයන් , නැගෙනහිරින් මාවනැල්ල හා හතරලියද්ද ප්‍රදේශීය සභා බල ප්‍රදේශයත්, දකුණෙන් කෑගල්ල නගර සභා බල ප්‍රදේශය හා ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයත්, බටහිරින් පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයත් පිහිටා ඇත. මෙහි සඳහන් ප්‍රදේශ ප්‍රවේශ හැකියාව අනුව මහා මාර්ග හා දුම්රිය මාර්ග යන මාධ්‍ය දෙකෙන්ම වර්තමානයේදී සෘජුව රඹුක්කන නගරය

හා සමග සම්බන්ධ වන අතර නගරයේ සංසරණය වන ජනගහනය වැඩි වශයෙන් පැමිණෙනු ලබන්නේ ද මෙම ප්‍රදේශ තුලින් වේ.

අධ්‍යයන ප්‍රදේශය

මූලික අධ්‍යයනයන්ගෙන් අනතුරුව සැලසුම සකස් කරන ලද ග්‍රාම නිලධාරී වසම් 89කින් යුතු රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා විශ්ලේෂණාත්මක අධ්‍යයනයන් ඉහත සැලසුම් ක්‍රියාවලියේ දක්වා ඇති පරිදි සිදු කරන ලදී.

සිතියම 2.1: අධ්‍යයන සීමාව



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

2.2 සැලසුම් හා තත්ත්ව සන්දර්භය

රඹුක්කන නගරයේ සැලසුම් හා තත්ත්ව සන්දර්භය විශ්ලේෂණය කිරීමේදී මූලිකව නගරයේ ඓතිහාසික තත්ත්වය අධ්‍යයනය කරනු ලැබූ අතර භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික යන අංශ යටතේ වර්තමාන සැලසුම් ප්‍රදේශය හඳුනා ගනු ලැබූ අතර, පූර්ව සැලසුම් ප්‍රයත්න මඟින් රඹුක්කන නගරය ජාතික හා කලාපීය වශයෙන් ස්ථාන ගත කිරීමද මෙම පරිච්ඡේදය මඟින් සිදු කරන ලදී.

2.2.1 ඓතිහාසික පසුබිම හා විකාශනය

ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට විකාශනය

රඹුක්කන නගරයේ ඉතිහාසය ක්‍රි.පූ. 1 වන සියවසේ වලගම්බා රජු සමය දක්වා දිවෙන බව සමකාලීනව ස්ථාපනය කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුක්ත ස්ථාන වලින් ගම්‍ය වේ. සතර කෝරලයට අයත් කිණිගොඩ කෝරලේ රඹුක්කන කොට්ඨාශයේ එවැනි ඓතිහාසික ආගමික පුරා විද්‍යාත්මක සාධක ලෙස ක්‍රි.පූ 1 වන සියවසේ වලගම්බා රජු සමයේ ඉදිකරන ලද පදවිගම්පල ගල්මැස්ස, දළුග්ගල විහාරය, වට්ටාරම පන්සල, දැලිවල කොටවෙහෙර, මීදුමලෙන් විහාරය, දඹුල්ල පන්සල, ආදිය හඳුනාගත හැකි අතර මාරුක්වතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාළිගාතැන්න නමින් හඳුන්වන ඉඩමේ ඇති පැරණි පොකුණ, පියගැටපේළි, ප්‍රකාර බැම්ම, ශිලා කුළුණු, කණු සිදුරු ස්ථාන ආගමික නොවන ඓතිහාසික පුරා විද්‍යාත්මක සම්පත් වේ. එසේම රාජධානි සමයට පෙර ජනාවාස වූයේ යැයි සැලකෙන උදන්විට, මොට්ටප්පුලිය, නාරංබැද්ද, පරපේ, දියසුන්නත, කඩිගමුව, කුඹල්දිවෙල, මංගලගම ආදි ප්‍රදේශ වලින් ඓතිහාසික හා ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් යැයි අනුමාන කළහැකි භෞතිකමය අවශේෂ රාශියක් පුරාවිද්‍යාඥයන් විසින් සොයා ගෙන ඇත.

රූප සටහන 2.1: රඹුක්කන සැලසුම් සීමාවේ ඓතිහාසික පුරා විද්‍යාත්මක ස්ථාන


පදවිගම්පොල ගල්මැස්ස


දලුග්ගල පන්සල


වට්ටාරම පන්සල


දැලිවල කොට වෙහෙර


මංගලගම අම්බලම


කිරිවන්දෙනිය පන්සල

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

රඹුක්කන නගරය ජනාවාසයක් ලෙස ආරම්භ වීම [කෝට්ටේ යුගය (ක්‍රි.ව 1412- ක්‍රි.ව 1597) සහ ඕලන්ද යුගය (ක්‍රි.ව 1505-ක්‍රි.ව 1658)]

සැලසුම් හා තත්ත්ව සන්දර්භය

කොට්ටේ යුගය වන විට මෙම ප්‍රදේශය කෙසෙල් වගාව සඳහා ඉතා ඉහළ ප්‍රසිද්ධියක් ඉසිලූ අතර අනෙකුත් කෘෂි භෝග වලින්ද ස්වයංපෝෂිත වූ ප්‍රදේශයක් ලෙස ජනප්‍රියත්වයට පත්ව තිබුණි. කෙසෙල් හෙවත් “රඹකැන්” යන නාමය පරිවර්ථනය වී “රඹුක්කන” යන ග්‍රාම නාමය සැදුණු බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

ඓතිහාසික පසුබිම හා විකාශනය

ඕලන්ද යුගයේදී කන්ද උඩරටට පිවිසෙන දුම්රිය මාර්ගය ඉදිකිරීම ආරම්භ කරමින් 1868දී රඹුක්කන එහි ආරම්භක දුම්රිය ස්ථානය වශයෙන් ඉදි කරන ලදී. මෙම දුම්රියපොළ ඉදිකිරීමේ ප්‍රධාන අරමුණ වූයේ, ග්‍රාමීය ප්‍රදේශ වලින් එක්රැස් කරගන්නා කෘෂිබෝග කන්ද උඩරටටත් කොළඹටත් ප්‍රවාහනය කිරීමයි. එතැන් පටන් දුම්රියපල ජනාවාසයක් ලෙසට රඹුක්කන නගරය ව්‍යාප්ත වීම ආරම්භය සිදු විය.

නිදහසෙන් පසු ප්‍රදේශයේ නගරය විකාශනය

ඉතිහාසයේ සිටම ඉතා ස්වයංපෝෂිත ග්‍රාමීය ආර්ථික රටාවකට හුරු පුරුදු වූ ජන කොට්ඨාශයක් මෙහි ජීවත් වූ අතර, ඔවුන්ගේ ජීවන රටාවද ඉතා සරල විය. එහෙත් ප්‍රදේශයේ සංවර්ධන දිශානැතිය නවමු මගකට මගකට යොමු කරමින් 1975 දී පින්නවල ප්‍රදේශයේ “අලි අනාථාගාරය” ඉදිකිරීමත් සමඟ කෘෂි කර්මාන්තයට තිබූ ආර්ථිකමය නැඹුරුතාව කාලානුරූපව අවම වී සංචාරක කර්මාන්තයේ පිබිදීමක් ඇති විය. ඉන් පසුව 2015 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම “එළිමහන් සත්වෝද්‍යානයත්” 2016 වසරේදී දී “අපේ ගම ” නේමා ගම්මානයත් පින්නවල ප්‍රදේශයේ ස්ථාපනය කිරීම සිදු විය. එමගින් මෙම ප්‍රදේශය ආර්ථික, භෞතික හා සාමාජීය වශයෙන් කලාපය තුළ හා කෑගල්ල දිස්ත්‍රික්කය තුල විශාල පිබිදීමක් ඇති විය.

2.2.2. වර්තමාන රඹුක්කන

රඹුක්කන ප්‍රදේශයේ වර්තමාන සැලසුම් සන්දර්භය හඳුනා ගැනීම සඳහා භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික යන අංශ පහත පරිදි විග්‍රහ කර ඇත.

2.2.2.1 භෞතික අංශය

අ) භූමි පරිහරණ රටාව

සැලසුම් ප්‍රදේශයේ වර්තමාන සවිස්තරාත්මක ඉඩම් පරිහරණය පිළිබඳව සැලකීමේදී සමස්ත භූමි ප්‍රමාණයෙන් ඉහළම ප්‍රතිශතයක් වන 37% ක් නේවාසික භාවිතයන් අයත්වන ගෙවතු කාණ්ඩයට අයත් වන අතර නාගරික ප්‍රදේශයේ ඉදි කිරීම් හා අනෙකුත් පොදු පහසුකම් සහිත ඉදිකළ සමස්ත භූමි ප්‍රමාණය ප්‍රතිශතාත්මකව 1.63 % ලෙස පහල මට්ටමක පවතී. ඉඩම් පරිහරණය සමස්තයක් වශයෙන් ගත්විට රබර්, කුඹුරු වගා බිම්, පොල් වගා බිම්, මිශ්‍ර කෘෂිකාර්මික, තේ වගා බිම්, වෙනත් බෝග අදී කෘෂිකර්මාන්තය සඳහා පොදුවේ භාවිත කරන ලද ඉඩම් ප්‍රමාණය අසන්න වශයෙන් හෙක්ටයාර් 6,800ක් පමණ වන අතර එය ප්‍රතිශතාත්මකව 52% කි. එසේම වනාන්තර ලඳු කැලෑ අයත්වන පාරිසරික සංවේදී කලාප යටතට හෙක්ටයාර් 750 ක බිම් ප්‍රමාණයක් ආසන්න වශයෙන් අයත් වන අතර එය ප්‍රතිශතාත්මකව 6% ක් වේ. කෘෂිකාර්මික භූමි පරිභෝජනයේ සවිස්තරාත්මක ව්‍යාප්තිය අනුව 27.5% ක් රබර් වගාව සඳහා වෙන් වී ඇත. වී වගාව සඳහා 14% ක ප්‍රතිශතාත්මක බිම් ප්‍රමාණයක් වෙන් වී ඇති අතර සීඝ්‍රයෙන් අනුබෙදුම්කරණයට ලක්වන පොල් වගා බිම් වල වර්තමාන බිම් ව්‍යාප්තිය 6%ක් පමණ වේ. (රූපසටහන 2.2)

රූපසටහන 2.2 : භූමි පරිහරණ ප්‍රතිශතය 2020



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

වර්තමාන රඹුක්කන

භෞතික අංශය

ප්‍රදේශයේ වනාන්තර, කුඹුරු ඉඩම්, ජල දේහ ආදී පාරිසරික සංවේදී භූමි භාවිතයන් හි ව්‍යාප්තිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී එම භාවිතයන් සමස්ත ප්‍රදේශය පුරාම විසිරී ඇති අකාරයක් දක්නට ලැබේ (ඇමුණුම 05). ඒ අනුව සංවර්ධන සැලසුම සකස් කිරීමේදී භෞතික වශයෙන් එවැනි සංවේදී කලාප සංරක්ෂණය හා ආරක්ෂණය සඳහා සුදුසු උපායමාර්ග හා මාර්ගෝපදේශ ලබාදීම වැදගත් වනු ඇත. මෙහිදී සංවර්ධනය සඳහා යොදාගත හැකි මුඩු ඉඩම් දක්නට නොලැබෙන අතර සංවර්ධන උපාය මාර්ග සකස් කිරීමේදී සංරක්ෂණ ක්‍රමවේද යටතේ ඒ සඳහා පවතින ඉඩම් යොදා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

ආ) ජාතික හා කලාපීය සම්බන්ධතා

රඹුක්කන ප්‍රාදේශිය සභා ප්‍රදේශය තුළ ජාතික හා කලාපීය වශයෙන් වැදගත් ස්ථානයක් ලෙස පින්නවල සංචාරක පුරවරය පිහිටා ඇති අතර යෝජිත අධිවේගී මාර්ගයේ රඹුක්කන පිවිසුම ඉදිවීමෙන් පසුව මෙම ප්‍රදේශයේ ජාතික හා කලාපීය සම්බන්ධතාව තවදුරටත් කාර්යක්ෂම වනු ඇත.

කලාපීය සම්බන්ධතා සැලකීමේදී පහත රූපසටහන් අංක 2.3 මගින් දක්වා ඇති පරිදි උතුරින් කුරුණෑගල නගරය, නැගෙනහිරින් මහනුවර නගරය, දකුණෙන් කෑගල්ල නගරය සහ බටහිරින් පොල්ගහවෙල නගරය යන ප්‍රධාන නගර සමඟ සෘජු සබඳතාවයක් පවත්වයි. දුම්රියපොල කේන්ද්‍ර කරගත් නගරය තුළ සහ පින්නවල සංචාරක කලාපය මූලික කරගනිමින් කෑගල්ල මාර්ගය දිගේ කෑගල්ල නගරය දෙසට වැඩි සංවර්ධන පීඩනයක් සිදුවන බව හඳුනාගත හැකිය. (ඇමුණුම 02)

රූප සටහන 2.3: රඹුක්කන නගරය හා බැඳුණු කලාපීය සබඳතා



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

ඇ) ප්‍රවාහන පද්ධතිය

මහා මාර්ග පද්ධතිය

වර්තමාන රඹුක්කන

ප්‍රවාහන පද්ධතිය

සැලසුම් ප්‍රදේශයේ ජාතික හා කලාපීය සම්බන්ධතාවය පිලිබඳ අධ්‍යයනයේදී කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගයේ කරඹුපන මංසන්ධියේ සිට කි.මී 8ක් පමණ දුරින් හා දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය වන කෑගල්ල නගරයේ සිට පෙර කී කරඹුපන මංසන්ධිය හරහා දිවෙන මාර්ගයේ (B199) කි.මී 13ක දුරකින් රඹුක්කන නගරය පිහිටා ඇත. රඹුක්කන නගරයේ සිට මාවනැල්ල නගරයට කි.මී. 17ක් (B 385 මාර්ගය ඔස්සේ) සහ කුරුණෑගල නගරයට කි.මී. 24 ක දුරක් (B384, B 87 සහ A6 මාර්ග ඔස්සේ) පවතී. සංසරණය වන ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක ගමන්වාර මෙම නගර අතර සිදුවන අතර වැඩිම ගමන් වාර ප්‍රමාණයක් කෑගල්ල හා රඹුක්කන නගර අතර පවතී. ජාතික මට්ටමේ නගර අතර සම්බන්ධතාවය සැලකීමේදී කොළඹට කි.මී. 96 ක් (B 199), A1 මාර්ග ඔස්සේ සහ මහනුවරට කි.මී.41 ක දුරක් (B385), A1 යන ජාතික මහා මාර්ග ජාලය ඔස්සේ පවතී.

රූප සටහන 2.4 : රඹුක්කන නගරය හා සම්බන්ධ වන මාර්ග පද්ධතියේ සම්බන්ධතාවය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

දුම්රිය මාර්ග පද්ධතිය

ජාතික හා කලාපීය සම්බන්ධතාවය සලකා බලන විට මහා මාර්ග පද්ධතිය ඔස්සේ පමණක් නොව දුම්රිය ජාලය ඔස්සේ පවතින සම්බන්ධතාවය අතින්ද රඹුක්කන නගරයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දුම්රිය ස්ථාන අතරින් රඹුක්කන දුම්රිය ස්ථානය 1867 ආරම්භ කරන ලද ඉතා පැරණිම සහ ප්‍රධානතම දුම්රිය ස්ථානයයි. මෙම මාර්ගය මුලින් කොළඹ සිට රඹුක්කන දක්වා 1933 දී ද්විත්ව ධාවන පථයක් ලෙස ගොඩනැගූ අතර ඇතිවූ ආපදා තත්වයක් හේතුවෙන් පොල්ගහවෙල සිට රඹුක්කන අතර කොටස 1940 දී තනි ධාවන පථයක් දක්වා අඩු කරන ලදී. මෙම කොටස ද්විත්ව ධාවන පථයක් ලෙස නැවත ස්ථාපනය කරන ලද්දේ 1998 දීය. පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයින් රඹුක්කන දුම්රිය ස්ථානය උපයෝගී කොටගෙන ගමන් කිරීමේ ප්‍රවනතාවයක් ඇති වූ බැවින් ඒ සඳහා පහසුකම් සැපයීමට අවශ්‍ය වීම හේතු කොටගෙනය. උඩරට දුම්රිය මාර්ගයේ කන්ද උඩරටට පිවිසීමේ ආරම්භක දුම්රිය ස්ථානය වශයෙන් රඹුක්කන දුම්රිය ස්ථානය පිහිටා ඇති අතර ඒ මගින් ප්‍රධාන දුම්රිය මධ්‍යස්ථාන වන පොල්ගහවෙල සහ කඩුගන්නාව යන දුම්රියපල සමග රඹුක්කන දුම්රියපල සෘජුව සම්බන්ධ වේ. උඩරට දුම්රිය මාර්ගයේ සුවිශේෂී පිහිටීමක් ලෙස රඹුක්කන සහ කඩිගමුව අතර වන කි.මී. 21ක දුරකින් යුතු මාර්ග කොටස මීටර් 430 ක නැග්මක් සහිතව ඉදි කර තිබීම හඳුන්වා දිය හැකිය. ප්‍රාදේශීය වශයෙන් සැලකීමේදී පනලිය, තිස්මල්පොල, යටගම, කිරිවල්ලපිටිය, කඩිගමුව, යටිවල්දෙනිය, ගංගොඩ හා මායිමට ආසන්න ඉහලකෝට්ටේ හා බලන දුම්රිය ස්ථාන සමඟ සෘජුව සම්බන්ධ වීමේ අවකාශයද දුම්රිය මාර්ගය මගින් සපයා ඇත.

යෝජිත අධිවේගී මාර්ග පද්ධතිය

ජාතික සම්බන්ධතාවයන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී මේ වනවිට ඉදිකිරීම් කටයුතු සිදු කරන මධ්‍යම අධිවේගී මාර්ගයේ කුරුණෑගල - ගලගෙදර කොටස ඉදිකර අවසන් කිරීමෙන් පසුව භෞතිකමය සම්බන්ධතාවය අතින් රඹුක්කන නගරයේ සම්බන්ධතාවය වැඩි වන බව පැහැදිලි වේ (ඇමුණුම 05). ප්‍රවාහන ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් වන මෙම ව්‍යාපෘතිය මගින් රඹුක්කන නගරය ට කි.මී. 7ක් දුරින් පිහිටි වැලිගමුව ප්‍රදේශයේ ඉදිවන අන්තර් ඛුවමාරු මධ්‍යස්ථානය ඔස්සේ ජාතික අධිවේගී මාර්ග පද්ධතිය සම්බන්ධ කරන සියලුම ගමනාන්තයන් කරා ප්‍රවාහන පහසුකම් ලබාගැනීමට හැකියාව ලැබේ.

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

ඈ) සේවා සහ යටිතල පහසුකම්

නිවාස

වර්තමාන රඹුක්කන

සේවා සහ යටිතල පහසුකම්

නිවාස ව්‍යාප්තිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී 2012 වසරේ ජාතික සංගණන වාර්තා වලට අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු නිවාස ගණන 22,018 ක් වන අතර එය කෑගල්ල දිස්ත්‍රික්කයේ මුළු නිවාස සංඛ්‍යාවෙන් 10% කි .

2019 වර්ෂයේදී සිදු කරන ඉඹි පරිහරණ සමීක්ෂණ වලට අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 89% ක් නේවාසික භාවිතය සඳහා යොදා ගෙන ඇත. රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති නිවාස වලින් 85% ස්ථිර නිවාසද 13% අර්ධ ස්ථිර නිවාසද 2% වැඩි දියුණු කරන ලද නිවාසත් වේ. නිවාස ඒකක වර්ගය අනුව තනි තට්ටුවේ නිවාස 98.5% ක්ද මුඩුක්කු හා පැල්පත් නිවාස 0.5% , ලයින් කාමර (පේළි නිවාස) 1% ක්ද වශයෙන් හඳුනා ගත හැකිය.

වගුව 2.1: රඹුක්කන ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ නිවාස ව්‍යාප්තිය 2009-2019

වර්ෂය	නිවාස සංඛ්‍යාව
2009	19,633
2012	22,018
2019	24,817

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන වාර්තා සහ සම්පත් පැතිකඩ,2019

රූප සටහන 2.5: රඹුක්කන ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ නිවාස වර්ගීකරණය



මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන වාර්තා, 2012

නිවාස ඝණත්වය ප්‍රතිශතාත්මකව වැඩිම ග්‍රාම නිලධාරී වසම් ලෙස රරියගොල්ල, හුරිමළුව, රඹුක්කන නගරය, දියසුන්නත, දළුග්ගල ආදී ග්‍රාම නිලධාරී වසම් හඳුනා ගත හැකි අතර නිවාස ඝණත්වය වර්ග කිලෝමීටරයට නිවාස 10ක් පමණ වේ. නිවාස ඝනත්වය අඩුම ග්‍රාම නිලධාරී වසම් ලෙස කෙම්පිටිය, යටගම, උදන්විට හා නත්තඹුර යන වසම් හඳුනාගත හැකි අතර එම වසම්වල සාමාන්‍ය නිවාස ඝනත්වය වර්ග කිලෝ මීටරයකට නිවාස 3ක් පමණ වේ.

සිතියම 2.2: රඹුක්කන ප්‍රාදේශිය සභා ප්‍රදේශයේ නිවාස ඝණත්වය, 2019



මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2019

ජල පහසුකම්

2020 වර්ෂයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නුළ නල ජලය ලබා දී ඇති ප්‍රතිශතය 28% ක් වන අතර 72% ක ප්‍රතිශතයකට නල ජලය සපයා නොමැත. ජලය සපයන ප්‍රධාන ජල මූලාශ්‍රය වනුයේ මා ඔයයි. මෙම ව්‍යාපෘතියේ ජල පිරිපහදු මධ්‍යස්ථානය හිරිවඩුන්න ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම ජල සැපයුම් ව්‍යාපෘතියේ ජල ධාරිතාවය දිනකට ඝන මීටර් 4,500 පමණ වන නමුත් වර්තමාන ජල සැපයුම් පරිමාව දිනකට ඝන මීටර් 3,500 පමණ වන නිසා අතිරික්ත ජල සැපයුමක් වුවද කළ හැකි බව පැහැදිලිය. ප්‍රදේශයේ වැඩි ප්‍රතිශතයක් ළිං හා උල්පත් ජලය මගින් ජල අවශ්‍යතාවය සපුරා ගනී.

විදුලිය පහසුකම්

2020 වර්ෂයේ රඹුක්කන ප්‍රදේශයේ බලශක්ති ව්‍යාප්තිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නුළ ලබා දී ඇති විදුලි සැපයුම් සම්බන්ධතා ප්‍රමාණය 93% ක් වන අතර ඉතිරි 7% ක ප්‍රමාණය, භූමිතෙල් 5% ක් හා සූර්ය බලය 2% ක් වශයෙන් වේ.

මළ හා අපජල කළමනාකරණය

රඹුක්කන නගර සීමාව නුළ නගර සංවර්ධනය යටතේ මාර්ග පද්ධතිය සකස් කිරීමේදී වැසි ජල කළමනාකරණය සඳහා කාණු පද්ධතිය අඩක් සකස් වී ඇති නමුත් නගර සංවර්ධනයට ඉඩම් පරිත්‍යාග කිරීමට ඉඩම් හිමියන් කිහිපදෙනෙක් අකමැති වීම නිසා කාණු පද්ධතියේ සමහර කොටස් ඉදිකිරීම නතර වී නිබේ. මේ වන විට එම් ඉඩම් කොටස් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර එය කඩිනමින් අවසන් වූ විට කාණු පද්ධතියේ සංවර්ධන කටයුතු ආරම්භ කළ හැකි බව රඹුක්කන ප්‍රාදේශිය සභාව පෙන්වා දෙයි. රඹුක්කන නාගරික ප්‍රදේශය සඳහා මළ අපවහන පද්ධතියක් ඉදිකර නොමැති අතර ඒ සඳහා සුදුසු ඉඩමක් වෙන් කර ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

රඹුක්කන නගරයේ කසල කළමනාකරණය රඹුක්කන ප්‍රාදේශීය සභාව මගින් සිදු කරන අතර 2020 වර්ෂයේ දත්ත වලට අනුව දිනකට එකතු වන මුළු කසල ප්‍රමාණය ටොන් 8 කට ආසන්න වේ. වර්තමානයේ කසල බැහැර කරනු ලබන්නේ රඹුක්කන නගර මධ්‍යයේ සිට කි.මී. 1.5 ක් පමණ දුරින් පිහිටි ගොන්දෙනිකන්ද ප්‍රදේශයේ පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අක්කරයක පමණ වූ භූමියකටයි. මේ සඳහා වෙනත් විකල්ප ස්ථානයක් නොමැති අතර අනාගතයේදී මෙම ඉඩම ප්‍රමාණවත් නොවනු ඇති බව ප්‍රාදේශිය සභාවේ අදහස වේ. නාගරික ප්‍රදේශය නුළ දිනකට එක් රැස් වන කසළ ප්‍රමාණය ටොන් 8ක් වුවද ඉන් එකතු කරනු ලබන්නේ ටොන් 6ක් පමණයි. දිනකට වාර 2ක් කසළ එකතු කරන අතර විශාල වශයෙන් කසළ

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

වර්තමාන රඹුක්කන

සේවා සහ යටිතල පහසුකම්

ජනනය වන ස්ථාන ලෙස සති පොළ, මධ්‍යම වෙළෙඳපොළ හා පින්නවල අලි අනාථාගාරය හැඳින්විය හැකිය. කසළ එකතු කිරීම සඳහා යොදවා ඇති ශ්‍රමිකයන්, උපකරණ හා රථ වල ප්‍රමාණාත්මකව හිඟයක් පවතී. කසළ එකතු වන ප්‍රමාණය වර්ගීකරණය කළ විට මුළු කසළ ප්‍රමාණයෙන් 60% ක් නේවාසික, 22% ක් වාණිජ, 10% ක් කර්මාන්ත වලින්ද 7% ක් බැංකු, හෝටල් සහ 1% ක් රෝහල් මගින් ද එක් රැස් වේ.

ඉඩම්වල වටිනාකම

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමස්ත බිම් ප්‍රමාණය හෙක්ටයාර 12,800 ක් වන අතර ඉන් සංවර්ධනයට ගත හැකි ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 10,263 හෙවත් 80% ක් වේ. සමස්ත භූමි ප්‍රමාණයෙන් 20% ක් සංවර්ධනයට ගත නොහැකි ඉඩම් (හෙක්ටයාර 2587) ලෙස පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ වන වගුරු බිම්, ජලාශ, වනාන්තර හා කඳු ආශ්‍රිත ප්‍රදේශ හා කුඹුරු ඉඩම්ද වේ. අධ්‍යයන කලාපය තුළ ඉඩම්වල වටිනාකම අනුව වැඩිම වටිනාකමක් ඇත්තේ A1 කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගය දෙපස ඉඩම් වලත් කෑගල්ල, මාවනැල්ල නගර සභා බල සීමාවලත් වේ. රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් වටිනාකම වැඩිම ප්‍රදේශය පින්නවල සංචාරක කලාපයයි. මෙම කලාපයේ කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගය දෙපස ඉඩම්වල වටිනාකමටත් වඩා ඉඩම් වටිනාකම ඉහළ යාමක් දක්නට ලැබේ.

ආපදා තත්ත්වය

ආපදා තත්ත්වය පිළිබඳව සලකා බලන විට අධ්‍යයන කලාපය තුළ නාය යෑමේ අවධානම ඇති කලාප ලෙස මාවනැල්ල, අරණායක, කෑගල්ල හා ඇතරලියද්ද යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ හැඳින්විය හැකි අතර රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගල්පල, ගබ්බල දකුණ, හේවාදිවල, ගොඩගන්දෙණිය හා පදවිගම්පල යන ග්‍රාම නිලධාරී වසම් නාය යෑමේ අවධානමක් සහිත බව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනා ගෙන ඇත. මෙම ප්‍රදේශය හැරුණු කොට ඇති අනෙකුත් සියලුම ප්‍රදේශ කිසිදු අවධානමක් නොමැති කලාප වන බැවින් එය සංවර්ධනයට වඩාත් හිතකර වේ. රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගංවතුර හෝ භූමි ජල ගැලීම් තත්ත්වයන් සුළු වශයෙන් වාර්තා වුවද එයින් ජීවිත හෝ දේපල හානි කිසිවක් මෙතෙක් වාර්තා වී නැත.

2.2.2.2 ආර්ථික අංශය

ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික නියාමනයන් ලෙස කෘෂිකර්මාන්තය, සංචාරක කර්මාන්තය, කුඩා කර්මාන්ත සහ වාණිජ කටයුතු හැඳින්විය හැකිය.

කෘෂිකර්මාන්තය

ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් අනුව ජනගහනය නිරත වී ඇති ප්‍රමාණය සලකා බලන විට කෑගල්ල දිස්ත්‍රික්කයේ පවතින කෘෂි ඉඩම් ප්‍රමාණයෙන් 10%ක් රඹුක්කන ප්‍රාදේශිය සභා ප්‍රදේශය තුළ පවතී. එමෙන්ම ජනගහනයෙන් 48% ක් රැකියාවක් වශයෙන් නිරත වී සිටින අතර ඉඩම් පරිහරණය අනුව මුළු භූමියෙන් 50%කට වැඩි භූමි ප්‍රමාණයක් කෘෂිකාර්මික ඉඩම් ලෙස තවමත් පවතී. මුළු භූමි ප්‍රමාණයෙන් වී හා පොල් ඉඩම් 13% බැගින්ද රබර් ඉඩම් 27%ක්ද මිශ්‍ර බෝග 6%ක් පමණද පවතී. ඉන් ගම්‍ය වන්නේ මෙම ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන අදායම් මාර්ගය කෘෂිකර්මාන්තය මත පදනම්ව ඇති බවයි.

රඹුක්කන ප්‍රාදේශිය සභා ප්‍රදේශය, දැලිවල සහ පින්නවල වශයෙන් ප්‍රධාන කෘෂිකාර්මික කලාප 2කට බෙදා ඇති අතර 60000ට වැඩි ගොවියන් ප්‍රමාණයක් ප්‍රදේශයේ ජීවත් වේ. ප්‍රධාන කෘෂි බෝග වලට අමතරව විවිධ පලතුරු විශේෂයෙන් කෙසෙල්, රඹුටන්, දූරියන්, අඹ, අලිගැටපේර, පේර, කොස් වැනි ශාක ප්‍රදේශය පුරා වගා කරනු ලබයි.

වගුව 2.2: ප්‍රධාන කෘෂිකාර්මික කලාප අනුව ගොවීන්ගේ ක්‍රියාකාරිත්වය

	කෘෂිකාර්මික කලාපය	
	දැලිවල	පින්නවල
ග්‍රාම සේවා වසම්	49	40
ගොවි සමාජ	49	40
ගොවියන් ගණන	4045	2556
කාන්තා ගොවි සමාජ ගණන	103	75
කාන්තා සාමාජිකයන් ගණන	2582	1849

මූලාශ්‍රය: ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, පින්නවල හා දැලිවල කලාප, 2019

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වාගොල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, රඹුටන් පර්යේෂණ ඒකකය, පොල් වගා මණ්ඩලයේ තවාන - එරමිණිගොල්ල, බිම්මල් බීජ නිෂ්පාදන මධ්‍යස්ථානය සහ පුද්ගලික අංශයට අදාළ පැල තවාන් රාශියක් ප්‍රදේශය පුරා පැතිර පවතී. වාගොල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය නැළින් ප්‍රදේශයේ වැඩි ඉල්ලුමක් පවතින අංකුර පලතුරු පැල වැඩි දියුණු කිරීම, පලතුරු බෝග සඳහා මව් පැල නඩත්තු කිරීම, බීජ නිශ්පාදනය, කෑගල්ල දිස්ත්‍රික්කයේ විශාලතම කොම්පෝස්ට් නිෂ්පාදන මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීම, ගොවීන්ට නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම, ගොවීන්, පාසල් ළමුන්

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

සහ නිලධාරීන් සඳහා පුහුණු පහසුකම් සැපයීම වැනි සේවාවන් රැසක් සිදු කෙරේ. රජයට අනුබද්ධිත ආයතන මෙන්ම පුද්ගලික වශයෙන්ද ක්‍රියාත්මක වන පැල තවාන් (පිටරට යවන විසිතුරු මල්පැල), පලතුරු හා අනෙකුත් වගාවන් බොහෝමයක් මෙම ප්‍රදේශය තුළ හඳුනාගත හැකිය.

වර්තමාන රඹුක්කන

රූපසටහන 2.6: රඹුක්කන ප්‍රදේශයේ පවතින රජයේ සහ පුද්ගලික අංශයට අදාළ කෘෂි බෝග වගා මධ්‍යස්ථාන

ආර්ථික අංශය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

සංචාරක කර්මාන්තය

සැලසුම් කලාපය තුළ සංචාරක ආකර්ශණීය ස්ථාන රාශියක් පිහිටා තිබෙන අතර ඒ අතුරින් පින්නවල සංචාරක කලාපය මේ වන විට ප්‍රදේශයේ ආර්ථිකය නගා සිටුවීම සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙයි. පින්නවල අලි අනාථාගාරය, එළිමහන් සත්වෝද්‍යානය හා අපේ ගම තේමා ගම්මානය පාදක කරගත් මෙම කලාපය ගැසට් පත්‍රයක් මගින් සංචාරක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති සබරගමු පළාතේ එකම කලාපයද වේ. මෙය විදේශීය සංචාරකයින් මෙන්ම දේශීය සංචාරකයින්ගේද ඉතා ආකර්ශනීය ස්ථානයක් ලෙස ප්‍රසිද්ධියට පත් වී ඇති අතර අධ්‍යාපනික වශයෙන් වැදගත් සහ රට මධ්‍යයේ පිහිටීම හේතුවෙන් දේශීය සංචාරකයින්ගේ පැමිණීම කැපීපෙනේ. එමෙන්ම සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පින්නවල කලාපය, ශ්‍රී ලංකාවේ වඩාත් ජනප්‍රිය සංචාරක ස්ථාන ඇතුළත් මාර්ග ජාලයේ පිහිටා තිබීම හා හඳුනාගෙන ඇති සංචාරක සංවර්ධන කලාප තුළ පිහිටා තිබීමත් නිසා දිවයිනේ සංචාරක කලාප අතරින් පින්නවල කලාපයේ වැදගත්කම පැහැදිලි වේ. (ඇමුණුම 06)

පින්නවල අලි අනාථාගාරය (1975)

මෙම අලි අනාථාගාරය 1975.02.16 දින ජී.බී කළුගල්ල මැතිතුමාගේ මූලිකත්වයෙන් වනයේදී රෝගාතුර වූ සහ උපකාර අවැසි අලි ඇතුන් රැක බලා ගැනීම පිණිස යෝධගම ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ ආරම්භ කරන ලදුව දැනට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන දෙස් විදෙස් සංචාරකයින් අතර ඉතා ජනප්‍රියත්වයට පත් ව ඇති ආකර්ෂණ මධ්‍යස්ථානයක් වේ. අක්කර 35 කට වැඩි භූමි භාගයක නිදැල්ලේ වෙසෙන අලි ඇතුන් 75ක් පමණ මෙහි වාසය කරන අතර දිනපතා දෙවරක් දිය නෑම සඳහා අසල ඇති මා ඔයට ගෙන යාම, සතුන් සඳහා පළතුරු ලබා දීම, කුඩා පැටවුන් සඳහා කිරි පෙවීම යනාදිය දෛනික ක්‍රියාකාරකම් මෙහිදී සිදු කෙරේ. ඒ අතරින් අලි ඇතුන් දිය නෑම විශාල සංචාරක ආකර්ශනයක් ඇති ක්‍රියාකාරකමක් වේ. මෙතරම් විශාල අලි ගහනයක් ඉතා ආසන්නව, එකවර නැරඹිය හැකි ස්ථානයක් වීම නිසා දේශීය මෙන්ම විදේශීය සංචාරකයන්ගේද නොමදව ආකර්ශණය හිමි වී ඇත.

රූප සටහන 2.7 : අලි ඇතුන් මා ඔයේදී දිය නෑම (ජම්බෝ බාත්)




මූලාශ්‍රය: : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය- පින්නවල අලි අනාථාගාරය

පින්නවල සත්වෝද්‍යානය (2015)

ශ්‍රී ලංකාවේ ප්‍රථම එලිමහන් සත්වෝද්‍යානය ලෙස 2015 අප්‍රේල් මස 17 විවෘත කරන ලද අක්කර 44ක් පමණ වන මෙම සත්තු වත්ත මා ඔය ස්වභාවික ජල ප්‍රදේශයෙන් මායිම් ව ඇත. දේශීය සහ විදේශීය සතුන් වර්ග 30 ට වඩා සහ විවිධත්ව පරාසයකින් යුතු සතුන් රාශියක් මෙහි දක්නට ලැබෙන අතර අධ්‍යාපනික වශයෙන්ද ඉතා වැදගත් ස්ථානයකි. සතුන් කූඩු කිරීමේ සංකල්පයෙන් බැහැරව විශාල සත්ව ආවරණ තුල සතුන් නිදැල්ලේ සිටියදී සතුන් නැරඹීමට හැකි වීම මෙහි විශේෂත්වයයි.

රූප සටහන 2.8: පින්නවල සත්වෝද්‍යානයේ ජීවීන්





මූලාශ්‍රය: ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය- පින්නවල සත්වෝද්‍යානය

පින්නවල අපේ ගම සංකීර්ණය(2016)

ප්‍රාග් ඓතිහාසික යුගයට නෑකම් කියනු ලබන සබරගමුව පළාතේ 17 හා 18 යන සියවස් වල පැවැති අතීත ජන උරුමය අනාගත පරපුරට හිඳිණ කර වීමට දරන උත්සාහයක් ලෙස ඉපැරණිගම හැඳින්විය හැකිය. එක් පසකින් මා ඔයට මායිම්ව ඉදි කර ඇති පින්නවල අපේ ගම හෙවත් “ඉපැරණිගම” සබරගමුවේ සහ සමස්ථ ශ්‍රී ලංකාවේ ඉපැරණි ජන උරුමයන් සජීවීව විද්‍යමාන කිරීමට සබරගමුව පළාත් සභාව මගින් ගනු ලැබූ උත්සාහයකි. අතීත ගැමි ජීවිතයේ අංගයන් ඇතුළත් මෙම අවේණික නේමා උද්‍යානයට පිවිසීමෙන් නූතන ලෝකයෙන් කෙටි කලකට මිදී සබරගමුව ගැමි සමාජයේ සැරිසැරීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ.

මෙහි දී වෙදගෙදර, ආරක්ෂක වැට, ආරච්චිල ගෙදර, වැව, එළිමහන් රඟහල, කුඹුර, රෙදිපිළි ගෙදර, කමත, කම්මල, හේන, වඩුමඩුව, හේනේ ගස මත බැදි පැල, කුඹල් ගෙදර, පන්සල, කෝපි කඩය, දඩු වැට,වන වදුල, වැව ඉඟත්තාව, ගැමි ගෙදර (තොරතුරු: සතර කෝරලේ විත්ති ග්‍රන්ථය ඇසුරිනි) වැනි නැරඹුම් ස්ථාන සජීවිකරණ අත්දැකීමක් ලෙස දැක බලා ගැනීමට නරඹන්නන්ට අවස්ථාව ලැබේ.

රූප සටහන 2.9: පින්නවල ඉපැරණි ගම නැරඹුම් ස්ථාන- ආරච්චිල ගෙදර සහ කුඹල් ගෙදර



මූලාශ්‍රය: ඉපැරැණිගම, මුහුණුපොත

පින්නවල ආශ්‍රිතව පවතින සංචාරක කර්මාන්තය නිසින් ජාතික ආර්ථිකය සඳහා දක්වන දායකත්වය 1%ක් වන අතර 2016, 2017 හා 2018 වර්ෂවල පින්නවල අලි අනාථාගාරය සහ සත්වෝද්‍යානය ලැබූ ආදායම පිළිවෙළින් රු. මිලියන 8.61, 7.50ක් හා 7.18ක් වේ. සංචාරක කර්මාන්තය නිසා සෘජු හා වක්‍ර රැකියා 5,000කට වැඩි ප්‍රමාණයක් මෙම ප්‍රදේශයේ ජනතාවට උදාවී ඇත. ඒ අනුව වර්තමානය වන විට ප්‍රදේශයේ එක් ප්‍රධාන ආදායම් මාර්ගයක් බවට සංචාරක කර්මාන්තය පත්ව ඇත. මෙම කලාපයේ ජීවත්වන 2,000ක් පමණ වන ජනතාවගේ සෘජු ආදායම් මාර්ග ලෙස හෝටල් සේවා, නවාතැන් පහසුකම් සැපයීම හා රෙදිපිළි /විසිතුරු භාණ්ඩ අලෙවිය වැනි රැකියා අවස්ථා හඳුනාගත හැකිය.

සංචාරකයන්ගේ පැමිණීම පිළිබඳව සලකා බැලීමේදී 2016, 2017 හා 2018 වර්ෂ වල අලි අනාථාගාරය සහ සත්වෝද්‍යානය නැරඹීමට පැමිණි දේශීය හා විදේශීය සංචාරකයින් ප්‍රමාණය පිළිවෙලින් මිලියන 1.32, 1.21 ක් හා 1.23ක් ලෙස වාර්තා වේ. විශේෂයෙන් විදේශ සංචාරකයන්ගේ පැමිණීම සැලකීමේදී එය 2016, 2017 හා 2018 වසර තුල පිළිවෙලින් 382,943ක් 341,303ක් හා 341,450ක් ලෙස සටහන් වේ. ඒ අනුව ලංකාවට පැමිණෙන සමස්ථ විදෙස් සංචාරකයන්ගෙන් 14%ක ප්‍රමාණයක් පින්නවල ප්‍රදේශයේ සංචාරය කරන බව මෙම දත්ත අනුව පැහැදිලි වේ. 2019 වසරේ ආරක්ෂක හේතූන් සහ පසුගිය 2021 සිට ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සිදු වූ සංචාරක ක්ෂේත්‍රයේ බිඳ වැටීම මෙම කලාපයේ ආර්ථිකය කෙරෙහිද ඍණාත්මක වශයෙන් බලපෑම් කරන ලද නමුත් ක්‍රමයෙන් යතාවත් වන සංචාරක ක්ෂේත්‍රයත් සමග නව පිබිදීමක් 2022 වසරේදී දක්නට ලැබේ. ඒ 2022 වසරේ ආරම්භයත් සමග ජනවාරි මස තුල පමණක් ශ්‍රී ලංකාවට පැමිණි මුළු විදේශීය සංචාරකයන් ගණන 82,327ක් ලෙස සටහන් වීමත් සමගයි. දෛනිකව එම අගය 2,000 – 3,000 අතර ප්‍රමාණයක් වේ (තොරතුරු: බේලි නිවුස් වෙබ් අඩවිය). මෙසේ පැමිණෙන විදේශීය සංචාරකයන් මෙන්ම දේශීය සංචාරකයන්ගේද අවධානය මෙම සැලසුම් කලාපය වෙත යොමු කරවීම සඳහා පින්නවල අලි අනාථාගාරය තුළ 2021දී උපන් නිවුන් අලි පැටවුන්, මා ඔයේ දිය නෑම සඳහා රැගෙන යාම, පැටවුන්ට කිරි ලබා දීමේ හා අලි ඇතුන්ට පළතුරු ලබා දීම වැනි ක්‍රියාකාරකම් සක්‍රීයව ක්‍රියාත්මක කිරීම හේතු සාධක වී ඇත.

රූපසටහන 2.10 :
පින්නවල අලි අනාථාගාරදී උපන් නිවුන් පැටවුන් සහ මව සුරංගි



රූපසටහන 2.11:
අලි ඇතුන් නෑවීමේ අවස්තාව නරඹන සංචාරකයින්



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2021

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

වර්තමාන රඹුක්කන

ආර්ථික අංශය

සැලසුම් කලාපය තුළ සංචාරක හෝටල් හා ආපන ශාලා 24 ක් පමණ ඇති අතර සංචාරකයින් නවාතැන් ගන්නා හෝටල් 6 ක් පමණ ඇත. විදේශීය සංචාරකයින් රාත්‍රී නවාතැන් ගන්නා ප්‍රමාණය ඉතාමත් අවම මට්ටමක් පෙන්නුම් කරන අතර එයට හේතු වශයෙන් මෙම හෝටල්, ආපනශාලා බහුතරයක් සංචාරක මණ්ඩලයේ අනුමැතීන් හා ප්‍රමිතියෙන් තොර ස්ථාන වීම සහ ප්‍රධාන වශයෙන් දිනයක් ගත කිරීමට තරම් සංචාරක ආකර්ෂණ ස්ථාන හා ක්‍රියාකාරකම් ප්‍රදේශයේ ප්‍රවර්ධනය කර නොතිබීම දැක්විය හැකි වේ. මෙවැනි හේතු සාධක මත සංචාරකයින් නවාතැන් නොගැනීම, ප්‍රදේශයේ ආර්ථිකයට ඍණාත්මකව බලපාන බැවින් අවශ්‍ය පහසුකම් ප්‍රමිතිගත කිරීම, නව පහසුකම් ඇති කිරීම හා දෙස් විදෙස් සංචාරකයන් සඳහා නව ආකර්ෂණ ස්ථාන හා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් ප්‍රදේශයේ ආර්ථිකය සංවර්ධනය කිරීමේ ලා ඇති බව පැහැදිලිය.

රූපය 2.12: පින්නවල විලා-සංචාරක නවාතැන්පල සහ එලිෆන්ට් පාර්ක් හෝටලය





මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2021

සංස්කෘතික උරුමයන් හා පුරාවිද්‍යාත්මක ස්ථාන

සැලසුම් කලාපය තුළ පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන ලෙස කැපී පෙනෙන පදවිගම්පොල ගල්මැස්ස, දලුග්ගල පන්සල, වට්ටාරම පන්සල, දැලිවල කොට වෙහෙර, කිරිවන්දෙනිය පන්සල, මීදුමලෙන් විහාරය, කැළෑ දඹුලු විහාරය, නාරංබැද්ද ගල් සෙල්ලිපිය, දියසුන්නත පන්සල, අළු ලෙන , කුඹල්දිවෙල හා මංගලගම අම්බලම යන ස්ථාන වැඩි දියුණු කර පහසුකම් සලසා දීම තුළින් දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ගැනීම සඳහා ප්‍රවර්ධනය කළහැකි ස්ථාන ලෙස හඳුනා ගත හැක(ඇමුණුම 07). පාරිසරික සංවේදීතාවයකින් යුතු අලගල්ල, ගබ්බල කන්ද වැනි කඳු ප්‍රදේශ හා මා-ඔය ජල මූලාශ්‍රයද සංරක්ෂණ උපායමාර්ග සහිතව සංචාරක ආකර්ශනීය ස්ථාන ලෙස සංවර්ධනය කිරීමේ අවශ්‍යතා පිළිබඳව මෙම සැලැස්ම තුළින් අවධානය යොමු කර ඇත.

සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත

සංචාරක කර්න්මාතයට අමතරව බ්‍රැන්ඩික්ස් (Brandix) ආයතනයේ නව කර්මාන්තශාලා අංගනය වඟව ප්‍රදේශයේ ඉදිකිරීම රඹුක්කන නගරයේ ආර්ථිකය නවමු මගකට යොමු කරන ලද අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. ඒ අනුව රඹුක්කන ප්‍රදේශයේ කර්මාන්ත මණ්ඩලයේ අනුමැතිය ලත් මධ්‍ය හා මහා පරිමාණ පාරිසරික වශයෙන් අනුකූලතාවයක් සහිත කර්මාන්තශාලා සඳහා ප්‍රවනතාවයක් මෙම ප්‍රදේශයට ඇති වී තිබෙන බව පැහැදිලිය. මේ වන විට ඉදිවන මධ්‍යම අධිවේගී මාර්ග පද්ධතිය සමඟද සම්බන්ධ වන රඹුක්කන නගරයට අනාගතයේදී මෙවැනි අවස්ථාවන් තවදුරටත් ආකර්ශනය වනු ඇත.

ප්‍රදේශයට ආවේණික සුළු හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්තයක් ලෙස කොළඹ - නුවර මාර්ගයේ මොලගොඩ ප්‍රදේශයේ ස්ථාපිතව ඇති මැටි අශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය, අලි වසුරු භාවිතයෙන් කඩදාසි හා වෙනත් විසිතුරු භාණ්ඩ නිපදවීම, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය ආදී නිෂ්පාදන කර්මාන්ත මෙන්ම බිම්මල් වගාව, විසිතුරු පැළ වගාව ආදී කෘෂිකර්මාන්තය මුල්කරගත් කර්මාන්තයන්ද මෙම ප්‍රදේශය තුල ව්‍යාප්තව ඇත.

වගු අංකය : 2.3 : රඹුක්කන සැලසුම් ප්‍රදේශයේ කර්මාන්ත ව්‍යාප්තිය

කර්මාන්තයේ නම	කර්මාන්ත ගණන	රැකියා ප්‍රමාණය
ඇඟලුම්	16	3296
බිම්මල් වගාව	160	172
මැටි භාණ්ඩ	45	60
අලි වසුරු නිෂ්පාදන	03	160
පැදුරු හා පන් / වියමන්	30	30
විසිතුරු භාණ්ඩ	10	12
විසිතුරු පැලෑටි	15	65

මූලාශ්‍රය: සම්පත් පැතිකඩ- 2019, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

2.2.2.3 සාමාජීය අංශය

රඹුක්කන ප්‍රදේශයේ සාමාජීය පසුබිම අධ්‍යයනය කිරීම සඳහා ජනගහනය, සෞඛ්‍ය, අධ්‍යාපන හා පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම් සම්බන්ධයෙන් මෙහිදී කරුණු දක්වා ඇත.

වර්තමාන රඹුක්කන

සාමාජීය අංශය

අ) ජනගහනය

2001 හා 2012 වර්ෂවල ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ජන සංගණන වාර්තා වලට අනුව රඹුක්කන ප්‍රාදේශිය සභා ප්‍රදේශයේ ජනගහනය පිළිවෙලින් 75,925 ක් හා 82,769 ක් වන අතර ස්වභාවික ජනගහන වර්ධන වේගය 0.8% ක් වේ. සංඛ්‍යා ලේඛන දත්ත අනුව ආසන්නතම ජනගහනය වශයෙන් 2020 වර්ෂයේ 87,711 ක් ලෙස දක්වා ඇති නමුත් රඹුක්කන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් නිකුත් කරන සම්පත් පැතිකඩ දත්ත අනුව 2020 වන විට 94,426 ක ජනගහනයක් මෙම ප්‍රදේශයේ ජීවත් වේ. කෙසේ වුවද 90,000 ක පමණ ජනතාවක් මේ 2022 වන විට මෙම ප්‍රදේශයේ ජීවත් වන බවට මෙම දත්ත වලට අනුව හඳුනාගත හැකිය.

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනගහනය ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 0.4% ක්ද සබරගමු පළාතේ ජනගහනයෙන් 4.3% ක්ද කෑගල්ල දිස්ත්‍රික් ජනගහනයෙන් 9.8 % ක්ද ලෙස වාර්තා වේ. ජන ඝණත්වය පිළිබඳ සලකා බැලීමේදී ර්රියගොල්ල, මොට්ටප්පුලිය, රඹුක්කන නගරය හා දියසුන්නත වැනි ග්‍රාම සේවා වසම්වල වර්ග කි.මී 1ට පුද්ගලයින් 664 ක් පමණ වන අතර වැඩිම ජන ඝණත්වයක් වාර්තා වී ඇත. කෙමිපිටිය හා උදන්ගම නිලධාරී කොට්ඨාසවල ජන ඝනත්වය අනෙකුත් ග්‍රාම නිලධාරී කොට්ඨාස හා සැසඳීමේදී ඉතා අඩු අගයක් ගෙන ඇත. (සිතියම 2.3, 2.4)

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් පුරුෂ ජනගහනය 47% වන අතර ස්ත්‍රී ජනගහනය 53% ක් ලෙසත් වාර්තා වේ. රඹුක්කන ප්‍රදේශයේ ජීවත් වන මුළු ජනගහනය අතුරින් 94% ක් සිංහල ජාතිකයන්ද, 3% ක් මුස්ලිම් ජාතිකයන්ද, 2% ක් දෙමළ ජාතිකයන්ද, 1% ක් අනෙකුත් ජාතිකයන්ද වේ. ආගම් අනුව ජන ව්‍යාප්තිය සැලකීමේදී රඹුක්කන ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් 90% ක් බෞද්ධ ආගමිකයන් වන අතර, 3.6% ක ප්‍රමාණයක් ඉස්ලාම් ඝක්තියන්ද, 4.45% ක් රෝමාණු කතෝලික ඝක්තියන්ද, 1% ක් ප්‍රමාණයක් හින්දු ඝක්තියන්ද, 0.01% ප්‍රමාණයක් වෙනත් ආගමික ඝක්තියන්ද වශයෙන් ව්‍යාප්තියක් ඇති බව හඳුනාගත හැකිය.

දෛනික අවශ්‍යතා මත රඹුක්කන ප්‍රදේශයේ දිනපතා සංසරණය වන ජනගහනය 45,000 ක් පමණ වන අතර, පින්නවල සංචාරක කලාපය වෙත දිනකට 10,000 - 20,000 ත් අතර ප්‍රමාණයක් පැමිණෙන බවට වාර්තා වේ. එක් එක් අවශ්‍යතා අනුව සලකා බලන විට 35% වන වැඩිම සංසරණයක් පාසල් ළමුන් වන බව පැහැදිලි වේ. එමෙන්ම 22% ක් එදිනෙදා අවශ්‍යතා සඳහා සංසරණය වන අතර 11%ක් සංචාරක අරමුණින් සංසරණය වේ. අප්‍රේල්, අගෝස්තු හා දෙසැම්බර් යන මාස වල දේශීය සංචාරකයන්ගේ පැමිණීම වැඩි අතර විදේශීය නරඹන්නන් අගෝස්තු සිට පෙබරවාරි දක්වා කාලය තුළ වැඩි වීමක් පෙන්නුම් කරයි. සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනවල සතිපොල හා කෙසෙල්කැන් පොල පවතින බැවින්, නගරයට පැමිණෙන ජනගහනය දෙගුණයක් පමණ වේ. රාත්‍රී කාලයේ මෙම ප්‍රදේශයේ ක්‍රියාකාරකම් ඉතා අවම අතර, දුම්රියෙන් සේවාව ලබා ගැනීමට පැමිණෙන පිරිස පමණක් කැපී පෙනේ.

සිතියම 2.3: ජන ඝනත්වය, 2001



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරී, 2022

සිතියම 2.4: ජන ඝනත්වය, 2012



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරි, 2022

ආ) සෞඛ්‍ය පහසුකම්

සෞඛ්‍යය පහසුකම් පිළිබඳව සැලකීමේදී සැලසුම් ප්‍රදේශය තුළ දිසා රෝහලක්, මධ්‍යම බෙහෙත් ශාලාවක් , රජයේ අයුර්වේද රෝහලක් හා ආයුර්වේද බෙහෙත් ශාලා 03ක් වශයෙන් පහසුකම් සලසා ඇතත් ප්‍රදේශයේ ජනතාවට එය ප්‍රමාණවත් නොවන බව පෙනේ. රඹුක්කන දිසා රෝහලේ පහසුකම් සලකා බලන විට භෞතික හා මානව සම්පත් දෙකෙහිම ප්‍රමාණවත් නොවන බවක් හඳුනාගත හැකිය. විශේෂඥ වෛද්‍යවරුන් මෙම රෝහලේ නොමැති අතර වෛද්‍ය නිලධාරීන් 13 ක්, දන්ත වෛද්‍යවරයෙක්, හෙද නිලධාරිහු 37 ක් හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිහු දෙදෙනෙක් මෙම රෝහලේ දැනට සේවය කරති.

2021 වර්ෂයේ රට මුහුණ පෑ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මෙම රෝහල ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරමින් රෝගීන් විශාල සංඛ්‍යාවක් සුවපත් කරමින් නොමද සේවාවක් සැපයීය.

රූප සටහන 2.13: රඹුක්කන දිසා රෝහල



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරී, 2022

රඹුක්කන ප්‍රදේශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන ආයුර්වේද රෝහල් 2ක් වන පින්නවල ආයුර්වේද පංචකර්ම ඒකකය හා වල්ගම මහීපාල හේරත් ආයුර්වේද රෝහල පිහිටා ඇති අතර සියලු සර්වාංග රෝග සඳහා මෙහිදී ප්‍රතිකාර සිදු කරයි. නවාතැන් ගෙන ප්‍රතිකාර ගත හැකි පහසුකම් මෙම රෝහල් වල පවතින බැවින් බොහෝ රෝගීන් මෙම මධ්‍යස්ථාන වලින් ප්‍රතිකාර ගනු ලබයි.

රූප සටහන 2.14: පින්නවල ආයුර්වේද පංචකර්ම ඒකකය හා වල්ගම මහීපාල හේරත් ආයුර්වේද රෝහල



මූලාශ්‍රය: පින්නවල ආයුර්වේද පංචකර්ම ඒකකය සහ මහීපාල හේරත් ආයුර්වේද රෝහල- මුහුණුපොත, 2022

ඇ) අධ්‍යාපන පහසුකම්

රඹුක්කන අධ්‍යාපන කොට්ඨාශය තුළ ඇති පාසල්, වර්ගීකරණයට අනුව 1AB වර්ගයේ පාසල් 4ක්ද, 1C වර්ගයේ පාසල් 16ක්ද, දෙවන වර්ගයේ පාසල් 11 ක් හා තුන්වන වර්ගයේ පාසල් 13ක් වශයෙන් මුළු පාසල් 44ක් ප්‍රදේශය පුරා දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා ස්ථාපිතව ඇත. සමස්ත ගුරුවරු සංඛ්‍යාව 1,233 ක් හා සිසුන් 16,846 ක් මෙම පාසල්වල සිටින අතර ගුරු සිසු අනුපාතය 1: 15ක් පමණ වේ. රඹුක්කන නගරයේ සිට කි.මී. 2ක් පමණ දුරින් පිහිටි පින්නවල මධ්‍ය මහා විද්‍යාලය කලාපීය වශයෙන් ජනප්‍රිය කාණ්ඩයේ පාසලක් ලෙස හඳුනාගත හැකිය. විභාග සාමාර්ථය අනුව 2016 වසරේ ශිෂ්‍යත්වය සමත් ගණන 8.7% ක්, සා .පෙ.64.09% ක් හා උ .පෙ.44.9% ක් වශයෙන් වාර්තා වේ.

මෙම ප්‍රදේශයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පැවතියද එය කීර්තිරත්නාරාම පන්සල් භූමියේ තාවකාලික ස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ. වර්තමානයේ එහි පාඨමාලා 3ක් පමණ ක්‍රියාත්මක වන අතර එය ප්‍රමාණවත් මට්ටමක නොපවතී. ඒ අනුව මේ සඳහා පහසුකම් සහිත ගොඩනැගිල්ලක අවශ්‍යතාවය පවතින බව හඳුනාගත හැකිය.

වගු අංක 2.4: රඹුක්කන අධ්‍යාපන කොට්ඨාශය තුළ ඇති පාසල් සංයුතිය

පාසල් බාණ්ඩය	පාසල් සංඛ්‍යාව	ළමුන් සංඛ්‍යාව			ගුරුවරුන් ගණන
		පිරිමි	ගැහැණු	මුළු සංඛ්‍යාව	
1AB	4	2584	2418	5002	367
1C	16	2146	2119	4265	405
2	11	2250	2300	4550	291
3	13	1524	1505	3029	170
මුළු ගණන	44	8504	8342	16,846	1233

මූලාශ්‍රය: කලාප කාර්යාලය, මාවනැල්ල 2021

උසස් අධ්‍යාපනික ආයතන ලෙස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානය (කර්මාන්ත සංවර්ධන අධිකාරිය), මැටි භාණ්ඩ කර්මාන්ත පුහුණු ආයතනය (ජාතික ශිල්ප සභාව), වාගොල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, තරුණ සේවා සභ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය යන ආයතන ප්‍රදේශය තුළ පවතින අතර ඒවායේ නිසි කළමනාකරණයකින් යුතුව කාර්යක්ෂම කටයුතු සිදුවන බවක් දක්නට නොලැබේ. එබැවින් ඒවා නැවත් පන ගන්වමින් ප්‍රදේශයේ දරුවන්ගේ උසස් අධ්‍යාපනික අවශ්‍යතා සපුරා ලීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුව ඇත.

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

ඈ) පොදු එලිමහන් විනෝද පහසුකම්

වර්තමාන රඹුක්කන සාමාජීය අංශය

සෘජු හා වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන කොටස් දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. සෘජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍යය. එනම්, ක්‍රීඩා කිරීම, පිහිනීම, දිවීම, ඇවිදීම, බෝට්ටු පැදීම හා සම්ප්‍රධායික මසුන් ඇල්ලීම නිදසුන් ලෙස දැක්විය හැක. ඒ අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන ලෙස ප්‍රදේශයේ පවතින උද්‍යාන පහත දැක්වේ.

වගු අංක 2.5: රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන

අනු අංකය	උද්‍යාන වර්ගය	ප්‍රමාණය (ha)
1.	පවතින ඉතා කුඩා උද්‍යාන Existing Pocket Parks (EPP)	0.46
2.	පවතින කුඩා උද්‍යාන Existing Mini Parks (EMP)	1.04
3.	පවතින අසල උද්‍යාන Existing Local Parks (ELP)	2.54
4.	පවතින මධ්‍ය නගර උද්‍යාන Existing Central Urban Parks (ECP)	21.4
	එකතුව	25.44

මූලාශ්‍රය: පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

වගු අංක 2.6: පවතින ඉතා කුඩා උද්‍යාන -Existing Pocket Parks (EPP)

අනු අංකය	උද්‍යාන වර්ගය	නම	ග්‍රාම නිලධාරී කොට්ඨාසය	භූමි ප්‍රමාණය(හෙක්:)
01.	EPP_1	වොලිබෝල් ක්‍රීඩා පිටිය	දැලිවල	0.04
02.	EPP^2	වොලිබෝල් ක්‍රීඩා පිටිය	මීදුම	0.04
03.	EPP_3	වොලිබෝල් ක්‍රීඩා පිටිය	නත්තඹුර	0.08
04.	EPP_4	වොලිබෝල් ක්‍රීඩා පිටිය	කණුගොල්ල	0.11
05.	EPP_5	වඟව ළමා උද්‍යානය	තල්දෑව	0.19

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2019

වගු අංක 2.7: පවතින කුඩා උද්‍යාන - Existing Mini Parks (EMP)

අනු අංකය	උද්‍යාන වර්ගය	නම	ග්‍රාම නිලධාරී කොට්ඨාසය	භූමි ප්‍රමාණය(හෙක්:)
01.	EMP_1	වැලිගමුව ක්‍රීඩාපිටිය	ඉහළ වල්පොල	0.38
02.	EMP_2	අශෝක කරුණාරත්න ක්‍රීඩාපිටිය	හුරිමළුව	0.66

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2019

වගු අංක 2.8: පවතින අසල උද්‍යාන -Existing Local Parks (ELP)

අනු අංකය	උද්‍යාන වර්ගය	නම	ග්‍රාම නිලධාරී කොට්ඨාසය	භූමි ප්‍රමාණය(හෙක්:)
01.	ELP_1	මහීපාල හේරත් ක්‍රීඩා පිටිය	බනඹුරය	1.24
02.	ELP_2	පින්නවල ඉපැරණි ගම තේමා උද්‍යානය	යෝධගම	1.30

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2019

වගු අංක 2.9: පවතින මධ්‍ය නගර උද්‍යාන -Existing Central UrbanParks (ECUP)

අනු අංකය	උද්‍යාන වර්ගය	නම	ග්‍රාම නිලධාරී කොට්ඨාසය	භූමි ප්‍රමාණය(හෙක්:)
01.	$ECUP_1$	පින්නවල අලි අනාථාගාරය	යෝධගම	10.41
02.	$ECUP_2$	පින්නවල සත්වෝද්‍යානය	යෝධගම	10.99

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2019

ඉහත සඳහන් කළ විනෝදාත්මක ස්ථාන අතරින් පින්නවල සංචාරක කලාපයේ පවතින අසල උද්‍යාන සහ මධ්‍ය නගර උද්‍යාන වන පින්නවල ඉපැරණි ගම තේමා උද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල එළිමහන් සත්වෝද්‍යානය සංචාරකයින්ට නැරඹීමට ඇති ප්‍රධාන ස්ථාන ලෙස හඳුනා ගත හැකිය.

I. පින්නවල අලි අනාථාගාරය.

කැළේ අතරමං වූ අලින් රැක බලා ගැනීමේ අරමුණින් 1975.02.16 වන දින යෝධගම ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ පින්නවල අලි අනාථාගාරය පී.බී කළුගල්ල මැතිතුමාගේ මූලිකත්වයෙන් ආරම්භ කර ඇත. සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මෙම අලි අනාථාගාරය දෙස් විදෙස් සංචාරකයින් අතර ඉතා ජනප්‍රියත්වයට පත් ව ඇත. ලෝකයේ ප්‍රථම වරට අලි අනාථාගාරයක ඕලෑ ඇතින්නක විසින් පැටවකු බිහි කරනු ලැබුවේද පින්නවල දී බව වාර්තා වේ. ඒ 1984.07.05 දින සුකුමලී නැමැති පැටවා බිහි කරවීමත් සමගය. නිදැල්ලේ වෙසෙන මෙම අලි ඇතුන් දිනපතා පෙ ව.10.00 සිට 12.00 දක්වාත් ප ව.

2.00 සිට 4.00 දක්වාත් දිය නෑම සඳහා අසල ඇති මා ඔයට ගෙන යනු ලබයි. කුඩා පැටවුන් සඳහා කිරි පෙවීම, පලතුරු කැවීම වැනි සක්‍රිය ක්‍රියාකාරකම් සෑම දිනකම සිදු කරන අතර එය දේශීය මෙන්ම විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණයට හේතු වී ඇත.

II. පින්නවල එළිමහන් සත්වෝද්‍යානය

මෙම සත්වෝද්‍යානය 2015 අප්‍රේල් මස 17 දින සිට මහජනතාව සඳහා විවෘත කරන ලදි. මෙය ලංකාවේ ප්‍රථම එළිමහන් සත්වෝද්‍යානය වන අතර දෙහිවල හැරුණුවිට ශ්‍රී ලංකාවේ දෙවන සත්වෝද්‍යානයද මෙයයි. සතුන් විශාල ප්‍රමාණයක් දැනටමත් දැක බලා ගත හැකි අතර විශාල ඉඩකඩක් සහිතව නිදැල්ලේ හැසිරීමට හැකි පරිදී මෙය නිර්මාණය කර තිබීම විශේෂත්වයක් ඇත.

III. පින්නවල අපේ ගම සංකීර්ණය

ප්‍රාග් ඓතිහාසික යුගයට නෑකම් කියනු ලබන සබරගමුව පළාතේ 17 හා 18 යන සියවස් වල පැවැති අතීත ජන උරුමය අනාගත පරපුරට තිළිණ කර වීමට දරන උත්සාහයක් ලෙස ඉපැරණිගම හැදින්විය හැකිය. මා ඔය මායිමිව ඉදි වී ඇති පින්නවල “ඉපැරණිගම " නුළින් සබරගමුවේ මෙන්ම පොදුවේ ශ්‍රී ලංකාවේ ඉපැරණි ජන උරුම විද්‍යමාන කිරීමට සබරගමුව පළාත්සභාව මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි. මෙහි දී පහත සඳහන් ස්ථාන නැරඹුම් ස්ථාන ලෙස සඳහන් කල හැක. මෙමගින් ආර්ථික සාමාජීය සංස්කෘතික උරුමයන් අනාගත පරපුරට දැක බලා ගැනීමට හැකි වන ලෙස සජීවීව නිර්මිතයක් ලෙස ඉදි කර ඇත. නිදසුන් ලෙස;

- වෙදගෙදර, ආරක්ෂක වැට, වැව, කුඹුර, කමත, හේන, පන්සල, දඩු වැට, ආරච්චිල ගෙදර, එළිමහන් රඟහල, රෙදිපිළි ගෙදර, කම්මල, වඩුමඩුව, කුඹල් ගෙදර, කෝපි කඩය වැනි ඉපැරැණි ගමක නිර්මාණයන් දැකගත හැකිය.

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වක්‍ර විනෝද පහසුකම් සලසාගත හැකි ස්ථාන පහත පරිදි වේ.

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

වගු අංක 2.10: රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වක්‍ර විනෝද පහසුකම්

පහසුකම්	සංඛ්‍යාව	ආසන ධාරිතාව
රැස්වීම් ශාලා	01 (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) 01 (ප්‍රාදේශීය සභා කාර්යාලය)	ආසන -200 ආසන -250
ප්‍රජා ශාලා	01(රඹුක්කන)	ආසන -500
පුස්තකාල	01(රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලය) 01(ඉඹුල්ගස්දෙණිය)	සාමාජික පිරිස-12,133 පොත් සංඛ්‍යාව - 28,900 සාමාජික පිරිස -1,413 පොත් සංඛ්‍යාව - 8,922
සිනමා ශාලා	01(රිජන්ට් සිනමා ශාලාව)	ආසන - 200

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2019

වර්තමාන රඹුක්කන

සාමාජීය අංශය

සිතියම 2.5: රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින උද්‍යාන සහ ක්‍රීඩාපිටි



මූලාශ්‍රය: පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

2.2.2.4 පාරිසරික අංශය

අ) පාරිසරික සම්පත්

කඳුකර තෙත් කලාපයට අයත් රඹුක්කන ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1500-3000 අතර පවතී. උෂ්ණත්වය සෙල්සියස් අංශක 20-25 අතර වෙනස් වේ.

ජලාශ්‍රිත ප්‍රදේශ

ප්‍රධානම ජල මූලාශ්‍රය මා-ඔය වන අතර පානීය ජලය ලබා ගන්නා ජල ප්‍රභවයද මෙයයි. ප්‍රදේශයේ මධ්‍යයෙන්ම ගලා බසින භූරිමලුව ප්‍රදේශයේදී කොටස් දෙකකට බෙදී නැගෙනහිර දෙසට රඹුක්කන් ඔය ලෙසින් ගලා බසින අතර මා-ඔය බටහිර දෙසට හැරී ගලා බසී. මා ඔය හැරුණු කොට බොහොර ඔය, වල් ආර ඔය, රඹුක්කන් ඔය සහ කරඹුගොල්ල ඇල පිහිටා ඇති අතර වැවි 8 ක්ද ප්‍රදේශයේ පිහිටා ඇත. ප්‍රදේශයේ ගාඛීය ජල වහන රටාවක් පෙන්නුම් කරන අතර මෙම ස්ථාන සංරක්ෂණය කල යුතු ප්‍රදේශ වේ. එමෙන්ම මා ඔයෙහි හිරිවඩුන්න පාලම ආසන්නයේ ඇති දූපත් සමූහද විශේෂයෙන් සංරක්ෂණය කල යුතු ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය.

වගු අංක 2.11: රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින වැවි

අංකය	වැවේ නම	ප්‍රමාණය (හෙක්ටයාර්)	ග්‍රාම නිලධාරී වසම
1.	ගොඩගන්දෙණිය වැව	0.30	ගොඩගන්දෙණිය
2.	කුඩාගම වැව	0.34	කුඩාගම උතුර
3.	මීදුම වැව	0.12	මීදුම
4.	තල්දෑව වැව	0.40	තල්දෑව
5.	ඉඟළ වල්පොළ වැව	0.13	ඉඟළ වල්පොළ
6.	සියඹලන්ගමුව වැව	0.60	උදන්විට
7.	කොහොලුල්ල වැව	0.06	වැරැල්ලපත
8.	ඉඹුල්ගස්දෙණිය වැව	0.32	ඉඹුල්ගස්දෙණිය

මූලාශ්‍රය : ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, 2022

වන රක්ෂිත

මෙම බල ප්‍රදේශයේ වන රක්ෂිත ලෙස හෙක්ටයාර් 833 ක ප්‍රමාණයක් හඳුනා ගත හැකි අතර එම වන රක්ෂිත ස්වභාවික වනාන්තර මෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යෝජිත වනාන්තර ප්‍රදේශද ඇතුලත් වේ.

වගු අංක 2.12. රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින වන රක්ෂිත ප්‍රදේශ

අනු අංකය	වන රක්ෂිතය	ප්‍රමාණය (හෙක්ටයාර්)
1.	සියඹලන්ගමුව වන රක්ෂිතය	73.92
2.	දඹුල්ල වන රක්ෂිතය	218.20
3.	ගඟේකුඹුර වන රක්ෂිතය	207.27
4.	ගොන්දෙනිකන්ද වන රක්ෂිතය	61.41
5.	නාරම්බැද්ද වන රක්ෂිතය	86.78
6.	කොටගම වන රක්ෂිතය	39.24
7.	කිවුල්පන වන රක්ෂිතය	22.91
8.	නැටියපාන වන රක්ෂිතය	25.12
9.	ඟලාගිරිය වන රක්ෂිතය	59.41
10.	ගොඩගන්දෙණිකන්ද යෝජිත වන රක්ෂිතය	21.28
11.	නාමල්ගොමුව යෝජිත වන රක්ෂිතය	18.05
	එකතුව	833.59

මූලාශ්‍රය : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, 2022

සිතියම 2.6: රඹුක්කන ප්‍රදේශයේ ඇති ජලාශ්‍රිත ප්‍රදේශ හා වන රක්ෂිතවල ව්‍යාප්තිය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

ආ) ස්වභාවික ආපදා

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2006 -2018 වර්ෂයන් දක්වා කාල සීමාව තුල වාර්තා වූ ආපදා හේතුවෙන් ආපදාවට ලක්වූ තත්ත්වයන් පහත පරිදි වේ.

වර්තමාන රඹුක්කන

පාරිසරික අංශය

වගු අංක 2.13: 2013 -2018 කාල සීමාව තුල වාර්තා වූ ආපදාවට ලක්වූ පුද්ගල සංඛ්‍යාව

අංකය	වර්ෂය	ආපදාවට ලක්වූ පුද්ගල සංඛ්‍යාව				
		ජල ගැලීම්	නියඟය	තද සුළං	අධික වර්ෂාව	නායයෑම්
1.	2013	-	-	76	-	-
2.	2014	95	-	5	-	63
3.	2015	38	-	66	7	8
4.	2016	3	565	43	-	215
5.	2017	-	3,450	-	3	-
6.	2018	22	-	161	-	-

මූලාශ්‍රය :https://www.desinventar. lk – 2019

ප්‍රදේශයේ සිදුවූ ආපදා හේතුවෙන් ආපදාවට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ සිදුවූ නිවාස හානි සංඛ්‍යාව 2006 සිට 2018 දක්වා සැලකීමේදී වැඩි පුද්ගලයින් සංඛ්‍යාවක් නියඟය හා තද සුලං හේතුවෙන් ආපදාවට ලක් වී ඇත. එහෙත් නිවාස ඇතුළු දේපළ හානි පිළිබඳව සලකා බලන විට ඉතා සුළු හානි ප්‍රමාණයක් වාර්තා වේ. පහත සඳහන් ප්‍රස්ථාර අංක 01 සහ 02 මගින් වැඩිදුරටත් දැක්විය හැකිය.

රූප සටහන 2.15: ආපදාවට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව



රූප සටහන 2.16: සිදුවූ නිවාස හානි සංඛ්‍යාව



මූලාශ්‍රය :https://www.desinventar. lk – 2019

ප්‍රදේශයේ නායයෑම් අවධානම් සහිත සහ නායයෑමේ විභවතාවයක් සහිත ප්‍රදේශ ලෙස ගොඩගන්දෙනිය, මුවන්දෙනිය සහ පරපේ වැනි ප්‍රදේශ හඳුනා ගත හැකිය. එය නායයෑම් අවධානම් කලාප සිතියම් අංක 2.9 මගින් දක්වා ඇත.

සිතියම 2.7 නායයෑම් අවධානම් කලාප සිතියම



රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාය යාම් අවදානම සහිත ප්‍රදේශ

මූලාශ්‍ර : මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2020

නාගරික සංවර්ධන අධිකාරිය
2022 නොවැම්බර්

සබරගමුව පළාත් කාර්යාලය | රඹුක්කන සංවර්ධන සැලැස්ම 2023 - 2033 | සැකසුම් - පරිසර හා භූ දර්ශන අංශය

මූලාශ්‍රය : පරිසර හා භූ දර්ශන අංශය, නා.සි.අ, 2022

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

2.2.3 පූර්ව සැලසුම් ප්‍රයත්න

පූර්ව සැලසුම් ප්‍රයත්න

නීතිමය විධි විධාන අනුගමනය කරමින් සැලසුම් ප්‍රදේශය සඳහා කරන ලද එකම පූර්ව සැලසුම වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය මගින් 2012 - 2020 කාලය සඳහා බලාත්මක කරන ලද රඹුක්කන නාගරික බල ප්‍රදේශය ආවරණය කරන ලද සංවර්ධන සැලැසුම හඳුනාගත හැකිය. එම සැලසුමෙහි ඉදිරි සංවර්ධන දැක්ම වුයේ "ප්‍රාදේශීය හා කලාපීය වශයෙන් වැදගත් වන්නා වූ ප්‍රදේශය සතුව පවතින සංවර්ධන විභවතාවන් කාර්යක්ෂමව සහ ආර්ථිකමය වශයෙන් වර්ධනය කරමින්ද, එම සංවර්ධන විභවතාවන් උපරිම ලෙස උපයෝගී කර ගනිමින් සංචාරක, නේවාසික මෙන්ම පෝෂක ප්‍රදේශයේ ප්‍රධාන වාණිජ හා සේවා නගරය ලෙස රඹුක්කන නගරය සංවර්ධනය කිරීම" යි.

තවදුරටත්, එකී දැක්ම ප්‍රකාරව ඉලක්කගත අරමුණු අතර නගරයේ සීමිත ඉඩම් සම්පත පූර්ණ ලෙස කාර්යක්ෂම භාවිතයට ගැනීම, අනාගත ඉල්ලුම සපුරාලිය හැකි පරිදි වාණිජ කටයුතු සඳහා වන ඉඩ ප්‍රස්ථාවැඩි කිරීම, සංචාරක කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම, පොදු පහසුකම් සංවර්ධනය කිරීම හා නේවාසික නගරයක් ලෙස සංවර්ධනය කිරීම ආදිය මගින් වර්ග කි.මී 3.8 ක් වන සැලසුම් ප්‍රදේශයේ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කොට ඇත.

රූප සටහන 2.17: රඹුක්කන නාගරික ප්‍රදේශය සඳහා වන කලාපීකරණ සැලැස්ම, 2012-2020



මූලාශ්‍රය: රඹුක්කන නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම, 2012-2020, නාගරික සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් 2000.06.28 දින ගැසට් අංක 1138/18 මගින් පින්නවල ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර (ඇමුණුම 08) මෙම ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් මේ වන තෙක් සකස් කර නොමැත.

පූර්ව සැලසුම් ප්‍රයත්න

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2000.08.11 දින ගැසට් අංක 1144/25 මගින් භූමි ප්‍රමාණය 131 km^2 සහ ග්‍රාම සේවා වසම් 89 කින් සමන්විත රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම නාගරික සංවර්ධන අධිකාරිය බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර මෙම සම්පූර්ණ ප්‍රදේශයම ආවරණය වන පරිදි සංවර්ධන සැලැස්මක් 2020 වන තෙක් සකස් කර නොතිබුණු බැවින් මෙකී කරුණු පදනම් කර ගනිමින් රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටම (2023-2033) සංවර්ධන සැලසුම සකස් කිරීම ආරම්භ කරන ලදී.

සබරගමුව පළාත් කලාපීය භෞතික සැලසුම 2007 – 2030 : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, සබරගමුව පළාත් කලාපීය සැලසුම් කමිටුව මගින් සම්පාදනය කරන ලද සැලසුමට අනුකූලව රඹුක්කන නගරය පළාත් නාගරික ධූරාවලියේ තෙවන මට්ටමේ නගරයක් ලෙස හඳුනාගෙන ඇත. සමස්ත පළාත තුල තෙවන මට්ටමේ නගර 10ක්, දෙවන මට්ටමේ නගර දෙකක් හා පළමු පෙළ නගරයක් ව්‍යාප්තව ඇති අතර ඉතරවන, පස්වන හා සයවැනි පෙළ නගර රාශියක් හඳුනාගෙන ඇත. ඒ අනුව රඹුක්කන නගරය පළාත් මට්ටමේ ප්‍රධාන නගරයක් ලෙස එම සැලසුම තුලින් නම්කර ඇති බව දැක්විය හැකිය. මෙම සැලැස්ම තුළින් රඹුක්කන ප්‍රදේශය සඳහා හඳුනාගත් සංවර්ධන ව්‍යාපෘති ලෙස සංචාරක ආකර්ෂණය කලාපයක් ලෙස පින්නවල සංවර්ධනය කිරීම හඳුනාගත හැකිය.

රූප සටහන 2.18 : සබරගමුව පළාත් කලාපීය භෞතික සැලැස්ම 2007 – 2030



මූලාශ්‍රය: ශ්‍රී ලංකා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ජාතික භෞතික සැලසුම 2050 දිශානතිය

ශ්‍රී ලංකා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සකස් කරන ලද ජාතික භෞතික සැලසුම 2050 හි දක්වා ඇති සංකල්පිත සැලසුම අනුව රඹුක්කන ප්‍රදේශය දිවයිනේ මධ්‍යම කඳුකර භූ කලාපය ආවරණය කරන මධ්‍ය පාරිසරික සංවේදී කලාපයේ පිහිටා ඇත. ඒ අනුව එකී සැලසුම මගින් ජාතික මට්ටමේ සංවර්ධන පාලිත කලාපයක් ලෙස හඳුනාගන්නා ලද ප්‍රදේශය තුල මෙම සංවර්ධන සැලසුමේ මායිම් ව්‍යාප්තව ඇත. ජාතික සැලැස්ම මගින් නම් කර හඳුනාගන්නා ලද නාගරික ධූරාවලියේ කුරුණෑගල, මහනුවර යන ජාතික නගර සමඟ සෘජු හා ආසන්න සම්බන්ධතාවයක් රඹුක්කන නගරයට ඇති අතර කොළඹ, කුරුණෑගල හරහා ත්‍රිකුණාමලය දක්වා නම් කර ඇති ආර්ථික සංවර්ධන කොරිඩෝවට අවකාශීයව ආසන්නයේ පිහිටා ඇත.

රූප සටහන 2.19: ජාතික භෞතික සැලසුම 2050



මූලාශ්‍රය: ශ්‍රී ලංකා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

2.3 සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

ක්‍රියාකාරී සීමාව

රඹුක්කන නගර සංවර්ධන සැලැස්මට අදාල සැලසුම් සීමාව නිර්ණය කිරීමේදී භූගෝලීය තොරතුරු පද්ධති (GIS) තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරමින් ක්‍රියාකාරී සීමා, භූ ගෝලීය සීමා සහ පරිපාලනමය සීමා වෙන් වෙන් වශයෙන් සහ ක්‍රියාකාරී සීමා අධ්‍යයනයන් සිදු කරමින් එම සීමාවන් හි සම්මිශ්‍රණයක් සහිතව අවසන් සැලසුම් සීමාව නිර්ණය කර ගැනීම සිදු විය. රඹුක්කන නගරය ප්‍රාදේශීය මට්ටමින් සලකා බලන විට ප්‍රාදේශීය සීමාවේ පිහිටි ප්‍රධාන නගර වන කෑගල්ල, මාවනැල්ල සහ කුරුණෑගල යන නගර වලින් වෙන් ව හුදකලාව පිහිටි නගරයක් ලෙස පිහිටා ඇති බැවින් සීමා නිර්ණය කිරීමේදී අනුකූලතාව ආරක්ෂා වන පරිදි රඹුක්කන නගරයේ සමස්ත පෝෂක ප්‍රදේශය හඳුනාගැනීම වැදගත් විය. එසේම ගැසට් නිවේදනයකින් සීමා දක්වන ලද ජාතික මට්ටමේ සංචාරක මධ්‍යස්ථානයක් පිහිටීම, නාගරික , ග්‍රාමීය හා අර්ධ නාගරික ලෙස පරාසයකින් යුතු ලක්ෂණ වලින් යුතු වීම, භෞතිකමය වශයෙන් තැනි බිම් මෙන් ම කඳු සහිත විෂම භූ ලක්ෂණයන්ගෙන් යුතු වීම යනාදී කරුණු කෙරෙහිද සීමා නිර්ණයේදී අවධානය යොමු කෙරිණි.

ක්‍රියාකාරී සීමාව

රඹුක්කන නාගරික ප්‍රදේශය සමස්ථයක් ලෙස වාණිජමය භාවිතයට වඩා නේවාසික භාවිතය සඳහා පහසුකම් සපයන නගරයක් ලෙස හඳුනාගත හැකිය. දුම්රිය ස්ථානය ක්නේද්‍ර කරගත් නගරයක් ලෙස සංවර්ධනය වී ඇති බැවින් දෛනිකව එම සේවාවන් ලබා ගැනීමට පැමිණෙන ජනතාව ක්‍රියාකාරී සීමා නිර්ණය සඳහා වැදගත් සාධකයක් විය. එමෙන්ම සතිපොල පැවැත්වෙන දිනවලදී වැඩි සංසරණ ජනගහනයක් දක්නට හැකි අතර රාජ්‍ය හා මූල්‍ය ආයතන වලින් සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාව ද නගරය ග්‍රාමීය ප්‍රදේශ හා සම්බන්ධ කරන ක්‍රියාකාරී සීමාව තව දුරටත් පුළුල් කිරීමට දායක වී ඇත. ඒ අනුව සමස්තයක් වශයෙන් රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාවේ ප්‍රධාන පරිපාලනමය මධ්‍යස්ථානය සහ ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථානය වශයෙන් සේවා ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා සීමාවේ ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් රඹුක්කන නගරය කරා ඇදී එයි.

ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථානයක් ලෙස, දිනකට 10,000 ක් පමණ වූ දේශීය හා විදේශීය සංචාරකයෝ මෙම ප්‍රදේශයේ සංචාරය කරති. පින්නවල මූලික කොටගත් මෙම සංචාරක කලාපය රඹුක්කන නගරයේ ක්‍රියාකාරී මායිම් ඉක්මවා රඹුක්කන - කෑගල්ල මාර්ගය ඔස්සේ කරඩුපන මංසන්ධිය දක්වා ව්‍යාප්ත වී කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ වීමෙන් ප්‍රාදේශීය මට්ටමේ නගර වන කෑගල්ල, මාවනැල්ල සමඟත්, ජාතික මට්ටමේ නගර වන කොළඹ හා මහනුවර සමඟත් සම්බන්ධ වන බවත් පැහැදිලි වේ.

මොළගොඩ ප්‍රදේශයේ ස්ථාපිතව ඇති මැටි ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගත් හා දෛනිකව සංසරණය වන ජනතාවගේ මැටි භාණ්ඩ අවශ්‍යතා

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

සපුරා ගන්නා ප්‍රධාන වෙළඳපොල ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයේ පිහිටා තිබීම නිසා මෙම ප්‍රදේශයේ ඉහළ ක්‍රියාකාරිත්වයක් හා සංසරණය වන ජනගහනයේ ධාරා ප්‍රදේශය ජාතික මට්ටම හා සමඟ සම්බන්ධ වේ.

සැලසුම් ප්‍රදේශය නීර්ණය කිරීම

සංවර්ධන පීඩක විශ්ලේෂණයට [(Development Pressure Analysis) (ඇමුණුම 2.1)] අනුව රඹුක්කන නගරයේ සිට B199 කෑගල්ල මාර්ගය ඔස්සේ පින්නවල හරහා කරඹුපන මංසන්ධිය දක්වාත් එහි සිට

භූගෝලීය සීමාවන්

කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගය ඔස්සේ මහනුවර දෙසට මොළගොඩ ප්‍රදේශය දක්වාත් සංවර්ධන ප්‍රවනතාවයක් සහිත බවත් එකී ප්‍රදේශය නාගරික ක්‍රියාකාරකම් බහුල ක්‍රියාකාරී සීමාව ලෙසත් මෙහිදී හඳුනා ගන්නා ලදී.

භූගෝලීය සීමාවන්

කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයේ කරඹුපන මංසන්ධියෙන් ප්‍රදේශයට ඇතුළු වීමේදී පසුකරන භූමිය තැනිතලා භූමියක් වන අතර රඹුක්කන ප්‍රාදේශීය සභා බල සීමාවේ ප්‍රධාන භූගෝලීය සීමාවක් ලෙස එම මාර්ගය මා-ඔය හමුවන වන ස්ථානය දැක්විය හැකිය. ඒ අනුව රඹුක්කන-කෑගල්ල මාර්ගය(B199) ඔස්සේ ඇතුළු වීමේදී භෞතික වශයෙන් දකුණු පස මායිම ලෙස මා-ඔය හඳුනාගත හැක.

නැගෙනහිර දෙසින් අලගල්ල කන්ද හා රඹුක්කන-ගලගෙදර මාර්ගය ඔස්සේ ගල ගෙදර දෙසට පිවිසීමේදී මද බෑවුම් සහිත කඳුකර ස්වභාවයක් පෙන්නුම් කරන අතර නැගෙනහිර සීමාව එම භූ විෂමතා ලක්ෂණ වලින් මායිම්ව පවතී. ජල දේහ ජාලයක් වශයෙන් සැලකීමේදී මා-ඔය ප්‍රධාන ජල මූලාශ්‍රය වන අතර රඹුක්කන් ඔය, බොහොර ඔය හා වල් ආර ඔය යන වාරි මාර්ග සම්බන්ධ වන වාරි මාර්ග ජාලයක් සහ ගොඩගන්දෙණිය වැව, කුඩාගම වැව, මීදුම වැව, තල්දැව වැව, ඉහල වල්පොල වැව, කොහොල්ල වැව, ඉඹුල්ගස්දෙණිය වැව හා සියඹලන්ගමුව වැව යනාදී කුඩා වැව් 08 ක් මඟින් මෙම ප්‍රදේශය ජල අවශ්‍යතාව සපුරා ගනු ලැබේ.

හිරිවඩුන්න පාලම අසල පිහිටි මා-ඔය දූපත්, කොස්සින්නකන්ද, නාරම්බැද්ද කැලය, ඉහල වල්පොල වසමේ පිහිටි වනාන්තරය, ගබ්බල දකුණ වැනි ප්‍රදේශ සංරක්ෂණය කළ යුතු සංවේදී පාරිසරික ප්‍රදේශ ලෙස හඳුනාගත හැක. භූගෝලීය සීමාව නීර්ණය කිරීමේදී භූගෝලීය පිහිටීම පදනම් කරගත් අතර ඒ අනුව ඉහත දක්වා ඇති පරිදි ප්‍රදේශය තුල පාරිසරික හා භූගෝලීය වශයෙන් සංවේදීතාවක් සහිත ප්‍රදේශයද ඇතුලත් වන භෞතික සීමාව හඳුනා ගන්නා ලදී. ස්වභාවික භූගෝලීය ලක්ෂණ මඟින් සැලසුම්කරණයේදී සීමා නීර්ණය කර දැක්වීම සාර්ථක උත්සහයක් නොවන බැවින් එකී සීමාව මෙහි අවසන් සීමා නිර්ණය සඳහා උපකාරවන පදනමක් වශයෙන් පමණක් සලකන ලදී.

පරිපාලන සීමාව

නාගරික සංවර්ධන අධිකාරී මඟින් සංවර්ධනය සඳහා ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කරන ලද ග්‍රාම නිලධාරී වසම් 89 කින් සමන්විත සමස්ථ රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පරිපාලන සීමා මායිම ලෙස හඳුනාගත හැකිය. මෙම සීමාව රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මායිමම වන අතර එය ප්‍රමාණයෙන් වර්ග කි.මී. 132කි. මෙම සීමාව හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා මැනුම් දෙපාර්තමේන්තුව (Survey Department of Sri Lanka) විසින් සකස් කර 2021 වර්ෂයේදී නිකුත් කරන ලද භූගෝලීය තොරතුරු මෘදු දත්ත අන්තර්ජාලය මඟින් බාගත කිරීම සිදු කරන ලදී.

සිතියම 2.8: පරිපාලන සීමාව



මූලාශ්‍රය: කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය, නා.ස.අ- 2022

2.4 සැලසුම් සීමාව

රඹුක්කන සංවර්ධන සැලසුම සඳහා සීමා නිර්ණය කිරීමේදී ඉහත දක්වන ලද මායිම් කාණ්ඩ නුනට අමතරව සංචාරක හෝටල් හා නවාතැන්, සංරක්ෂණය කළ යුතු පුරාවිද්‍යාත්මක ස්ථාන, පාසල්, යටිතල පහසුකම් පැතිරී ඇති ස්වභාවය හා රටාව, නේවාසික ව්‍යාප්තිය, ආපදා වැනි සාධක ද සැලකිල්ලට ගනු ලැබූ අතර සංවර්ධන විභවතා වලින් යුක්ත ප්‍රදේශය මෙහිදී සැලසුම් සීමාව ලෙස හඳුනාගන්නා ලදී.

රඹුක්කන ප්‍රාදේශීය පරිපාලන සීමාව වන රඹුක්කන ප්‍රදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන බල ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති බැවින් එය සැලසුම් සීමාවට නිතැතින්ම අන්තර්ග්‍රහනය කර ගැනීමට සිදු විය. එමෙන්ම පින්නවල සංචාරක කලාපයේ ක්‍රියාකාරී ප්‍රදේශය, රඹුක්කන නගර සීමාව හා මොලගොඩ නගර වෙළඳපොල කලාපය මෙම පරිපාලන බල සීමාව තුළ පිහිටන බැවින් ග්‍රාම සේවා වසම් 89කින් සමන්විත රඹුක්කන ප්‍රදේශීය සභා බල ප්‍රදේශයම සැලසුම් සීමාව වශයෙන් නිර්ණය කර ගැනීමට සැලසුම් කණ්ඩායම අවසන් වශයෙන් තීරණය කරන ලදී.

සිතියම 2.9: සැලසුම් සීමාව



මූලාශ්‍රය: කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය, නා.ස.අ- 2021

03 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

3.1 හැඳින්වීම

රඹුක්කන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ අරමුණ වන්නේ, වර්තමානයේ මෙම නගරයේ පවතින ගැටලු හා විභවතා හඳුනා ගැනීම තුළින් නාගරික සංවර්ධනයේදී පැන නැඟින ගැටලු වලට උපායමාර්ගික විසදුම් ලබාදීමත් අනාගත සංවර්ධනයන් මනා ලෙස කළමනාකරණය කිරීමත් තුළින් ආර්ථික, සාමාජිය, පාරිසරික හා සංස්කෘතික යන සාධකයන්ගේ ඒකාග්‍රතාවය ඇති වන අයුරින් ව්‍යාපෘති සැකසීම හා රෙගුලාසි සම්පාදනය කිරීමයි.

මෙම ප්‍රදේශයේ වර්තමානය තුළ පවතින ගැටලු හා විභවතාවයන් හඳුනා ගැනීම සඳහා ප්‍රදේශයේ පාර්ශවකරුවන්ගෙන් අදහස් ලබා ගැනීමට පාර්ශවකරුවන්ගේ රැස්වීමක් පැවැත්වූ අතර එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා නගර නිර්මාණ ශිල්පීන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින් රඹුක්කන නගරයේ හා අවට ප්‍රදේශයේ පවතින ගැටලු හඳුනා ගන්නා ලදී. (ඇමුණුම 09) මෙලෙස හඳුනා ගන්නා ලද ගැටළු අතරින් ඉතා කැපී පෙනෙන හා වඩාත් සැලකිය යුතු ගැටළු ප්‍රමුඛතාකරණය කරන ලදී.

එහිදි අනෙකුත් නගර හා සසඳන විට එතරම් කැපී පෙනෙන ගැටළු රඹුක්කන නගරයේ දක්නට නොමැති අතර එයට මූලික හේතුව වන්නේ මෙය ග්‍රාමීය ලක්ෂණ වලින් යුතු සංකීර්ණ බවින් අඩු නගරයක් වීමයි. කෙසේ වුවද මෙම ප්‍රදේශයේ හඳුනා ගත් ගැටළු සහ ඒවායේ ප්‍රමුඛතාවය හා වැදගත්කම මත වෙන් කර දැක්විය හැකිය.

3.2 ගැටළු හඳුනා ගැනීම

3.2.1 ප්‍රදේශයේ ප්‍රධාන කෘෂි බෝග සීග්‍රයෙන් අඩු වී යාම

අතීතයේ පටන් මෙම ප්‍රදේශය වී, පොල්, රබර්, කෙසෙල් ඇතුළු අනෙකුත් භෝග වගාවන් ඉතා සරුසාරව පැවති ප්‍රදේශයක් බවට ප්‍රසිද්ධියක් උසුලයි. ඉංග්‍රීසි ජාතිකයන් විසින් රඹුක්කන දුම්රිය ස්ථානය ආරම්භ කරන ලද්දේද මෙම ප්‍රදේශයෙන් එක් රැස් කර ගන්නා ලද කෘෂි භෝග කොළඹටත් කන්ද උඩරටටත් ප්‍රවාහනය කිරීමේ අරමුණින්ය. ඒ අනුව එයින් ගම්‍ය වනනේ මෙම ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය අතින් ස්වයංපෝෂිත ප්‍රදේශයක් ලෙස පැවතුණු බවයි. රඹුක්කන යන නාමය නිර්මාණය වී ඇත්තේ කෙසෙල් ගෙවත් “රඹ-කැන්” යන්න කාලයත් සමඟ වෙනස් වීමෙන් බව ජනප්‍රවාදයේ පැවත එන්නකි. විශාල කෙසෙල් වතු මෙම ප්‍රදේශයේ තිබී ඇති අතර 2000 වර්ෂය පමණ වන තෙක් කෙසෙල් තොග වෙළෙඳපොළක් රඹුක්කන නගරයේ අබණ්ඩව පැවතුනු බවට සාධක පවතී.

නමුත් වර්තමානය වන විට ඉහත කී කෘෂි භෝග අතරින් පොල් සහ කෙසෙල් විශාල ලෙස අඩු වී ගෙන යාමක් පවතින බව දත්ත අනුව හඳුනා ගත හැක. (රූප සටහන 3.1 සහ 3.2 : 1981 සිට 2018 දක්වා කාලයේ රඹුක්කන ප්‍රාදේශිය සභා සීමාවේ කෘෂිකාර්මික බෝග ව්‍යාප්තියේ අඩුවීම සහ 2011 – 2020 දක්වා

රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාව තුල ඉඩම් පරිහරණ රටා වෙනස් වීම (ගෘගල් සිතියම්) තවමත් ප්‍රදේශයේ ආර්ථිකය 48% කෘෂිකාර්මාන්තය මත රදා පවතින බැවින් එහි සීග්‍ර අඩුවීම ප්‍රදේශයේ ආර්ථිකයට ඍජුවම බලපානු ඇත. මෙලෙස කෘෂි ඉඩම් ප්‍රමාණය අඩු වීමට හේතු ලෙස කෘෂි ඉඩම් වෙනත් භාවිතයන් සඳහා යොමු වීම, ඉඩම් කට්ටි වීම වැඩිවීම, නේවාසික හා කර්මාන්ත සඳහා ඉල්ලුම වැඩිවීම, නිසි වෙළඳපලක් නොමැති කම (කෙසෙල්) හා යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම හඳුනා ගත හැකිය.

ඉහත සඳහන් කළ හේතු මත පොල් ඉඩම් හා කෙසෙල් වගා ඉඩම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. 2011 සිට 2020 දක්වා ඉඩම් පරිහරණ සිතියම් අධ්‍යයනය කිරීමේදී එය වඩාත් තහවුරු වේ. එමගින් ප්‍රදේශයට අනන්‍ය වූ කෘෂි බෝග ක්‍රමයෙන් අඩු වී යාමත් මිනිසුන්ගේ ජීවනෝපායන් ඇනහිටීම නුලින් ප්‍රදේශයේ ස්වයංපෝෂිත ආර්ථිකයද නැති වී යයි. රූප සටහන 3.1 හා 3.2 මගින් රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාව තුල කෘෂිකාර්මික බෝග ව්‍යාප්තියේ අඩුවීම හා ඉඩම් පරිහරණ රටා වෙනස් වීම පැහැදිලිව හඳුනාගත හැකි අතර රූප සටහන 3.3 මගින් රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාවේ 2018 සිට 2020 වන විට ඉඩම් අනු බෙදීම් සඳහා ලැබී ඇති අයදුම්පත් ඉහළ ගොස් ඇති ආකාරය නුළින් ඉහත කී වගා ඉඩම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවී යාමට හේතු සාධක පැහැදිලි වී ඇත.

රූප සටහන 3.1 : 1981-2018 දක්වා රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාවේ කෘෂිකාර්මික බෝග ව්‍යාප්තියේ අඩුවීම



මූලාශ්‍රය: දිස්ත්‍රික් සංඛ්‍යානමය අත්පොත, 2020

රූප සටහන 3.2: රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාව තුල ඉඩම් පරිහරණ රටා වෙනස් වීම 2011-2020



මූලාශ්‍රය: ගූගල් සිතියම්

රූප සටහන 3.3 : රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාවේ ඉඩම් අනුබෙදුම් හා ගොඩනැගිලි අයදුම්පත් නිකුත් කිරීම , 2018-2020



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය , රඹුක්කන ප්‍රාදේශීය සභාව

3.2.2 මා-ඔය ජල සම්පතෙන් උපරිම ප්‍රයෝජන නොගැනීම

රඹුක්කන ප්‍රදේශයේ පානීය ජල සැපයුමේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන්නේ මා-ඔයයි. මෙම සම්පත ප්‍රදේශයේ හෙක්ටයාර 630 (0.8%) ක පමණ වපසරියක් පුරා පැතිර පවති. ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සහ අනෙකුත් බොහෝ ජල අවශ්‍යතා සපුරාලන මෙය කෘෂිකාර්මික කටයුතු සඳහාද ජලය ලබා දෙයි. ප්‍රදේශය මධ්‍යයෙන් ගලා බසින ජල ධාරාව, රඹුක්කන-කෑගල්ල ප්‍රධාන මාර්ගය ඔස්සේ ගමන් කරන විට හිරිවඩුන්න පාලම අසලදී ප්‍රධාන මාර්ගයට සමීප වෙයි. අනතුරුව වාගොල්ල කෘෂිකාර්මික කලාපයට යාබදව කි.මී 2 ක් පමණ දුරක් ප්‍රධාන මාර්ගයට සමාන්තරව ගමන් කරයි.

මා-ඔය ආශ්‍රිතව සිදුවන තවත් සුවිශේෂී ක්‍රියාකාරකමක් ලෙස අතීතයේ පටන් පින්නවල අලි අනාථාගාරයේ සිටින අලි නෑවීම සඳහා භාවිතා කරයි. දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය නොමදව දිනාගත් වඩාත් කැපී පෙනෙන, සංචාරකයින් ප්‍රියතම අංගය ලෙස මා-ඔයේ අලි නෑවීම ප්‍රසිද්ධ වී ඇත. ඒ සඳහා මා-ඔය ජල ප්‍රභවයේ පිහිටීම සුවිශේෂී වී ඇත. එමෙන්ම කෑගල්ල-රඹුකක්න ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව හෝටල්, ලැඟුම්හල් ආදිය ඉදිවීම සඳහාද හේතු පාදක වී ඇත්තේ මෙම ජල මූලාශ්‍රයේ පිහිටීමයි.

මෙලෙස ප්‍රයෝජන රාශියක් ගත්තද නවදුරටත් මා-ඔය පදනම් කරගත් විභවතාවයන් දක්නට ලැබෙන අතර ඒවා නිසි ලෙස කලමනාකරණය කරගැනීමෙන් ක්‍රියාකාරකම් රැසකින් යුක්ත විවේක සහ විනෝදාත්මක ස්ථාන සංවර්ධනය කළ හැකිය. මා-ඔය මධ්‍යයේ පිහිටි දූපත්, දර්ශනීය නැරඹීම් ස්ථාන, දිය නෑමේ ස්ථාන හා විනෝදාත්මක උද්‍යාන, ඇවිදින මංතීරු සහිතව ජල මුහුණත සංවර්ධනය කිරීම තුළින් දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය තවදුරටත් වැඩි කර ගත හැක. එමගින් සංචාරක කර්මාන්තයද සංවර්ධන වන අතර රැකියා අවස්ථා වැඩි වීමෙන් ප්‍රදේශයේ ආර්ථිකයද ඉහළ නැංවෙනු ඇත.

රූප සටහන 3.4 : මා ඔය ආශ්‍රිත ආකර්ශනීය ස්ථාන



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

03 පරිවිඡේදය
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

ගැටළු හඳුනා ගැනීම

3.2.3 සංචාරක කලාපයේ ඇති පොදු පහසුකම් ප්‍රමාණවත් නොවීම හා අවිධිමත් සංවර්ධනය

දෛනිකව සංචාරකයින් 10,000-15,000 පමණ අලි අනාථාගාරය නැරඹීම සඳහා මෙම ප්‍රදේශයට පැමිණෙන බව වනජීවී දෙපාර්තමේන්තුවේ දත්ත හා තොරතුරු අනුව ගම්‍ය වේ. එහෙත් මෙම කලාපයේ ඇති පොදු පහසුකම් පිළිබඳව අවධානය යොමු කරන විට ඒවා ප්‍රමාණවත් නොවන බව පෙනේ. මා-ඔයේ අලි නාවන ස්ථානය දක්වා ඇති ගමන් මාර්ගය දෙසප අවිධිමත් වාණිජ සංවර්ධනයක් දක්නට ලැබේ. පදික වේදිකාවක් හෝ සංචාරකයින්ට පහසුවෙන් හිඳ නැරඹීය හැකි ස්ථාන සඳහා කිසිදු ඉඩකඩක් නොමැති අයුරින් කඩ සාප්පු සහ හෝටල් ඉදි කරගෙන ඇති අතර වැසි කාල වලදී මෙම ගැටලුව දැඩි ලෙස බලපායි. වර්තමානයේදී කඩසාප්පුවල හා හෝටල්වල ඉදිරිපස කොටසේ සිට අලි නෑවීම නැරඹීමට ස්ථාන සකස් කර තිබුණද ඒවා පුද්ගලික ව්‍යාපාරික ස්ථාන වන බැවින් මංගල උත්සව වැනි අවස්ථා වලදී එම ස්ථාන පොදු ස්ථාන ලෙස භාවිතා කිරීම අපහසුය. විශේෂයෙන් අධ්‍යාපන චාරිකා වලදී අනිවාර්ය නැරඹුම් ස්ථානයක් ලෙස පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා කුඩා පාසල් ළමුන් අති විශාල ප්‍රමාණයක් මෙම ස්ථානයට පැමිණේ. අලි නෑවීම සඳහා අලින් රැගෙන යාමට මෙන්ම සංචාරකයින්ටද මා-ඔය වෙත යාමට ඇති එකම මාර්ගය මෙය නිසාත් සංචාරකයින්ට මෙන්ම විශේෂයෙන්ම කුඩා දරුවන්ගේ ආරක්ෂාවටද එය තර්ජනයකි.

එමෙන්ම මා-ඔයේ මුහුණත වැසෙන පරිදි සහ රක්ෂිතය තුළ ඉදිකිරීම් සිදු කර තිබීමද දක්නට ලැබේ. පින්නවල අලි අනාථාගාරය සඳහා ඇති ආකර්ෂණය නිසාම මෙම කලාපයේ හෝටල් සහ වාණිජ සංවර්ධනයන් සීඝ්‍රයෙන් සිදු වීම මෙයට හේතුව ලෙස දැක්විය හැකිය. මෙයින් බොහෝමයක් ඒවා අනවසර ඉදිකිරීම් ලෙස හඳුනා ගත හැකිය.

රූප සටහන 3.5: මා ඔය රක්ෂිතයේ සිදුකර ඇති අනවසර ඉදිකිරීම්



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

රූප සටහන 3.6: මා-ඔය රක්ෂිතයේ අවිධිමත් වාණිජ සංවර්ධනය





මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, නා.ස.අ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය, 2022

වගු අංක 3.1: පින්නවල සංචාරක කලාපයේ වාණිජ භාවිතයන්

භාවිතය	භාවිතයන් සංඛ්‍යාව
හෝටල්	4
හෝටල් සහ අවන්හල්	3
කුළුබඩු උද්‍යාන ශාකසාර උද්‍යාන /	1
සම්බාහන මධ්‍යස්ථාන	1
ලැඟුම්හල්	1
නිෂ්පාදන කර්මාන්ත කඩ සාප්පු - අලි ගොම කඩදාසි නිෂ්පාදන කර්මාන්ත	4
බැංකු සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	5
විසිතුරු භාණ්ඩ සහිත කඩසාප්පු	15
මැණික් සහ ස්වර්ණාභරණ	3

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, නා.ස.අ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය, 2021

එමෙන්ම සනීපාරක්ෂක පහසුකම් සහිත පොදු ස්ථානයක් නොමැති වීමද ගැටලුවකි. අලි නෑවීමේ ක්‍රියාකාරකම පැය 2ක පමණ කාලයක් පවතින බැවින් සංචාරකයින් වැඩි වේලාවක් මෙම ස්ථානයේ රැඳී සිටිනු දක්නට ලැබේ. මෙහි පවතින හෝටල් පුද්ගලික ව්‍යාපාරික ස්ථාන බැවින් පොදු භාවිතයට ලබා නොදේ. එම නිසා අත්‍යවශ්‍ය පොදු පහසුකම් වන සනීපාරක්ෂක පහසුකම් සහිත විවේක ස්ථානයක් නොතිබීම ගැටලුවක් වී ඇති අතර මෙම පහසුකම් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

03 පරිවිඡේදය
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

පින්නවල අලි අනාථාගාරය ඉදිරිපසෙන් දිවෙන කෑගල්ල-රඹුක්කන මාර්ගයේ පදික වේදිකා නොමැති වීම ගැටලුවක් වී ඇත. මාර්ගයේ වාහන ගමනාගමනය නිසාත් තාවකාලික කඩසාප්පු පදික වේදිකා සීමාවේ පැවතීමත් හේතුවෙන් රථගාල වෙත ඇවිද යන සංචාරකයින් හට එය බාධාකාරී වී ඇත.

ගැටළු හඳුනා ගැනීම

එමෙන්ම මෙම ප්‍රදේශයේ වීදි ලාම්පු නොමැති වීම නිසා රාත්‍රී කාලය දැඩි අඳුරු ස්වභාවයක් ප්‍රදේශය පුරාම දක්නට ලැබේ. පස්වරු 6න් පසුව කිසිදු ක්‍රියාකාරකමක් සංචාරකයින් හට නොමැති වීම නිසා මෙලෙස රාත්‍රී කාලයේ ඉතා පාලු ස්වභාවයක් දක්නට ලබෙන අතරම මාර්ගය දෙපස ආලෝකමත් නොවීම සමාජ විරෝධී ක්‍රියා ඇතිවීම සඳහාද හේතු සාධක වී ඇත.

රූප සටහන 3.7: පින්නවල අලි ඇතුන් නැවීම සඳහා ගෙනයන මාර්ගය



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, නාගරික සංවර්ධන අධිකාරිය, කෑ.දි.කා 2022

රූප සටහන 3.8 : කෑගල්ල - රඹුක්කන ප්‍රධාන මාර්ගය දෙපස ඉදිකර ඇති අනවසර වෙළඳසැල්



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

පින්නවල සංචාරක කලාපයේද වාහන නැවැත්වීම සඳහා දැනට පවතින්නේ එක් ස්ථානක් පමණක් වන අතර එහි ගාල් කළ හැක්කේ වාහන 50-60 ක් පමණ සංඛ්‍යාවකි. නමුත් බස් රථ වැනි ප්‍රමාණයෙන් විශාල රථවාහන නැවැත්වීමේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන නිසා කෑගල්ල-රඹුක්කන මාර්ගය දෙපස ගාල් කරනු දක්නට ලැබෙන අතර එමඟින් රථවාහන තදබදය හා පදිකයන් හට අනාරක්ෂිත බවක් හා අපසුතාවයක් ඇති කරයි. එබැවින් සංචාරකයින් රැගෙන එන විශාල බස් රථ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් සහිත රථගාල් පහසුකම් ඇති කිරීම අත්‍යවශ්‍ය වේ. මෙලෙස විධිමත් හා ප්‍රමාණවත් වාහන නැවතුම්පොළක් නොමැතිකම සංචාරක අකාර්ෂණයටද බාධා ඇති කරයි. ඉදිරි අනාගත අවශ්‍යතාවයන්ද සලකා බලන විට වාහන 150-200 පමණ නැවැත්වීමට හැකි වාහන නැවතුම්පොළක අවශ්‍යතාවය පවතී.

රූපය 3.9 : පින්නවල සංචාරක කලාපයේ රථ වාහන





ගාල් කිරීම
මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

04 වන පරිච්ඡේදය

සංවර්ධන සැලසුම් රාමුව

04 පරිච්ඡේදය
සංවර්ධන සැලසුම් රාමුව

සංවර්ධන සැලැස්මේ දැක්ම

දැක්මෙහි ප්‍රකාශනය

4.1 සංවර්ධන සැලැස්මේ දැක්ම



"ශ්‍රී ලංකා කඳුරට පිවිසුමේ උද්දීප්ත කෘෂි මධ්‍යස්ථානය"

4.2 දැක්මෙහි ප්‍රකාශනය

රඹුක්කන නගරයේ අනාගත සංවර්ධන දැක්ම අනුව එය කලාපීය වශයෙන් පිළිගත් ප්‍රධානතම කෘෂිකාර්මික නගරය ලෙස ස්ථාපිත කිරීම අපේක්ෂා කෙරේ. අතීතයේ සිටම ප්‍රදේශය කෘෂි ආර්ථිකයකට හිමිකම් කීම, ඉඩම් පරිහරණයෙන් ප්‍රතිශතාත්මකව 54%ක් කෘෂිකාර්මික පරිහරණයට යොදා ගැනීම සහ සමස්ත රැකියා අවස්ථා බෙදී යාමේදී කෘෂිකාර්මික ක්ෂේත්‍රය ආශ්‍රිතව 48% ක රැකියා ප්‍රතිශතයක් දක්නට ලැබීමත් සංවර්ධනයේ දිශානතිය කලාපීය වශයෙන් උද්දීප්ත කෘෂි මධ්‍යස්ථානයක් කරා යොමු කරවීමට හේතු සාධක වීය.

ශ්‍රී ලංකාව අතීතයේදී "සිලෝන්" ලෙස හඳුන්වනු ලැබූ කාලයේ සිට සංචාරක ක්ෂේත්‍රය සඳහා භෝලීය වශයෙන් ප්‍රචලිත මධ්‍යස්ථානයක් විය. ඒ අනුව දිවයිනේ වැදගත් භූගෝලීය පිහිටීමක් වන මධ්‍යම කඳුකරය අතීතයේ පටන් දෙස් විදෙස් සංචාරකයන් අතර ප්‍රකට ආකර්ෂණීය මධ්‍යස්ථානයක් විය. මධ්‍යම කඳුකරය සඳහා ප්‍රවේශකත්වය ලබා දෙන ආකර්ශනීය ගමන් මාර්ගයක් වන උඩරට දුම්රිය මාර්ගයේ රඹුක්කන දුම්රියපොළ යනු මධ්‍යම කඳු කරයේ පිවිසුම් ද්වාරය ලෙස හඳුන්වා දිය හැකිය. ඒ රඹුක්කන සිට කඩිගමුව දක්වා වන කි.මී 7 ක දුම්රිය මාර්ග කොටස මීටර් 430ක නැග්මක් සහිතව එකී ප්‍රවේශය සැබවින්ම සනිටුහන් කරන නිසා වේ. එසේම සබරගමුව පළාතේ නීතිගත කරන ලද එකම සංචාරක කලාපය රඹුක්කන සිට කි.මී. 2ක් දුරින් පින්නවල ප්‍රදේශයේ පිහිටා තිබීම සහ ඒ සඳහා ලංකාවට පැමිණෙන විදෙස් සංචාරකයින්ගෙන් 14%ක පැමිණීමක් සටහන් වන නිසා මෙම ප්‍රදේශය සංචාරක ක්ෂේත්‍රයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් ලෙස හඳුන්වා දිය හැකිය. මීට අමතරව ස්භාවික හා මිනිසා විසින් නිර්මාණය කරන ලද ආකර්ශනීය ස්ථාන සහ ඉතිහාසය සමග බැඳුනු පුරා විද්‍යාත්මක හා සංස්කෘතිකමය වටිනාකම් ප්‍රදේශය පුරා ව්‍යාප්තව ඇත. මෙවැනි

විභවතාවයන් උපයෝගී කොට ගනිමින් මෙම ප්‍රදේශය සංචාරකයන් හා එම ක්ෂේත්‍රය හා බැඳුණු අංශ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් ශ්‍රී ලංකාවේ (සිලෝන් හි) මධ්‍ය කඳුකරයේ පිවිසුම (Gateway to the Highlands of Ceylon) යන වදන සැලසුමේ අනාගත සංවර්ධන දිශානතිය අර්ථ දැක්වීම සඳහා යොදාගෙන ඇත.

ඉහත ප්‍රපංචයන් සහිත දැක්මෙහි අවසන් දිශානතිය, ආර්ථික වශයෙන් උද්දීප්ත වූත් ප්‍රමාණවත් යටිතල පහසුකම් වලින් සමන්විත වූත් සියලු ජනතාව සඳහා සුමට යාන්ත්‍රණයක් සහිත බහු කේන්ද්‍රීගතව ව්‍යාප්ත වූ නේවාසික හා නාගරික ප්‍රදේශයක් ස්ථාපිත කිරීම කෙරේ යොමුව ඇත.

4.3 සංවර්ධන සැලැස්මේ අරමුණු

රඹුක්කන සංවර්ධන සැලැස්මේ දැක්ම වෙත ළඟා වීම සඳහා ප්‍රධාන අරමුණු 03ක් ගොඩ නඟා ඇත.

සංවර්ධන සැලැස්මේ අරමුණු

අරමුණ 01	**රඹුක්කන,** 2033 වන විට කලාපයේ වඩාත් ම ධරණීය වූ කෘෂි ආර්ථිකයක් සහිත නගරය බවට පත් වීම
අරමුණ 02	**රඹුක්කන,** 2033 වන විට සමාජ පාරිසරික සන්දර්භයන්ට අනුකූල ශ්‍රී ලංකාවේ පුනර්ජීවනය වන සංචාරක ආකර්ෂණ මධ්‍යස්ථානයක් වීම
අරමුණ 03	**රඹුක්කන,** 2033 වන විට ප්‍රදේශයේ වෙසෙන සියලුම නාගරික හා අර්ධ නාගරික වාසීන් සඳහා අනුකූලනාවයක් සහිත වඩාත් හිතකර ජනාවාසයක් බවට පත් වීම

සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

4.4 සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

අපේක්ෂිත අනාගත දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා එක් එක් ඉලක්කයක් ශදුඅත(SWOT) විශ්ලේෂණය මගින් විශ්ලේෂණය කොට සංවර්ධන විභාවනාවයන් මගින් ප්‍රදේශයේ පවත්නා ගැටළු සඳහා පිළියම් ලබා දිය හැකි ආකාරය අධ්‍යයනය කරමින් පහත දක්වා ඇති පරිදි විශේෂීකරණය වූ පරමාර්ථ ගොඩනගා ගැනීම සිදු කරන ලදී.

අරමුණ 01

රඹුක්කන, 2033 වන විට කලාපයේ වඩාත් ම ධරණීය වූ කෘෂි ආර්ථිකයක් සහිත නගරය බවට පත් වීම

පරමාර්ථ:

1. වසර 2033 වන විට කෘෂි නිෂ්පාදන අගය එකතුකිරීමේ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය කොට 3% ක් වන විරැකියාව(2300) තුරන් කිරීම සඳහා දායකත්වය ලබා දීම
2. වසර 2033 වන විට කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ගොවිපලකරණය, කර්මාන්ත හා නිෂ්පාදනයන් සඳහා භාවිතයට ගැනෙන නවීන තාක්ෂණික ක්‍රමෝපායන් හා කාබනික පොහොර භාවිතය සඳහා යොමු කර වීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
3. වසර 2033 වනවිට භූමි පරිහරණයන් පරිවර්තනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන යෝග්‍ය සැලසුම් ක්‍රමවේද අනුගමනය කරමින් පවතින කෘෂි ඉඩම් (6500 ha) ඒ අයුරින්ම පවත්වා ගැනීම
4. වසර 2033 වනවිට සියලු පාර්ශවයන්ට අනුකූලනාවයක් සහිත ආර්ථිකමය මොඩලයක් ඇති කරවීම සහතික කරමින් ප්‍රාදේශීය වෙලඳපොලේ කෘෂිකාර්මික හා අගය එකතු කළ කෘෂි නිෂ්පාදන සහිත ශක්තිමත් වෙළඳපොලක් ගොඩනැගීම.

අරමුණ 02

රඹුක්කන, සමාජ පාරිසරික සන්දර්භයන්ට අනුකූල ශ්‍රී ලංකාවේ පුනර්ජීවනය වන සංචාරක ආකර්ෂණ මධ්‍යස්ථානයක් වීම

පරමාර්ථ:

1. 2033 වනවිට වසරකට මිලියන 2ක සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා පාරිසරික - සමාජ සන්දර්භයට අනුකූලතාවයක් සහිත සංචාරක කර්මාන්තයක් ස්ථාපිත කිරීම.

2. වසර 2033 වනවිට රඹුක්කන සැලසුම් ප්‍රදේශයේ පවතින සංවේදී පාරිසරික කලාපය (හෙක්ටයාර 673) තුළ හඳුනාගත් ස්ථානවල පමණක් (හෙක්ටයාර 80) හිතකර සංරක්ෂණ ක්‍රමවේදයන් අනුගමය කරමින් සංචාරක සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අනුකූල කර ගැනීම.

3. වසර 2033 වනවිට රඹුක්කන ප්‍රදේශයේ දිනකට සංචාරකයන් 500ක් සඳහා රාත්‍රී නවාතැන් ගැනීම සඳහා අවශ්‍ය වන නවාතැන් පහසුකම් හා යටිතල පහසුකම් සැපයීම.

4. වසර 2033 වනවිට රඹුක්කන ප්‍රදේශයේ සංචාරක ක්ෂේත්‍රය මගින් සපයන ආර්ථික දායකත්වය ඉහල නැංවීම සඳහා සංචාරක හා ආගන්තුක සත්කාර විෂයට අදාළ වෘත්තීමය අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

අරමුණ 03

රඹුක්කන, ප්‍රදේශයේ වෙසෙන සියලුම නාගරික හා අර්ධ නාගරික වාසීන් සඳහා අනුකූලතාවයක් සහිත වඩාත් හිතකර ජනාවාසයක් බවට පත් වීම

පරමාර්ථ:

1. වසර 2033 වනවිට සම්පත් බෙදී යාමේ විෂමතාවය අවම කර ගැනීම සඳහා රඹුක්කන නගරය සමග කුඩා නගර සම්බන්ධ වන බහු කේන්ද්‍රීය අවකාශීය ව්‍යාප්තියක් සහිත සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

2. වසර 2033 වනවිට විවිධ මාදිලි වලින් සමන්විත සුමට සහ ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් රඹුක්කන ප්‍රදේශයේ ස්ථාපිත කිරීම.

3. නියමිත ප්‍රමිතීන්ගෙන් යුතු යටිතල පහසුකම් ලබා දීම 100% ක් සහතික කරමින් සියලු නේවාසික හා සංසරණය වන ජනතාව සඳහා යහපත් ජීවන තත්වයක් ලබා දීම.

4. වසර 2033 වන විට රඹුක්කන සැලසුම් සීමාවේ වෙසෙන සියලු ජනතාව සඳහා ආරක්ෂාකාරීව ජීවත් වීම සඳහා සුදුසු පරිසරයක් සහිත ආපදා ප්‍රත්‍යස්ථ ජනාවාස ස්ථාපිත කිරීම.

05 වන පරිච්ඡේදය

ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය (ශ.දු.අ.ත විශ්ලේෂණය)

05 පරිච්ඡේදය
ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය

5.1 සාරාංශගත ශ.දු.අ.ත විශ්ලේෂණය

සාරාංශගත ශ.දු.අ.ත විශ්ලේෂණය

2033 වර්ෂය වන විට රඹුක්කන, කඳුරට පිවිසුමේ උද්දීප්ත කෘෂි මධ්‍යස්ථානය කිරීමේ දැක්ම වෙත ළඟා වීමට හැකිවන අයුරින් භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් පවතින ප්‍රබලතා, දුබලතා, අවස්ථා හා තර්ජන හඳුනා ගැනීම සඳහා SWOT විශ්ලේෂණය සිදුකළ අතර, එමඟින් සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව එක් එක් අරමුණට අදාලව සිදු කරන ලද SWOT විශ්ලේෂණය පහත දැක්වේ.

5.1.1.: “රඹුක්කන, කලාපයේ වඩාත් ම ධරණීය වූ කෘෂි ආර්ථිකයක් සහිත නගරය බවට පත් වීම” යන අරමුණ සඳහා වන සාරාංශගත SWOT විශ්ලේෂණය

වගු අංක 5.1: අරමුණ අංක 01ට අදාළ ශ.දු.අ.ත (SWOT) විශ්ලේෂණය

ශක්තීන්	දුර්වලතා
I. වර්තමාන ඉඩම් පරිහරණයෙන් 54%ක් කෘෂිකාර්මික භාවිතයන් පැවතීම. II. ප්‍රදේශයේ මුළු රැකියා නියුක්තිකයන්ගෙන් 32% ක් කෘෂිකාර්මික අංශයේ සේවකයින් වීම III. සෘජු සේවකයන් 30,000කට ආසන්න සංඛ්‍යාවක් සිටින විවිධාංගීකරණය වූ කෘෂිකාර්මික අංශයේ නිරත වී සිටීම. IV. කෘෂිකර්මාන්තයට හිතකර රතු-කහ Podzolic පස සහිත වීම. V. කෘෂිකාර්මික අංශයේ පර්යේෂණ ආයතන රාශියක් ප්‍රදේශය තුළ තිබීම. උදා: දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි මධ්‍යස්ථානය, වාගොල්ල VI. සැලසුම් ප්‍රදේශය තුළ ආසන්න වශයෙන් පුද්ගලයින් 4000 කට පමණ රැකියා අවස්ථා ලබා දෙන අපනයන නැඹුරු මධ්‍ය/මහා පරිමාණ කෘෂිකාර්මික, ගොවිතැන් සහ හස්න කර්මාන්ත කර්මාන්ත නිර්මාණය වී තිබීම.	I. පොල් ඉඩම් වෙනත් පරිහරණයන්ට සීඝ්‍රයෙන් පරිවර්තනය කිරීම II. විවිධාංගීකරණය වූ කෘෂිකාර්මික සහ වැවිලි නිෂ්පාදන වලින් උපරිම ප්‍රයෝජනය ගෙන නොතිබීම III. වැසි ජලය මූලික කරගත ප්‍රධාන ජල මූලාශ්‍ර කෘෂිකර්මාන්තයට උපරිම ඵලදායීතාවයකින් යොදා නොගෙන තිබීම. IV. රඹුක්කන ප්‍රධාන සතිපොළ හැර නිෂ්පාදනය සඳහා නිසි වෙළෙඳ පොළක් නොමැති වීම
අවස්ථා	**තර්ජන**
I. යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය රඹුක්කන ප්‍රදේශය හරහා ගමන් කිරීම සහ එහි එක් පිවිසුමක් ලෙස වැලිගමුව ඉදිවීම නිසින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර සමඟ සෘජු ප්‍රවේශය ලැබීම.	I. අනරමැදි වියලි කලාපයේ පිහිටීම

මූලාශ්‍රය: කෑ.දි.කා, නාගරික සංවර්ධන අධිකාරිය, 2022

5.1.2: “රඹුක්කන, සමාජ පාරිසරික සන්දර්භයන්ට අනුකූල ශ්‍රී ලංකාවේ පුනර්ජීවනය වන සංචාරක ආකර්ෂණ මධ්‍යස්ථානයක් වීම” යන අරමුණ සඳහා වන සාරාංශගත SWOT විශ්ලේෂණය

වගු අංක 5.2: අරමුණ අංක 02ට අදාළ ශ.ද.අ.ත (SWOT) විශ්ලේෂණය

ශක්තීන්	දුර්වලතා
I. පින්නවල ප්‍රකාශිත සංචාරක කලාපයක් ලෙස වසරකට මිලියනයක් පමණ නරඹන්නන් ආකර්ෂණය කරන අතර සංචාරක ක්ෂේත්‍රයට අදාළ රැකියා අවස්ථා 5000ක් පමණ විවර වී තිබීම. II. ස්වාභාවික වනාන්තර සහ ජල මූලාශ්‍ර ඇතුළුව සමස්ත භූමි පරිහරණයෙන් 7%ක් ආවරණය වන ප්‍රදේශයේ ස්වභාවික පාරිසරික සුන්දරත්වයෙන් යුක්ත වීම. III. හෙක්ටයාර 917ක් පමණ වන මෙම ස්වභාවික පරිසරය සංචාරක ආකර්ශනය සඳහා භාවිත කළ හැකිය. IV. සංචාරක සංවර්ධනය සඳහා සංස්කෘතික හා ඓතිහාසික වශයෙන් වටිනා විභවතාවන් ප්‍රදේශය තුළ පැවතීම V. ජාතික පරිමාණ බහුමාධ්‍ය ප්‍රවාහන සම්බන්ධතා තිබීම VI. දුම්රිය මාර්ග ප්‍රවේශකත්වය සහ සිදුවෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධනය නිසා වැඩි සංචාරක ආකර්ෂණයක් ලබා ගැනීමට හැකිය.	I. සංචාරක අංශයේ සංවර්ධනය සඳහා ප්‍රදේශයේ පවතින ස්වභාවික, සංස්කෘතික හා ඓතිහාසික විභවයන් ප්‍රශස්ත ලෙස යොදා නොගැනීම. II. සංචාරක ක්‍රියාකාරකම් කිහිපයක් සඳහා පමණක් සංචාරකයින්ට “ක්‍රියාකාරී විනෝදාත්මක ක්‍රියාකාරකම්” ලෙස සංචාරක සඳහා විවෘතව පැවතීම. III. පවතින සංචාරක ආකර්ෂණ ස්ථාන වල නිසි යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම. IV. සංචාරක හෝටල් රාශියක් තිබුණද උසස් තත්ත්වයේ සංචාරක නවාතැන් සහ ආපනශාලා පහසුකම් ප්‍රමාණය අවම වීම. V. සංචාරක අංශයට සම්බන්ධ අධ්‍යාපන ආයතන ප්‍රදේශය තුළ නොමැති වීම. VI. සංචාරක කර්මාන්තයට පෞද්ගලික අංශයේ දායකත්වය ප්‍රමාණාත්මක නොවීම. VII. සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා දුම්රිය ප්‍රවේශකත්වය උපරිම අයුරින් ප්‍රයෝජනයට නොගැනීම. විදේශීය අමුත්තන්ගේ වංචාවන් පිළිබඳ සිදුවීම් වාර්තා වීම.
අවස්ථා	**තර්ජන**
I. පින්නවල සංචාරක කලාපයේ සංවර්ධනය කෙරෙහි සංචාරක සංවර්ධන අධිකාරියේ අවධානය යොමු වී තිබීම.	I. ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින්ගෙන් එක් රැයක්වත් ගත කරන ප්‍රමාණය 50-100 වැනි අනලෝස්සක සංචාරකයින් ප්‍රමාණයක් වීම. II. පින්නවල අලි අනාථාගාරයේ අලි මෙල්ල කිරීම සඳහා ඇත්ගොවිවන් විසින් හෙන්ඩු භාවිතා කිරීම සහ දම්වැල් දමා බැඳ තිබීම නිසා බොහෝ විදේශ සංචාරකයින් සෘණාත්මකව දැක්මක් පින්නවල පිළිබඳව හුවාදැක්වීම සංචාරක ආකර්ෂණයට බලපෑම් ඇති කිරීම.

මූලාශ්‍රය: කෑ.දි.කා., නාගරික සංවර්ධන අධිකාරිය, 2022

05 පරිච්ඡේදය
ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය

5.1.3: “රඹුක්කන, ප්‍රදේශයේ වෙසෙන සියලුම නාගරික හා අර්ධ නාගරික වාසීන් සඳහා අනුකූලතාවයක් සහිත වඩාත් හිතකර ජනාවාසයක් බවට පත් වීම” යන අරමුණ සඳහා වන සාරාංශගත SWOT විශ්ලේෂණය

වගු අංක 5.3: අරමුණ 03ට අදාළ ශ.දු.අ.ත (SWOT) විශ්ලේෂණය

සාරාංශගත ශ.දු.අ.ත විශ්ලේෂණය

ශක්තීන්	දුර්වලතා
I. ඉහළ අවදානම් සහිත නායයෑම් අවදානම් ප්‍රදේශවලින් 13%ක් පමණක් වාර්තා කිරීමෙන් දිස්ත්‍රික්කය තුළ අඩුම ආපදා අවදානම් ප්‍රදේශය ලෙස පැවතීම. II. අවශ්‍ය පොදු පහසුකම් සැපයීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සහ පළාත් පාලන ආයතන මගින් සිදු කර ඇති සංවර්ධන ව්‍යාපෘති සහ මැදිහත්වීම්. III. ජනගහන වර්ධන වේගය වැඩි වන ස්වරූපයක් පෙන්නුම් කිරීම. IV. නිවාස ඝනත්වය අඩු බැවින් සංවර්ධනය කළ හැකි ඉඩම් පැවැතීම. V. සම්පූර්ණ සැලසුම් ප්‍රදේශය ස්ථාපිත විදුලි සැපයුම් සහ ජල සැපයුම් ජාලයෙන් ආවරණය වීම	I. විවිධ ප්‍රවාහන ක්‍රම හොඳින් සම්බන්ධ වී නොමැති අතර ඒකාබද්ධ මෙහෙයුම් පද්ධතියක් නොමැතිකම
අවස්ථා	**තර්ජන**
I. ආපදා අවධානම් කලාප වල ජනාවාස ඉදිකිරීම් සිදු කරන විට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ මැදිහත් වීම	I.අතරමැදි වියලි කලාපයේ පිහිටීම

මූලාශ්‍රය: කෑ.දි.කා, නාගරික සංවර්ධන අධිකාරිය, 2022

06 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්ම

6.1 සංකල්පිත සැලැස්ම

සංකල්පිත සැලැස්ම

රඹුක්කන නගරයේ සංවර්ධන බලවේගයන් “ශ්‍රී ලංකා කඳුරට පිවිසුමේ උද්දීප්ත කෘෂි මධ්‍යස්ථානය” යන දැක්ම කරා යොමු කරවමින් අපේක්ෂිත සංවර්ධන පරිවර්තනය සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලිය පෙර සැලසුම් කොටගත් යෝජිත "අවකාශීය සංකල්පිත සැලසුම" මතින් ගොඩනැගී ඇත. යෝජිත සංකල්පිත සැලසුමේ මූලික හරය වන්නේ ප්‍රදේශයේ පවතින ආර්ථික බලවේගයන් වන සංචාරක කර්මාන්තය සහ නේවාසික භාවිතයන්ට අනුකූලතාවයක් සහිත කෘෂිකර්මාන්තය මගින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට හැකි අවකාශීය ව්‍යුහයක් භූමියේ ස්ථාපනය කිරීමයි.

යෝජිත සංකල්පිත සැලසුම සකස් කිරීම සඳහා මෙකී ආර්ථික බලවේගයන්ට අමතරව පවතින භූගෝලීය තත්වයන් සහ අධිවේගී මාර්ගය වැනි අනාගත මහා සංවර්ධන ව්‍යාපෘති වල බලපෑම පිළිබඳවද අවධානය යොමු කරන ලදී. සංකල්පිත සැලසුමේ මූලික අවකාශීය උපායමාර්ගය වූයේ, සැලසුම් කලාපය තුල බහු කේන්ද්‍රීය සංවර්ධනයක් ස්ථාපිත කිරීමයි. පාරිසරික සහ භූ විෂමතා බාධක සහිත ප්‍රදේශයන් තුල සුලභව දැකිය හැකි සම්පත් බෙදී යාමේ විෂමතාවය අවම කර ගැනීම සඳහා වඩාත් උචිත භෞතික සංවර්ධන සංකල්පය වන්නේ මෙයයි.

සැලසුම් කලාපය තුල අපේක්ෂිත ජනගහන හා නිවාස ව්‍යාප්තිය පදනම් කරගනිමින් සංකල්පිත සැලසුමේ අදාළ නේවාසික ලක්ෂණයන් විග්‍රහ කර ඇත. එමෙන්ම ඒ හා අනුකූලතාවයක් සහිත සේවා මධ්‍යස්ථාන ධූරාවලිය සහ ක්‍රියාකාරිත්වය මත පදනම් වූ නාගරික කලාප හඳුනා ගැනීමේදී අදාළ නගර සැලසුම් න්‍යායන්, සංකල්පයන් සහ පර්යේෂණ අධ්‍යයනයන් ආශ්‍රය කරගන්නා ලදී. භෞතික මාර්ග ජාලය මත ගොඩනැගුණු රඹුක්කන නගරයේ සංකල්පමය සම්බන්ධතාවයන්ට අනුව, නගරය සැලසුම් සීමාව තුල දුරස්ථව සහ විසිරී ඇති යෝජිත සංවර්ධන කේන්ද්‍රස්ථාන සමඟ "සංවර්ධන ප්‍රවර්ධන කොරිඩෝව" මගින් සම්බන්ධ වන අතර කොළඹ - නුවර (A1) මාර්ගය සහ කෑගල්ල - පොල්ගහවෙල (A19) මාර්ග තුලින් හඳුනාගත් "ප්‍රමුඛ සංවර්ධන කොරිඩෝව" ඔස්සේ සැලසුම් සීමාවෙන් පිටතට කලාපීය සහ ජාතික සම්බන්ධතා ගොඩනැඟී ඇත.

රූප සටහන 6.1: යෝජිත අවකාශීය සංකල්පිත සැලැස්ම



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

6.2 යෝජිත භූමි පරිහරණ සැලැස්ම

රඹුක්කන සැලසුම් බල ප්‍රදේශය අනාගතයේ සෞභාග්‍යමත් පුරවරයක් ලෙස සංවර්ධනය කිරීමේදී යෝජිත ආර්ථික, පාරිසරික, සෞඛ්‍ය හා අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම හරහා ක්‍රියාවට නැංවීමට නියමිත උපාය මාර්ගික ව්‍යාපෘති තුළින් බිහිවන නාගරික ආකෘතියේ පිළිබිඹුව යෝජිත භූමි පරිහරණ සැලැස්ම හරහා නිරූපණය කෙරේ. සංචාරක ආකර්ශනය නොමදව ඇති ප්‍රදේශයක් ලෙසත් කෘෂිකාර්මික ආර්ථික රටාවක් සහිත ජනතාවක් ජීවත්වන ප්‍රදේශයක් ලෙසත් ප්‍රදේශයේ පවතින විභවතා සංවර්ධනය කොට මෙකී අංශ දෙක ඔප් නැංවීම තුළින් ප්‍රදේශය සමෘද්ධිමත් කිරීම යෝජිත භූමි පරිහරණ සැලැස්ම තුළින් පිළිබිඹු වේ. (ඇමුණුම 09)

සමස්ථ භූමි පරිහරණ සැලැස්ම මූලික වශයෙන් නගරයේ වාණිජ සංවර්ධනයත් කෘෂිකාර්මාන්තය, සංචාරක කර්මාන්තය සහ නේවාසික සංවර්ධනය අරමුණු කරගෙන ඉහත කී සියලු අංශ වල සංවර්ධනයක් අපේක්ෂා කරයි. ප්‍රධාන මාර්ග දෙපස වාණිජ භාවිතයන් සඳහා සිරස් සංවර්ධනයක් යෝජනා කරන අතර දුම්රියපොළ කේන්ද්‍ර කරගෙන ජනතාව සඳහා ඉහළ ගුණාත්මක සේවාවක් සැපයිය හැකි අයුරින් සංවර්ධනය විය යුතුය. ප්‍රදේශයේ පවතින අතුරු මාර්ග, විකල්ප මාර්ගය හා නව මාර්ග සංවර්ධනය කිරීම තුළින් ප්‍රදේශය තුළ ගමනාගමන සංසරණය වැඩි කර ඒ තුළින් කෘෂිකාර්මික, කර්මාන්ත නිෂ්පාදන නගරය වෙත ගෙන ඒමටත් අනෙකුත් ප්‍රදේශ වලට බෙදා හැරීමට පහසු වනු ඇත. ඒ තුළින් නාගරික සංවර්ධනය තිරසර ලෙස අභ්‍යන්තර ප්‍රදේශ වලටත් ව්‍යාප්ත වීම කාර්යක්ෂම වනු ඇත. එමෙන්ම ඉහළ ඝනත්වයකින් යුතු නේවාසික කලාපයට සේවා සම්පාදනයද විධිමත් වනු ඇත.

ප්‍රදේශයේ පවතින අති විශාල කුඹුරු ඉඩම්, පොල් සහ රබර් ඉඩම් තිරසර ලෙස පවත්වා ගනිමින් සංවර්ධන කටයුතු සිදු කිරීම අරමුණ වේ. මා-ඔය මූලික කරගත් ජල මූලාශ්‍ර ආශ්‍රිත විවෘත භූමි ප්‍රදේශයේ ආකර්ෂණය ඉස්මතු වන ලෙස නිර්මාණය කිරීම තුළින් ප්‍රදේශයේ සුන්දරත්වය සහ සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීම සඳහා තවදුරටත් යොදා ගැනීමට සැලසුම් කර ඇත.

නාරම්බැද්ද, කොස් කැලේ වැනි රක්ෂිත වනාන්තර, මා-ඔය ඇතුළු ජල මූලාශ්‍ර ආරක්ෂාකර ගනිමින් නීල හරිත පරිසරයකින් සමන්විත ආකර්ෂණීය නගරයක් දැකගත හැකිය. තවද අලගල්ල කන්දේ දර්ශනීය කෝණයන් (senic view points) හා මා-ඔයේ දර්ශණීය ස්ථාන විවෘතව තබමින් අවහිර නොවන පරිදි ඒ ඒ ප්‍රදේශයට ගැලපෙන ගොඩනැගිලිවල උස මට්ටම් පවත්වාගෙන යාමද අරමුණු වේ. ඒ තුළින් ප්‍රදේශයට පිවිසෙන ඕනෑම පුද්ගලයෙකුට නිහඬ නිස්කලංක පරිසරයක් දර්ශනය වන අතර නගරය මධ්‍යය තුළ කඩිසරව ක්‍රියාත්මක වන වටපිටාවක් දර්ශනය වේ.

ඒ අනුව 2033 වන විට ඉහත කී සියලු විස්තර වලින් පැවසෙන පරිදී “ශ්‍රී ලංකා කඳුරට පිවිසුමේ උද්දීප්ත කෘෂි මධ්‍යස්ථානය” යන දැක්ම මෙම යෝජිත භූමි පරිහරණ සැලැස්ම තුළින් සාක්ෂාත් වන බව පැහැදිලිය. ඉඩම් පරිහරණ සැලසුම් උපායමාර්ගය ප්‍රධාන වශයෙන් කලාපීකරණ සැලැස්ම සහ ප්‍රකාශිත සංචාරක ප්‍රදේශය සඳහා වන මාර්ගෝපදේශ සැලැස්ම යන සැලසුම් දෙක තුළින් සකස් කිරීම මෙහිදී අරමුණු වේ.

වත්මන් ඉඩම් පරිහරණය, සංවර්ධන ප්‍රවනතාවය, පාරිසරික සංවේදීතාවය, නේවාසික භාවිතය සඳහා ඉඩම්වල සුදුසු බව, දැනට පවතින සහ අනාගත සංවර්ධනය කළ හැකි ප්‍රදේශ, ආපදා සිදුවන ප්‍රදේශ, අපේක්ෂිත නාගරික ආකෘතිය (අපේක්ෂිත අවකාශීය සංවර්ධනය) යන සාධක සැලකිල්ලට ගනිමින් රට අනුකූල වන පරිදී කලාපීකරණ සැලැස්ම සහ රෙගුලාසි හඳුන්වාදීම සිදු කර ඇත. සංචාරක අංශයේ භෞතික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, සංචාරකයින් සඳහා සුවපහසු පහසුකම් සැපයීම සහ අද්විතීය පරිසරයක් නිර්මාණය කිරීම යන කරුණු පදනම් කර ගනිමින් පින්නවල ආශ්‍රිත ප්‍රදේශය මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය ලෙස හඳුනාගෙන රට අදාළ රෙගුලාසි හඳුන්වා දී ඇත.

6.2.1 අපේක්ෂිත නාගරික ආකෘතිය

සේවා මධ්‍යස්ථාන ධූරාවලිය

නාගරික/සේවා මධ්‍යස්ථානයන් හි ධූරාවලිය පෙළගැස්වීමෙහිදී එක් එක් මධ්‍යස්ථානයන් දැනට පවතින සේවාවන් සහ සැලසුම් කාල සීමාව තුලදී ස්ථාපනය කිරීමට අපේක්ෂිත පහසුකම් පිළිබඳව අවධානය යොමු කරන ලදී. ඒ අනුව සැලසුම් ප්‍රදේශය තුල පහත දක්වා ඇති පරිදි ස්ථර පහකින් යුතු සේවා ස්ථාන ධූරාවලියක් හඳුනාගෙන ඇති අතර සැලසුම් සීමාවෙන් පිටත ඒ ආසන්නයේ ඇති කලාපීය නගරය ලෙස කෑගල්ල නගරය හඳුනාගන්නා ලදී.

5 ප්‍රධාන කලාපීය නගරය - කෑගල්ල
6 පළමු පෙළ (නගර කලාපය)- රඹුක්කන
7 දෙවන පෙළ (නගරය) - හිරිවඩුන්න, වහව, මොලගොඩ
8 තෙවන පෙළ (කුඩා නගරය) - කිරිවල්ලපිටිය, පත්තම්පිටිය, පින්නවල
9 සිව්වන පෙළ (ගම්මාන) - හේවාදිවෙල, ගබ්බල, වැලිගමුව, මොරගොල්ල, ඉම්බුල්ගස්දෙණිය
10 පස්වන පෙළ (කුඩා ගම්මාන) - මුවාපිටිය, කිවුල්පන, නාරම්බැද්ද, තිස්මල්පොළ, යටගම, කඩිගමුව, යටිවල්දෙණිය, පනලිය, දැලිවල, වල්ගම

මෙම නාගරික/සේවා මධ්‍යස්ථාන ධූරවලිය සැකසීමේ න්‍යායත්මක පදනම සහ එක් එක් කාණ්ඩයේ ලක්ෂණ අවකාශීය සංවර්ධන උපාය මාර්ගය යටතේ විස්තර කෙරෙනු ඇත.

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

අපේක්ෂිත නාගරික ආකෘතිය

නේවාසික ලාක්ෂණික කලාප

නේවාසික ලාක්ෂණික කලාපීකරණයේදී සැලසුම් සීමාව තුල අපේක්ෂිත සංවර්ධන ව්‍යාප්තිය පිළිබඳව අවධානය යොමු කරන ලදී. ඒ අනුව නම් කරන ලද නේවාසික කලාපයන් වන්නේ නාගරික නේවාසික කලාපය, අධි ඝනත්ව නේවාසික ප්‍රවර්ධන කලාපය සහ අඩු ඝනත්ව නේවාසික ප්‍රවර්ධන කලාපය වේ.

රඹුක්කන නගර මධ්‍යයේ සිට කි.මී 4ක අරයක් සහිත යෝජිත සංකල්පමය නාගරික නේවාසික කලාපය තුල රඹුක්කන නගරයේ සේවාවන් ලබා ගැනීම සඳහා පහසු සහ ඉක්මන් ප්‍රවේශයන් ලබා දීම සිදු වනු ඇත. මෙහි ඉදිවන ජනාවාස සඳහා වාණිජ, පරිපාලන, විනෝද, අධ්‍යාපන, සෞඛ්‍ය සහ වෙනත් සියලුම නාගරික පහසුකම් ලබා දීම සිදු වන අතර ප්‍රවාහනයට දුම්රිය සේවාව ලබා ගැනීම සඳහා ප්‍රධාන දුම්රියපල සමග පහසු සම්බන්ධතාවයක් ඇති කිරීම සිදු කරනු ලැබේ.

යෝග්‍ය ප්‍රමාණයට විවෘත අවකාශ සහ හරිත කලාප ද ඇතුළත් අධි ඝනත්ව සහ මධ්‍යම ප්‍රමාණයේ උස සහිත ඉදිකිරීම් මෙම කලාපය තුල අපේක්ෂිත නාගරික නිර්මිතයන් වනු ඇත. එසේම මෙම කලාපය තුල වැඩි ඝනත්වකින් යුතු නේවාසික පහසුකම් ලබාදීමට හැකියාව ඇති අතර ඒ තුලින් අනුකූලතාවයක් සහිත සියලු දෙනා අන්තර්ග්‍රණය කරගැනීමට හැකියාවක් ඇති සැලසුම්කරණයක් හඳුන්වාදෙනු ඇත. නේවාසික භාවිතයට අමතරව දුම්රිය මාර්ගයේ විභවනාවය උපයෝගී කරගනිමින් පරිසර හිතකාමී මධ්‍ය හා කුඩා පරිමාණ කර්මාන්ත සඳහාද මෙම කලාපය යෝග්‍ය වනු ඇත.

නාගරික නේවසික කලාපය සහ අඩු ඝනත්ව නේවාසික ප්‍රවර්ධන කලාපය අතර යෝජිත සංකල්පමය අධි ඝනත්ව නේවාසික ප්‍රවර්ධන කලාපය පිහිටා ඇත. මෙම කලාපය ස්ථාපනය කිරීම සඳහා අනාගත ජාතික සංවර්ධන ව්‍යාපෘතියක් වන අධිවේගී මාර්ග ජාලය සමග ඍජුව සම්බන්ධ වීමේ හැකියාව සහ ඒ තුලින් උත්පාදනය වන විභවතාවය පිළිබඳව අවධානය යොමු කරන ලදී. ඒ අනුව නාගරික නේවාසික කලාපයට සාපේක්ෂව මෙම කලාපය තුල වඩා වැඩි විවෘත අවකාශයන්ගෙන් යුතු අනන්‍ය ලක්ෂණ සහිත භූමි නිර්මිතයක් අපේක්ෂා කෙරේ. ප්‍රදේශයේ එවැනි නේවාසික භාවිතයන් සඳහා ප්‍රවර්ධනය කල හැකි භූමි ප්‍රදේශයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා අනුකූලතාවයක් සහිත ගොඩනැගිලි සහ සැලසුම් රෙගුලාසි හඳුන්වාදීමට මෙම සැලසුමේ දී අවධානය යොමු කරනු ඇත. එසේම අධිවේගී මාර්ගයේ විභවතාවය පදනම් කරගනිමින් මධ්‍ය පරිමාණ පරිසර හිතකාමී කර්මාන්ත, නේවාසික මහල් නිවාස සහ සංචාරක හෝටල් සඳහා ද මෙම කලාපය ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

නේවාසික ව්‍යාප්තියේ අවසාන ස්ථරය වන අඩු ඝනත්ව නේවාසික ප්‍රවර්ධන කලාපය අධි ඝනත්ව නේවාසික මායිමේ සිට සැලසුම් සීමාව දක්වා විහිදී යයි. අවම ගොඩනැගිලි ඉදිකිරීම් ඝනත්වයකින් යුතුව බහුතර ඉඩම් පරිහරණයක් කෘෂිකාර්මික පරිහරණයට සහ හරිත කලාප සඳහා වෙන් කර තිබීම මෙම කලාපයේ අපේක්ෂිත භූමි නිර්මිතය වේ. මෙම ප්‍රදේශය සඳහන් කළ ලාක්ෂණිකයන්ගෙන් යුතු වූ බවට තීරණය කිරීම

සඳහා එහි දක්නට ලැබෙන පාරිසරික සංවේදී ලක්ෂණ, උස් බිම් සහ නාය යාම් අවදානම් සහිත ආපදා ප්‍රදේශ යන කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදී.

යෝජිත ස්ථර තුනකින් යුතු නේවාසික ලාක්ෂණික කලාපයන් ගෙන් පිටත කලාපයේ "ප්‍රමුඛ සංවර්ධන කොරිඩෝව" (A1- කොළඹ - නුවර මාර්ගය) මගින් ප්‍රවේශය ලබන මොලගොඩ ප්‍රදේශයේ ද ඉහත මධ්‍ය ඝනත්ව නේවාසික කලාපයේ අපේක්ෂිත නගර නිර්මිතය සඳහා අවකාශය ලබා දීමට මෙම සංකල්පිත සැලසුම මගින් යෝජනා කෙරේ.

සමස්ත සැලසුම් ප්‍රදේශය පුරාම ව්‍යාප්තව ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්ථාන, කුඹුරු ඉඩම් සහ වනාන්තර ආරක්ෂණ විධි විධාන යටතේ ආරක්ෂා කර ගනිමින් ජනාවාස සංවර්ධනය කිරීමටත් අනෙකුත් ව්‍යාප්තව ඇති හරිත ප්‍රදේශ සහ ඉඩම් නිසි සංරක්ෂණ ක්‍රමවේද භාවිතා කරමින් ජනාවාසකරණයට යොදා ගැනීමටත් මෙහිදී යෝජනා කෙරේ.

ක්‍රියාකාරිත්වය මත පදනම් වූ නාගරික කලාප

ක්‍රියාකාරී යාන්ත්‍රණය පදනම් කරගනිමින් සංකල්පිත සැලසුම මගින් කාර්ය මූල නාගරික කලාප තුනක් (03) හඳුනාගෙන ඇත. දැනට පවතින සහ අපේක්ෂිත නාගරික ලක්ෂණයන් මත පදනම්ව ගොඩනැගුණු මෙම සංකල්පමය කලාප නාමිකව “ප්‍රධාන නගරය”, “උප නගරය ” සහ “සංචාරක නගරය ” වේ.

රඹුක්කන නගරය අන්තර්ග්‍රහණය වන “ප්‍රධාන නගරය” සියලුම නාගරික පහසුකම් වලින් සමන්විත ප්‍රදේශය වේ. දුම්රියපල, බස්රථ පර්යන්තය, සති පොල, දිස්ත්‍රික් රෝහල, තොග සහ සිල්ලර වාණිජ සේවා සැපයුම්, අධ්‍යාපන පහසුකම් සහ අනෙකුත් සියලුම නාගරික පහසුකම් මෙම කලාපය තුල සපයනු ඇත. එම සේවා ලබාගැනීම සඳහා සැලසුම් සීමාව තුල මෙන්ම සැලසුම් සීමාවෙන් පිටත ජනතාව ප්‍රධාන නගර කලාපයට ආකර්ෂණය කරනු ඇත.

ප්‍රධාන නගර කලාපයට අසන්න සීමාවේ පිහිටි “උප නගර” කලාපය තුල ප්‍රධාන නගරයේ සීමා ඉක්මවා ව්‍යාප්ත වන අතිරික්ත පහසුකම් ස්ථාපනය කිරීම සිදුවනු ඇත. මේ සඳහා යෝජනා කරන වහව මංසන්ධිය අයත් වන ප්‍රදේශය මේ වනවිටත් රඹුක්කන නගරයට සාපේක්ෂව අර්ධ නාගරික ලක්ෂණ වලින් සමන්විත අතර බුළුගොල්ල - වහව (B475) මාර්ගය , රඹුක්කන - කටුපිටිය (B384) මාර්ගය සහ පොල්ගහවෙල වහව මාර්ගය සම්බන්ධ වීමෙන් ඉහල අවකාශීය සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. දැනට ඉදිකර ඇති බ්‍රැන්ඩික්ස් ආයතනයේ කර්මාන්ත ශාලාව සහ අධි ඝනත්ව නේවාසික කලාපය තුල අපේක්ෂිත කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්තද මෙම වහව සේවා මධ්‍යස්ථානය ආශ්‍රිතව ස්ථාපනය වන බැවින් රඹුක්කන ප්‍රදේශයේ උප නගරය ලෙස යෝජිත කලාපය සංවර්ධනය වීමට විභවතාවයක් ඇති බවට පෙනී යයි.

පින්නවල ආශ්‍රිත සංචාරක ආකර්ෂණ ස්ථාන සමග හඳුනාගත් “සංචාරක නගර කලාපය” සැලසුම් සීමාවේ අනන්‍ය නාගරික කලාපයක් ලෙස හඳුනාගත හැකිය. සංචාරක ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් සහ ආකර්ෂණයන්

06 පරිවිඡේදය
සංවර්ධන සැලැස්ම

හා බැදුණු සංවර්ධනයන් මෙම කලාපය තුල ස්ථාපනය කිරීමට යෝජිත අතර යටිතල පහසුකම් හා සේවා සැපයීමේදීද සංචාරක ක්ෂේත්‍රයේ උන්නතිය සඳ රට අනුකූලතාවයක් සහිත වන පරිදි අදාළ සංවර්ධන කටයුතු කිරීම සිදු කරනු ඇත. තවදුරටත් සංචාරක කර්මාන්තයට අදාළව අපේක්ෂිත පරාසයකින් යුතු

අපේක්ෂිත නාගරික
ආකෘතිය

නේවාසික පහසුකම් සැපයීම දිරි ගැන්වීම සඳහා යෝග්‍ය සැලසුම් සහ ගොඩනැගිලි රෙගුලාසි බලාත්මක කෙරෙනු ඇත.

සංවර්ධන කොරිඩෝව

රඹුක්කන සැලසුම් සීමාව තුල සහ සීමාවෙන් පිටත වන සේවා ස්ථාන අතර සම්බන්ධතාවය ගොඩනගන සංවර්ධන කොරිඩෝ මාදිලි දෙකක් සංකල්පිත සැලසුම මඟින් යෝජනා කර ඇත. ඒ අනුව යෝජිත “ප්‍රමුඛ සංවර්ධන කොරිඩෝව” මඟින් රඹුක්කන නගරය සැලසුම් සීමාවෙන් පිටත පිහිටි කලාපීය ප්‍රධාන නගර සමඟ සම්බන්ධ කරනු ලැබේ. ජාතික මහා මාර්ග ජාලයේ “A” කාණ්ඩයට අයත් මාර්ග වන කොළඹ - නුවර (A1) මාර්ගය, කෑගල්ල - රඹුක්කන (B199) මාර්ගය සහ කෑගල්ල - පොල්ගහවෙල (A19) මාර්ගය යන මාර්ග වල කොටස් මෙම කොරිඩෝව නියෝජනය කරන අතර මාර්ග රක්ෂිතයන්ට අදාළ මාර්ගොපදේශයන්ට යටත්ව අධි ඝනත්ව සංවර්ධනයක් අපේක්ෂා කරනු ලැබේ.

සැලසුම් සීමාව තුල පිහිටි සේවා මධ්‍යස්ථාන සමඟ රඹුක්කන නගරය සම්බන්ධ කරන කොරිඩෝව “සංවර්ධන ප්‍රවර්ධන කොරිඩෝව” ලෙස හඳුනාගෙන ඇත. මෙම කොරිඩෝව විහිදී ඇති ප්‍රදේශයේ පාරිසරික සහ භූ ගෝලීය තත්වයන් මත මධ්‍යම සිට අවම ඝනත්ව සංවර්ධනයක් සංරක්ෂණ මාර්ගෝපදේශ යටතේ ස්ථාපනය කිරීමට යෝජනා කෙරේ. වර්තමාන තත්වය සලකා බැලීමේදී මෙම කොරිඩෝව සංවර්ධනය නොවූ සහ ඒ සඳහා අවධානය නොලැබුණු ග්‍රාමීය මාර්ග වශයෙන් හඳුනාගත හැක. ඒ අනුව යෝජිත සංකල්ප සැලසුම මඟින් පරිසර තත්වයන්ට අනුකූල සංවර්ධනයක් පමණක් ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ.

සංකල්පිත සැලසුමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ අනාගත සංවර්ධන බලවේගයන් සැලසුම් කලාපයේ අනාගත දැක්ම වන “ශ්‍රී ලංකා කඳුරට පිවිසුමේ උද්දීප්ත කෘෂි මධ්‍යස්ථානය” යන්න සාක්ෂාත් කර ගැනීම සඳහා යොමු කරවීමයි. ඒ අනුව සංකල්පිත සැලසුමේ අදහස වන්නේ පරාසයකින් යුතු ව ව්‍යාප්ත වන නේවාසික කලාප වල සුමට යාන්ත්‍රණයක් සහතික කරන අතර ශ්‍රී ලංකාවේ කඳුරට පිවිසුමේ වඩාත් උද්දීප්ත කෘෂි මධ්‍යස්ථානය පිහිටුවීමයි. මේ සඳහා 13%ක් ලෙස ව්‍යාප්තව ඇති කුඹුරු ඉඩම් සහ 5%ක් ලෙස ව්‍යාප්තව ඇති වනාන්තර බිම් කිසිදු වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනීම වලකමින් ආරක්ෂා කිරීම සිදු කරන අතර සමස්ත ඉඩම් පරිහරණයෙන් 54%ක් වූ මුළු කෘෂිකාර්මික බිම් ප්‍රමාණය යෝජිත දැක්මට අනුව ප්‍රවර්ධනය කෙරෙනු ඇත. එසේම ප්‍රකට සංචාරක මධ්‍යස්ථානයක් වන පින්නවල ආශ්‍රිත සංචාරක කලාපය තව තවත් ආකර්ශනීය සහ නව ව්‍යාපාර ක්‍රමවේද ඔස්සේ සංවර්ධනය කරමින් වැඩි ආර්ථික ප්‍රතිලාභයන් ලබා ගැනීම සඳහා යටිතල පහසුකම් ලබා දීම සිදුකල යුතුය.

6.3 අවකාශීය සංවර්ධන උපායමාර්ග සැලැස්ම

නාගරික හා ජනාවාස ධුරාවලි රටාවක් හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීම තුළින් හිතකර හා තිරසාර ජනාවාස ස්ථාපිත කිරීමේ අරමුණ පෙරදැරිව ඝනත්ව කලාපකරණය සහ මාර්ගෝපදේශ හඳුන්වා දීම සහ එය ක්‍රමවත්ව පවත්වාගෙන යාම මෙම උපායමාර්ගය ඉදිරිපත් කිරීමේ මූලික අරමුණ වී ඇත. එමෙන්ම මේ තුළින්, සේවා මධ්‍යස්ථාන බෙදා හැරීම සමඟ තිරසාර ජනාවාස රටාවක් නිර්මාණය කිරීම, සංවර්ධනය සඳහා වන ඉල්ලීම් පරිසරය සුරැකීමේ අවශ්‍යතාවය සමඟ සමතුලිත කිරීම, නගරයේ සහ ඉන් පිටත ප්‍රදේශවල පවතින සම්පත් බෙදී යාමේ අසමතුලිතභාවය මඟ හැර ආර්ථික හා සමාජ සංවර්ධනය අතර සමතුලිතතාවය වැඩි දියුණු කිරීම හා සුදුසු භූමි පරිහරණ ව්‍යුහයක්, ඝනත්ව රටාවක් සහ ප්‍රමුඛ භාවිතයක් පවත්වාගෙන යාම යන අරමුණුද මෙම උපායමාර්ගය තුළින් අපේක්ෂා කෙරේ.

6.3.1 සේවා මධ්‍යස්ථාන ස්ථානගත කිරීම සඳහා නාගරික ධුරාවලියක් හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීමේ උපාය මාර්ගය

දැනට ජීවත්වන හා අපේක්ෂිත ජනගහනය, සේවා ලබා ගැනීමේ හැකියාව, භෞතික සහ සමාජ යටිතල පහසුකම් ලබා ගැනීමේ හැකියාව යන මූලික සංරචක පදනම් කරගෙන රඹුක්කන ප්‍රදේශයේ සේවා සපයන මධ්‍යස්ථාන, නාගරික ධුරාවලියක් අනුව හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීම සිදුකර ඇත. ඒ අනුව පලමු පෙළ සිට පස්වන පෙළ දක්වා පිලිවෙළින් සේවා සපයන මධ්‍යස්ථාන පහත පරිදි දැක්විය හැකිය.

රූප සටහන 6.2: පලමු පෙළ සිට පස්වන පෙළ දක්වා සේවා සපයන මධ්‍යස්ථාන



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

සිතියම 6.1 : නාගරික ධුරාවලිය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

ඉහත පරිදී ඔඳුනාගත් එක් එක් නාගරික ධුරාවලියට අනුව සේවා සපයන මධ්‍යස්ථාන ලෙස එම පහසුකම් සංවර්ධනය විය යුතු ආකාරය “බලපෑමේ ගෝලය” නම් පහත දැක්වෙන න්‍යාය පදනම් කරගෙන ඔඳුනා ගෙන ඇත.

රූප සටහන 6.3: “ජනාවාසයක බලපෑම් ක්ෂේත්‍රය” සංකල්පය



මූලාශ්‍රය: https://rashidfaridi.com/2020/03/26/urban-hierarchies-and-anomalies/

යම් ජනාවාසයක බලපෑම් ක්ෂේත්‍රය යනුවෙන් විස්තර කරන්නේ යම් සේවාවක් කෙතරම් වපසරියකින් යුක්තව බලපෑම් කරන්නේද යන්නයි. විවිධ සේවාවන් සඳහා එහි බලපෑමේ ගෝලය ආවරණය වන ප්‍රදේශය විවිධාකාර වේ. ඉහත රූප සටහනේ දැක්වන (A අකුරින් දැක්වෙන) පරිදි විශාල නගරයේ පවතින සේවාවන් වල බලපෑමේ ක්ෂේත්‍රය විශාලය. එයට හේතුව එහි මිනිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා පුළුල් පරාසයක සේවා සහ කාර්යයන් විහිදී තිබීමයි. නිදසුනක් වශයෙන්, සුපිරි වෙළඳසැලකට සැතපුම් 20 ක අරයක් ඇති පුද්ගලයින් ආකර්ෂණය කර ගත හැකි අතර, චිත්‍රපටයක් නැරඹීම සඳහා සිනමාශාලාවක් වෙත යෑම වැනි විවේක ක්‍රියාකාරකමකට කෙතරම් දුරක එය පිහිටා තිබුණද මිනිසුන් ආකර්ෂණය කර ගත හැකිය. නමුත් ගෘහ භාණ්ඩ වැනි සංසන්දනාත්මක භාණ්ඩයක් හෝ යම් සේවාවක් ලබා ගැනීමට මිනිසුන් තම ආසන්නම නගරය වෙත ගමන් කරයි. ඒ අනුව නගරයක් තුළින් සේවා සපයන වපසරිය වඩා පුළුල් පරාසයකට (A අකුරින් දැක්වෙන) බලපෑම් ඇති කරන බව මෙම නියායෙන් පැහැදිලි කරයි.

එහෙත් ප්‍රධාන නගරයට නොගොස් සපුරා ගත හැකි අවශ්‍යතා උප නගර (B අකුරින් දැක්වෙන) වලින් සපුරා ගත හැකිය. අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා ජනතාව මෙම උප නගර වෙත ගමන් කරයි. එමඟින් ප්‍රධාන නගරයේ ඇතිවන තදබදයද අවම වේ. එමෙන්ම එහි බලපෑම් ක්ෂේත්‍රයද ප්‍රධාන නගරයට වඩා සීමාවේ. නමුත් කුඩා ගමක හන්දියක (C අකුරින් දැක්වෙන) තිබෙන කුඩා කඩයකින් දිනපතා අවශ්‍ය කරන පුවත්පත්, පාන්, කිරි වැනි ආහාර හා අත්‍යවශ්‍ය දේ ලබා ගත හැකිය. මෙවැනි දෛනිකව අවශ්‍ය වන භාණ්ඩ මිලදී ගැනීම සඳහා ජනතාව ඉතා කෙටි දුරක් පමණක් ගමන් කිරීමට කැමැත්තක් දක්වයි.

06 පරිවිඡේදය
සංවර්ධන සැලැස්ම

මෙම සංකල්පය පදනම් කර ගනිමින් තිරසාර ජනාවාසයක් නිර්මාණය කිරීමේ අරමුණ පදනම් කර ගෙන පහත සඳහන් පරිදි සේවා පහසුකම් සංවර්ධනය වීම අවශ්‍ය බව හඳුනාගන්නා ලදී.

අවකාශීය සංවර්ධන
උපායමාර්ග සැලැස්ම

උපායමාර්ගය 01

වගුව 6.1: එක් එක් පෙළ සේවා සපයන මධ්‍යස්ථානයන්හි පහසුකම් සංවර්ධනය විය යුතු ආකාරය

පළමු පෙළ	පොදු වෙළෙඳසැල්, සුපිරි වෙළෙඳසල්, තොග සහ සිල්ලර වෙළෙඳසල්, බැංකු, බස් නැවතුම්පොළ වැනි ප්‍රවාහන පහසුකම් මධ්‍යස්ථාන, පොලිස් ස්ථානය, රජයේ රෝහල් හා පුද්ගලික රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන, ඔසුසල්, සනීපාරක්ෂක පහසුකම්, පරිපාලන ආයතන, පොදු ප්‍රජා උද්‍යාන හා ක්‍රීඩා පිටියක්, රංග ශාලා හා සමාජශාලා, ප්‍රධාන පාසල් (රජයේ/පුද්ගලික) ෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය, ත්‍රිරෝද රථ ගාල්, කුලියට ගත් වාහන පහසුකම්, සේවා ප්‍රතිපාදන මධ්‍යස්ථාන ආදිය;
දෙවන පෙළ	සුපිරි වෙළඳසැල්, සිල්ලර වෙළඳසැල්, සේවා සපයන මධ්‍යස්ථාන, වෛද්‍ය මධ්‍යස්ථාන, ෆාමසි, ත්‍රිරෝද රථ ගාල්, ප්‍රාථමික හා ද්විතීයික පාසල්, පෙර පාසල්, ෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථාන, සනීපාරක්ෂක පහසුකම්, ප්‍රවේශය මාර්ග පහසුකම්, ක්‍රීඩා පිටි, විනෝදාත්මක ප්‍රදේශයන්, ප්‍රජා අවකාශයන්, ක්ෂුද්‍ර මූල්‍ය මධ්‍යස්ථාන ආදිය;
තෙවන පෙළ	සුපිරි වෙළඳසැල්, සිල්ලර වෙළඳසැල්, ප්‍රවාහන පහසුකම්, පොදු ප්‍රජා මධ්‍යස්ථාන, ක්‍රීඩා පිටි, ත්‍රිරෝද රථ ගාල්, ක්ෂුද්‍ර මූල්‍ය මධ්‍යස්ථාන, ප්‍රාථමික පාසල්, පෙර පාසල්, ඩිස්පැන්සරි සහ පුද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන ආදිය;
හතරවන පෙළ	සිල්ලර වෙළඳසැල්, ප්‍රවාහන පහසුකම්, ප්‍රජා අවකාශය, ක්‍රීඩා පිටි, ක්ෂුද්‍ර මූල්‍ය මධ්‍යස්ථානය, ත්‍රිරෝද රථ ගාල්, ඩිස්පැන්සරි සහ පුද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන, පෙර පාසල ආදිය;
පස්වන පෙළ	සිල්ලර වෙළඳසැල්, ප්‍රවාහන පහසුකම්, ප්‍රජා පහසුකම්, පෙර පාසල ආදිය;
සංචාරක නගරය	සංචාරක ආකර්ෂණ ස්ථාන, සනීපාරක්ෂක පහසුකම්, විනෝදාස්වාද ස්ථාන, ප්‍රවාහන පහසුකම්, භූ දර්ශනයන් සහ විවේක ස්ථාන, තොරතුරු මධ්‍යස්ථාන, ATM, බැංකු, හෝටල් සහ වෙනත් නවාතැන්, අවන්හල්, ෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථාන ආදිය;

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

6.3.2 ඝනත්වය සහ විවිධත්වය මත පදනම්ව ජනාවාස ධුරාවලියේ රටාව හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීම

රඹුක්කන ප්‍රදේශයේ අපේක්ෂිත නේවාසික සංවර්ධන ව්‍යාප්තිය පිළිබඳව මෙම උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇති අතර එහිදී සැලසුම් සීමාව නාගරික නේවාසික ප්‍රදේශය, අධි ඝනත්ව නේවාසික ප්‍රවර්ධන ප්‍රදේශය සහ අඩු ඝනත්ව නේවාසික ප්‍රවර්ධන ප්‍රදේශය යන ප්‍රදේශ තුනක් වශයෙන් සංවර්ධනය කල යුතු බව හඳුනා ගෙන ඇත (රූප සටහන 6.3). ප්‍රදේශයේ අනාගත අපේක්ෂිත ජනඝනය, යටිතල පහසුකම් හා අනෙකුත් සේවා පහසුකම් පදනම් කර ගනිමින් මෙම ජනාවාස ස්ථානගත කිරීමේ උපායමාර්ගය සංකල්පිතමය වශයෙන් හඳුනාගෙන ඇත.

රූප සටහන 6.4: යෝජිත නේවාසික සංවර්ධන උපාය මාර්ගය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

අවකාශීය සංවර්ධන
උපායමාර්ග සැලැස්ම

උපායමාර්ගය 02

නාගරික නේවාසික ප්‍රදේශය

මෙම කලාපය රඹුක්කන නගරය කේන්ද්‍ර කරගනිමින් සංවර්ධනය වන ප්‍රදේශයකි. රඹුක්කන නගර මධ්‍යයේ සිට කි.මී 4ක අරයක් සහිත යෝජිත සංකල්පමය නාගරික නේවාසික ප්‍රදේශය තුල රඹුක්කන නගරයේ සේවාවන් ලබා ගැනීම සඳහා පහසු සහ ඉක්මන් ප්‍රවේශයන් ලබා දීම අපේක්ෂා කෙරේ. මෙහි ඉදිවන ජනාවාස සඳහා වාණිජ, පරිපාලන, විනෝද, අධ්‍යාපන, සෞඛ්‍ය සහ වෙනත් සියලුම නාගරික පහසුකම් ලබා දීම අපේක්ෂිත වන අතර ප්‍රවාහන පහසුකම් ලෙස බස්රථ, දුම්රිය හා අධිවේගී ප්‍රවාහන සේවාවන් ලබා ගැනීම සඳහා ප්‍රධාන බස් නැවතුම්පොළ සහ දුම්රියපල සමඟ පහසු සම්බන්ධතාවයක් ඇති කිරීම සිදු කරනු ලැබේ. අධි ඝනත්වයෙන් යුතු නාගරික ලක්ෂණ සහිත නේවාසික ජනතාවක් ජීවත් වන ප්‍රදේශයේ පිහිටි එකම ප්‍රදේශය වන්නේද මෙයයි. මෙම කලාපය ප්‍රධාන වාණිජ නගරය වන රඹුක්කන නගරයත් උප නගරය ලෙස වඟව හන්දියත් සංචාරක නගරය ලෙස පින්නවලත් සංවර්ධනය විය යුතු අතර මෙම නගර තුනෙන් සමන්විත කලාපය, “නාගරික නේවාසික ප්‍රදේශය” යනුවෙන් හැඳින්විය හැකිය.

අධි ඝනත්ව නේවාසික ප්‍රවර්ධන ප්‍රදේශය

මෙම කලාපය නාගරික නේවාසික ප්‍රදේශයට පිටතින් පිහිටි කලාපය වන අතර වැඩි ඝනත්වයෙන් යුතු නේවාසික ජනතාවක් සඳහා මෙම ප්‍රදේශය ඉඩ සලසා දීම අරමුණු කරගෙන ඇත. ඒ අනුව නාගරික නේවාසික ප්‍රදේශයට සාපේක්ෂව මෙම කලාපය තුල වඩා වැඩි විවෘත අවකාශ වලින් යුතු අනන්‍ය ලක්ෂණ සහිත භූමි නිර්මිතයක් අපේක්ෂා කෙරේ. ප්‍රදේශයේ එවැනි නේවාසික භාවිතයන් සඳහා ප්‍රවර්ධනය කල හැකි භූමි ප්‍රදේශයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා අනුකූලතාවයක් සහිත ගොඩනැගිලි සහ සැලසුම් රෙගුලාසි හඳුන්වාදීමට මෙම සැලසුමේ දී අවධානය යොමු කරනු ඇත. එසේම අධිවේගී මාර්ගයේ විඟවතාවය පදනම් කරගනිමින් මධ්‍ය පරිමාණ පරිසර හිතකාමී කර්මාන්ත, නේවාසික මඟල් නිවාස සහ සංචාරක හෝටල් සඳහා ද මෙම ප්‍රදේශය ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

අඩු ඝනත්ව නේවාසික ප්‍රවර්ධන ප්‍රදේශය

මෙම ප්‍රදේශය ඉතා අඩු ජනඝණයක් ජීවත් වන ග්‍රාමීය ලක්ෂණ සහිත ප්‍රදේශයක් වන බැවින් අඩු ඝනත්ව නේවාසික ප්‍රවර්ධන කලාපය ලෙස සංවර්ධනය වීමට ඉඩ සලසා දීම අරමුණු කරගෙන ඇත. අවම ඉදිකිරීම් ඝනත්වයකින් යුතුව බහුතර ඉඩම් පරිභරණයක් ඖරිත කලාප සඳහා වෙන් කර තිබීම මෙම කලාපයේ අපේක්ෂිත භූමි නිර්මිතය වේ. ප්‍රධාන වශයෙන් ප්‍රදේශයේ මූලික ආර්ථික ප්‍රභවය ලෙස කෘෂිකර්මාන්තය පවතින බැවින් එය සංවර්ධනය කිරීම සඳහාද මෙම ප්‍රදේශය අඩු ඝනත්වයෙන් යුතුව පවත්වාගැනීමේ අරමුණු වී ඇත. මෙම ප්‍රදේශය අඩු ඝනත්වයෙන් යුතු සංවර්ධනයක් ඇති විය යුතු බවට තීරණය කිරීම සඳහා එහි දක්නට ලැබෙන පාරිසරික සංවේදී ලක්ෂණ, උස් බිම් සහ නාය යාම් අවදානම් සහිත ආපදා ප්‍රදේශ යන කරුණු පදනම් විය.

යෝජිත උපදේශාත්මක සැලසුම් ප්‍රදේශය

රඹුක්කන ප්‍රදේශයේ මෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේද පවතින එකම සංචාරක කලාපය ලෙස පින්නවල සංචාරක කලාපය අයත් ප්‍රදේශයේ කේන්ද්‍ර කරගනිමින් කරඹුපන ඉන්දියෙන් ආරම්භ වී බතඹුරේ පොදු ක්‍රීඩාංගණය දක්වා කෑගල්ල-රඹුක්කන මාර්ගය දිගේ මීටර් 400 බැගින් දෙපසට තීරුව ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කර ඇත (ඇමුණුම 10). එබැවින් මෙම කලාපයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා දීමේදී එහි මුහුණත, උස හා අනුමත වර්ණයන් පිළිබඳව උපදේශාත්මක මග පෙන්වීමක් ලබා දිය යුතු බවට හඳුනාගෙන ඇත.

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

6.3.3 ඝනත්ව කලාපකරණය සහ මාර්ගෝපදේශ මත පදනම්ව ජනාවාස ව්‍යාප්තිය පවත්වාගෙන යාම

අවකාශීය සංවර්ධන
උපායමාර්ග සැලැස්ම

උපායමාර්ග 03

ඝනත්වය සහ විවිධත්වය මත පදනම්ව නාගරික නේවාසික ප්‍රදේශය , අධි ඝනත්ව නේවාසික ප්‍රවර්ධන ප්‍රදේශය, අඩු ඝනත්ව නේවාසික ප්‍රවර්ධන ප්‍රදේශය සහ යෝජිත උපදේශාත්මක සැලසුම් ප්‍රදේශය (සංචාරක කලාපය) යන ප්‍රධාන ප්‍රදේශ ඔතර පදනම් කර ගනිමින් ඝනත්වය පවත්වාගෙන යා යුතු ආකාරය පහත දැක්වෙන ඔරස්කඩ මගින් පැහැදිලි කර ඇත.

මෙහිදී A-B මගින් රඹුක්කන නගරයේ අධි ඝනත්වයෙන් යුතුව ජනාවාස සංවර්ධනය වීමටත් C-D මගින් පින්නවල සංචාරක කලාපයේ සහ E – F මගින් දැක්වෙන යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය පිවිසුම් ප්‍රදේශයේ මධ්‍ය ඝනත්වයෙන් යුතුව ජනාවාස සංවර්ධනය වීමටත් G – H අලගල්ල කන්ද ආශ්‍රිත ග්‍රාමීය ප්‍රදේශය අඩු ඝනත්වයෙන් යුතුව ජනාවාස සංවර්ධනය වීමටත් ඝනත්ව කලාපකරණය සහ රෙගුලාසි නැළින් මාර්ගෝපදේශ ඔඳුන්වා දී ඇත.

රූප සටහන 6.5: යෝජිත කලාපීකරණ සැලැස්මට අනුව ඝනත්වය පවත්වාගෙන යා යුතු ආකාරය දැක්වෙන ඔරස්කඩ

A- B රඹුක්කන නගරය



***C - D** පින්නවල සංචාරක කලාපය*



***E – F** යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග පිවිසුම් ප්‍රදේශය*



***G – H** අලගල්ල කන්ද ආශ්‍රිත ග්‍රාමීය ප්‍රදේශය*



සිතියම 6.2: යෝජිත කලාපීකරණ සැලැස්මට අනුව ඝනත්වය පවත්වාගෙන යා යුතු ආකාරය දැක්වෙන සිතියම



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

6.4 අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම

අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම

රඹුක්කන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන සියලුම ජනතාව සඳහා ජීවත්වීමට සුදුසු වාසස්ථාන සහිත පඟසුකම් සමානාත්මතාවයෙන් යුතුව සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම අපරවයුඟ පඟසුකම් සංවර්ධනය උපායමාර්ගය හඳුන්වා දී ඇත. මෙහිදී ඉහළ මාර්ග සම්බන්ධතාවයක්, කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක්, නිවාස, සෞඛ්‍ය හා අධ්‍යාපන පඟසුකම් සහතික කිරීම මගින් රඹුක්කන නගර මධ්‍යයේ පමණක් නොව පර්යන්ත ප්‍රදේශවල විෂමතාව අවම කිරීම මූලික අරමුණ වී ඇත. අපරවයුඟ පඟසුකම් සංවර්ධන කිරීමේ උපායමාර්ගික සැලැස්ම ප්‍රධාන අංශ දෙකක් වන භෞතික අපරවයුඟ පඟසුකම් හා සමාජීය අපරවයුඟ පඟසුකම් වශයෙන් වර්ගීකරණය කර දක්වා ඇත.

සාමාජීය අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ග

රූප සටහන 6.6: අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ගය වර්ගීකරණය



6.4.1 සාමාජීය අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ග

සාමාජීය අපරවයුඟ පඟසුකම් සංවර්ධනය යටතේ නේවාසික, සෞඛ්‍ය හා අධ්‍යාපන යන ප්‍රධාන සාමාජීය අපරවයුඟ පඟසුකම් අංශ යටතේ අධ්‍යයනය කරමින් වර්ෂ 2033 සඳහා වන සංවර්ධන උපායමාර්ග හඳුනාගෙන ඇත.

අ) නිවාස

සියලු නේවාසික ජනතාවට ජීවත්වීමට උචිත ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමේදී ඊට අවශ්‍ය නේවාසික පඟසුකම් ඵලදායී ලෙස සැපයීම මෙහි මූලික අරමුණ වේ. මෙම සැලසුම් ප්‍රදේශයේ 2022 වන විට පවුල් 24,817 ක් පමණ ජීවත් වේ. 2033 වන විට ජනගහන ප්‍රක්ෂේපනය කිරීම සඳහා සමාන්‍ය ජනගහන වර්ධනය සහ සැලැස්මෙන් අපේක්ෂිත සංවර්ධනය යන දෙකම සැලකිල්ලට ගෙන 134,647 ක ජනගහනයක්

ඇතිවේ යැයි ගණනය කරන ලදී. ඒ අනුව එක් පවුල් ඒකකයක් තුළ පුද්ගලයින් 4 දෙනෙකු සිටින බවට උපකල්පනය කර ගණනය කළ විට 33,662 ක නිවාස ප්‍රමාණයක් 2033 වන විට රඹුක්කන ප්‍රදේශය තුළ ස්ථාපිත වීමට ඉඩකඩ අවශ්‍ය බව පැහැදිලි විය. මෙම ප්‍රදේශයේ සංවර්ධනය කළ හැකි වැඩි භූමි ප්‍රමාණයක් පවතින බැවින් ඊට අවශ්‍ය ඉඩකඩ සපයා ගැනීම කළ හැකිය.

ආපදා අවධානම පිළිබඳව සැලකිල්ලට ගැනීමේදී නාය යෑම් අවධානම් සහිත ප්‍රදේශ ලෙස උඩගල්දෙනිය, මුවන්කන්ද, ඔතරලියද්ද වැනි ප්‍රදේශ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය හඳුනාගෙන ඇත. 2021 උඩගල්දෙනිය ප්‍රදේශයේ සිදු වූ නාය යෑම නිසා ජීවිත සහ දේපළ හානි සිදු විය. මෙවැනි ප්‍රදේශ නේවාසික භාවිතය සඳහා සුදුසු නොවන අතර එවැනි ප්‍රදේශ හඳුනාගෙන ජනතාවගේ ආරක්ෂාව සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍යය.

උපායමාර්ග

I. නායයෑම් අවධානමක් සහිත ප්‍රදේශ හඳුනාගෙන (ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය පෙන්වා දී ඇති කලාප) ආපදා අවධානම් රහිත ප්‍රදේශ තුළ නැවත පදිංචි කිරීම.
II. සියලුම අදාළ රාජ්‍ය ආයතන ඒකාබද්ධව නිවාස අවශ්‍යතාවය සහිත පවුල් හඳුනාගෙන අවශ්‍ය සහන සැලසීම.
III. මධ්‍යම පාන්තික නිවාස අවශ්‍යතාව සපුරාලීම සඳහා නිවාස යොජනා ක්‍රම ආරම්භ කළ හැකි ස්ථාන ලෙස හඳුනාගෙන ඇති පහත ඉඩම්වල නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

වගුව 6.2: නිවාස යෝජනා ක්‍රම ආරම්භ කළ හැකි ස්ථාන

අනු අංකය	ග්‍රා.නි.වසම	ඉඩමේ නම	පිහිටීම	විශාලත්වය	අයිතිය
1	යටගම	කොරස්සවත්ත රබර් ඉඩම	යටගම වසම තුළ	අක් 80 පමණ	කෑගලු වැවිලි සමාගම
2	පුවක්මොටේ	වැල්ගාල කන්ද ජනපදය	කඳු සහිත	අක් 10	රජය සතු
3	කෙම්පිටිය	කෙම්පිටිය වත්ත	පත්තම්පිටිය	අක් 20	රජය සතු

මූලාශ්‍රය: සම්පත් පැතිකඩ, 2019

2033 වන විට කලාප සැලැස්මට අනුව නිවාස අවශ්‍යතාවය 33,662 ක් වන අතර ඒ සඳහා භූමිය වෙන් කිරීම කලාපීකරණය අනුව පහත පරිදි බෙදා වෙන් කර දක්වා ඇති අතර 50% කට වැඩි නිවාස ප්‍රමාණයක් නේවාසික කලාප තුනෙහි ස්ථාපිත වන අයුරින් පවතින සංවර්ධිත භූමිය වෙන් කර තැබිය යුතු බව හඳුනාගෙන ඇත.

වගුව 6.3 : කලාප අනුව නේවාසික අවශ්‍යතාවය -2033

සංවර්ධන කලාපය	උප සංවර්ධන කලාපය	නේවාසික ජනඝනය - 2033	2033 වන විට අවශ්‍ය නිවාස සංඛ්‍යාව
නේවාසික කලාපය	අධි ඝනත්ව නේවාසික කලාපය	23118	5780
	මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය	68230	17,057
	අඩු ඝනත්ව නේවාසික කලාපය	25269	6317
වාණිජ කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය	3881	970
	මධ්‍ය ඝනත්ව වාණිජ කලාපය	3537	884
කර්මාන්ත කලාපය	මධ්‍ය ඝනත්ව කර්මාන්ත කලාපය	1916	479
සංචාරක සංවර්ධන කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය	4364	1091
	අඩු ඝනත්ව සංචාරක කලාපය	4332	1083
කෘෂිකාර්මික කලාපය	කෘෂිකාර්මික කලාපය -I (කුඹුරු)	-	-
සංවේදී සංරක්ෂණ කලාපය	අධි සංවේදී වනාන්තර සංරක්ෂණ කලාපය	-	-
මුළු ගණන		134,647	33,662

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

ආ) සෞඛ්‍ය

යම් ප්‍රදේශයක ජීවත්වන ජනතාව නීරෝගී ජනතාවක් ලෙස කායික සහ මානසික සෞඛ්‍ය තත්ත්වය යහපත් මට්ටමක පවත්වාගෙන යාම සඳහා මෙම සෞඛ්‍ය අංශයට අදාළ අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීම වැදගත්ය. රඹුක්කන දිසා රෝහල ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන සෞඛ්‍ය මධ්‍යස්ථානය ලෙස පවතින අතර මෙම රෝහල ලොව පුරා පැතිර ගිය කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වය පවතින අවස්ථාවේදී රට පුරා සිටි ජනතාවට ප්‍රතිකාර කිරීම සඳහා යොදාගත් කැපී පෙනුනු රෝහලක් බවට පත්විය. රෝහල් කාර්ය මණ්ඩලය සහ පරිපාලන අංශය විශාල කැපකිරීමක් එම රෝගීන් සඳහා සිදු කළ බව දැකගත හැකි විය.

එමෙන්ම පින්නවල සහ වල්ගම ආයුර්වේද රෝහල් 2ක් පිහිටා ඇති අතර ඒවා ප්‍රදේශයේ මෙන්ම කලාපයේ ජනතාව සඳහාද නොමද සේවාවක් සපයයි. උඩබැද්දවල ප්‍රදේශයේ පවතින මධ්‍යම බෙහෙත් ශාලාවද අවට පිවත්වන ජනතාවට තම අවශ්‍යතා සපුරා ගැනීමට විශාල දායකත්වයක් ලබා දේ.

උපායමාර්ග

I. 2033 වන විට අපේක්ෂිත ජනගහනය සඳහා ප්‍රමාණවත් හා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීම.
II. වැඩි සංචාරක ආකර්ෂණයක් ලබා ගැනීම සඳහා සුවතා හා පංචකර්ම පහසුකම් ප්‍රදේශය තුළ ඇති කිරීම.
III. එලිමහන් විනෝද කටයුතු ආශ්‍රිත පහසුකම් සැපයීම තුළින් ජනතාවගේ මානසික සෞඛ්‍ය යහපත් මට්ටමක පවත්වාගැනීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.

රූප සටහන 6.7: සංචාරකයින් ඉලක්ක කරගත් සුවතා හා පංචකර්ම වැඩසටහන්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා සුවතා සහ වෛද්‍ය සංචාරක - ශ්‍රී ලංකාවේ ආයුර්වේද සංචාරක (srilankabusiness.com)

සිතියම 6.3: රෝහල් පෝෂිත ප්‍රදේශ හා අනෙකුත් සෞඛ්‍ය පහසුකම්



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

ඇ) අධ්‍යාපනය

මූලික අධ්‍යාපන පහසුකම් සපුරාලීම සඳහා දැනට මෙම ප්‍රදේශය තුළ පාසල් 44ක් පමණ පිහිටා ඇති අතර එය ප්‍රමාණවත් මට්ටමක පවතී. පින්නවල ජාතික පාසල ප්‍රදේශයේ පිහිටි ප්‍රධානම ජාතික පාසල වන අතර එය ප්‍රදේශයේ පමණක් නොව මුළු දිවයිනේම ළමුන් අධ්‍යාපනික වශයෙන් කැපී පෙනෙන දස්කම් දක්වන පාසලක් ලෙස ප්‍රසිද්ධියක් උසුලයි. මෙලෙස මූලික අධ්‍යාපන පහසුකම් ප්‍රමාණවත් වුවද වෘත්තීය පුහුණු අධ්‍යාපනය සඳහා දැනට පවතින පහසුකම් වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක බවක් දක්නට නැත. විශේෂයෙන් සංචාරක කර්මාන්තය ඇතුළු අනෙකුත් කුඩා කර්මාන්ත බොහෝ ප්‍රමාණයක් පවතින ප්‍රදේශයක් ලෙස ඒවා වැඩිදියුණු කිරීම සඳහා වෘත්තීය අධ්‍යාපනය තවදුරටත් සංවර්ධනය විය යුතු බව මෙම සැලැස්ම තුලින් හඳුනාගෙන ඇත.

උපායමාර්ග

- පාසල් දරුවන්ගේ ආරක්ෂාව සඳහා මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් හඳුනාගත් පාසල් අසළ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම.
- පාසල් හැර යන සිසුන් සඳහා උසස් අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු අවස්ථා වැඩි කිරීමේ අරමුණින් කෘෂිකාර්මාන්තය සහ සංචාරක කර්මාන්තය ඉලක්ක කරගත් අපරවයුහ පහසුකම් වැඩිදියුණු කිරීම.

සිතියම 6.4: පාසල් පෝෂිත ප්‍රදේශ සහ අනෙකුත් අධ්‍යාපන පහසුකම්



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

ඈ) ප්‍රවාහනය

රඹුක්කන නගරයේ ප්‍රවාහන පද්ධතිය ප්‍රධාන වශයෙන් බස්රථ හා දුම්රිය පදනම් කරගෙන ගොඩනැගී ඇත. ප්‍රධාන බස් නැවතුම්පොළ හා දුම්රිය ස්ථානය නගර මධ්‍යයේම පිහිටා තිබුද සෘජු භෞතික සම්බන්ධතාවයක් දක්නට නොලැබේ. රඹුක්කන නගරයේ ගමනාගමන මණ්ඩලයට අයත් බස් නැවතුම්පොළ හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් බස් නැවතුම්පොළ වශයෙන් බස් නැවතුම්පොළවල් දෙකක් පිහිටා ඇති අතර එය කටුපිටිය-කුරුණෑගල මාර්ගයේ දෙපසට වන්නට පිහිටා ඇත.එබැවින් නගර මධ්‍යයේ වාහන තදබදය, බස් රථ හැරවීමට ප්‍රමාණවත් ඉඩක් නොමැති වීම, අවම මගී යටිතල පහසුකම් පැවතිම වැනි ගැටලු මෙහි හඳුනාගත් හැකිය. තවද යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සහ 2033 වන විට අනාගත ජනගහන වර්ධනයත් සමඟ දැනට පවතින බස් නැවතුම්පොළ ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නොවනු ඇත. එමෙන්ම නගර මධ්‍යයේ වාණිජ ඉල්ලුම සපුරාලීම සඳහා පවතින භූමිය මනා ලෙස කලමනාකාරණය කර ගනිමින් වාණිජ අවකාශයන් වැඩි කර ගැනීමද ප්‍රවාහන සැලැස්ම තුළින් අපේක්ෂා කෙරේ.

රඹුක්කන දුම්රිය ස්ථානය ප්‍රතිසංවර්ධනය, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගැසට් කළ රඹුක්කන සංවර්ධන සැලැස්ම-2012-2020 තුළින් ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන සියලු පහසුකම් සහිතව සංවර්ධනය කර ඇත. පින්නවල සංචාරක කලාපය නැරඹීමට දුම්රිය ප්‍රවාහනය භාවිතයෙන් පැමිණෙන සංචාරකයින් අවම මට්ටමක පවතින බැවින් එය ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම අවශ්‍ය බව මෙම සැලැස්ම තුළින් හඳුනාගෙන ඇත.

උපාය මාර්ග

1. මගීන්ගේ ගමන් පහසුව සඳහා අවශ්‍ය වන නගර මධ්‍යයේ ඇති ප්‍රවාහන අපරවයුහ පහසුකම් ප්‍රතිසංවර්ධනය කිරීම.

වාහන නැවතුම්පොළ පහසුකම් පිළිබඳව සලකා බැලීමේදී රඹුක්කන පොදු රථගාල හා වාණිජ සංකීර්ණය ව්‍යාපෘතියේ අදියර 1 යටතේ 2021 වර්ෂයේදී වාහන නැවතුම් 59ක් සහිතව පොදු රථගාල ඉදිකර අවසන් කර ඇත. නගරයේ විශාල ගැටලුවක් ලෙස පැවති වාහන නැවතුම්පොළක අවශ්‍යතාවය මෙමගින් සම්පූර්ණ වී ඇත. නමුත් දුම්රිය ස්ථානය හරහා දෛනික රැකියා සඳහා යන විශාල ජනතාවක් සිටින බැවින් ඔවුන් සඳහා දුම්රිය ස්ථානය ආසන්නයේ බයිසිකල්, ත්‍රීරෝදරථ ඇතුළු පුද්ගලික වාහන නවතා තැබිය හැකි ස්ථානයක අවශ්‍යතාය පවතී. මේ සඳහා පුද්ගලික නිවාසවල සකස් වූ තාවකාලික වාහන නැවතුම්පොළවල් ඇතත් නිසි ආරක්ෂාවක් හා කළමනාකරණයක් ඒවායේ දක්නට නොලැබේ.

එමෙන්ම පින්නවල සංචාරක කලාපය සඳහාද දැනට පවතින රථවාහන නැවතුම්පොළ නිසි පහසුකම් සහිතව සංවර්ධනය නොවී තිබීම නිසා එහි භූමිය සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. මෙම රථවාහන නැවතුම්පොළ සංචාරකයින් පැමිණෙන විශාල බස් රථ සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා වෙනත් රථවාහන නැවතුම්පොළක අවශ්‍යතාවය පවතී.

උපාය මාර්ග

2. ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා නගර මධ්‍යයේ සහ පින්නවල සංචාරක කලාපයේ පොදු ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීම හා රථගාල් පහසුකම් ඇති කරලීම.

අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම

රඹුක්කන නගරය සහ පින්නවල සංචාරක කලාපය ආශ්‍රිතව වැඩි ජනගහනයක් සංසරණය වන බැවින් පදික වේදිකා, බයිසිකල් මංතීරු, ගස් සිටුවීම් සහ විදුලි පහන් කනු ඇති කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත. එමෙන්ම යෝජිත අධිවේගී මාර්ග පිවිසුම දක්වාද විශේෂයෙන් සංවර්ධනය විය යුතු බව හඳුනාගෙන ඇති බැවින් එම එක් එක් මාර්ග ඒ ඒ අවශ්‍යතාවය අනුව පදික වේදිකා, බයිසිකල් මංතීරු, සෙවණ ගස් සිටුවීම සහ වීදි ලාම්පු සවිකිරීම කළ යුතුය. විශේෂයෙන්ම බස් පර්යන්තවල සහ දුම්රිය ස්ථානයේ භෞතික පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා G.D. තෝමස් සිල්වා මාවත සහ විකල්ප මාර්ගය පදිකයින් සඳහා පහසුකම් වැඩි දියුණු කර තැබීම කළ යුතුය. සංචාරක කර්මාන්තය සංවර්ධනය කර ගැනීම සඳහා පැමිණෙන සංචාරකයින් නවීන ප්‍රවාහන මාධ්‍යයන් හඳුන්වා දීම තුළින් දුම්රිය හරහා එන සංචාරකයින් රඹුක්කන නගරයට ඇතුල් වීමත් සමඟ ඔවුන් සඳහා බයිසිකල්, ස්කූටර්, ත්‍රිරෝද රථ සේවා පහසුකම් විදිමත් ලෙස සැපයීම කළ යුතුය.

සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග

උපාය මාර්ග

3. සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා විවිධ ප්‍රවාහන මාධ්‍ය සඳහා අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීම.
4. සංචාරක කලාපයේ සංසරණය පහසු කිරීම සඳහා අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීම.

6.4.2 භෞතික අපරවයුහ පහසුකම් සංවර්ධනය

අ) මාර්ග හා ගමනාගමන

යම් නගරයක හෝ ප්‍රදේශයක සංවර්ධනයේ ඉදවන ලෙස හඳුන්වන්නේ එහි මාර්ග පද්ධතියයි. රට හේතුව වන්නේ, එම ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය සඳහා ඍජුවම බලපාන සාධකය මෙය වීමයි. රඹුක්කන ප්‍රදේශයේ පවතින මාර්ග පද්ධතිය කාර්යක්ෂමතාව අඩු වීමේ ගැටලුව මූලික කරගනිමින් විධිමත්, සුවපහසුව සහ කාර්යක්ෂම මාර්ග ජාලයක් ඇති කිරීමේ අවශ්‍යතාවය දැඩිව ඉඳුනාගෙන ඇත. රඹුක්කන නගරයත්, පින්නවල සංචාරක කලාපය සහ යෝජිත වැලිගමුව අධිවේගී මාර්ග හුවමාරුව මූලික කරගෙන මට්ටම් 5කට මාර්ග ජාලය (සිතියම 6.7) වර්ගීකරණයකර ඉඳුනාගත් අතර ඒ අනුව ඉහත කී අරමුණ වෙත ළඟා වීම සඳහා පහත පරිදි ආකාර කිහිපයකින් කටයුතු සැලසුම් කළ යුතුව ඇත.

වගුව 6.4: මාර්ග පද්ධතිය ධුරාවලිය

ධුරාවලිය	මාර්ගය
පළමු පෙළ	කොළඹ-මහනුවර මාර්ගය(A1)
දෙවන පෙළ	කෑගල්ල-රඹුක්කන මාර්ගය, කටුපිටිය-කුරුණෑගල මාර්ගය, දොබේමඩ-කුරුණෑගල මාර්ගය, රඹුක්කන-මාවනැල්ල මාර්ගය, රඹුක්කන-මුවන්කන්ද මාර්ගය, ගලගෙදර - රඹුක්කන මාර්ගය
තුන්වන පෙළ	හේවාදිවෙල - රඹුක්කන මාර්ගය, නාරම්බැද්ද මාර්ගය, රඹුක්කන-වල්ගම මාර්ගය, කිරිවන්දෙනිය-මොලගොඩ මාර්ගය
හතරවන පෙළ	රෝහල මාර්ගය, වහව-රෝහල මාර්ගය, අශෝක විද්‍යාල මාර්ගය, රිරියගොල්ල මාර්ගය, ඩී. එස් සේනානායක මාර්ගය, නිල්වක්ක -රඹුක්කන මාර්ගය, දුනුකේවල මාර්ගය, පදවිගම්පොල මාර්ගය, හලාගිරිය මාර්ගය, කෙම්පිටිය වත්ත මාර්ගය, නවගමුව මාර්ගය, යටිකොටගම මාර්ගය, හදගම මාර්ගය, හුරිමලුව මාර්ගය, මැදගොඩැල්ල මාර්ගය, ගල්වල මාර්ගය, යටිවල්දෙනිය මාර්ගය, හේනේපොල මාර්ගය
පස්වන පෙළ	ඉහත නම් සඳහන් මාර්ග හැර ඉතිරි සියලුම මාර්ග මෙයට ඇතුළත් වේ.

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

සිතියම 6.5: මාර්ග පද්ධති ධූරාවලිය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ඉහත සඳහන් කළ පරිදි හඳුනාගත් මාර්ග ධූරාවලියට අනුව මාර්ග පුළුල් කිරීම සහ පවතින මාර්ග වල තත්ත්වය වැඩි දියුණු කිරීම අපේක්ෂා කරන අතර එම මාර්ග අතුරින් විශේෂයෙන් සංවර්ධනය විය යුතු මාර්ග වගු අංක 6.5 මගින් දැක්වේ. 2012-2020 රඹුක්කන නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනා ගෙන තිබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (රූපසටහන 6.5- ව්‍යාපෘති අංක 8) යටතේ මාර්ග කිහිපයක් සංවර්ධනය කර ඇති අතර තවදුරටත් සංවර්ධනය කළ යුතු මාර්ග සහ මාර්ග කොටස් මෙම සැලැස්ම තුළින් සම්පූර්ණ කිරීම සඳහා හඳුනාගෙන ඇත.

අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම

එම සැලැස්මට අනුව ඟුරිමළුව පාර, අශෝක විද්‍යාල පාර(කොටසක්), මිහිඳු මාවත සංවර්ධනය කර ඇති අතර සේනානායක මාවත, දියසුන්නත පාර තවදුරටත් සංවර්ධනය විය යුතු මාර්ග ලෙස හඳුනාගෙන ඇත. අශෝක විද්‍යාල පාර කොටසක් සංවර්ධනය කර ඇති බැවින් එය පුළුල් කර සම්පූර්ණයෙන් සංවර්ධනය කළ යුතු බව මෙම නව සංවර්ධන සැලැස්ම තුළින් යෝජනා කර ඇත. මීට අමතරව නගර මධ්‍යයේ පවතින කාලීන අවශ්‍යතා අනුව සංවර්ධනය විය යුතු බවට හඳුනාගත් මාර්ගයද *(වගුව 6.5: පුළුල් කිරීමට යෝජිත මාර්ග)* පුළුල් විය යුතු ආකාරය පඟන වගුවේ දැක්වේ.

භෞතික අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ග

රූපසටහන 6.8: 2012-2020 රඹුක්කන නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගෙන තිබූ ව්‍යාපෘති



මූලාශ්‍රය: රඹුක්කන නගර සංවර්ධන සැලැස්ම-2012-2020

වගුව 6.5: පුළුල් කිරීමට යෝජිත මාර්ග

අංකය	පුළුල් කිරීමට යෝජිත මාර්ගය	පුළුල් කිරීමට යෝජිත පළල (මීටර්)
01	කෑගල්ල- රඹුක්කන මාර්ගය (කරඹුපන සිට රඹුක්කන නගරය දක්වා)	9
02	කටුපිටිය - කුරුණෑගල මාර්ගයේ රඹුක්කන නගරයේ සිට අධිවේගී මාර්ග හුවමාරුව(වැලිගමුව) දක්වා	9
03	රඹුක්කන - මාවනැල්ල මාර්ගය කිරිවල්ලපිටිය මංසන්ධිය දක්වා සංවර්ධනය කිරීම	9
04	සේනානායක පාර සංවර්ධනය කිරීම	9
05	කොන්තනාවත්ත-නවගමුව මාර්ගය (පින්නවල අලි අනාථාගාරය අසල)	6
06	එරියාව පාර හරහා වහව පාලම සිට රෝහල දක්වා කොටස	9
07	හදගම මාර්ගය කඩිගමුව-හලගිරිය මාර්ගය දක්වා සම්බන්ධ කරමින් සංවර්ධනය කිරීම (පින්නවල ජාතික පාසල අසල)	6
08	අශෝක විද්‍යාලය මාර්ගය සංවර්ධනය කිරීම	6
09	දැලිවල- තිස්ස විද්‍යාලය මාර්ගය සංවර්ධනය කිරීම	6
10	MOH ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම	6
11	තොමස් සිල්වා මාවත	9
12	සතිපොල වට මාර්ගය	6

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

රඹුක්කන නගරයත් පින්නවල සංචාරක කලාපයත් යෝජිත අධිවේගී මාර්ගයත් පදනම් කරගෙන මෙම මාර්ග සංවර්ධනයන් සැලසුම් කර ඇත. ඒ අනුව රූපසටහන් 6.5, 6.6 හා 6.7 මගින් දක්වා ඇති මාර්ග හරස්කඩ වලින් නගර මධ්‍යය කොටස කටුපිටිය මාර්ගය සංවර්ධනය විය යුතු ආකාරය, කෑගල්ල-රඹුක්කන මාර්ගය සංවර්ධනය විය යුතු ආකාරය සහ කටුපිටිය මාර්ගය අධිවේගී මාර්ග පිවිසුම දක්වා කොටසත්, මාවනැල්ල මාර්ගයේ කිරිවල්ලාපිටිය දක්වාත් සංවර්ධනය විය යුතු ආකාරය පැහැදිලි කර ගත හැක.

රූපසටහන 6.9: කටුපිටිය මාර්ගය (නගර මධ්‍යය කොටස) සංවර්ධනය විය යුතු ආකාරය



රූප සටහන 6.10: කෑගල්ල-රඹුක්කන මාර්ගය සංවර්ධනය විය යුතු ආකාරය



රූප සටහන 6.11: කටුපිටිය මාර්ගය අධිවේගී මාර්ග පිවිසුම දක්වා කොටස සහ මාවනැල්ල මාර්ගයේ කිරිවල්ලාපිටිය දක්වා සංවර්ධනය විය යුතු ආකාරය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

විකල්ප මාර්ග සංවර්ධනය

අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම

රඹුක්කන ප්‍රදේශයේ පවතින මාර්ග සංවර්ධනය කිරීම මෙන්ම නව විකල්ප මාර්ග ඇඳුන්වාදීමෙන් ප්‍රදේශයේ සංවර්ධනය තවදුරටත් වර්ධනය කර ගැනීම අපේක්ෂා කරයි. මෙහිදී විශේෂයෙන්ම සංචාරක කලාපය අරමුණු කරගෙන මාර්ග ජාලය විධිමත් කිරීම සඳහා රඹුක්කන නගරයත් පින්නවලත් අතර අන්තර් සම්බන්ධතාවය වැඩි කිරීම සඳහා සේනානායක මාවත ප්‍රඵල් කර දුම්රිය මාර්ගය හරහා ගුවන් පාලමකින් සම්බන්ධ වී තල්ගස් කුඹුර වත්ත මාර්ගය හා සම්බන්ධ වී පොලිසිය අසලින් නැවත කටුපිටිය-කුරුණෑගල මාර්ගයට වැටෙන ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් යෝජනා කර ඇත. මෙම මාර්ගය සංවර්ධනය කිරීම නිසා රඹුක්කන නගරයේ සිට පින්නවලට ගමන් කිරීමේ දුර සහ කාලය අවම වීම, නගරය මගහැර යා හැකි විකල්ප මාර්ගයක් ලෙස ක්‍රියාත්මක වීම, දුම්රිය මාර්ගය හරහා අනාරක්ෂිත පදික හුවමාරු වීම් වලක්වා ගැනීම වැනි ප්‍රයෝජන රාශියක් ලඟා කර ගත හැකිය.

භෞතික අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ග

එමෙන්ම සංචාරක කර්මාන්තයේ සංවර්ධනය අපේක්ෂා කරගනිමින් විවිධ ප්‍රවාහන මාධ්‍ය ප්‍රවර්ධනය කිරීමට මෙම සැලැස්ම තුළින් අපේක්ෂා කරයි. ඒ සඳහා රඹුක්කන දුම්රිය ස්ථානයේ සිට පින්නවල දක්වා නව දුම්රිය මාර්ගයක් ඉදි කිරීම සඳහා මෙම සැලැස්ම තුළින් යෝජනා කර ඇත. මෙහි ගමන් මාර්ගය මා-ඔය ආසන්නයෙන් ගමන් කරමින් පින්නවල අලි අනාථාගාරය ආසන්න ප්‍රදේශය දක්වා ඉදිකිරීමටත් එහි කුඩා දුම්රිය නැවතුම්පොළක් ඉදි කිරීමටත් සැලසුම් ඉදිරිපත් කර ඇත. මෙමගින් දුම්රිය හරහා පැමිණෙන සංචාරකයින්ට පින්නවල සංචාරක කලාපය නැරඹීම සඳහා සෘජු බලපෑමක් ඇති වන අතර මා-ඔයේ සුන්දරත්වය හා මුසුවූ නැවුම් අත් දැකීමක් ලබා ගැනීමට සංචාරකයින්ට ඉඩ සැලසේ. මෙය සංචාරක ආකර්ෂණය තවදුරටත් වැඩි කර ගැනීමට මෙය හේතු සාධක වේ.

ප්‍රදේශයේ පවතින අවශ්‍යතා අනුව විකල්ප මාර්ග ලෙස හිරිවඩුන්න සමෘද්ධි බැංකුව අසලින් අන්දිරමඩ හරහා පොල්ගහවෙල මාර්ගය සම්බන්ධ කිරීමට කෙටි මාර්ගයක් ඉදිකිරීම සහ කඩිගමුව දුම්රිය බිංගෙය පුරාවිද්‍යාත්මක වස්තුවක් වන බැවින් තවදුරටත් විශාල කළ නොහැකි නිසා විකල්ප මාර්ගයක් ලෙස කඩිගමුව අදාඟනාගරය අසලින් සමෘද්ධි බැංකුව අසලට සම්බන්ධ වන නව විකල්ප මාර්ගයක් ඉදිකිරීම සඳහා මෙම සැලැස්ම තුළින් යෝජනා ඉදිරිපත් කර ඇත.

සිතියම. 6.6: යෝජිත ප්‍රවාහන සැලැස්ම, 2033



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ආ) පානීය ජලය

අපරවයුඟ පඟසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම

ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන පානීය ජල අවශ්‍යතාවයෙන් 80%ක් පමණම ළිං ජලය මගින් සපුරා ගන්නා අතර, ඉතිරි 20% නල ජලය මගින් සපුරා ගනී. මෙම ප්‍රදේශයේ නළ ජලය ලබාදීම ජාතික ජල සම්පාදනය හා ජලපවාහන මණ්ඩලය හා ප්‍රජා ජල යෝජනා ක්‍රම දෙක මගින් ක්‍රියාත්මක වේ. මා-ඔය ප්‍රධාන ජල සැපයුම් මූලාශ්‍රය වන අතර හිරිවඩුන්න පාලම අසල පිහිටි ජල පවිත්‍රාගාරය මගින් ජලය පිරිපහදු කර බෙදා හැරේ. ප්‍රදේශයේ පවතින ළිං ජලය සහ ප්‍රජා ජල යෝජනා ක්‍රම තුළින් ජල අවශ්‍යතාවය සැපිරෙන බැවින් ජල හිඟයක් නොමැති අතර ජාතික ජල සම්පාදනය හා ජලපවාහන මණ්ඩලය පෙන්වා දෙන අන්දමට දැනට පවතින ජල පවිත්‍රාගාරයේ ධාරිතාවය වර්තමානයේ පවතින ඉල්ලුමට ප්‍රමාණවත්ව පවතී.

භෞතික අපරවයුඟ පඟසුකම් සංවර්ධනය

නමුත් පානීය ජල සැපයීමේදී නගර සීමාව තුළ පදික වේදිකාව එකටම යා කර මාර්ගය පුළුල් කිරීම නිසා ඇතැම් ස්ථානවලදී බෙදාහැරීමේ නල පද්ධතිය අකාරාදී පිළිවෙලට සිදුවන බැවින් නව ජල සම්බන්ධතා ලබා දීම ඉතා අපහසු තත්ත්වයක පවතින බව ජාතික ජල සම්පාදනය හා ජලපවාහන මණ්ඩලය පෙන්වා දී ඇත. මෙම ගැටලුවට විසඳීම සඳහා අදාළ ආයතන සියල්ල එකඟතාවයකින් යුතුව කටයුතු කළ යුතුව ඇත. එමෙන්ම ගැමුණු මාවත, හෙට්ටියවත්ත, ඒරියාව, රෝහල පාර ඉහළ කොටස, ස්ටේෂන් පාර, දියසුන්නත, අශෝකපුර, පිංඝේන, අලවත්ත ඉහළ කොටස හා ඉහළ ඇත්වටෙවත්ත යන ප්‍රදේශය වල දැනට පවතින නල පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවන බැවින් තාක්ෂණිකව යෝග්‍ය විජ්කම්භයකින් යුතු නලයක් කඩිනමින් එලිය යුතුව ඇත.

උපාය මාර්ග

- 2033 වන විට අපේක්ෂිත ජනගහන වර්ධනය සඳහා අවශ්‍ය ජල සැපයුම සම්පූර්ණ කිරීමට ප්‍රදේශයේ භෞතික අපරවයුඟ පඟසුකම් සංවර්ධනය කිරීම.
- 2033 වන විට අපේක්ෂිත ජල සැපයුම යෝජිත සංවර්ධන කලාප අනුව ප්‍රමුඛතාගත කිරීම.

2033 වන විට අපේක්ෂිත නේවාසික හා සංසරණ ජනගහනයත් අනුව සලකා බලන විට මුළු ජල අවශ්‍යතාවය ඝන මීටර් 22,020ක් වන බැවින් ඝන මීටර් 20,000 කට වැඩි ධාරිතාවයෙන් යුත් ජල පවිත්‍රාගාරයක් සමඟ බෙදාහැරීම් පද්ධතියක අවශ්‍යතාවයක් පවතී. ඒ සඳහා ජාතික ජල සම්පාදනය හා ජලපවාහන මණ්ඩලය දැනටමත් සැලසුම් සකස් කර ඇති අතර එය ක්‍රියාත්මක කළ යුතුව ඇත. එමෙන්ම අනාගතයේදී තවදුරටත් නේවාසික ජනගහනය සඳහා ඉඩකඩ ලබා දීමේ අරමුණ ඇතිව ඉඳුනාගත් නේවාසික කලාපයන්හි ජල අවශ්‍යතාව 100% ක් සපුරාලීම පිළිබඳව අවධානය යොමු කරමින් 2033 පානීය ජල ඉල්ලුම (වගුව 6.6) හා යෝජිත ජල සැපයුම් සැලැස්ම (සිතියම 6.8) මගින් ඉදිරිපත් කර ඇත.

වගුව 6.6: සංවර්ධන කලාප මට්ටමින් පානීය ජල ඉල්ලුම, 2033

අනු අංකය	සංවර්ධන කලාපය	උප සංවර්ධන කලාපය	නේවාසික ජනඝනය - 2033	එක් පුද්ගලයකු සඳහා නේවාසික ජල අවශ්‍යතාවය (ලීටර්)	මුළු නේවාසික ජල අවශ්‍යතාවය (ලීටර්)
1	නේවාසික කලාපය	අධි ඝනත්ව නේවාසික කලාපය	23118	160	3698880
		මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය	68230		10916800
		අඩු ඝනත්ව නේවාසික කලාපය	25269		4043040
2	වාණිජ කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය	3881		620960
		මධ්‍ය ඝනත්ව වාණිජ කලාපය	3537		565920
3	කර්මාන්ත කලාපය	මධ්‍ය ඝනත්ව කර්මාන්ත කලාපය	1916		306560
4	සංචාරක කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක සංවර්ධන කලාපය	4364		698240
		අඩු ඝනත්ව සංචාරක සංවර්ධන කලාපය	4332		693120
ජල අවශ්‍යතාවය (ලීටර්)					21543520
සංසරණය ජනඝනය- 56,450 X ලීටර් 10= ලීටර් 564,500					564.5
අවශ්‍ය මුළු ජල පරිමාව -ලීටර්					21544084.5
ඝන මීටර්					21,544.08

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

සිතියම 6.7 : යෝජිත ජල සැපයුම් සැලැස්ම, 2033



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

ඇ) විදුලිය හා දත්ත රැහැන්

වර්තමානය වන විට රඹුක්කන සැලසුම් ප්‍රදේශයම ආවරණය කරමින් විදුලි බල සැපයුම සිදු කර ඇති අතර මොලගොඩ උපපොල මඟින් විදුලි අවශ්‍යතාව සපුරගනු ලබයි. සැලසුම් ප්‍රදේශයම ආවරණය වන පරිදී විදුලි රැහැන් ආවරණය කර ඇති අතර දෛනික විදුලි ඉල්ලුමට පවතින සැපයුම් ප්‍රමාණවත් වේ.

උපායමාර්ග

- නේවාසික විදුලි අවශ්‍යතාවය සපුරාලීම සඳහා සූර්ය බලශක්තිය භාවිතයට ප්‍රජාව දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- සංචාරක ව්‍යාපෘතිවල යෝජිත මාර්ග සහ උද්‍යාන ආලෝකකරණය සඳහා නඩත්තු වියදම් අවම කිරීමට පුනර්ජනනීය බලශක්තිය යොදා ගත හැකි අයුරින් භෞතික අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීම.
- සංචාරක ආකර්ෂණ ස්ථාන වෙත පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීම සඳහා වේගවත් අන්තර්ජාල පහසුකම් ඇති කිරීම.

වර්තමානය වන විට දත්ත රැහැන් පද්ධතිය ප්‍රධාන මාර්ග දිගේ අඛණ්ඩව ව්‍යාප්ත කර ඇති අතර සංඥා පහසුකම් ප්‍රමාණවත් නොවන වැලිඟමුව, කිරිවන්දෙනිය, හලාගිරිය, හිරිවඩුන්න-පොල්ගහවෙල මාර්ගය වැනි ප්‍රදේශය කිහිපයක් හඳුනාගත හැකිය. එම ස්ථාන සඳහා අවශ්‍ය ධාරිතාවයෙන් යුක්ත සංඥා කුලුණු සවිකර ප්‍රමාණවත් සංඥා පහසුකම් ලබාදීම අවශ්‍යය. විශේෂයෙන්ම සංචාරකයින් අධික ප්‍රමාණයක් පැමිණෙන දිනවලදී පින්නවල ප්‍රදේශයේ සංඥා ගැටලු ඇති වන බැවින් ඒ සඳහා අවශ්‍ය අධිසංවේදී සංඥා සහ වේගවත් අන්තර්ජාල පහසුකම් සපුරාලීම තුළින් සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම.

පින්නවල හා රඹුක්කන නගරය මූලික කරගෙන ක්‍රියාත්මක කිරීමට යෝජිත උද්‍යාන (උදාහරණයක් ලෙස ඇවිදින මංතීරුව අදියර II) සහ වීදි අලංකරණ ව්‍යාපෘති, සැලැස්ම තුළින් යෝජිත පාපැදි මාර්ගය (සේනානායක මාවත) සහ පින්නවල කලාපයේ පදික වේදිකා ආශ්‍රිතව සූර්ය පැනල සවි කර ප්‍රදේශයේ කටයුතුවලට අවශ්‍ය විදුලි අවශ්‍යතාවය සපුරා ගැනීමටද හැකිය.

රූප සටහන 6.12: සූර්යකෝෂ භාවිතාවන වීදී ලාම්පු හා සූර්ය පැනල සහිත පාපැදි මාර්ගයක්




මූලාශ්‍රය : අන්තර්ජාලය(https://www.theneweconomy.com/energy/technologys-biggest-flops-and-why-solar-roadways-are-set-to-join-them

සිතියම 6.8: විදුලි සැපයුම් සැලැස්ම, 2033



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

ඈ) වැසිජල කාණු හා මළපුවාහන කළමනාකරණය

රඹුක්කන නාගරික බල ප්‍රදේශය තුළ වැසිජල කානු පද්ධතිය මේ වන විට සකස් කර ඇත. නමුත් ස්ථාන දෙකකින් පමණක් (තෝමස් සිල්වා මාවතේ කොටසක් සහ පොදු වෙළඳපල ආසන්නයේ) කානු පද්ධතිය අබණ්ඩව සකස් කිරීමට ඉඩ නොදීම නිසා එහි කානුව සකස් වී නොමැත. 2033 වන විට වැඩි වන ජනඝනය හා සංසරණ ජනඝනය අනුව සලකා බලමින් වැසි ජල කානු පද්ධතිය නගර මධ්‍යයේ සිට තවදුරටත් මධ්‍යය ප්‍රදේශ වලට සංවර්ධනය විය යුතුය. එමෙන්ම පින්නවල සංචාරක කලාපය කේන්ද්‍රය කරගමින් හිරිවඩුන්න පාලම අසල සිට රඹුක්කන නගරය දක්වාම කානු පද්ධතිය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පවතින බවට හඳුනාගෙන ඇත. *(රූප සටහන 6.10 හා 6.11)*

මළපුවාහන කළමනාකරණ පද්ධතියක් ප්‍රදේශය තුළ නොමැති අතර, අනාගත ජනඝනය වර්ධනය හා සංචාරකයින් පැමිණීමේ ප්‍රරෝකතන අනුව ඒ සඳහා සුදුසු ප්‍රදේශයක් වෙන් කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මළපුවාහන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා තිබිය යුතු මූලික අවශ්‍යතා, ඉදි කළ යුතු පද්ධතියේ ප්‍රමාණය හා ඉඩමේ පිහිටීම යන සාධක ජාතික ජල සම්පාදනය හා ජලපවහන මණ්ඩලය විසින් සිදු කරන ලද ගණනය කිරීම් වලට අනුව සැලකිල්ලට ගනිමින් මා-ඔය ජල ප්‍රභවයට ආසන්න සහ නේවාසික ව්‍යාප්තිය අවම මධ්‍ය ඝණත්වය නේවාසික කලාපය තුළ හල්පිටිය ග්‍රාම සේවා වසමට අයත් හල්පිටිය ප්‍රදේශයේ ඉඩමක් යෝජනා කර ඇත.(ඇමුණුම 10)

රූප සටහන 6.13: නගර මධ්‍යයේ අප ජල කානු පද්ධතිය සංවර්ධනය විය යුතු ප්‍රදේශ



මූලාශ්‍රය: රඹුක්කන ප්‍රාදේශිය සභාව, 2022

රූප සටහන 6.14: පින්නවල අප ජල කළමනාකරණය සංවර්ධනය විය යුතු ප්‍රදේශ



මූලාශ්‍රය: රඹුක්කන ප්‍රාදේශිය සභාව, 2022

ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ජීවත්වීමට හිතකර වටපිටාවක් සහිත නගරයක් නිර්මාණය කිරීමේදී කසළ කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය කරුණකි. මේ වන විට නගරයේ කසළ එක් රැස් කිරීම රඹුක්කන ප්‍රාදේශිය සභාව මගින් සිදු කරනු ලබන අතර දෛනිකව කසළ ටොන් 6ක් පමණ එක් රැස් කරයි. මෙලෙස එක් රැස් කරන කසළ සාර්ථක ලෙස ගොන්දෙණියකන්ද ප්‍රදේශයේ ඉඩමකට බැහැර කරනු ලබන අතර එය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අක්කරයක ඉඩමකි. මෙහි කොම්පෝස්ට් ව්‍යාපෘතිය ඉතා සාර්ථකව අන්දමින් ක්‍රියාත්මක වෙමින් පවතින අතර දැනට කසළ කළමනාකරණය පිළිබඳව ගැටලුවක් නොමැත.

රූපසටහන 6.15: ගොන්දෙනිකන්ද කසළ කළමනාකරණ මධ්‍යස්ථානය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

වගුව 6.7: අපේක්ෂිත ඝන අපද්‍රව්‍ය උත්පාදනය,2033

කලාපය	නේවාසික ජනගහනය -2033	අපේක්ෂිත ඝන අපද්‍රව්‍ය උත්පාදනය (T/D)	දෛනික සංසරණ ජනගහනය-2033	අපේක්ෂිත ඝන අපද්‍රව්‍ය උත්පාදනය (T/D)
අධි ඝණත්ව වාණිජ කලාපය	3537	1.5	17,650	7.7
මධ්‍ය ඝණත්ව වාණිජ කලාපය	3881	1.7	8700	3.7
මධ්‍ය ඝණත්ව සංචාරක කලාපය	4364	1.9	24,450	10.7
මුළු ගණන	11,750	5.1	50,800	22.1

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම

භෞතික අපරව්‍යූහ පහසුකම් සංවර්ධනය

දිනකට එක් පුද්ගලයකු බැහැර කරන කසළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 0.4 ලෙස සලකමින් ගණන් බැලූ විට ඉහත වගුවට අනුව 2033 අපේක්ෂිත ඝන අපද්‍රව්‍ය උත්පාදනය මෙට්‍රික් ටොන් 27.2 ක් පමණ වේ. මෙය වාණිජ කලාපවල සහ සංචාරක කලාපය මූලික කරගනිමින් ගණන් බලා ඇති අතර නේවාසිකව එක් රැස් වන කසළ තම ගෙවත්තේ වලදැමීම සහ පිලිස්සීම සඳහා ඉඩකඩ පවතින බවට මෙහිදී උපකල්පනය කර ඇත.

6.5 ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

රඹුක්කන සංවර්ධන සැලැස්ම 2023-2033 යටතේ ආර්ථික සංවර්ධන උපායමාර්ගය ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික කුළුණු වන කෘෂිකාර්මික, සංචාරක හා කර්මාන්ත යන අංශ තුන යටතේ හඳුනාගත් උපායමාර්ග පහතින් දක්වා ඇත. මෙම උපායමාර්ගය පිහිටුවීමේ අරමුණ ලෙස, කලාපීය කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීමට දායක වීම, අගය එකතු කිරීමේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, ආහාර නිෂ්පාදනය සහ විකුණුම් වෙළෙඳපොළ සඳහා ඉඩප්‍රස්ථා වැඩි කිරීම, කෘෂි- සංචාරක සංකල්ප ප්‍රවර්ධනය කිරීම, පුහුණු ශ්‍රමය හා ව්‍යවසායකයින් නඟා සිටුවීම, වැවිලි භෝගවල ගුණාත්මක බව සහ ඵලදායිතාව ඉහළ නැංවීම හා විවිධ ආර්ථික අංශ වල නියැලෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම යනාදිය දැක්විය හැකිය.

කෘෂිකාර්මික, සංචාරක හා කර්මාන්ත යන අංශ තුන යටතේ හඳුනාගත් එක් එක් උපායමාර්ග පහත රූප සටහන මගින් වර්ගීකරණය කර දක්වා ඇත.

රූප සටහන 6.16: ආර්ථික සංවර්ධන උපායමාර්ග වර්ගීකරණය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ආර්ථික සංවර්ධන
උපායමාර්ගික සැලැස්ම

කෘෂි ආර්ථික ප්‍රවර්ධන
උපාය මාර්ගය

6.5.1 කෘෂි ආර්ථික ප්‍රවර්ධන උපාය මාර්ගය

ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ප්‍රධාන අදායම් මාර්ගය ලෙස කෘෂිකාර්මාන්තය ඉදිරියෙන් පවතින බැවින් කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීමට, නිෂ්පාදනවල අගය වර්ධනය කිරීමට, සංචාරක කර්මාන්තයේ කෘෂි යෙදුම් යොදාගැනීමට, ව්‍යවසායකයින් නඟා සිටුවීමට සහ කෘෂි නිෂ්පාදන සඳහා වෙළඳපල වැඩිදියුණු කිරීම සඳහා විවිධ උපායමාර්ග පහත පරිදි හඳුනාගෙන ඇත.

අ) කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීමේ උපාය මාර්ගය

කලාපයේ ආහාර අවශ්‍යතාවය සපුරා ලීම සඳහා ප්‍රදේශයේ පවතින අතහැර දැමූ කුඹුරු ඉඩම් සහ රජයේ ඉඩම් භාවිතා කරමින් කෙටිකාලීන සහ දිගුකාලීන ආහාර බෝග වගාව ප්‍රවර්ධනය කිරීම මෙයින් අදහස් කෙරේ. දැනට ප්‍රදේශයේ හෙක්ටයාර 1476 ක පමණ කුඹුරු වගා කර ඇති අතර අතහැර දැමූ කුඹුරු ඉඩම් හෙක්ටයාර 33.51ක් පවතී. මෙම ඉඩම් කෙටි කාලීන භෝග වගාවට වුවද සුදුසු බැවින් ඒ පිළිබඳව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකාර්ම දෙපාර්තමේන්තුව වැනි ආයතනවල මැදිහත්වීම තුළින් නව සැලසුම් හරහා මෙම අතහැර දැමූ කෘෂිකාර්මික ඉඩම් හඳුනා ගෙන නැවත වගා කිරීමට කටයුතු කිරීමෙන් කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කර ගත හැකිය.

මෙම ප්‍රදේශයේ බොහෝමයක් වගා කටයුතු වැසි ජලය සහ කෘෂිකාර්මික ජලාශ, ඇළ හා අමුණු උපයෝගී කරගෙන සිදු කරයි. වර්තමානය වන විට එක් ජලාශයක් සහ ඇළ හා අමුණු 19ක් පමණ අක්‍රීය මට්ටමේ පවතී. පහත වගු අංක 6.8 හා 6.9 මගින් දක්වා ඇති මෙම කෘෂිකාර්මික ජලාශ, ඇළ හා අමුණු ප්‍රති සංවර්ධනය කර කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කර ගැනීමට දායක කර ගැනීම අවශ්‍යය.

වගු අංක 6.8: ගොන්දෙනිකන්ද ජලාශයේ ක්‍රියාකාරිත්වය

ජලාශය	ජල ධාරිතාවය (අක්කරයට අඩි)	වගා කළ හැකි භූමි ප්‍රමාණය (අක්කර)
ගොන්දෙනිකන්ද ජලාශය	4	20

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, 2019

වගු අංක.6.9: ඇළ හා අමුණුවල ක්‍රියාකාරිත්වය

ඇළ හා අමුණු			
ජල ධාරිතාවය (අක්කරයට අඩි)	අක්‍රීය මට්ටමේ පවතින ඇළ හා අමුණු ගණන	වගා කළ හැකි භූමි ප්‍රමාණය (අක්කර)	දැනට වගා කරන හැකි භූමි ප්‍රමාණය (අක්කර)
1413.541	19	697.05	580.57

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, 2019

ආ) නිෂ්පාදන අගය වර්ධනය කිරීමේ උපාය මාර්ගය

ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික මාර්ගය ලෙස කෘෂිකර්මාන්තය පවතින බැවින් එවායේ නිෂ්පාදන විවිධාංගීකරණය කර අපනයන කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම සහ අගය එකතු කිරීමේ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා යොදා ගැනීම තුළින් ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය හා රැකියා අවස්ථා වැඩි කිරීමට ඉවහල් වේ. මෙම ප්‍රදේශයේ කෙසෙල්, අඹ, රඹුටන් වැනි පලතුරු, ගම්මිරිස්, කෝපි, කොකෝවා වැනි සුළු අපනයනය භෝග සහ කොස්, දෙල්, පොලොස් වැනි අතුරු භෝග රාශියක් පවතින බැවින් ඒවා යොදාගෙන විවිධ නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කළ හැකිය. විශේෂයෙන් පලතුරු සැකසීම සහ ටින් කිරීමේ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ කාබනික පොහොර නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහාද යෝජනා මෙම සැලැස්ම තුළින් පෙන්වා දී ඇත.

මෙවැනි ව්‍යාපෘති USAID – PARTNER වැඩසටහන මඟින්ද හඳුනාගෙන ඇති අතර, රට අදාළ සුදුසු ප්‍රදේශයක් ලෙස රඹුක්කන හඳුනාගෙන ඇති අතර ඒ අනුව මෙම සංවර්ධන සැලැස්ම තුළින් අපනයන කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම සහ අගය එකතු කිරීමේ කර්මාන්තශාලාවක් ඉදි කිරීම සඳහා කර්මාන්ත කලාපය තුළ සුදුසු ස්ථානයක් යෝජනා කර ඇත.

ඇ) කෘෂි නිෂ්පාදන සඳහා විධිමත් සහ ශක්තිමත් වෙළඳපොළ ස්ථාපිත කිරීමේ උපාය මාර්ගය

රඹුක්කන ප්‍රදේශයේ නිෂ්පාදනය කරන කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා විධිමත් සහ ශක්තිමත් වෙළඳපොළක් පැවතීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත. ඒ අනුව රඹුක්කන නගරයේ පිහිටි දුම්රිය භූ දර්ශන කලාපය තුළ සහ වාගොල්ල දිස්ත්‍රික් කෘෂිකාර්මික ගොවිපළ තුළ වෙළඳසැලක් සඳහා ස්ථානයක් වෙන් කර තැබීම වඩාත් සුදුසු බව හඳුනාගන්නා ලදී. නැවුම් එළවළු සහ පලතුරු වැනි දේශීය සහ ප්‍රදේශයට ආවේණික කෘෂි නිෂ්පාදන අලෙවිය තුළින් ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම මෙම උපායමාර්ගය තුළින් අපේක්ෂා කෙරේ.

ඈ) සංචාරක කර්මාන්තයේ කෘෂි යෙදුම් උපාය මාර්ගය

කෘෂි- සංචාරක ව්‍යාපාරය ස්ථාපිත කිරීම සඳහා ආවේණික හා සම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය කිරීම වැදගත්ය. ඒ සඳහා වාගොල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම මධ්‍යස්ථානය සහ මයික් ෆ්ලෝරා ඕකිඩ් වගාව වැනි ආයතන මූලික කරගනිමින් රට අදාළ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් ඇති කිරීම තුළින් ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට ඉවහල් වේ.

ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

කෘෂි ආර්ථික ප්‍රවර්ධන උපාය මාර්ගය

ඉ) කෘෂිකාර්මික අධ්‍යාපනය සහ පුහුණුව වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගය

කෘෂිකාර්මාන්තය නඟා සිටුවීම සඳහා කෘෂිකාර්මික අංශය පිළිබඳ අධ්‍යාපනය සහ පුහුණුව වැඩිදියුණු කිරීම අවශ්‍ය බව හඳුනා ගත් අතර ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් උපයෝගීතා පර්යේෂණ ඒකකය වැඩි දියුණු කර කෘෂිකර්ම විශ්වවිද්‍යාලයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා මෙම සැලැස්ම තුළින් යෝජනාවක් ලෙස ඉදිරිපත් කර ඇත.

ඉහත හඳුනාගත් උපාය මාර්ග වලට අමතරව කෘෂිකාර්මාන්තය නඟා සිටුවීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමද අත්‍යවශ්‍ය අතර ඒ සඳහා ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු(RRBs) හරහා මූල්‍ය පහසුකම් සැපයීම කළ හැකිය. මේ සඳහා දැනටමත් පින්නවල ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ගොවිජන බැංකුවක්, නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර ඇත. මීට අමතරව ප්‍රජා පාදක සංවිධාන (CBOs) සඳහා අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීමද මෙම සැලැස්ම තුළින් හඳුනාගෙන ඇත.

ඊ) ප්‍රදේශයේ වඳුරන්ගෙන් සිදුවන වගා හානි සඳහා දිගුකාලීන හා කෙටිකාලීන මැදිහත්වීම් ප්‍රවර්ධනය කිරීම

රඹුක්කන ප්‍රදේශයේ විශාල ගැටලුවක්ව පවතින වඳුරන් සිදු කරන වගා හානි නිසා කිසිදු කෘෂිකාර්මික වගාවක් සාර්ථකව සිදු කර ගැනීමට නොහැකි වී ඇත. මෙම ගැටලුව මූලික කරගෙන කෙටිකාලීන හා දිගුකාලීන මැදිහත්වීම් තුළින් වඳුරු උවදුර පාලනය කිරීම සඳහා උපාය මාර්ගවල සංයෝජන අවශ්‍ය වේ.

දිගුකාලීන මැදිහත්වීම් ලෙස වනාන්තරවල ආහාර කලාප මායිම් වෙන් කිරීම වැනි ප්‍රායෝගික උපායමාර්ග මෙහිදී යෝජනා කර ඇත. මෙහිදී වඳුරන් වැඩි වශයෙන් ප්‍රිය කරන පළතුරු වගාවන් සිදු කිරීම තුළින් මෙම සතුන් තම ආහාර අවශ්‍යතාවය සඳහා වනාන්තර ප්‍රදේශයන් වලට සීමා කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. එමෙන්ම පින්නවල අලි අනාථාගාරයේ සහ සත්වෝද්‍යානයේ ඉතිරි වන එළවළු සහ පලතුරු හඳුනාගත් වනාන්තර කලාපවලට දැමීමද කළ හැකිය. මෙම ක්‍රියාදාමයට අමතරව ක්‍රමානුකූලව වඳුරන් වන්ධ්‍යාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමද ආයතන මට්ටමින් මැදිහත් වීම් සිදු කිරීමද අත්‍යවශ්‍යය. එය අදාළ දෙපාර්තමේන්තු හා ආයතන අන්තර් සම්බන්ධීකරණයක් තුළින් කළ යුතුය.

කෙටිකාලීන මැදිහත් වීම් ලෙස කෘෂි වගා බිම් සඳහා සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජෙව ධිවනි භාවිතය, වඳුරන් බිය ගන්වන නුවක්කු භාවිතය, නවීන වඳුරු උගුල් භාවිතය වැනි තාවකාලික ක්‍රියාකාරකම් තුළින්ද තරමක් දුරට හෝ මෙම වඳුරු උවදුර පාලනය කර ගත හැකිය.

6.5.2 සංචාරක ප්‍රවර්ධන උපාය මාර්ගය

පින්නවල අලි අනාථාගාරය මූලික කරගෙන නිර්මාණය වී ඇති සංචාරක කර්මාන්තය රඹුක්කන ප්‍රදේශයේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයයි. මෙම කලාපය තුළින් මිනිස්සුගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීමට සඳහා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 5000 කට වඩා වැඩි ප්‍රමාණයක් උත්පාදනය වී ඇත. කෑගල්ල දිස්ත්‍රික්කයේ එකම ගැසට් කරන ලද සංචාරක කලාපය ලෙස ප්‍රදේශයේ පවතින ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් හා තවදුරටත් සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සංවර්ධනය විය යුතු අතර ඒවා මෙම සංචාරක ප්‍රවර්ධන උපාය මාර්ගය තුළින් පහත පරිදී හඳුනාගෙන ඇත.

මෙහිදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර ඇති “උපායමාර්ගික සංචාරක සැලැස්ම 2022-2025” සහ පින්නවල අලි අනාථාගාරය සහ සත්නුවත්ත ඒකාබද්ධව සකස් කරන මූලික සැලසුම් අදියරේ පවතින සංචාරක සංවර්ධන සැලැස්මෙහි අදහස් හා යෝජනා යනාදිය සැලකිල්ලට ගනිමින් මෙම උපාය මාර්ගය හඳුනාගෙන ඇත.

අ) ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගය

සංචාරක සංවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම ප්‍රවාහනය සහ පිවිසුම් දොරටු සංවර්ධනය කළ යුතු බව හඳුනාගෙන ඇත. මෙහිදී ප්‍රධාන පිවිසුම් දොරටු ලෙස කරඹුපන හන්දිය, රඹුක්කන දුම්රිය ස්ථානය සහ වැලිගමුව යන ස්ථාන සංවර්ධනය කළ යුතුය. සංචාරක සංචරණය වැඩි දියුණු කිරීම සඳහා මාර්ග, පදික වේදිකා, වීදි ලාම්පු හා මාර්ග සංඥා වැඩිදියුණු කිරීම, සංචාරක කර්මාන්තය අරමුණු කරගත් ඔටල් සේවාවන් /කුලී වාහන සහ බයිසිකල් මංතීරුවක් සඳහා ඉඩකඩ වෙන් කිරීම වැනි ප්‍රවාහන සේවාවන් ඇති කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම මෙම උපායමාර්ග තුළින් පෙන්වා දී ඇත.

සිතියම 6.9: ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ සංචාරක සංවර්ධන උපායමාර්ගය උපායමාර්ගය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

ආ) සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ අලෙවිකරණ උපාය මාර්ගය

- දැනට පවතින ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම

අලි නෑවීම, කිරිපෙවිම, පලතුරු කෑවීම යන ක්‍රියාකාරකම් දැනට පවතින ක්‍රියාකාරකම් වන අතර ඒවා සඳහා සංචාරකයින් සහසම්බන්ධ වීම ඉතා අවම මට්ටමක පවතී. දැනට ක්‍රියාත්මක වැඩසටහන් විවිධත්වයකින් තොරවීම, විවිධ නව ක්‍රියාකාරකම් හඳුන්වා නොදීම වැනි ගැටලු නිසා සංචාරක ආකර්ෂණය ක්‍රමයෙන් අඩු වෙමින් පවතින බවක් දක්නට ලැබේ.

අලි නෑවීමේ ක්‍රියාකාරකම ඉතා ජනප්‍රිය අංගයක් වුවද තායිලන්තයේ ෆුකෙට් අලි අභයභූමිය අලි නෑවීමේ ක්‍රියාකාරකම (උදාහරණයක් ලෙස) හා සසඳන විට පින්නවලට පැමිණෙන සංචාරකයින් උනන්දුවෙන් සහභාගි වන ආකාරයක් දක්නට නොලැබේ (රූප සටහන 6.15, 6.16). සංචාරකයින් මේ සඳහා බියක් දක්වන අතර රට ප්‍රධාන හේතුවක් ලෙස පින්නවල අලි වර්ගීකරණය කිරීමකින් තොරව නෑවීම සඳහා රැගෙන යාම දැක්විය හැකිය. දරුණු නැති අලියන් සහ අලි පැටවුන් මේ සඳහා යොදාගත හැකි අතර එහි ප්‍රායෝගිකභාවය පිළිබඳව සලකා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අලි අනාථාගාරයේ කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය.

එපමණක් නොව මෙවැනි ජල ක්‍රියාකාරකම් සඳහා පැමිණෙන සංචාරකයින් උනන්දුවක් දැක්වුවද ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් (ඇදුම් මාරු කිරීමට සහ සනීපාරක්ෂක පහසුකම්) සඳහා පොදු ස්ථානයක් නොමැති වීමද මේ සඳහා දිරිමත් නොවීමට හේතු වී ඇත.

උපායමාර්ග

- අලි අනාථාගාරයේ නිසි කළමනාකාරිත්ව වැඩපිළිවෙළක් සකස් කර සංචාරකයින් ක්‍රියාකාරකම් සඳහා සහසම්බන්ධ කර ගැනීම වැඩි කිරීම.
- සංචාරකයින්ට විනෝද විය හැකි නව ක්‍රියාකාරකම් හඳුන්වා දීම සහ පවතින ක්‍රියාකාරකම්වල විවිධත්වය වැඩි කිරීම.
- මා-ඔය ආසන්නව පහසුකම් මධ්‍යස්ථානයක් (ඇදුම් මාරු කිරීමට සහ සනීපාරක්ෂක පහසුකම්) ඇති කිරීම.

පැමිණෙන සංචාරකයින් බොහොමයක් පින්නවල අලි අනාථාගාරය පමණක් නරඹන අතර මෙය කලාපයක් ලෙස ක්‍රියාත්මක වන බවක් නොතිබුණු බැවින් කාලීන අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන 2023 වර්ෂය වන විට සත්වෝද්‍යානය සහ අලි අනාථාගාරය යන ස්ථාන දෙකම එකම ටිකට පතකින් නැරඹීමට හැකි වන පරිදි කොම්බෝ ටිකට් පතක් (රූප සටහන 6.17) නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර ඇත. එමෙන්ම අලෙවිකරණ උපායමාර්ගයක් ලෙස පින්නවල සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය සංවර්ධනය කර පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත. තවද මෙතෙක් ක්‍රියාත්මක නොවූ මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රවේශපත්‍ර වෙන් කරවා ගැනීම සඳහාද ශ්‍රී ලංකාව මොබිටෙල් ආයතනය සමඟ එක්ව ඒ සඳහා

අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතී. ඒ තුළින් විදේශීය සංචාරකයින් හට ඕනෑම ස්ථානයක සිට ප්‍රවේශපත්‍ර වෙන් කරවා ගැනීමේ පහසුව සලසා ඇත.

රූපසටහන 6.17: නිකුත් කර ඇති කොම්බෝ ටිකට් පතේ මිල ගණන්



රූප සටහන 6.18: නායිලන්තයේ ෆුකෙට් අලි අභයභූමිය නැවීම



රූප සටහන 6.19: පින්නවල අලි නෑවීම



මීට අමතරව ප්‍රදේශයේ සහ කලාපය තුළ පවතින සංචාරක ආකර්ශනීය ස්ථාන පදනම් කරගෙන පූර්ණ දිනයක් සංචාරය කළ හැකි අයුරින් සංචාරක පැකේජයක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමද අවශ්‍යය. විශේෂයෙන් අලගල්ල හා ගබ්බල කඳු ප්‍රදේශයන් කඳු නැගීම, පදවිගම්පොල ගල්මැස්ස හා දැලිවල කොට වෙහෙර වැනි පුරාවිද්‍යා ස්ථාන, සංචාරක නැරඹුම් ස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම මේ තුළින් කළ හැකිය. තවද පින්නවල සංචාරක කලාපය එක් කලාපයක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා ප්‍රවේශපත් නිකුත් කිරීම ඇතුළු අනෙකුත් පරිපාලනමය කටයුතුද අදාළ ආයතන අතර අන්තර් සම්බන්ධීකරණයක් තුළින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයද පවතින බව හඳුනාගෙන ඇත.

- දේශීය සහ විදේශීය උනන්දුවක් දක්වන කණ්ඩායම් අතර ස්වේච්ඡා සේවා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම

ස්වේච්ඡා සේවා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම ලොව පුරා ප්‍රචලිත ක්‍රියාකාරකමක් ලෙස දැක්විය හැකිය. මෙම වැඩසටහන් සංවිධානය කිරීම තුළින් පින්නවල පිළිබඳව සංචාරක ප්‍රචාරණය ප්‍රළුල් වන අතර එය විවිධ

සමාජ කණ්ඩායම් හා සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කළ හැකිය. වර්තමානය වන විට පින්නවල අලි අනාථාගාරය නැළ පිරිසිදු කිරීමේ කටයුතුවලට ස්වේච්ඡා කණ්ඩායම් ලෙස ඉදිරිපත්ව කටයුතු කරන අතර ඔවුන් සඳහා වටිනා සහතික පතක්ද නිකුත් කෙරේ (රූප සටහන 6.20). එවැනි ප්‍රවර්ධනය කටයුතු දිගු කාලීනව පවත්වාගෙන යාමෙන් නඩත්තු වියදම් අවම කර ගැනීමටද හැකියාව ලැබේ.

නඩත්තු කටයුතු සඳහා පමණක් නොව විවිධ අධ්‍යාපනික ක්‍රියාකාරකම් සඳහාද ස්වේච්ඡා සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත්ය. විශේෂයෙන් කුඩා දරුවන් චිත්‍ර ඇඳීම වැනි ක්‍රියාකාරකම් සඳහා විශාල ප්‍රියතාවයක් දක්වන බැවින් ඒ සඳහා ස්වේච්ඡා සේවා වැඩසටහන් සංවිධානය කර ඒ සඳහා දරුණු නොවන අලි පැටවුන් සහ අලි ඇතුන් යොදා ගනිමින් දේශීය සහ විදේශීය උනන්දුවක් දක්වන කණ්ඩායම් අතර එවැනි ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම කළ හැකිය. මෙවැනි ස්වේච්ඡා වැඩසටහන් තායිලන්තයේ ෆුකෙට් අලි අභයභූමිය තුළ මනාව සිදුවන අකාරය (රූප සටහන 6.21) මගින් දැකගත හැකිය. පින්නවල සංචාරක කලාපය තුළ මෙවැනි ක්‍රියාකාරකම් සඳහාද අවශ්‍ය පහසුකම් හා පසුබිම වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

රූප සටහන 6.20: පින්නවල අලි අනාථාගාරය ස්වේච්ඡා සේවා වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය



මූලාශ්‍රය: පින්නවල අලි අනාථාගාරය, මුහුණුපොත (අන්තර්ජාලය ඇසුරිනි)

රූප සටහන 6.21: තායිලන්තයේ ෆුකෙට් අලි අභයභූමිය තුළ ස්වේච්ඡා සේවා වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය



මූලාශ්‍රය: https://elephantjunglesanctuary.com/phuket/ (අන්තර්ජාලය ඇසුරිනි)

- නව සංචාරක ආකර්ෂණ ක්‍රියාකාරකම් හඳුන්වාදීම

මෙම කලාපය තුළ දැනට පවතින ක්‍රියාකාරකම් පමණක් නොව නව ක්‍රියාකාරකම්ද හඳුන්වා දීම තුළින් සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීමට අපේක්ෂා කරයි. ඒ සඳහා අලි ඇතුන් සමඟ ඇවිදීම, නව ස්වභාවික සංචාරක ගම්මානයක් හඳුන්වා දීම හා රාත්‍රී කාලයේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම මූලික වශයෙන් කළ යුතු ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන ඇත.

අලි ඇතුන් සමඟ ඇවිදීම සඳහා විදේශීය සංචාරකයින් විශාල ඇල්මක් දක්වයි. පින්නවල ප්‍රදේශයේ මෙවැනි ක්‍රියාකාරකම් පුද්ගලික අංශය විසින් සිදු කරගෙන යන නමුත් විධිමත් බවක් නොමැත. පින්නවල අලි අනාථාගාරය මගින් මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නේ නම් විධිමත් බවකින් යුතුව මෙම ක්‍රියාකාරකම් පවත්වාගෙන යා හැකිය. ඕවෙල ගම්මානය කේන්ද්‍ර කරගනිමින් නව ස්වභාවික සංචාරක ගම්මානයක් හඳුන්වා දීම මෙම සැලැස්ම තුළින් කර ඇති අතර එය සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීමටත් වැඩි කාලසීමාවක් ප්‍රදේශය තුළ රඳවා ගැනීමටත් ඉවහල් වේ. එමෙන්ම නිවාස ආශ්‍රිත සංචාරක නැවතුම්පොළවල් ඇතුළු විවිධත්වයක් සහිත සංචාරක ගම්මානයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය බව හඳුනාගෙන ඇත. විශේෂයෙන් කුඩා දරුවන්ට විනෝද විය හැකි උද්‍යානයක්, ජායාරූපකරණ සඳහා සුදුසු පරිසරයක්, රාත්‍රි ක්‍රියාකාරකම්, කෘෂිකාර්මික කටයුතු සඳහා සංචාරකයින් සහභාගි කර ගැනීම, ග්‍රාමීය ස්වභාවික පරිසරය ආරක්ෂාකර ගනිමින් සංචාරකයින් වැඩි ප්‍රමාණයක් ගෙන්වා ගැනීමටත් එක් රාත්‍රියක්වත් නවතා ගැනීමටත් උපයෝගී කර ගැනීම මෙහි අරමුණ වේ.

රූප සටහන 6.22: අලි ඇතුන් සමඟ ඇවිදීමේ ක්‍රියාකාරකම

රූප සටහන 6.23: ඕවෙල ගම්මානයේ වර්තමාන තත්ත්වය





මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය සහ අන්තර්ජාලය ඇසුරිනි, 2022

ත්‍රාසජනක සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමද මෙම සැලැස්ම තුළින් අවධානය යොමු කර ඇත. ඒ අනුව මා-ඔය දූපත් සංවර්ධනය කිරීම, නාන ස්ථාන සංවර්ධනය කිරීම සහ බෝට්ටු පැදීම / කේබල් කාර් සේවා ඇති කිරීම වැනි සංවර්ධනයන් හඳුනාගෙන ඇත.

ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

කඳු නැගීම සහ කඳවුරු බැඳීම ප්‍රවර්ධනය කිරීම සඳහා අලගල්ල කන්ද හා ගබ්බල කන්ද බොහෝ දේශීය සංචාරකයින්ගේ ජනප්‍රිය ස්ථාන වේ. නමුත් විදේශීය සංචාරකයින් සඳහාද මෙම ස්ථාන හඳුන්වා දීම කළ හැකිය. මීට අමතරව පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකමක් සහිත ස්ථාන ප්‍රවර්ධනය කිරීම, මොලගොඩ මැටි භාණ්ඩ, අලි වසුරු නිෂ්පාදන කර්මාන්තය වැනි කුඩා කර්මාන්ත සංචාරක ව්‍යාපාරය සඳහා ප්‍රවර්ධනය කිරීම, කෘෂිසංචාරක ව්‍යාපාරය එකිනෙකට සම්බන්ධ කර ප්‍රවර්ධනය කිරීම- වැනි ක්‍රමෝපායන් ප්‍රවර්ධනය කිරීම තුළින් ප්‍රදේශය තුළම ඇති සම්පත් සංවර්ධනය වී ආර්ථිකමය වශයෙන් ප්‍රදේශයේ දියුණුවට දායක කර ගත හැකිය.

සංචාරක ප්‍රවර්ධන උපාය මාර්ගය

සිතියම 6.10: රඹුක්කන හා අවට ප්‍රදේශයේ ඇති සංචාරක ආකර්ෂණීය ස්ථාන



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

- සංචාරක ආකර්ෂණ ස්ථාන සඳහා විවිධ සමාජ මාධ්‍ය භාවිතා කිරීම

සංචාරක ආකර්ෂණය වැඩි කරගැනීම සඳහා විවිධ සමාජ මාධ්‍ය භාවිතා කිරීම අත්‍යවශ්‍ය වී ඇත. වර්තමානයේ පින්නවල අලි අනාථාගාරයේ අලි ඇතුන් දම්වැල් වලින් බැඳ තැබීම පිළිබඳව වැරදි මතවාදයක් විදේශීය සංචාරකයින් අතර පැවතීම නිසා සංචාරක ආකර්ෂණය අඩු වෙමින් පවතී. එයට ප්‍රධාන හේතුවක් ලෙස වැඩි වශයෙන්ම හීලෑ නොවූ අලි ඇතුන් මෙහි සිටීම නිසා එලෙස දම්වැල් වලින් බැඳ තැබීම අත්‍යවශ්‍ය වී ඇත. මෙම තත්ත්වය පිළිබඳව පැමිණෙන සංචාරකයින් නිසි ආකාරව දැනුවත් කිරීමත් (පරිශ්‍රයට පැමිණි පසු දැනුවත් කිරීම), හීලෑ උනු අලි ඇතුන් වෙන් කර විනෝදාත්මක කටයුතුවල ප්‍රවර්ධනය කිරීමටත් අවශ්‍ය පහසුකම් සකස් කළ යුතුය. තවදුරටත් සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීමටත් දැනුවත් කිරීම සඳහාත් මුහුණුපොත, වට්සැප්, ට්විටර්, ලින්කින්, youtube, වැනි සමාජ මාධ්‍ය ජාලා යොදා ගනිමින් අවශ්‍ය ප්‍රවර්ධන කටයුතු කළ හැකිය.

රූප සටහන 6.24: පෞද්ගලික youtube සමාජමාධ්‍ය ක්‍රියාකාරිකයෙකු විසින් පින්නවල පිළිබඳව කළ වැඩසටහනක්



මූලාශ්‍රය: youtube සමාජමාධ්‍ය , 2022

ඇ) සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සැලසීමේ උපාය මාර්ගය

වර්තමානයේ පවතින සංචාරක ආකර්ශනීය ස්ථාන සඳහා සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා පහත පරිදි පහසුකම් වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.

- කාර්යක්ෂම හා විවිධත්වයෙන් යුතු ප්‍රවාහන පහසුකම් සැපයීම (කුලී/ටැක්සි/ත්‍රීරෝදරථ/බයිසිකල්)
- තොරතුරු සහ මාර්ගෝපදේශ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම (සංචාරක තොරතුරු මධ්‍යස්ථානයක්, සංචලන සලකුණු ආදිය.;)
- හඳුනාගත් නිශ්චිත ස්ථානවල වංචා හා සමාජ විරෝධී ක්‍රියා වළක්වා ගැනීම සඳහා හොඳින් කළමනාකරණය කළ ආරක්ෂක පද්ධතියක් ස්ථාපිත කිරීම (CCTV - රඹුක්කන සහ පින්නවල, සංචාරක පොලිසිය)
- විවිධාංගීකරණය වූ නවාතැන් පහසුකම් ඇති කිරීම (තරු පන්ති හෝටල්/හෝටල්/ නිවාස ආශ්‍රිත නවාතැන් සහ වෙනත්)
- නරඹන්නන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සංචාරක පහසුකම් සේවා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.
- රථවාහන නැවැත්වීමේ ස්ථාන, සනීපාරක්ෂක පහසුකම්, විවේක ස්ථාන ආදිය සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සැපයීම.
- පින්නවල අලි අනාථාගාරය ඉදිරිපිට කෑගල්ල මාර්ගය සහ අලි නෑවීම සඳහා ගෙන යන මාවතේ ඉදිකර ඇති තාවකාලික වෙළෙඳසැල් වල මුහුණත ප්‍රතිනිර්මාණය කිරීම.
- අපේ ගම පරිශ්‍රය හෙළ බොජුන් අවන්හල තුළින් ගුණාත්මක සේවාවක් ලබාදිය හැකි අයුරින් තවදුරටත් සංවර්ධනය කිරීම.

ඈ) සංචාරකයින් සඳහා රාත්‍රී ක්‍රියාකාරකම් ඇති කිරීම

පින්නවල සංචාරක කලාපයට ඇදී එන සංචාරකයින් වැඩි කර ගැනීමට සහ එක් රාත්‍රියක්වත් ප්‍රදේශයේ නවාතැන් ගන්නා පරිදි ඊට අවශ්‍ය රාත්‍රී ක්‍රියාකාරකම් ඇති කිරීම වැදගත් වේ. විදෙස් සංචාරකයින් වැඩි වශයෙන් මෙම රාත්‍රී ක්‍රියාකාරකම් සඳහා වැඩි ප්‍රියතාවයක් දක්වන බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කළ හැකිය. 2016 වර්ෂයේ දී “අපේ ගම” පරිශ්‍රයේ කොහොඹ කංකාරිය සංස්කෘතික උත්සවයක් රාත්‍රී කාලයේ පවත්වා ඇති අතර ඒ සඳහා අති විශාල සංචාරකයින් ප්‍රමාණයක් සහභාගි වී ඇත. නමුත් ඉන් අනතුරුව එවැනි කිසිදු කටයුත්තක් මෙම ප්‍රදේශයේ සංවිධානය කර නොමැත. විශේෂයෙන් ‘අපේ ගම” හා පින්නවල සත්වෝද්‍යානය මූලික කරගනිමින් රාත්‍රී කාලයේ විනෝදාත්මක ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම තුළින් වැඩි සංචාරක ආකර්ෂණයක් මෙන්ම ප්‍රදේශයේ ආර්ථිකයද තවදුරටත් වැඩි කර ගත හැකිය.

උපායමාර්ග

01. ‘අපේ ගම’ පරිශ්‍රයේ නව සංස්කෘතික උත්සව ඇඳුන්වා දීම (කොහොඹ කංකාරි ශාන්තිකර්මය, රූකඩ සංදර්ශන, කෝලම්, නාඩගම්, නැටුම් භාණ්ඩ, පෙරහැර ආදිය;)

02. වෙළෙඳසැල්, සංචාරක හෝටල් හා වාගොල්ල දිස්ත්‍රික් කෘෂිකාර්මික මධ්‍යස්ථාන සහ සම්බන්ධ වී “රාත්‍රි වෙළෙඳසැල්” වැනි දේ සංවිධානය කිරීම

6.5.3 කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධන උපාය මාර්ගය

අ) කර්මාන්ත ස්ථාපිත කිරීම ප්‍රවර්ධන කිරීමේ උපාය මාර්ගය

ප්‍රදේශයේ පවතින කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා දුම්රිය මාර්ගය ප්‍රවේශකත්වය සහ අධිවේගී මාර්ගයේ විභවතාවය සැලකිල්ලට ගනිමින් කර්මාන්ත සඳහා කටුපිටිය-කුරුණෑගල මාර්ගයේ වහාව සිට වැලිගල්ල යෝජිත අධිවේගී මාර්ග පිවිසුමට ආසන්න වන ප්‍රදේශය වඩාත් සුදුසු බවට හඳුනාගෙන ඇත. එය කලාපකරණ සැලැස්ම හරහා කර්මාන්ත කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිත අතර ඒ නුළින් සුදුසු කර්මාන්ත සඳහා අවකාශය ලබාදේ.

වගුව 6.10: රඹුක්කන ප්‍රදේශයේ වෘත්තීය පුහුණු ආයතනවල වත්මන් තත්ත්වය

අනු අංකය	කර්මාන්තය/ආයතනය	ඉඩමේ අයිතිය	වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස ලියාපදිංචි කර තිබේද යන්න	අධ්‍යයන කාර්ය මණ්ඩලය
01	රඹුක්කන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය	රජය	ඔව්	03
02	වැලිගමුව යාන්ත්‍රික වඩු පාසල (කර්මාන්ත සංවර්ධන අධිකාරිය)	රජය	නැත	0 (වසා දමා ඇත)
03	අත් යන්ත්‍ර රෙදිපිළි විවීමේ පුහුණු මධ්‍යස්ථානය	පළාත් රජය	නැත	01
04	මැටි භාණ්ඩ කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානය	රජය	නැත	02
05	දිස්ත්‍රික් කෘෂිකාර්ම පුහුණු මධ්‍යස්ථානය	පළාත් රජය	නැත	03
06	නරුණ සේවා සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය	පෞද්ගලික	නැත	02

මූලාශ්‍රය: සම්පත් පැතිකඩ, 2019

ආ) කුඩා/මධ්‍ය පරිමාණ කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළඳපොළ ස්ථාපිත කිරීමේ උපාය මාර්ගය

කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළඳපොළ තිබීම අත්‍යවශ්‍ය අතර ඒ සඳහා වැඩි සංසරණ ජනගහනයක් සිටින රඹුක්කන නගරය, පින්නවල සංචාරක කලාපය සහ මොලගොඩ අන්කම් ප්‍රදර්ශනාගාරය (ප්‍රතිසංවර්ධනය) යන ප්‍රදේශ තුනෙහි විධිමත් සහ ශක්තිමත් වෙළෙඳ පොළවල් පිහිටුවීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත. එම ස්ථාන වලම නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව සැලසීමද (ප්‍රදර්ශන පැවැත්වීම/විකිණීම) කළ හැකිය.

රූපසටහන 6.25: කර්මාන්ත වෙළඳපල ස්ථානගත කිරීමට සුදුසු ස්ථාන



මූලාශ්‍රය: Google සිතියම් හා අන්තර්ජාලය ඇසුරිනි, 2022

ඇ) ව්‍යවසායකයින් නඟා සිටුවීමේ උපාය මාර්ගය

කර්මාන්ත අංශය වැඩි දියුණු කිරීම සඳහා කුඩා පරිමාණ කර්මාන්ත අංශයේ වෘත්තීය පුහුණු සහ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම (විදාතා පුහුණු මධ්‍යස්ථානය) සඳහා අවශ්‍ය පහසුකම් ඇති කිරීම වැදගත් බව හඳුනාගෙන ඇත. රඹුක්කන ප්‍රදේශයේ වර්තමානයේ පවතින වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නිසියාකාරව ක්‍රියාත්මක නොවන තත්ත්වයක් හඳුනාගත හැකි අතර එවායේ තොරතුරු පහත පරිදී වේ.

මෙම පවතින වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කර ප්‍රදේශයේ ජීවත්වන දරුවන් රැකියා විරහිත කාන්තාවන් සහ ස්වයං රැකියා කිරීම සඳහා කැමැත්තක් දක්වන ජනතාව වැඩි පිරිසකට වෘත්තීය දැනුම ලබා දීම තුළින් එකී ජනතාවගේ සහ ප්‍රදේශයේ ආර්ථික ශක්තිමත් වනු ඇත.

කර්මාන්ත අංශය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රාදේශීය සහ ග්‍රාමීය බැංකු හරහා මුල්‍ය පහසුකම් සැපයීමද ඉතා වැදගත් වේ. එවැනි පහසුකම් ඇති කිරීම සඳහා අවශ්‍ය භූමි ප්‍රතිපාදන ලබා දීම, අනුමැතිය ලබා දීම වැනි කටයුතු සම්බන්ධයෙන් වැඩි අවස්ථාවක් ලබාදිය යුතු බව හඳුනාගෙන ඇත. ඒමෙන්ම ප්‍රජා මූලික සංවිධාන (CBOs) සඳහා ද පහසුකම් සැලසීම කළ යුතු බවත් එමගින් ශක්තිමත් ආර්ථිකයක් ඇති කිරීමේ අරමුණ සාක්ෂාත් වනු ඇත.

6.6 තිරසර පාරිසරික සංවර්ධන උපායමාර්ගය

තිරසර පාරිසරික සංවර්ධන උපායමාර්ගය

රඹුක්කන ප්‍රාදේශිය සභා සැලසුම් ප්‍රදේශය තුළ තිරසර පාරිසරික සංවර්ධනයක් සිදු කිරීම මගින් යෝජිත දැක්ම සාක්ෂාත් කර ගැනීමට හැකි වන අයුරින් මා- ඔය, රඹුක්කන් ඔය වැනි ජල මූලාශ්‍ර හා වනාන්තර වලින් ගහන ප්‍රදේශයක් ලෙස සලකා බලා මෙම තිරසාර පරිසර උපාය මාර්ගික සැලැස්ම සකස් කර ඇත. ඒ අනුව තිරසාර පරිසර උපාය මාර්ගික සැලැස්ම ප්‍රධාන අනු කොටස් 4කින් සමන්විත වේ.

පාරිසරික සංරක්ෂණ උපාය මාර්ගය

- පරිසර සංරක්ෂණ සැලැස්ම
- පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම
- සංස්කෘතික සහ උරුම කළමනාකරණ උපාය මාර්ගික සැලැස්ම
- ආපදා කළමනාකරණ සැලැස්ම

6.6.1 පාරිසරික සංරක්ෂණ සැලැස්ම

සංවේදීතා විශ්ලේෂණය තුළින් හඳුනාගනු ලැබූ පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි ක්‍රමවත් භූමි පරිහරණයන් ඇති කරමින් එම ප්‍රදේශය සංරක්ෂණය කර ගැනීම පරිසර සංරක්ෂණ සැලැස්මෙහි පරමාර්ථය ලෙස දැක්විය හැකිය. මෙම උපායමාර්ගය තුළින් සැලසුම් ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන ජල මූලාශ්‍රද එම ජල මූලාශ්‍ර වලට සම්බන්ධ අනෙකුත් ජල මාර්ගද සියලුම ජලාභිමුඛ ප්‍රදේශයන් හා ඇළ, දොළ, ගංගා වැව් සහ පොකුණු වැනි භූමි සහ සියලු රක්ෂිත වනාන්තර සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගෙන ඇත.

උපායමාර්ග

අ) ජලාභිමුඛ ප්‍රදේශ සංරක්ෂණය කිරීම සඳහා රක්ෂිත කලාප හඳුනා ගැනීම

i. මා-ඔය, රඹුක්කන් ඔය හා කුඩා ඔය ජල රක්ෂිතයන්

පරිච්ඡේදය 09 හි සඳහන් ඇළ/දොළ, ගංගා සඳහා නැබිය යුතු ගොඩනැගිලි සීමාව මඟින් දැක්වෙන පරිදි ඉහත ජල මූලාශ්‍රවල රක්ෂිතයන් පවත්වාගත යුතු අතර මෙම රක්ෂිතය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශයන්ට යටත් විය යුතුය.

ආ) රක්ෂිත වනාන්තර සංරක්ෂණය කිරීම

රඹුක්කන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් සියලුම රක්ෂිත වනාන්තර හඳුනාගෙන ඒවා අධි සංවේදී සංරක්ෂණ කලාපය ලෙස කලාපීකරණ සැලැස්මට ඇතුළත් කර ඇත.08 වන පරිච්ඡේදය වන කලාපීකරණ නියමනා යටතේ මෙම අධි සංවේදී සංරක්ෂණ කලාපය සඳහා වන අවසරලත් භාවිතයන් හා ඊට අදාළ පොදු රෙගුලාසි සඳහන් කර ඇත. ඒ අනුව කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා මෙම කලාපය තුළ අවසර ලබා නොදෙන අතර එම රක්ෂිත ප්‍රදේශයවල ආරක්ෂණ කලාපයන්හි (buffer zone) සිදු කරන කටයුතු පරිසර ආරක්ෂණ පනතෙහි සඳහන් “නියමිත ව්‍යාපෘති” සඳහා පමණක් අවසර ලබා දෙනු ලැබේ.

6.6.2 පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (PORS)

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රමිති මට්ටම්වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර් 1.4 ක් වශයෙන් පොදු එළිමහන් විවෘත භූමි ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේදී වෙන් කල යුතුය. රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වසරට ජනසංඛ්‍යාව 100,205 ක් ලෙස සංගණන වාර්තාවේ දක්වා ඇත. සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2033 වන විට ජනසංඛ්‍යාව 134,647 බවට පුරෝකථනය කර ඇත. ඒ අනුව 2033 වන විට පොදු එළිමහන් විවෘත භූමි ලෙස ඉඩම් හෙක්ටයාර් 188.5 අවම වශයෙන් වෙන් කල යුතුය.

උපාය මාර්ග

I. රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා පිටි ප්‍රතිසංවර්ධනය කිරීම.

පවතින සියලුම ක්‍රීඩා පිටි සහ ළමා උද්‍යාන ප්‍රමිතීන්ට අනුව ප්‍රති සංවර්ධනය කිරීම මෙම සැලැස්ම මඟින් යෝජනා කරනු ලැබේ. මෙම ක්‍රීඩාංගන වල පහසුකම් වැඩි දියුණු කිරීම හා ඒවා නඩත්තු කිරීමේ ක්‍රියා පිළිවෙත් සැකසීම නිවැරැදි දිශානතියෙන් යුත් නව ක්‍රීඩාගාරශෘහස්ථ ක්‍රීඩාගාර සහ යටිතල පහසුකම් ගොඩනැංවීම වැඩි දුරටත් සඳහන් කල හැක.

රූප සටහන 6.26: මහීපාල හේරත් ක්‍රීඩාංගණය



රූප සටහන 6.27: වඟව ළමා උද්‍යානය



මූලාශ්‍රය : නාගරික සංවිධනය අධිකාරිය, 2022

II. රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුල පවතින ඔය, ඇල මාර්ග ආශ්‍රිත රක්ෂිත ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීම

හඳුනාගත් ඔය/ඇළ රක්ෂිත රේඛිය උද්‍යාන ලෙස සංවර්ධනය කිරීමටද යෝජනා කෙරේ. එම රක්ෂිත සීමාවන් රේඛීය උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම මඟින් අනවසර ඉදිකිරීම් /ගොඩකිරීම් සීමාවන අතර විනෝද විවේක පහසුකම් ලබාගත හැකි බව වැඩි දුරටත් සඳහන් කළ හැකිය .මෙහි විනෝද පහසුකම් සඳහා වෙන් වූ ස්ථාන සඳහා පහසුකම් ඇතුළු ව්‍යායාම භූමි, ව්‍යායාම මංතීරු, ජලාශ්‍රිත ක්‍රීඩා වැනි දේ අනුමත භාවිතයන් ලෙස දැක්විය හැකිය. තවද නගරයේ අනෙකුත් යෝජිත රේඛීය උද්‍යාන සඳහා ඉඩකඩ ඇති භූමි භාග පොදු

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ජනතාවගේ විවේක පහසුකම් ලබා ගැනීම සඳහා පරිසර හිතකාමී තිරසාර භූ දර්ශන සංකල්පයන්ට අනුව සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කෙරේ.

තිරසර පාරිසරික සංවර්ධන උපායමාර්ගය

- විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම මඟින් අනවසර ඉදි කිරීම් පාලනය කිරීම.
- ඉඩම් සහ අනු බෙදීම්වලදී වෙන් කරනු ලබන 10% අදාළ විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම සහ එම ඉඩම් සෘජු විනෝද පහසුකම් සඳහා පමණක් යොදා ගැනීම.

පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (PORS)

III. සාමාජීය විනෝද කටයුතු පහසුකම් වැඩි දියුණු කිරීම

දේශීය සහ විදේශීය සංචාරකයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි සංචාරක අවශ්‍යතා වලට ගැලපෙන ප්‍රමිතියෙන් යුතු ක්‍රීඩා සමාජ, සංචාරක හොටල් ,නිවාඩු නිකේතන සහ සංචාරක බංගලා ස්ථාපිත විය යුතු බවට මෙම සැලැස්ම මඟින් යෝජනා කරනු ලැබේ.

IV. සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීම - (පින්නවල සංචාරක කලාපය)

දේශීය සංචාරකයන්ට පහසු මිළට නවාතැන් පහසුකම් සපයන ස්ථාන ඇති කිරීම මෙන්ම දේශීය විදේශීය සංචාරකයන්ට සහ පාරිසරික අධ්‍යනයන් සඳහා පැමිණෙන පර්යේෂකයන්හට (වන රක්ෂිත ආශ්‍රිතව) අවශ්‍ය සහ ප්‍රයෝජනවත් ආකර්ශණීය ස්ථාන පරිසර හිතකාමී සංවර්ධනය ඔවුන්ගේ දීර්ඝ කාලීන නැවතීම් වලට හේතු විය හැක. ඒවාට අදාල අනෙකුත් සෘජු හා වක්‍ර පහසුකම් විශේෂයෙන් සංචාරක බංගලා, හෝටල් පොදු ප්‍රවාහන පහසුකම්, ප්‍රදේශයට අවේනික සංස්කෘතික සංදර්ශන කටයුතු වැනි දෑ හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම, ඔය ආශ්‍රිතව ප්‍රදේශ අවශ්‍ය පහසුකම් පාලනයක් සහිතව සංරක්ෂණය හා බැදුණු වැඩි දියුණු කිරීමකට මෙයින් යෝජනා කෙරේ. උසස් ප්‍රමිතියෙන් යුතු සංචාරක බංගලා, හෝටල්, පොදු ප්‍රවාහන පහසුකම්, සෞඛය මධ්‍යස්ථාන, අයුර්වේද මධ්‍යස්ථාන පිහිනුම් තටාක සහිත නිවාඩු නිකේතන විදේශිකයින් සඳහා ස්ථාපිත කර සංවර්ධනය කිරීම තුලින් සංචාරක කර්මාන්තය දියුණු කර ආර්ථිකයට සෘජු දායකත්වයක් ලබාදිය හැකිසි.

V. මාර්ග දෙපස රුක් රෝපණ තීරු සඳහා ඉඩකඩ වෙන් කිරීම

ප්‍රධාන මාර්ග දෙපස ඇති ඉඩ ප්‍රමාණයන්ට ගැලපෙන හා දේශගුණයට ගැලපෙන ආවේණික ශාක විශේෂ රුක් රෝපණයට භදුනාගෙන මේ සඳහා යොදා ගත හැක. එක් එක් කලාපයට අනන්‍යතාවය ලැබෙන සේ විවිධ ශාක වර්ග තෝරා පෙව විවිධත්වය වැඩි දියුණු වන පරිදි රුක් රෝපණය කිරීම නගර අලංකරණයට හේතු වේ. මෙම ප්‍රදේශයේ රුක් රෝපණය සඳහා සුදුසු ශාක වර්ග පහත පරිදි දැක්විය හැකිය. එසේම රුක් රෝපනය කල හැකි මාර්ගයන් පහත පරිදි වේ.

මාර්ග සංවර්ධන කටයුතුවලදී නගර සංවර්ධන සංකල්ප අනුව විධිමත් භූදර්ශන සැලසුම් තෝරාගෙන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුය. (රුක් රෝපණය සඳහා සුදුසු ශාක වර්ග ඇමුණුම 11 හි සඳහන් කර ඇත.)

රුක් රෝපණය කල හැකි මාර්ගයන්

1. කොළඹ - මහනුවර මාර්ගය (A01) - කි.මී 4.8
2. පොල්ගහවෙල - කෑගල්ල (A19) - කි.මී 2.52
3. ගලගෙදර - රඹුක්කන (B122) - කි.මී 0.96
4. කරඹුපන - රඹුක්කන (B199) - කි.මී 5.46
5. මාවතගම - මුවන්කන්ද (B281) - කි.මී 5.44
6. රඹුක්කන - කටුපිටිය (B384) - කි.මී 10.04
7. රඹුක්කන - මාවනැල්ල (B385) - කි.මී 10.03
8. බුලුගොල්ල - දොඹේන්මඩ - වහව (B 475) - කි.මී 9.7
9. රඹුක්කන අතුරු මාර්ගය (රඹුක්කන මාර්ගය) - කි.මී 0.39

රූප සටහන 6.28: මාර්ග දෙපස සිදු කරන රුක් රෝපණයන්



මූලාශ්‍රය: අන්තර්ජාලය (2022) ඇසුරිනි.

සිතියම් අංක 6.11: රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම



මූලාශ්‍රය : පාරිසරික හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2022

VI. සැලසුම් ප්‍රදේශයේ දර්ශනීය ස්ථාන (Scenic view points) හඳුනා ගැනීම

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දර්ශනීය ස්ථාන බොහොමයක් හඳුනාගත හැකිය. ඒ අතර මා ඔය දර්ශනය වීම (කෑගල්ල-රඹුක්කන මාර්ගය හා පොල්ගහවෙල - කෑගල්ල මාර්ගය), අලගල්ල කඳු පන්තිය ආශ්‍රිත දර්ශනීය ප්‍රදේශය (රඹුක්කන-මාවනැල්ල මාර්ගය සහ රඹුක්කන නගරය - වටරවුම ආශ්‍රිත ප්‍රදේශය සහ දුම්රිය ගේට්ටුව සහිත කෑගල්ල මාර්ගය) සහ උතුවන්කන්ද දර්ශනය වීම (කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගය) වැනි ස්ථාන දැක්විය හැකිය. මෙම දර්ශනීය ස්ථාන සුරැකෙන අයුරින් සංවර්ධන කටයුතු සිදුකිරීම තුලින් සුන්දර පරිසරය ආරක්ෂා කර ගැනීමත් වක්‍ර විනෝදාත්මක ස්ථාන ප්‍රවර්ධනය කිරීමත් අපේක්ෂා කරයි.

මෙම මාර්ග වල ගමන් කිරීමේදී දැකිය හැකි දර්ශනීය ප්‍රදේශයන්ට බාධා වන ඉදිකිරීම් මෙන්ම දැන්වීම් පුවරු පාලනය කිරීම සඳහා මෙම සංවර්ධන සැලැස්ම තුළින් නීති රෙගුලාසි බලාත්මක කෙරේ. මේ සඳහා ප්‍රදේශයේ පවතින දර්ශනීය ස්ථාන හඳුනාගෙන ඒවා ආරක්ෂා කිරීම, එම දර්ශනීය දසුන් වලට බලපාන/අවහිර කරන සියලුම සංවර්ධන ක්‍රියාකාරකම් අධෛර්යමත් කිරීම, කුඹුරු යායවල් ආශ්‍රිත මාර්ග සහ ජල මුහුණත විවෘත කිරීම සහ ඒ තුළින් මහජනතාවට විනෝදාස්වාද අත්දැකීමක් ලබා දීම අපේක්ෂා කරයි.

මෙම සුවිශේෂී ස්ථාන මූලික කරගෙන දර්ශන පථ විශ්ලේෂණ සිදු කළ අතර(අදාළවන ඝනත්ව කලාපීකරණ රෙගුලාසි වල දක්වා ඇත) එමගින් ගොඩනැගිලි ඉදි කිරීමේදී උස මට්ටම් තීරණය කිරීමට පහසුවෙන් හැකියාව ලැබේ. ඒ අනුව රෙගුලාසි සකස් කිරීමේදී ඒ පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කර ඇත.

රූප සටහන.6.29: රඹුක්කන නගරයට හා රඹුක්කන - මාවනැල්ල මාර්ගයට අලගල්ල කන්ද දර්ශනය වීම



මූලාශ්‍රය : පාරිසරික හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2022

රූප සටහන.6.30: කොළඹ-මහනුවර මාර්ගයේ මංගලගම ප්‍රදේශයට උතුවන්කන්ද සරදියල් ගල දර්ශනය වීම



මූලාශ්‍රය : පාරිසරික හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2022

6.6.3 සංස්කෘතික සහ උරුම කළමනාකරණ උපාය මාර්ගික සැලැස්ම

ප්‍රදේශය තුළ සංස්කෘතික සහ පෞරාණික වටිනාකමකින් යුතු ස්ථාන රාශියක් හඳුනාගත හැකි වන අතර ඒ අතරින් පුරාවිද්‍යාත්මක දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කළ යුතු ස්ථාන කිහිපයක් හඳුනාගත හැකි අතර පදවිගම්පල, දැලිවල, මීදුම, දඹුල්ල, උදන්විට, මොට්ටප්පුලිය, නාරංබැද්ද, පරපේ, දියසුන්න, කඩිගමුව, කුඹල්දිවෙල, මංගලගම ආදි ප්‍රදේශවලින් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් යැයි අනුමාන කළහැකි දේ මෙන්ම ඓතිහාසික තොරතුරු රාශියක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇත .

උපායමාර්ග

I. සංස්කෘතික, ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත්වන ස්මාරක පමණක් පුරාවිද්‍යාත්මක ක්‍රමවේද යටතේ සංරක්ෂණය කිරීම.

II. සංරක්ෂණය කරන ලද ස්මාරක නිසි පරිදි නඩත්තු කිරීම මගින් සංචාරක ආකර්ශනය ඇති කිරීම

III. ඓතිහාසික හා සංස්කෘතික පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳව දැනුවත් භාවයක් ඇති කිරීම සහ ස්මාරක ජාල ගත කිරීම (Connectivity) මගින් දේශීය හා විදේශීය සංචාරක වැඩසටහන් ප්‍රවර්ධනය කර ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා ගැනීමට කටයුතු කිරීම.

IV. සංරක්ෂණය හා විද්‍යාත්මක පර්යේෂණ මත පදනම් වූ උරුමයන් රැක ගැනීම. (කැලෑදඹුල්ල විහාරයේ චිත්‍ර, දියසුන්නත කීර්ති ශ්‍රී රාජසිංහ රජ මහා විහාරයේ චිත්‍ර, බුදු පිලිම හා ගල් කැටයම් සහිත දොරටුව)

V. නරඹන්නන් සඳහා යටිතල පහසුකම් හා විධිමත් වෙළඳ කටයුතු (replica - අනුරූභල්) වැඩි දියුණු කිරීම මගින් ජාතික ආර්ථිකයට දායකත්වය වටිනාකමක් ලබා ගැනීම.

VI. පවතින ස්මාරක පුරාවිද්‍යාත්මක ඓතිහාසික සහ සංස්කෘතික වටිනාකම රැකෙන පරිදි සංරක්ෂණය කිරීම මගින් ජාතික ආර්ථික හා සමාජීය අවශ්‍යතාවයන්ට ලඟාකර ගැනීම , ප්‍රතිසංවර්ධනය කිරීම (සිඟිවටන ඡායා රූප මගින්). (උදා : පදවිගම්පල ගල්මැස්ස, දැල්වල කොට වෙහෙර, කුඩාගම පල්ලිය, මීදුම වලව්ව)

VII. සංචාරක ආකර්ෂණය වැඩි ස්මාරක සංචාරක මණ්ඩලයේ සංචාරක මාර්ගෝපදේශ සැලැස්මට (Tourism Guid Plan) ඇතුලත් කිරීම (උදා: දල්වෙල කොටවෙහෙර, මීදුම රජමහා විහාරය, පදවිගම්පල ගල්මැස්ස, උදම්මිට රජ මහා විහරය, මලියදේව අරඹත්ත විහාරය)

VIII. ජාතික වැදගත්කමක් සහිත විහාරස්ථාන විද්‍යාත්මක පර්යේෂණ මත පදනම්ව මතුපරපුරේ අධ්‍යාපනය සඳහා සහ සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පරිදි සැලසුම් කිරීම (කැලෑ දඹුල්ල, දියසුන්නත කීර්ති ශ්‍රී රාජසිංහ රජ මහා විහාරය, උදම්මිට රජ මහා විහරය, මලියදේව අරඹත්ත විහාරය)

IX. පුරා විද්‍යා ස්ථාන, ස්මාරක හා චංචල පුරාවස්තු ප්‍රදර්ශනය කිරීම.

X. ප්‍රකාශන, සමුළු දේශන හා සම්මන්ත්‍රණ මගින් ජනතාව, සිසුන් දැනුවත් කිරීම. (අන්තර් ජාලය ඇතුළු සන්නිවේදන ක්‍රම ඔස්සේද මෙය කළ හැකිය)

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

නිරසර පාරිසරික
සංවර්ධන උපායමාර්ගය

සංස්කෘතික සහ උරුම
කළමනාකරණ උපාය
මාර්ගික සැලැස්ම

XI. පදවිගම්පල ග්‍රාමයෙහි දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ නිර්මාණය වූ සංචාරක සත්කාරක නිවහන් (Home Stay) සංකල්පය ලංකාවේ දැනට ක්‍රියාත්මක පළමු සංචාරක සත්කාරක නිවහන් සංකල්පයයි. මෙහිදී සාම්ප්‍රදායික කෑම බිම සාදන ආකාරය, සාම්ප්‍රදායික සිරිත්විරිත් හා විවිධ කලා ශිල්ප ප්‍රවර්ධනය කළ හැකිය. මෙම ගම්මානය තුල ප්‍රදේශයේ අනෙකුත් පුරාවිද්‍යා ස්ථාන නාම හා ගමන් මාර්ගය ප්‍රදර්ශනය කිරීම නුලින් එම ස්ථාන වලටද සංචාරක ආකර්ශනය ලබා ගැනීම කළ හැකිය.

6.6.4 ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හඳුනාගත හැකි විශේෂිත වූ පවතින ආපදා තත්ත්ව ලෙස නායයෑම් අවදානම් ප්‍රදේශ දැක්විය හැක. එබැවින් ඒ සඳහා අවදානම අවම කිරීමේ උපාය මාර්ග පහත පරිදී හඳුනාගෙන ඇත.

6.6.4.1 නායයෑම් අවදානම් ප්‍රදේශ සඳහා නායයාම් අවදානම අවම කිරීමේ උපාය මාර්ග

නායයාම් අවදානම් ප්‍රදේශ සුරක්ෂිත කිරීම තුළින් මිනිසාට හා දේපළ වලට වන හානි අවම කිරීමත්, අනාගත ජල සම්පත ආරක්ෂා කර ගැනීමත්, පස, සතුන් සහ ශාක හා වගාවන් ආරක්ෂා කිරීමත්, මෙමඟින් සිදු කෙරේ. පහත ක්‍රමෝපායන් තුළින් ආපදා තත්වයකදී මුහුණ දියහැකි ආකාරයේ භෞතික පරිසරය ස්ථාවර කිරීමට අපේක්ෂා කෙරේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් හඳුනාගෙන ඇති නායයෑම් අවධානම් ප්‍රදේශ වල ඉදිකිරීම් කටයුතු සිදුකරන්නේනම් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිරවුල් සහතික ලබාගත යුතුය. නායයෑම් වලක්වා ගැනීම සහ ආරක්ෂා වීම සඳහා ගතහැකි උපාය මාර්ග පහත පරිදි වේ. (මූලාශ්‍රය - සුරක්ෂිත නිවසක් ඉදිකිරීම සඳහා උපදෙස් - ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය)

I. ඉඩම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම වලක්වා ගැනීම
II. හෙල්මළු ක්‍රමයට බිම් සකස් කොට වගා කිරීම
III. කෘෂිකාර්මික ඉඩම් වෙනත් කටයුතු සඳහා යොදාගැනීම පාලනය කිරීම
IV. ඉඩම් වල පාංශු බාදනයට ලක්වන නුසුදුසු භෝග ව්‍යාප්තිය පාලනය කිරීම
V. ගොඩනැගිලි සැලසුම් කිරීමේදී පස් කපා ඉවත් කිරීම වෙනුවට භූමියේ ස්වභාවයට අනුකූල වෙමින් හෙල්මළු ක්‍රමයට ගොඩනැගිල්ල ඉදිකිරීම
VI. යටිතල පහසුකම් සැපයීමේදී නිසි තාක්ෂණික උපදෙස් පිළිපැදීම
VII. කඳු බෑවුම් සහිත මතුපිටක් ඇති භූමියක තණ පිඩලි ඇල්ලීම මඟින් නායයාම් ක්‍රියාවලිය අවම කිරීම
VIII. නායයාම් හා ගං වතුර පාලනය කිරීම සඳහා මතුපිට ජලය උරා ගැනීම සඳහා උපක්‍රම යෙදීම.
IX. පැති බැම් හා සමෝච්ච කාණු ඉදිකිරීම තුළින් පස ආරක්ෂා කිරීම.
X. බෑවුම් කඩා වැටීම, කණ්ඩි කැපීමේදී සිදුවන දුර්වලතා අවම වන පරිදි පාරිසරික ඔිතකාමී අන්දමින් කඳු ප්‍රදේශ සංවර්ධනය කිරීම.
XI. නාය යෑම් අවස්ථාවන්ට ඔරෝත්තු දෙන ලෙස ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීම හා රෙගුලාසි හඳුන්වා දීම

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

6.6.4.2 ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නාය යෑම් අවධානම් කලාපීකරණයට අනුව ඒ ඒ කලාප සඳහා නිර්දේශිත භාවිතයන් සහසම්බන්ධ කර ගැනීම.

නිරසර පාරිසරික
සංවර්ධන උපායමාර්ගය

අධි අවදානම්, මධ්‍යම අවධානම් හා අඩු අවධානම් වශයෙන් ප්‍රධාන කලාප තුන යටතේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නාය යෑම් අවධානම් කලාපීකරණය සිදු කර ඇති අතර එම කලාප සඳහා වෙන් වෙන් වශයෙන් නිර්දේශිත භාවිතාවන් හා නිර්දේශ නොකරන භාවිතාවන් හඳුන්වා දී ඇත. පහත වගුවේ

ආපදා අවධානම් අවම
කිරීමේ සැලැස්ම

සඳහන් පරිදී එම මාර්ගෝපදේශයන් සංවර්ධන කටයුතු සිදු කිරීමේදී සැලකිල්ලට ගැනීම තුළින් ආපදා අවධානම අවම කර ගත හැකිය.

වගුව 6.11: නාය යෑම් අවධානම් කලාපවල නිර්දේශ කරන භාවිතයන් සහ නිර්දේශ නොකරන භාවිතාවන්

කලාපය	නිර්දේශිත භාවිතාවන්	නිර්දේශ නොකරන භාවිතාවන්	වෙනත් අවශ්‍යතා
අඩු අවදානම් කලාපය	• උද්‍යාන වන වගාවන්, වනාන්තර කැලෑ සංරක්ෂිත උද්‍යාන, පැල තවාන් උද්‍යාන විවෘත භූමි ක්‍රීඩා පිටි. • බෑවුම් සඳහා නිර්දේශිත කෘෂි වගාවන්. • නාගරික සංවර්ධන අධිකාරියේ සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශිත නේවාසික කටයුතු. • සමෝච්ච රේඛ ක්‍රමයට කරනු ලබන වගා කටයුතු. • තාවකාලික ගොඩනැගිලි.	කර්මාන්ත. අධ්‍යාපන ආයතන. මහජනයා රැස්වන ස්ථාන, මූල්‍යමය ක්‍රියාකාරකම් සිදුකරන ස්ථාන, සත්ත්ව උත්පාදන මධ්‍යස්ථාන.	• සියළුම ඉදිකිරීම් කළ යුත්තේ බෑවුම් ආනතිවලට අනුකූලව අනිකුත් ආරක්ෂාකාරී පියවරයන් යටතේය. • විශේෂිත මලාපවාහන පිරිපහදු ක්‍රම හඳුන්වා දිය යුතුය. • අදාළ ආයතනවල අවසර ලබා ගැනීම - නා.සං.අ. - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය. - ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය. • ප්‍රමාණවත් රථවාහන ගාල් පහසුකම් සහ අපරවයුහ පහසුකම් සැපයිය යුතුය.

කලාපය	නිර්දේශිත භාවිතාවන්	නිර්දේශ නොකරන භාවිතාවන්	වෙනත් අවශ්‍යතා
මධ්‍යම අධිකාරීම් කලාපය	• නේවාසික කටයුතු. • කර්මාන්ත කටයුතු, උද්‍යාන ක්‍රීඩා පිටි. • විවෘත භූමි සහ විවේක හා විනෝද කටයුතු සඳහා. • වගා කටයුතු. • වනු වගාවන්. • ආයතනික කටයුතු. • ප්‍රජා සංවර්ධන කටයුතු. • මහජනයා එක්රැස් වන මධ්‍යස්ථානය. • මූල්‍යමය කටයුතු. • බර අනුව නිර්දේශිත බහුකාර්ය ගොඩනැගිලි. • සමෝච්ච රේඛ ක්‍රමවේද අනුව කරනු ලබන වගාවන්		1. අදාළ බිම් ආනති වලට අනුකූලව අනිකුත් සියළුම ආරක්ෂාකාරී පියවරයන් යටතේ ඉදිකිරීම් කළ යුතුය. 2. විශේෂ මලාපවාහන සහ පිරිපහදු ක්‍රම භාඳුන්වා දිය යුතුය 3. අදාළ ආයතනවලින් අවසර ලබා ගත යුතුය. - නා.සං.අ. - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය. - ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය. 4. ප්‍රමාණවත් රථවාහන ගාල් පහසුකම් සහ අපරවයුහ පහසුකම් ලබා දිය යුතුය. (ආපදාවලට ගොදුරු නොවන ආකාරයේ) 5. සමෝච්ච රේඛා ක්‍රමවේද අනුව කරන ලබන වගාවන්.

කලාපය	නිර්දේශිත භාවිතාවන්	නිර්දේශ නොකරන භාවිතාවන්	වෙනත් අවශ්‍යතා
අඩු අධිකාරීම් කලාපය	• නේවාසික (බිම් ආවරණය අඩු.) • කර්මාන්ත • අඩි උස ගොඩනැගිලි සඳහා ඉඩ ලබාදීම. • මහජනයා රැස්වන ස්ථාන. • රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි. • පරිපාලන සංකීර්ණ, අධ්‍යාපන හා පුහුණු ආයතන, සංස්කෘතික මධ්‍යස්ථාන, සහ ආගමික ස්ථාන, ප්‍රජා ශාලා, කෞතුකාගාර හා රථගාල් සංකීර්ණය. • රථ නැවතුම් ස්ථාන. • වගා කටයුතු වැවිලි කර්මාන්ත. • බල ශක්ති උත්පාදන ස්ථාන.		1. සියළුම ඉදිකිරීම් සමෝච්ච රේඛා පදනම් කරගෙන ඒ අනුව සිදුකළ යුතුය. 2. සියළුම වගාවන් සමෝච්ච රේඛා ක්‍රමවේදය අනුව හා අනිකුත් ආරක්ෂාකාරී පියවරයන් යටතේ සිදුකළ යුතුය. 3. මලාපවාහන පිරිපහදු ක්‍රම භාඳුන්වා දිය යුතුය 4. පළාත් පාලන ආයතන සහජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබා ගත යුතුය. 5. ප්‍රමාණවත් රථවාහන ගාල් පහසුකම් සැපයිය යුතුය.

මූලාශ්‍රය: ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, 2022

6.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

6.7.1 හැඳින්වීම

රඹුක්කන සංවර්ධන සැලැස්ම මඟින් සෞභාග්‍යමත් කෘෂි-සංචාරක පුරවරයක් ලෙස රඹුක්කන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය භෞතික, සාමාජීය, පාරිසරික සහ ආර්ථික යන සියලු අංශ ඔස්සේ සංවර්ධනය කිරීමෙහිලා හඳුනාගත් උපාය මාර්ගික සැලසුම් භූමිය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා එම සැලසුම් යටතට ගැනෙන උපාය මාර්ගික ව්‍යාපෘති රාශියක් හඳුනාගෙන ඇත. එහිදී ප්‍රදේශයේ පවතින ගැටලු හා පවතින විභවතා උපරිම ලෙස ප්‍රයෝජනයට ගත හැකි වන අයුරින් සංවර්ධන ව්‍යාපෘති හඳුනාගෙන ඇත.

6.7.2 ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

වර්ෂ 2033 සඳහා යෝජිත රඹුක්කන සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගත් ව්‍යාපෘති පාර්ශවකරුවන්ගේ ප්‍රමුඛතාගත කිරීම අනුව, භෞතික, සාමාජීය, ආර්ථික, පාරිසරික බලපෑම් අනුව, ව්‍යාපෘති කාලය, ව්‍යාපෘති පිරිවැය සහ අපේක්ෂිත සංවර්ධන සංකල්පයට අනුකූල වීම යන සියලු අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යාපෘති පෙළගැස්ම සිදු කර ඇත. (ඇමුණුම 12)

පළමු ප්‍රමුඛත්ව ව්‍යාපෘති

1. සේනානායක මාවත විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම
   I. සේනානායක මාවත පුළුල් කර සංවර්ධනය කිරීම
   II. සේනානායක මාවත සහ ඝුරිමළුව පාර වෙත සම්බන්ධ වීමට නව මාර්ගයක් ඉදිකිරීම හා එය සම්බන්ධ වන තල්ගස් කුඹුරවත්ත පාර පුළුල් කර සංවර්ධනය කිරීම
   III. දුම්රිය මාර්ගය හරහා ගුවන් පාලමක් ඉදි කිරීම (සේනානායක මාවත සම්බන්ධ වන ස්ථානය)
2. කෑගල්ල-රඹුක්කන මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම
3. බස් නැවතුම්පොළ ප්‍රතිසංවර්ධනය කිරීම
4. වාණිජ සංකීර්ණය ඉදිකිරීම
5. දුම්රිය ස්ථානය අසල සංචාරක නොරතුරු මධ්‍යස්ථානයක් සහිත පහසුකම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම
6. පින්නවල අලි අනාථාගාරය ඉදිරිපිට රථවාහන නැවතුම්පොල සංවර්ධනය හා අනවසර කඩ ප්‍රතිසංවර්ධනය කිරීම
7. පින්නවල ආයුර්වේද පංචකර්ම ආයතනය සංචාරක සුවතා මධ්‍යස්ථානයක් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම
8. අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය
9. වාගොල්ල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම
10. අපනයන කෘෂිකාර්මික අගය එකතු කිරීමේ කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම
11. පින්නවල ඇවිදින මංතීරු ව්‍යාපෘතිය-අදියර II
12. පින්නවල ජාතික පාසල අසළ යෝජිත ගුවන් පාලම ඉදි කිරීම
13. රඹුක්කන නගරයේ ළමා/ නාගරික උද්‍යානයක් සංවර්ධනය කිරීම

14. පින්නවලට පැමිණෙන සංචාරක බස් රථ සඳහා මෝදරවත්ත නව රථවාහන නැවතුම්පොළක් ඉදි කිරීම
15. කෑගල්ල රඹුක්කන මාර්ගයේ කරඹුපන මංසන්ධියේ සිට පින්නවල දක්වා සංචාරක ආකර්ෂණය වැඩි වන ඈ දර්ශනයක් නිර්මාණය කිරීම- අදියර I (පින්නවල සිට හිරිවඩුන්න දක්වා)

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

දෙවන ප්‍රමුඛත්ව ව්‍යාපෘති

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

1. රඹුක්කන - මාවනැල්ල මාර්ගය කිලෝමීටර් 5 ක් දුරට මංතීරු 2 ලෙසට සංවර්ධනය කිරීම
2. නගරයේ කානු පද්ධතිය ඉතිරි කොටස සංවර්ධනය කිරීම
3. හිරිවඩුන්න අන්දිරමඩ හරහා පොල්ගහවෙල මාර්ගයට සම්බන්ධ වන ලෙස හිරිවඩුන්න සමෘද්ධි බැංකුව හා පාලම අසලින් කෙටිදුර මාර්ගයක් ඉදිකිරීම.
4. ප්‍රදේශයේ ඇති ව්‍යාන්තීය ප්‍රහුණු මධ්‍යස්ථාන නැවත සංවර්ධනය කිරීම (වැලිගමුව වඩු පාසල, මොලගොඩ අත් යන්ත්‍ර වැඩපල සහ ජාතික ශිල්ප සභාව)
5. කැබැල්ලවත්ත බිංගෙය සඳහා යෝජිත විකල්ප පාර ඉදිකිරීම
6. රෝහල පාර කටුපිටිය මාර්ගය දක්වා දීර්ඝ කරන නව මාර්ගයක් ඉදිකිරීම
7. නගරයේ පිහිටි ගුඩ්ශෙඩ් ගොඩනැගිල්ල ආකේඩ් ආකෘතියට අනුව සංවර්ධනය කිරීම
8. පින්නවල -මා-ඔය ආශ්‍රිතව නාන තොටුපලක් ඉදිකිරීම
9. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අනුවර්තන පර්යේෂණ ඒකකය “කෘෂිකර්ම පර්යේෂණ විශ්වවිද්‍යාලක්” ලෙස වැඩි දියුණු කර සංවර්ධනය කිරීම
10. පොදු වෙළෙඳපොළ ප්‍රති සංවර්ධනය කිරීම
11. කටුපිටිය-කුරුණෑගල පාර පුළුල් කර සංවර්ධනය කිරීම
12. පින්නවල -මා-ඔය හරහා වැල් පාලමක් ඉදිකිරීම
13. වඟව ළමා උද්‍යානය සංවර්ධනය කිරීම
14. වාගොල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම ප්‍රහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ දේශීය කෘෂි නිශ්පාදන අළෙවිසැලක් ඇති කිරීම
15. සතිපොල සඳහා කෙටිදුර මාර්ගය සංවර්ධනය කිරීම
16. මා-ඔය අලි නාවන ස්ථානයක්ට ආසන්නව සනීපාරක්ෂක පහසුකම් සහිත පහසුකම් මධ්‍යස්ථානයක් ඇති කිරීම.
17. පින්නවල අලි අනාථාගාරයේ සිට සත්නුවත්ත දක්වා මාර්ගයට සමාන්තරව පදික ගමන් මංතීරුවක් නිර්මාණය කිරීම.

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

නෙවන පෙළ ප්‍රමුඛත්ව ව්‍යාපෘති

1. කොන්නානවත්ත -නවගමුව පාර පුළුල් කර සංවර්ධනය කිරීම
2. යෝජිත ස්වභාවික සංචාරක ගමන්මාර්ගය නිර්මාණය කිරීම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

3. පින්නවල ආශ්‍රිත මා-ඔයේ පිහිටි ස්වභාවික දූපත්, සංචාරකයිගේ දර්ශනය සඳහා සැලසීම.
4. ඕවෙල පාර සංවර්ධනය කිරීම.

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

5. දුම්රිය කෞතුකාගාරය ප්‍රති සංවර්ධනය කිරීම සහ භූ දර්ශන කලාපය අසළ දුම්රිය ආපනශාලාවක් ඇති කිරීම.
6. බයිසිකල් මංතීරුවක් ඇති කිරීම
    - අදියර I- දුම්රිය ස්ථානයේ සිට සේනානායක මාවත ඔස්සේ පින්නවල දක්වා
    - අදියර II- පින්නවල සිට කෑගල්ල -රඹුක්කන මාර්ගය දිගේ කරඩුපන දක්වා
7. තෝමස් සිල්වා මාවත ඉතිරි කොටස පුළුල් කර සංවර්ධනය කිරීම
8. හඳුනාගත් පහත සඳහන් මාර්ග දෙපස රුක් රෝපණයන් සිදු කිරීම
    - නගර මධ්‍යය කොටස
    - යෝජිත සේනානායක මාවත විකල්ප මාර්ගය
    - කටුපිටිය-කුරුණෑගල මාර්ගය (අධිවේගී මාර්ග පිවිසුම දක්වා කොටස)
    - අතුරු මාර්ගය (දුම්රියපොල පාර)
    - තෝමස් සිල්වා මාවත
    - කෑගල්ල-රඹුක්කන මාර්ගය
    - රඹුක්කන - මාවනැල්ල මාර්ගයේ කිරිවල්ලාපිටිය දක්වා
9. පින්නවල දක්වා නව දුම්රිය මාර්ගයක්(දුම්රිය බස් රථ සේවාවක් සඳහා) ඉදි කිරීම
10. පින්නවල ඇවිදින මංතීරුව සඳහා මුරකුටියක් සහ සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම
11. පින්නවල ළමා උද්‍යානයක් ඉදි කිරීම
12. මංගලගම "අම්බලම“ ගිමන් හරින ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම හා භාවිතයට ගැනීම
13. නවගමුව පත්තිනි දේවාලය සහ නුගවෙල පුරාණ ගිනිපත්තිනි දේවාලය සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් (සනීපාරක්ෂක පහසුකම් සහ පානීය ජල පහසුකම්)ලබා දීම.
14. රබර් අතුරු නිශ්පාදන කර්මාන්තයක් ලෙස රබර් ආශ්‍රිත සෙල්ලම්බඩු සැකසුම් කර්මාන්තශාලාවක් ඉදි කිරීම.

ව්‍යාපෘතිය: 01

ව්‍යාපෘතියේ නම	සේනානායක මාවත විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම		
ව්‍යාපෘති අංශය	අපරවයුහ පහසුකම් සංවර්ධනය		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	මොට්ටප්පුලිය, ඝුරිමළුව
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		රඹුක්කන දුම්රිය ස්ථානයේ සිට කෑගල්ල-රඹුක්කන මාර්ගයට ළඟාවීම සඳහා කෙටිදුර මාර්ගය වශයෙන් මෙම සේනානායක මාවත පවතී. මෙම මාර්ගයේ පළල සහ ගුණාත්මක භාවය අඩු අතර එය දුම්රිය මාර්ගය හරහා අනාරක්ෂිත ලෙස මිනිසුන් ගමන් කරයි. රඹුක්කන නගරය මග හැර යාමට හැකි විකල්ප මාර්ගයක් ලෙස සේනානායක මාවත සංවර්ධනය කිරීම සඳහා නව මාර්ග කොටසක් ඉදිකර එය තල්ගස් කුඹුරවත්ත මාර්ගයට සම්බන්ධ කළ යුතුය.	
ඉඩමේ අයිතිය	රජය හා පුද්ගලික	ඉඩමේ ප්‍රමාණය	කි.මී. 1.5

අපේක්ෂිත තත්ත්වය





ව්‍යාපෘති වර්ගය	නව		වැඩි දියුණු කිරීම	✓	දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	ඈ දර්ශන/ විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්	
						✓		

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 01

ව්‍යාපෘති පදනම	අධි ඝනත්ව වාණිජ කලාපයේ පිහිටා තිබෙන රඹුක්කන දුම්රිය ස්ථානයේ සිට මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය දක්වා මෙම මාර්ගය විහිදී ඇත. රඹුක්කන දුම්රිය ස්ථානයෙන් බසින සංචාරකයින්ට මෙම මාර්ගය හරහා ඉතා පහසුවෙන් පින්නවල් සංචාරක ප්‍රදේශ වෙත ගමන් කළ හැකිය. එමෙන්ම නගරය මග හැර යාම සඳහා විකල්ප මාර්ගයක් ලෙසද මෙය භාවිතා කළ හැකිය. ඒ සඳහා මෙම මාර්ගය පුළුල් කර ගුවන් පාලමක් සහිතව පහසුකම් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ පදනම වේ.						
ව්‍යාපෘතියේ අරමුණු	▪ රඹුක්කන දුම්රිය ස්ථානයෙන් රඹුක්කන නගරයට ඇතුළු වන දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා පින්නවල සංචාරක කලාපයට ගමන් කිරීම සඳහා භාවිත කළ හැකි කෙටිම මාර්ගය ලෙස සංවර්ධනය කිරීම. ▪ යෝජිත අධිවේගී මාර්ගය වෙත ගමන් කරන මගී ජනතාව සඳහා විකල්ප මාර්ගයක් ලෙස භාවිතා කිරීම ▪ දුම්රිය හරස් මාර්ගයක් ලෙස අනාරක්ෂිත මගී ගමන් අවම කර ආරක්ෂිත ලෙස දුම්රිය ස්ථානය වෙත යාමට පහසුකම් සැලසීම						
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)	√	දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)		
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය අධි ඝනත්ව නේවාසික කලාපය						

ව්‍යාපෘතිය: 02

ව්‍යාපෘතියේ නම	කෑගල්ල- රඹුක්කන මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම		
ව්‍යාපෘති අංශය	අපරවයුඟ පඟසුකම් සංවර්ධනය		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	යෝධගම, බනබුරය, පින්නවල, දලුග්ගල, රඹුක්කන නගරය
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		කෑගල්ල - රඹුක්කන මාර්ගය මංතීරු 02 ක් වශයෙන් පවතී. කොළඹ - මඟනුවර මාර්ගයේ කරඬුපන ඟන්දියේ සිට රඹුක්කන නගරය දක්වා මෙම මාර්ගය විහිදී ඇති අතර මෙය සංචාරක කලාපය සඳහා ඇතුළු වන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය වේ. එහෙත් සංචාරක කර්මාන්තය සඳහා මෙම ප්‍රවේශ මාර්ගය ප්‍රමාණවත් නොවන මට්ටමක පවතී.	
ඉඩමේ අයිතිය	පුද්ගලික /රජය	ඉඩමේ ප්‍රමාණය	කි.මී 5

අපේක්ෂිත තත්ත්වය

ව්‍යාපෘති වර්ගය	නව		වැඩි දියුණු කිරීම	✓	දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන/ විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පඟසුකම් සංවර්ධන	වෙනත්	
						✓		
ව්‍යාපෘති පදනම	පින්නවල සංචාරක කලාපයට සංචාරකයින් ඇදී ඒමේදි කෑගල්ල - රඹුක්කන මාර්ගය ප්‍රධාන තැනක් ගනී. රඹුක්කන දුම්රිය ස්ථානයේ සිට පැමිණෙන සංචාරකයින්, කරඬුපන ඟන්දියේ සිට පැමිණෙන සංචාරකයින් හා අන්දිරමඩ- පොල්ගඟවෙල පාරේ සිට පැමිණෙන සියලුම සංචාරකයින් මෙම මාර්ගය භාවිතා කරයි. මෙම මාර්ගය මංතීරු දෙකක් වශයෙන් පවතින බැවින් විශාල සංචාරක බස් රථ වැනි වාහන ඇතුළු වීමේදී මෙම මාර්ගය ප්‍රමාණවත් නොවේ. එමෙන්ම පදික වේදිකා, වීදි පහන් වැනි පඟසුකම් නොමැති අතර එය සංචාරකයින්ට සුව පහසු ප්‍රවාහන සේවයක් ලබාදීමට අපහසු වී ඇත. එමෙන්ම සංචාරක කලාපයට ඇතුල් වන මෙම මාර්ගයේ දෙපස භූ දර්ශනය, සංචාරක කලාපයක් සඳහා යෝග්‍ය වන අයුරින් සංවර්ධනය කිරීමට යෝජනාද ඉදිරිපත් කර ඇති බැවින් ඒවා සඳහාද මාර්ගය ඉඩකඩ සහිතව සංවර්ධනය විය යුතුය.					

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

	ව්‍යාපෘතියේ අරමුණු	සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීම සහ ර්ට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම					
	ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)	✓	(අවුරුදු 3 හෝ ර්ට වැඩි)	
ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය	ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය අධි ඝනත්ව නේවාසික කලාපය					

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 02

ව්‍යාපෘතිය: 03

ව්‍යාපෘතියේ නම	බස් නැවතුම්පල ප්‍රතිසංවර්ධනය කිරීම		
ව්‍යාපෘති අංශය	වාණිජ සංවර්ධනය		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	මොට්ටප්පුලිය
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		රඹුක්කන නාගරික බල ප්‍රදේශය තුළ ප්‍රධානතම වාණිජ හා සේවා සපයන නගරය රඹුක්කන නගරය වන නමුත්, නගරයේ ප්‍රධාන බස් නැවතුම්පොළ අඩු පහසුකම් සහිත කුඩා බස් නැවතුම්පලක් වශයෙන් පවතී. නගරයේ බස් නැවතුම්පොළවල් දෙකක් ක්‍රියාත්මක වන අතර ඒවා එකිනෙකට මුහුණලා පිහිටා ඇති නිසා වාහන තදබදයද අනාරක්ෂිත පදික භුවමාරුවද දක්නට ලැබේ.	
ඉඩමේ අයිතිය	රජය හා පුද්ගලික	ඉඩමේ ප්‍රමාණය	අක්කර 0.5
අපේක්ෂිත තත්ත්වය			
			

ව්‍යාපෘති වර්ගය	නව		වැඩි දියුණු කිරීම	✓	දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන / විනෝදකටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්	
						✓		

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 03

ව්‍යාපෘති පදනම	රඹුක්කන නගර මධ්‍ය ප්‍රදේශය ප්‍රධාන වාණිජ හා සේවා සපයන මධ්‍යස්ථානය ලෙසත්, සංචාරක හා කෘෂි කර්මාන්ත සඳහා අවශ්‍ය සේවා සැපයිය හැකි ප්‍රධාන නගරය ලෙසත් රඹුක්කන නාගරික සංවර්ධන බල ප්‍රදේශයේ ප්‍රමුඛත්වය ලබාගෙන ඇත. නමුත් නගර මධ්‍යයේ තිබෙන බස් නැවතුම්පොල පහසුකම් අඩු ඉතා කුඩා ප්‍රමාණයේ එකක් වේ. එබැවින්, ජනතාවගේ පොදු ප්‍රවාහන සේවා විධිමත් කර අවශ්‍ය පහසුකම් සහිතව සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියෙහි පදනම වේ.					
ව්‍යාපෘතියේ අරමුණු	අධි ඝනත්ව වාණිජ කලාපයේ නාගරික සේවා අවශ්‍යතා පුළුල් කිරීම වාණිජ සංවර්ධනය වැඩි කිරීම සඳහා භූමිය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම					
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)	✓	දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ර්ට වැඩි)	
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය					

ව්‍යාපෘතිය: 04

ව්‍යාපෘතියේ නම	වාණිජ සංකීර්ණය ඉදිකිරීම		
ව්‍යාපෘති අංශය	වාණිජ සංවර්ධනය		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	ඒරියාව
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		රඹුක්කන නගර මධ්‍යයේ රඹුක්කන සති පොළ යාබදව තිබෙන නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමකි. සතිපොල පොදු වෙළඳපොල, කෙසෙල්කැන් පොල යනාදී වාණිජ ඒකක අවට භාවිතයන් වේ. වාණිජ සංකීර්ණය ඉදිකිරීම සඳහා භූමිය සකස් කර ඇත.	
ඉඩමේ අයිතිය	නාගරික සංවර්ධන අධිකාරිය	ඉඩමේ ප්‍රමාණය	පර්චස් 50

අපේක්ෂිත තත්ත්වය											
ව්‍යාපෘති වර්ගය	නව	✓	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්				
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන/ විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්				
		✓									
ව්‍යාපෘති පදනම	රඹුක්කන නගර සංවර්ධන සැලැස්ම තුළින් අධි ඝනත්ව වාණිජ කලාපය තුළ පිහිටා ඇති රඹුක්කන නගරය ප්‍රදේශයේ ප්‍රධාන වාණිජ හා සේවා මධ්‍යස්ථානයයි. නමුත් පහසුකම් සහිත ක්‍රමවත් වාණිජ සංකීර්ණයක් රඹුක්කන නගරය තුල දක්නට නැත. එම අවශ්‍යතාවය සපුරාලීම මෙම ව්‍යාපෘතියේ පදනම වේ.										
ව්‍යාපෘතියේ අරමුණු	අධි ඝනත්ව වාණිජ කලාපයේ නාගරික වාණිජ සේවා අවශ්‍යතා පුළුල් කිරීම										
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)	✓	මධ්‍ය කාලීන (අවුරුදු 1-3)		දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)						
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය										

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 05

ව්‍යාපෘතිය: 05

ව්‍යාපෘතියේ නම	දුම්රිය ස්ථාන ඉඩම තුළ සංචාරක හොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම		
ව්‍යාපෘති අංශය	සංචාරක ප්‍රවර්ධනය සඳහා පහසුකම් වර්ධනය කිරීම		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	මොට්ටප්පුලිය
පිහිටීම		වර්තමාන තත්වය/අවට ඝාතිතය	
		කොළඹ - මහනුවර දුම්රිය මාර්ගයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් වශයෙන් රඹුක්කන දුම්රිය ස්ථානය හඳුන්වා දිය හැකිය. වාණිජ කලාපයේ තුළ පිහිටා ඇති රඹුක්කන දුම්රිය ස්ථානයේ ප්‍රධාන ප්‍රවේශපත්‍ර කවුළුව අසළ මේ සඳහා සුදුසු බිම් කොටසක් යෝජනා කර ඇත.	
ඉඩමේ අයිතිය	දුම්රිය ස්ථානය	ඉඩමේ ප්‍රමාණය	
අපේක්ෂිත තත්ත්වය	 		

ව්‍යාපෘති වර්ගය	නව	✓	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන/ විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්	
							✓	
ව්‍යාපෘති පදනම	පින්නවල සංචාරය කිරීම සඳහා රඹුක්කන දුම්රිය ස්ථානයෙන් බසින සංචාරකයින්ට රඹුක්කන පමණක් නොව සමස්ථ කලාපයේම (කෑගල්ල දිස්ත්‍රික්කයේම) සංචාරය කළ හැකි ස්ථාන පිළිබඳව හොරතුරු ලබා ගත හැකි මධ්‍යස්ථානයක් ඇති කිරීම හා							

	පැමිණෙන සංචාරකයින්ට විවේක ගැනීමට අවශ්‍ය පහසුකම්ද ඇති කිරීම මෙම ව්‍යාපෘතියයේ පදනම වේ.					
ව්‍යාපෘතියේ අරමුණු	සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම					
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)		දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)	
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය					

ව්‍යාපෘතිය: 06

ව්‍යාපෘතියේ නම	පින්නවල අලි අනාථාගාරය ඉදිරිපිට රථවාහන නැවතුම්පොල සංවර්ධනය හා අනවසර කඩ ප්‍රතිසංවර්ධනය කිරීම		
ව්‍යාපෘති අංශය	යටිතල පහසුකම් හා වාණිජ සංවර්ධනය කිරීම		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	යෝධගම
පිහිටීම 		වර්තමාන තත්වය/අවට භාවිතය පින්නවල අලි අනාථාගාරය ඉදිරිපිට ඇති මෙම රථවාහන නැවතුම්පොල අඩු පහසුකම් සහිත කුඩා ඉඩ ප්‍රමාණයක් සහිතය. දේශීය හා විදේශීය සංචාරකයින් බොහෝ දෙනෙක් සංචාරය කරන කලාපයක් වුවද ක්‍රමවත් හා ප්‍රමාණවත් රථවාහන නැවතුම්පොළක් දැකිය නොහැකිය. එමෙන්ම කෑගල්ල-රඹුක්කන මාර්ගයට මුහුණලා පවතින අක්‍රමවත් ලෙස ඉදි කර ඇති අනවසර වෙළෙඳසැල් හේතුවෙන් සංචාරක ආකර්ෂණයට බලපෑම් ඇති කරයි.	
ඉඩමේ අයිතිය	රඹුක්කන ප්‍රාදේශීය සභාව	ඉඩමේ ප්‍රමාණය	පර්චස් 20
අපේක්ෂිත තත්ත්වය 			

ව්‍යාපෘති වර්ගය	නව		වැඩි දියුණු කිරීම	✓	දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන / විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්	
			✓			✓		

ව්‍යාපෘති පදනම	ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන සංචාරක ආකර්ෂණ කලාපයක් ලෙස මෙම පින්නවල සංචාරක කලාපයේ පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් වැඩි සංචාරක ආකර්ෂණයක් සහ පැමිණෙන සංචාරකයින් සඳහා ගුණාත්මක සේවාවක් සැපයීම.					
ව්‍යාපෘතියේ අරමුණු	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපයේ සංචාරක ප්‍රවර්ධනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම					
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)	√	මධ්‍ය කාලීන (අවුරුදු 1-3)		දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)	
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය					

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතිය: 07

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 07

ව්‍යාපෘතියේ නම	පින්නවල ආයුර්වේද පංචකර්ම ආයතනය සංචාරක සුවතා මධ්‍යස්ථානයක් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම		
ව්‍යාපෘති අංශය	සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	කැරියම්පොල
පිහිටීම		වර්තමාන තත්වය/අවට ඝාවිතය	
		මධ්‍ය ඝනත්ව නේවාසිකය කලාපය තුළ පිහිටා ඇති මෙය ආයුර්වේද පංචකර්ම රෝහලක් ලෙස වර්තමානයේ පවතී. මෙම රෝහල සංචාරකයින් සඳහා විවෘත කිරීමට සංචාරක සුවතා මධ්‍යස්ථානයක් ලෙස අවශ්‍ය පහසුකම් (නේවාසික ප්‍රතිකාර) සංවර්ධනය වී නොමැත.	
ඉඩමේ අයිතිය	ආයුර්වේද දෙපාර්තමේන්තුව	ඉඩමේ ප්‍රමාණය	අක්කර 1.6

අපේක්ෂිත තත්ත්වය



ව්‍යාපෘති වර්ගය	නව		වැඩි දියුණු කිරීම	✓	දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන/ විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්	
							✓	
ව්‍යාපෘති පදනම	මධ්‍ය ඝනත්ව සංචාරක සංවර්ධන කලාපයේ පිහිටා ඇති මෙම මධ්‍යස්ථානය ප්‍රදේශයේ ජනතාව ආයුර්වේද ප්‍රතිකාර ලබා ගන්නා ප්‍රධාන ස්ථානයකි. නමුත් නේවාසික ප්‍රතිකාර සඳහා පහසුකම් නොමැති වීම මෙහි ප්‍රධානතම අඩුපාඩුවක් ලෙස පවතී. විශේෂයෙන් විදේශීය සංචාරකයන් ආයුර්වේද ප්‍රතිකාර සම්බන්ධව විශාල උනන්දුවක් දක්වන බැවින්, සංචාරක							

	ප්‍රවර්ධනය සඳහා ආයුර්වේද ප්‍රතිකාර ලබාගැනීමේ පහසුකම් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික පදනම වේ. සංචාරක සුවතා මධ්‍යස්ථානයක් ලෙස අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමද අපේක්ෂා කරයි.					
ව්‍යාපෘතියේ අරමුණු	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපයේ සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම					
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)		දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)	
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය					

ව්‍යාපෘතිය: 08

ව්‍යාපෘතියේ නම	අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය		
ව්‍යාපෘති අංශය	අපරවයුහ පහසුකම් සංවර්ධනය		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	හිරිවඩුන්න
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		නාරම්බැද්ද මාර්ගයේ හල්පිටිය ප්‍රදේශයේ පොල් වගා ඉඩමක් ලෙස පවතින භූමියකි. මා-ඔය ජල මූලාශ්‍රයට යාබදව පිහිටි මෙම භූමිය අවට ඉහා අඩු නේවාසික ජනගහනයක් දක්නට ලැබේ.	
ඉඩමේ අයිතිය	පුද්ගලික	ඉඩමේ ප්‍රමාණය	අක්කර 4

අපේක්ෂිත තත්ත්වය



ව්‍යාපෘති වර්ගය	නව	✓	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්		
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන / විනෝද කටයුතු		නැවත පදිංචි කිරීම්		යටිතල පහසුකම් සංවර්ධන		වෙනත්	
							✓		
ව්‍යාපෘති පදනම	රඹුක්කන නගරයේ සහ පින්නවල සංචාරක කලාපයේ සංසරණ ජනගහනය මත පදනම්ව සලකා බලන විට අප ජල කළමනාකරණ පද්ධතියක අවශ්‍යතාවය පවතී. අනාගත සැලසුම් හා ඉලක්ක අනුවද සංචාරක කලාපයේ විශාල සංචාරකයින් ප්‍රමාණයක් දෛනිකව පැමිණෙන බැවින් වැඩි අප ජලය ප්‍රමාණයක් බැහැර වේ යැයි								

	අපේක්ෂා කළ හැක. එමෙන්ම පින්නවල අලි අනාථාගාරය හා සත්නුවන්න නුළින්ද බැහැර කරන අප ජල ප්‍රමාණය ඉහල අගයක් ගනී. තවද සංචාරක හෝටල් වැඩි ප්‍රමාණයක් මා-ඔය ආශ්‍රිතව ස්ථානගත වී ඇත. මෙම අපජලයද විධිමත් අයුරින් බැහැර කිරීම අත්‍යවශ්‍යය. මෙකී කරුණු සලකා බලන විට විධිමත් ක්‍රමවේදයකට ප්‍රදේශයේ අප ජල බැහැර කරලීම හා කළමනාකරණය කිරීම මෙම ව්‍යාපෘතියේ පිහිටුවීමේ පදනම වේ.					
ව්‍යාපෘතියේ අරමුණු	මනා අප ජල කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම නුළින් ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම					
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)		දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)	✓
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය					

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 09

ව්‍යාපෘතිය: 09

ව්‍යාපෘතියේ නම	වාගොල්ල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම		
ව්‍යාපෘති අංශය	අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	යෝධගම
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් මෙම නව ගොඩනැගිල්ල වාගොල්ල දිස්ත්‍රික් කෘෂිකාර්මික මධ්‍යස්ථානයට යාබදව පිහිටා ඇත. මෙය උසස් අධ්‍යයනය ආයතනයක් පිහිටුවීමේ අරමුණින් ඉදිකරන ලද්දකි. විවිධ අවස්ථා වලදී විවිධ අදහස් හා යෝජනා මේ පිළිබඳව තිබුණද වර්තමානය වන විට කිසිදු භාවිතයකට වෙන් කර නැත. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු බොහෝදුරට  අවසන් කර ඇත.	
ඉඩමේ අයිතිය	රජය	ඉඩමේ ප්‍රමාණය	අක්කර 0.6

අපේක්ෂිත තත්ත්වය

ව්‍යාපෘති වර්ගය	නව		වැඩි දියුණු කිරීම	✓	දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	ඈ දර්ශන / විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්	
							✓	
ව්‍යාපෘති පදනම	කෑගල්ල-රඹුක්කන ප්‍රධාන මාර්ගයේ සංචාරක කලාපය හා වාගොල්ල කෘෂිකාර්මික ප්‍රදේශය තුළ පිහිටීමත් නිසා වෘත්තීය පුහුණුව සඳහා මධ්‍යස්ථානයක් ලෙස මෙය සංවර්ධනය කිරීම වඩාත් යෝග්‍ය වේ. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයට සහ කෘෂිකර්මාන්තයට අවශ්‍ය වෘත්තීමය ශ්‍රමිකයන් ප්‍රදේශය තුළින්ම නිර්මාණය කර ගැනීම මෙම ව්‍යාපෘති පිහිටුවීමේ පදනම වේ.						
ව්‍යාපෘතියේ අරමුණු	▪ වෘත්තීය පුහුණු පහසුකම් සංවර්ධනය කිරීම ▪ ප්‍රදේශයේ පවතින රැකියා ඉල්ලුම සපුරාලීම							

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)	✓	මධ්‍ය කාලීන (අවුරුදු 1-3)		දීර්ඝ කාලීන (අවුරුද්ද 3 හෝ ඊට වැඩි)	
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය					

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතිය: 10

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 10

ව්‍යාපෘතියේ නම	අපනයන කෘෂිකාර්මික අගය එකතු කිරීමේ කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම		
ව්‍යාපෘති අංශය	කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අපරවයුඟ පහසුකම් වැඩි දියුණු කිරීම		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	වැලිගමුව
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		මධ්‍ය ඝනත්ව කර්මාන්ත කලාපය තුළ රඹුක්කන - කුරුණෑගල මාර්ගයේ පිහිටි ඉඩමකි. වර්තමානයේ මෙම භූමිය තුළ පේෂකර්ම දෙපාර්තමේන්තුවට අයත් භාවිතයට ගත නොහැකි පැරණි ගොඩනැගිල්ලක් පවතී.	
ඉඩමේ අයිතිය	රජය	ඉඩමේ ප්‍රමාණය	අක්කර 0.4

අපේක්ෂිත තත්ත්වය



ව්‍යාපෘති වර්ගය	නව	✓		වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්					
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)			වාණිජ	භූ දර්ශන/ විනෝද කටයුතු		නැවත පදිංචි කිරීම්		යටිතල පහසුකම් සංවර්ධන		වෙනත්		
												✓	
ව්‍යාපෘති පදනම	යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගයේ වැලිගමුව පිවිසුමට පහසුවෙන් ප්‍රවේශකන්වය ලබාගත හැකි පරිදි පිහිටා තිබෙන ප්‍රදේශයක් බැවින්, ප්‍රදේශය පුරා පවතින කෘෂි නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා අගය එකතු කිරීමේ කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම හා ඒ තුළින් අපනයනය දිරිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ පදනම වේ. එමෙන්ම කර්මාන්ත කලාපයේ කර්මාන්ත කටයුතු ප්‍රවර්ධනය කිරීමද සිදුවේ.												
ව්‍යාපෘතියේ අරමුණු	▪ අපනයන කෘෂිකාර්මික නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා අවශ්‍ය කර්මාන්ත පහසුකම් සංවර්ධනය ▪ රැකියා අවස්ථාවක් උත්පාදනය කිරීම												

ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)	✓	දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)	
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව කර්මාන්ත කලාපය					

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතිය: 11

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 11

ව්‍යාපෘතියේ නම	පින්නවල ඇවිදින මංතීරු ව්‍යාපෘතිය-අදියර II		
ව්‍යාපෘති අංශය	සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා අපරවයුඹ පහසුකම් වැඩිදියුණු කිරීම		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	යෝධගම
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		මධ්‍ය ඝනත්ව සංචාරක සංවර්ධන කලාපයේ කෑගල්ල - රඹුක්කන මාර්ගයෙන් ප්‍රධාන ප්‍රවේශය ලබා ගනිමින් මා ඔය රක්ෂිතයට සමාන්තරව මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ අතර එහි අදියර I හිරිවඩුන්නේ සිට මීටර් 50ක් දුරට අවසන් කර ඇත. මෙහි අදියර II කොටස සඳහා භූමිය සකස් කර ඇත.	
ඉඩමේ අයිතිය	මා ඔය රක්ෂිතය	ඉඩමේ ප්‍රමාණය	මීටර් 50
අපේක්ෂිත තත්ත්වය			

ව්‍යාපෘති වර්ගය	නව		වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම	✓	ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන/ විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්	
				✓				

ව්‍යාපෘති පදනම	මධ්‍ය ඝනත්ව සංචාරක සංවර්ධන කලාපයේ සංචාරක ආකර්ශනය වැඩි කිරීම අරමුණු කරගෙන සංචාරකයින්ට විනෝද අවස්ථා වැඩි කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. සංචාරක ක්‍රියාකාරකම් වැඩි කිරීම නුළින් සංචාරකයින් වැඩි කාලයක් මෙම ප්‍රදේශය තුළ රඳවා ගැනීමද ප්‍රධාන අරමුණකි.						
ව්‍යාපෘතියේ අරමුණු	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපයේ සංචාරකයන් සඳහා භූ දර්ශන/ විවේක සහ විනෝද කටයුතු පහසුකම් සංවර්ධනය කිරීම						
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)	✓	මධ්‍ය කාලීන (අවුරුදු 1-3)		දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)		
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය						

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 12

ව්‍යාපෘතිය: 12

ව්‍යාපෘතියේ නම	පින්නවල ජාතික පාසල අසළ යෝජිත ගුවන් පාලම ඉදි කිරීම		
ව්‍යාපෘති අංශය	අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීම		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	පින්නවල
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		අධි ඝනත්ව නේවාසික කලාපයේ කෑගල්ල- රඹුක්කන මාර්ගයට මුහුණලා පිහිටි පින්නවල ජාතික පාසල අසළ පාසල් දින වලදී අධික තදබදයක් පවතී. පාසල් දරුවන් විශාල ප්‍රමාණයක් මාර්ගය හරහා ගමන් කිරීම නිසා අනාරක්ෂිත තත්ත්වයක් පවතී.	
ඉඩමේ අයිතිය	මාර්ග සංවර්ධන අධිකාරිය	ඉඩමේ ප්‍රමාණය	-

අපේක්ෂිත තත්ත්වය



ව්‍යාපෘති වර්ගය	නව	✓	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්		
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන/ විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්		
						✓			
ව්‍යාපෘති පදනම	අධි ඝනත්ව නේවාසික කලාපයේ කෑගල්ල - රඹුක්කන මාර්ගයේ පින්නවල ජාතික පාසල අසළ පවතින මාර්ග තදබදය අවම කිරීම හා පාසල් දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.								
ව්‍යාපෘතියේ අරමුණු	යටිතල පහසුකම් සංවර්ධනය කිරීම								
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)		✓	දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ර්ට වැඩි)			
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	අධි ඝනත්ව නේවාසික කලාපය								

ව්‍යාපෘතිය: 13

ව්‍යාපෘතියේ නම	ළමා/නාගරික උද්‍යානයක් ඉදිකිරීම		
ව්‍යාපෘති අංශය	විවේක හා විනෝද පහසුකම් වැඩිදියුණු කිරීම		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	රඹුක්කන නගරය
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		අධි ඝනත්ව වාණිජ කලාපයේ සතිපොලට යාබද පිහිටි භාවිතයට නොගන්නා බිම් කොටසක් මේ සඳහා යෝජනා කර ඇත. රථ වාහන නැවතුම්පොළක් සහ සති පොළ අවට භාවිතයන් ලෙස පවතී.	
ඉඩමේ අයිතිය	රඹුක්කන ප්‍රාදේශීය සභාව	ඉඩමේ ප්‍රමාණය	අක්කර 03

අපේක්ෂිත තත්ත්වය

- ඇවිදින /ව්‍යායාම මංතීරු
- විවේක ස්ථාන
- අවන්හල්/ආපනශාලා
- ළමා ක්‍රීඩා උපකරණ
- ආරක්ෂිත වැට/ ආරක්ෂක කුටිය
- විවේක කාමරය/ ගබඩාව
- ජල පොකුණක්





ව්‍යාපෘති වර්ගය	නව	✓	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්	
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන/ විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්	
				✓				
ව්‍යාපෘති පදනම	අධි ඝනත්ව වාණිජ කලාපයේ විවේක හා විනෝදාත්මක කටයුතු ප්‍රවර්ධනය කිරීම.							
ව්‍යාපෘතියේ අරමුණු	විවේක හා විනෝද පහසුකම් සංවර්ධනය කිරීම							
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)	✓	දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)			
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය							

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 14

ව්‍යාපෘතිය: 14

ව්‍යාපෘතියේ නම	පින්නවලට පැමිණෙන සංචාරක බස් රථ සඳහා මෝදරවත්ත නව රථවාහන නැවතුම්පොළක් ඉදි කිරීම		
ව්‍යාපෘති අංශය	අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීම		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	යෝධගම
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		මෙම යෝජිත භූමිය සංචාරක කලාපයේ පින්නවල අලි අනාථාගාරය සහ සත්නුවන්න අතර ප්‍රදේශයේ කෑගල්ල-රඹුක්කන මාර්ගයට යාබදව පිහිටා ඇත. සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් මෙම භූමිය සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.	
ඉඩමේ අයිතිය	සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	ඉඩමේ ප්‍රමාණය	අක්කර 2

අපේක්ෂිත තත්ත්වය



ව්‍යාපෘති වර්ගය	නව	✓	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්		
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	භූ දර්ශන / විනෝද කටයුතු	නැවත පදිංචි කිරීම්	යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්		
						✓			
ව්‍යාපෘති පදනම	ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන සංචාරක ආකර්ෂණ කලාපයක් ලෙස මෙම පින්නවල සංචාරක කලාපයේ පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීම නුළින් වැඩි සංචාරක ආකර්ෂණයක් සහ පැමිණෙන සංචාරකයින් සඳහා ගුණාත්මක සේවාවක් සැපයීම.								

ව්‍යාපෘතියේ අරමුණු	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපයේ සංචාරක ප්‍රවර්ධනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම					
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)	✓	දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)	
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය					

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ව්‍යාපෘතිය: 15

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

ව්‍යාපෘතිය 15

ව්‍යාපෘතියේ නම	කෑගල්ල රඹුක්කන මාර්ගයේ කරඹුපන මංසන්ධියේ සිට පින්නවල දක්වා සංචාරක ආකර්ෂණය වැඩි කිරීමට ඈ දර්ශන ප්‍රදේශයක් නිර්මාණය කිරීම- අදියර I (පින්නවල සිට හිරිවඩුන්න දක්වා)		
ව්‍යාපෘති අංශය	අපරවයුහ පහසුකම් වැඩිදියුණු කිරීම		
ව්‍යාපෘති විස්තර			
පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරී වසම
සබරගමුව	කෑගල්ල	රඹුක්කන	යෝධගම
පිහිටීම		වර්තමාන තත්වය/අවට භාවිතය	
		කෑගල්ල-රඹුක්කන මාර්ගය මේ සඳහා යෝජනා කර ඇති අතර එය පුළුල් කිරීමේ කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී. එයට සමගාමීව මෙම ඈ දර්ශන ව්‍යාපෘතිය සඳහා භූමිය වෙන් කළ යුතුව ඇත. මෙහිදී පින්නවල සිට හිරිවඩුන්න දක්වා අදියර 1 වශයෙන් හඳුනාගෙන සංවර්ධනය කිරීමට අපේක්ෂිත අතර ඒ සඳහා මාර්ගය දෙපස පිහිටි වාගොල්ල කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය හා සත්වෝද්‍යානයට අයත් රජයේ ඉඩම් වැඩි කොටසක් පවතී.	
ඉඩමේ අයිතිය	මාර්ග සංවර්ධන අධිකාරිය	ඉඩමේ ප්‍රමාණය	කි.මී 1.7
අපේක්ෂිත තත්ත්වය			

ව්‍යාපෘති වර්ගය	නව	✓	වැඩි දියුණු කිරීම		දීර්ඝ කිරීම		ඉඩම් සංවර්ධනය පමණක්		
ව්‍යාපෘති ප්‍රභේදය	සංරක්ෂක (පාරිසරික හෝ පුරාවිද්‍යාත්මක)		වාණිජ	ඈ දර්ශන/ විනෝද කටයුතු		නැවත පදිංචි කිරීම්		යටිතල පහසුකම් සංවර්ධන	වෙනත්
				✓					

ව්‍යාපෘති පදනම	සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීම සහ සංචාරක කලාපය සංවර්ධනය කිරීම					
ව්‍යාපෘතියේ අරමුණු	සංචාරක ආකර්ෂණය වැඩි කර ගැනීම					
ව්‍යාපෘති කාලය	කෙටි කාලීන (අවුරුදු 1)		මධ්‍ය කාලීන (අවුරුදු 1-3)	✓	දීර්ඝ කාලීන (අවුරුදු 3 හෝ ඊට වැඩි)	
ව්‍යාපෘතිය අයත් ඝනත්ව කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය					

II වන කොටස

07 වන පරිච්ඡේදය

ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග නියාමනය

7.1 හැඳින්වීම

2023-2033 කාල පරිච්ඡේදය සඳහා සකස් කරන ලද රඹුක්කන නගර සංවර්ධන සැලැස්මේ ඉඩම් හා ගොඩනැගිලි ඉදිරි වර්ෂයන් තුළ සංවර්ධනය විය යුතු ආකාරය මෙහිදී විස්තර කෙරේ. මෙම කලාපීකරණ සැලැස්ම හා සංවර්ධන රෙගුලාසි සැකසීමේදී ප්‍රදේශයේ භූ විෂමතාවය අවධානයට ගන්නා ලදී.

හැඳින්වීම

එමෙන්ම ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මික, සංචාරක හා කර්මාන්ත සංවර්ධන විභවතා ඔප්නැංවීම, පාරිසරික සංරක්ෂණ ප්‍රදේශයන් ආරක්ෂා කිරීම හා පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වටිනාකම් රැක ගැනීමත් හරහා ප්‍රදේශයේ නේවාසික ජනතාවට වඩා හිතකර ප්‍රදේශයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කිරීම මෙහිදී සිදු කෙරේ.

ඒ අනුව සංවර්ධන පීඩනය විශ්ලේෂණය (Development Pressure Analysis), පාරිසරික සංවේදීතා විශ්ලේෂණය (Sensitivity Analysis) බෑවුම් කලාප විශ්ලේෂණය (Slope Analysis) හා ජීවත් වීමට සුදුසු කලාප (Livability Analysis), විභවතා කලාප විශ්ලේෂණය (Potential Analysis) හා අපේක්ෂිත නාගරික ආකෘතිය යනාදිය පදනම් කර ගන්නා ලදී.

සංවර්ධන පීඩනය විශ්ලේෂණය සඳහා පවතිනා ජන ඝණත්වය, ජනගහන වර්ධන වේගය, නිවාස ඝණත්වය, යටිතල පහසුකම් ව්‍යාප්තිය, මාර්ග ඝණත්වය යන විශ්ලේෂණයන් පාදක කොට ගන්නා ලදී. මෙම සියළු විශ්ලේෂණයන් භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) හරහා ඒ ඒ විශ්ලේෂණයන්ගේ බලපෑම අනුව බර තබා සංවර්ධන පීඩනය විශ්ලේෂණය සකස් කර ගන්නා ලදී.

බෑවුම් කලාප විශ්ලේෂණය සඳහා ප්‍රධාන වශයෙන්ම භූ විෂමතාවයේ බෑවුම සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව රඹුක්කන ප්‍රාදේශිය සභා සීමාවම සැලකිල්ලට ගැනීමේදී මුහුදු මට්ටමේ සිට මීටර් 100-900 අතර උසක් දක්වා ව්‍යාප්ත වී ඇත. මෙහිදී නගර මධ්‍යයේ තැනිතලා භූ විෂමතාවයක් පෙන්නුම් කෙරෙන අතර නගරයෙන් ඔබ්බට යන විට ඊසාන හා ගිනිකොන සීමාවේ කඳු බෑවුම් ප්‍රදේශය වලින් සමන්විත වේ.

විභවතා කලාප විශ්ලේෂණය සඳහා දුම්රිය හා මහා මාර්ගය ව්‍යාප්තිය හා ඝණත්වය, යෝජිත අධිවේගී මාර්ගයේ ව්‍යාප්තිය, යටිතල පහසුකම්වල ව්‍යාප්තිය, පින්නවල සංචාරක කලාපය ඇතුළු පුරාවිද්‍යාත්මක හා සංචාරක ආකර්ශනීය ස්ථාන, ස්වභාවික ආකර්ශනීය ස්ථානවල ව්‍යාප්තිය වැනි විභවතාවන් සැලකිල්ලට ගෙන ඇත.

මෙලෙස විශ්ලේෂණය කර සකසා ගත් එක් එක් විශ්ලේෂණයන් භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) හරහා ඒ ඒ අංශයට අදාළ බලපෑම අනුව බර තබා සංවර්ධන දිශානතිය හඳුනා ගන්නා ලදී. පසුව අනාගත නේවාසික ජනගහනය හා සංක්‍රමණික ප්‍රජාව එම එක් එක් ප්‍රදේශවල පවතින දරාගැනීමේ හැකියාව මත ඇති කළ හැකි ඝනත්වය මත පදනම් වූ කලාපීකරණ සැලැස්ම සකස් කරන ලදී.

7.2 සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

7.2.1 සංවර්ධන කලාප

රඹුක්කන සංවර්ධන සැලැස්ම මඟින් රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ප්‍රධාන සංවර්ධන කලාප 06 කට බෙදා ඇති අතර එම ප්‍රධාන සංවර්ධන කලාප අපේක්ෂිත සංවර්ධන ඝනත්වය මත පදනම්ව නැවත උප කලාප 10කට බෙදා දක්වා ඇත. එම එක් එක් උප කලාප වලට අදාළ කලාප කේතයන්ද සහිතව පහත වගුවෙන් දක්වා ඇත. 2023-2033 සඳහා බල පැවැත්වෙන රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන කලාපිකරණ සැලැස්ම සිතියම් අංක 7.1 මඟින් දක්වා ඇත.

වගු අංක 7.1: සංවර්ධන කලාප

අනු අංකය	සංවර්ධන කලාපය	උප සංවර්ධන කලාපය	කලාප කේතය
01	නේවාසික කලාපය	අධි ඝනත්ව නේවාසික කලාපය	R1
		මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය	R2
		අඩු ඝනත්ව නේවාසික කලාපය	R3
02	වාණිජ කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය	C1
		මධ්‍ය ඝනත්ව වාණිජ කලාපය	C2
03	කර්මාන්ත කලාපය	මධ්‍ය ඝනත්ව කර්මාන්ත කලාපය	In2
04	සංචාරක කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය	T2
		අඩු ඝනත්ව සංචාරක කලාපය	T3
05	කෘෂිකාර්මික කලාපය	කෘෂිකාර්මික කලාපය I- කුඹුරු	A1
06	සංරක්ෂණ කලාපය	අධි සංවේදී සංරක්ෂණ කලාපය - වනාන්තර	Cn1

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

7.2.2 කලාපීකරණ සැලසුම

සිතියම් අංක 7.1: රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන කලාපීකරණ සැලැස්ම, 2033-2033



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

7.3 කලාප සංගුණකය

රඹුක්කන සංවර්ධන සැලැස්ම මගින් රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ප්‍රධාන සංවර්ධන කලාප 06 කට බෙදා ඇති අතර එම ප්‍රධාන සංවර්ධන කලාප අපේක්ෂිත සංවර්ධන ඝනත්වය මත පදනම්ව නැවත උප කලාප වලට බෙදා දක්වා ඇත. ඒ අනුව, එම සංවර්ධන කලාපය සඳහා අපේක්ෂිත සංවර්ධන ඝනත්වය හා සංවර්ධනය කල හැකි භූමි ප්‍රමාණය මත පදනම්ව කලාප සංගුණකය නිර්ණය කරන ලදී. (වගු අංක 7.2)

වගු අංක 7.2: සංවර්ධන කලාපවලට අදාළ කලාප සංගුණකයන්

අනු අංකය	සංවර්ධන කලාපය	උප සංවර්ධන කලාපය	කලාප කේතය	කලාප සංගුණකය
01	නේවාසික කලාපය	අධි ඝනත්ව නේවාසික කලාපය	R1	1.82
		මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය	R2	1.21
		අඩු ඝනත්ව නේවාසික කලාපය	R3	0.6
02	වාණිජ කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය	C1	2.23
		මධ්‍ය ඝනත්ව වාණිජ කලාපය	C2	1.76
03	කර්මාන්ත කලාපය	මධ්‍ය ඝනත්ව කර්මාන්ත කලාපය	In2	1.42
04	සංචාරක කලාපය	මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය	T2	1.41
		අඩු ඝනත්ව සංචාරක කලාපය	T3	0.5
05	කෘෂිකාර්මික කලාපය	කෘෂිකාර්මික කලාපය I (කුඹුරු)	A1	0
06	සංරක්ෂණ කලාපය	අධි සංවේදී සංරක්ෂණ කලාපය (වනාන්තර)	Cn1	0

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

7.4. සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

i. වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ අංක 1144/25 හා 2000.08.11 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිපාලන සීමාව තුල පිහිටි සියලුම ප්‍රදේශයන් සඳහා මෙම රෙගුලාසි බල පැවැත්වේ.

ii. රඹුක්කන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී, කලාපිකරණ සැලැස්මේ නියමතාවන්ට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021 ජූලි මස 08 දිනැතිව හා අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති සැලසුම් හා සංවර්ධන රෙගුලාසි ද බලාත්මක වේ.

iii. 1986.03.10 දිනට පෙර නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ සඳහා 1986.03.10 දිනට පෙර අනුබෙදුම් කර ඇති අවම බිම් ප්‍රමාණය ව.මී. 150ට අඩු බිම් කොටස්, පවත්නා බිම් කට්ටියක් ලෙස සලකන අතර 1986.03.10 දිනට පසු නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ සඳහා නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති දිනට පෙර අනුබෙදුම් කර ඇති අවම බිම් ප්‍රමාණය ව.මී. 150ට අඩු බිම් කොටස්, පවත්නා බිම් කට්ටියක් ලෙස සලකනු ලබයි.

iv. සංවර්ධන නියාමන ප්‍රදේශ සඳහා සංවර්ධන නියාමන සැලසුම් මගින් (Development Guide Plan) හඳුන්වා දෙනු ලබන රෙගුලාසි අදාළ වන අතර එම රෙගුලාසි හඳුන්වාදෙන තෙක් මෙම සැලැස්මේ සඳහන් කලාපිකරණ රෙගුලාසි එම ප්‍රදේශ සඳහාද බල පැවැත්වේ. එමෙන්ම ඉහත සංවර්ධන නියාමන ප්‍රදේශයන්හි සිදුකිරීමට නියමිත සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මුලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලබාගත යුතු අතරම, අධිකාරිය විසින් සකස් කර ඇති කෙටුම්පත් සංවර්ධන නියාමන සැලැස්ම ප්‍රකාරව සංවර්ධනයන් තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

v. යම් ඉඩමක අයිතිකරුවකු විසින්, වීථි රේඛාවට/යෝජිත මාර්ග පළලට අයත් වන ඉඩම් කොටස මාර්ගය සඳහා වන්දියකින් තොරව ප්‍රදානය කරන්නේ නම්, යෝජිත සංවර්ධන කටයුත්ත සඳහා වන අවසරලත් ගෙබිම් අනුපාතය සඳහා සම්පූර්ණ ඉඩමේ ප්‍රමාණය සලකා බලනු ලබයි. නමුත් බිම් කට්ටි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී වීථි රේඛාවට/ යෝජිත මාර්ග පළලට අයත් වන කොටස හැර ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණය සැලකිය යුතුය.

vi. එකිනෙකට ස්වායත්තව ප්‍රධාන මාර්ගයන් හා සම්බන්ධ වන, අවම පළල මීටර් 6ට හෝ ඊට වැඩි සහ නිත්‍යානුකූල ප්‍රවේශ අයිතිය හිමි මාර්ග එකකට වඩා වැඩි ප්‍රමාණයක් සංවර්ධන පරිශ්‍රයට මුහුණලා ඇති අවස්ථාවන්හිදී, ප්‍රවේශ මාර්ගයේ පළල ලෙස එකී සියලු මාර්ගවල පළල එකතුව සලකා අවසරලත් සංවර්ධනය ගණනය කිරීම අවස්ථානුකූලව සලකා බැලිය හැකිය.

vii. කිසියම් ඉඩමක් කලාප දෙකකට හෝ වැඩි ගණනකට වැටෙන සේ පෙන්වා දී ඇති අවස්ථාවන්හිදී, එම බිම් ප්‍රදේශයට හසුවන කලාපය තීරණය කරනු ලබන්නේ, එම බිම් කොටසට ප්‍රවේශය ලබන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය අයත් කලාපය මගිනි.
එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් කලාපය අදාළ කරගත යුතුය.
*සංරක්ෂණ කලාප සඳහා මෙම නියමනාවය අදාළ නොවේ.

viii. කිසියම් බිම් කොටසක් පළාත් පාලන බල ප්‍රදේශ දෙකක් අතරට හසු වන සේ පිහිටා ඇති විටකදී, එම බිම් කොටසට ප්‍රධාන ප්‍රවේශය ලබන කලාපයේ භාවිතයන් සඳහා යොදාගැනීම අදාළ පළාත් පාලන ආයතනවල එකඟතාවය මත අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ.
එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් පළාත් පාලන බල ප්‍රදේශය අදාළ කරගත යුතුය.

ix. යම් ප්‍රවේශ මාර්ගයක පළමු බිම් කොටස හරහා කලාප මායිම් වැටී ඇති විටක, එකී බිම් කොටසේ ප්‍රවේශ මාර්ගයට සමාන්තරව ඈතින්ම පිහිටි අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතු වේ.
යම්හෙයකින්, පිටුපස බිම් කොටස් පළමු බිම් කොටසට ඒකාබද්ධ කර තනි ඉඩමක් ලෙස අනුමත කර ඇතිවිටක, එකී තනි ඉඩමේ අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතුය.

x. කලාපිකරණ සැලැස්මේ පෙන්වා දී ඇති මායිම්, භෞතික මායිම් හා භූගෝලීය බණ්ඩාංක යන දෙකෙන්ම නිර්වචනය කර ඇති අවස්ථාවකදී මායිම් වෙනසක් සිදු වුවහොත් ඒ පිලිබඳ අවසාන තීරණය නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව සතු වේ.

xi. කලාපිකරණ සැලැස්මේ අවසරලත් භාවිත කාණ්ඩයේ සඳහන් නොවන නමුත් එකී කලාපයේ අවසරලත් භාවිතයන් හා සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබාදීම පිලිබඳ තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

07 පරිච්ඡේදය
ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග නියාමනය

xii. යෝජිත කලාපිකරණ සැලැස්ම තුල අනුමත භාවිතයන් නොවන නමුත් දැනට පවත්වාගෙන යන භාවිතයන් තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පමණක් අවසර ලබාදීම සලකා බලනු ලැබේ. නමුත් පවත්නා භාවිතයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා අනුමැතිය ලබා දීම පිලිබඳව සලකා බලනු නොබලන අතර භාවිතය දිගින් දිගටම පවත්වාගෙන යාම අභිතකර යැයි හැඟි යන්නේ නම් එකී භාවිතය නතර කරන ලෙස නියම කරනු ලැබිය හැක.

සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

xiii. ගොඩනැගිලි සිමාව තුල මායිම් තාප්ප ඉදිකිරීම සඳහා මාර්ගය අයත් ආයතනය සමග නිර්වන්දි ගිවිසුමක් අත්සන් කිරීමට යටත්ව අනුමැතිය සඳහා සලකා බැලිය හැක.

xiv. ප්‍රදේශයේ මංසන්ධි, මාර්ග දෙපස ගොඩනැගිලි සිමා, මාර්ග පළල් කිරීමේ සිමා හා රක්ෂිත තුල විවිධ ආගමික ප්‍රතිමා, ආගමික සංකේත, සලකුණු හෝ ඒ සමාන ඉදිකිරීම් සඳහා අවසර නොදෙන අතර, එවැනි ඉදිකිරීම් ඉවත් කිරීමේදී ඒ සඳහා වන්දි ගෙවීමක් සිදු නොකරනු ලබයි.

xv. සුසාන භූමියක්/ආදාහනාගාරයක් සඳහා යම්කිසි ඉඩමක් වෙන් කරනු ලබන්නේ නම් අදාළ පළාත් පාලන ආයතනයේ හා නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශ ලබාගත යුතුය.

xvi. සංවර්ධන සැලැස්ම තුල හඳුනාගෙන නොමැති නමුත් පහත් බිම්, වගුරු බිම්, කුඹුරු, පුරන් කුඹුරු, දෙණිය, තෙත්බිම් හෝ ඕවිට හෝ ර්ට අනුගාංශික ඉඩම් සඳහා අවසර දීමේදී නාගරික සංවර්ධන අධිකාරියෙහි නිරවුල් සහතිකයක් ලබාගත යුතුය.

xvii. යම් සංවර්ධනයක් සඳහා කැළුණු දොඔකර භාවිතා කරනු ලබන්නේ නම් ඒ සඳහා සුදුසුකම්ලත් ඉංජිනේරුවරයකුගේ නිර්දේශ සහ රක්ෂණාවරණයක් සහිතව අවසර පත්‍රයක් අදාළ සංවර්ධනය සඳහා අනුමැතිය ලබාදීමේදී ඉදිරිපත් කළ යුතුය.

xviii. පාසල් හා ළමා නිවාස සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී වීවෘත ඉඩකඩ වශයෙන් භූමියෙන් 50%ක ප්‍රමාණයක් වීවෘතව තැබීය යුතු වේ.

xix. රථවාහන නැවතුම් ඉඩකඩ සංවර්ධන භූමිය තුළින්ම සැපයීමට අපොහොසත් වන්නේනම්, උපරිමය මීටර් 500ක දුරකින් පවතින භූමියක් ඒ සඳහා යොදා ගැනීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සිදුකළ හැකිය.

xx. අධිකාරිය විසින් හඳුනා ගනු ලබන ප්‍රදේශ වල අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි ගෘහ නිර්මාණ/ සැලසුම්කරණ නියමතා පැනවිය හැකිය.

07 පරිච්ඡේදය
ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග නියාමනය

xxi. මෙම සැලසුම් ප්‍රදේශය තුල පවතින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යනාදී රාජ්‍ය ආයතන දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්ට අයත් ඉඩම් හෝ රක්ෂිත කලාපයන්හි සංවර්ධන කටයුතු සිදු කිරීමට ප්‍රථමයෙන් අදාළ ආයතනයන්ගේ නිර්දේශයන් හා සංවර්ධන යෝජනා ලබා ගත යුතු වේ.

සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

xxii. සියලු කැණීම් කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුළු අදාළ ආයතනයන්හි නිර්දේශයන්ට අනුව සිදු කල යුතු අතර, එම කටයුත්ත නිම වීමෙන් පසුව එකී ආයතනයේ නිර්දේශයට අනුකූලව කැණීම් කරන ලද ස්ථාන යථා තත්වයට පත් කිරීම හෝ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

xxiii. යම්කිසි නීතිගත සැලසුම්, සංවර්ධන හෝ ගොඩනැගිලි රෙගුලාසියක් සම්බන්ධයෙන් හෝ එහි අර්ථකථනය සම්බන්ධයෙන් හෝ ප්‍රයෝගික භාවිතය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගෙන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව සතුවේ.

xxiv. සංවර්ධන අනුමැතිය ලබා දීමේදී යම් හේතුවක් නිසා භූමිය සම්බන්ධව රෙගුලාසියක් ලිහිල් කරන්නේ නම් හෝ ඉවත් කරන්නේ නම් සහ එම රෙගුලාසියට අයත් ඉඩමේ ප්‍රමාණය සංඛ්‍යාත්මකව ගණනය කර, ඊට අදාළ වටිනාකම තක්සේරු කර, එම වටිනාකමින් 30% කට නොවැඩි මුදලක් අවස්තානුකූලව අධිකාරියට අය කර ගත යුතුය.

xxv. මෙම නාගරික බල ප්‍රදේශය තුළ සෑම ඉදිකිරීමක් සඳහාම භූමි යෝග්‍යතාව හා ඉදිකිරීම සම්බන්ධව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) නිර්දේශය ලබා ගත යුතු අතර, මීටර් 1.5 ට වැඩි උස ඉවුරු කැපීම් වලදී හා ආනතියක් සහිත භූමියක ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී පහත රෙගුලාසි බලපැවැත්වේ.

- මීටර් 1.5 ට වැඩි උස ඉවුරු කැපීමකදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ අනුව කටයුතු කිරීම අනිවාර්යය වේ. එසේ වුවද කැපුම් කරනු ලබන ඉවුරේ උස මීටර් 1.5 ට

වඩා අඩුවන හා එම කැපුම් තලයට රැඳවුම් බැම් ඉදි නොකරනු ලබන අවස්ථා වල යාබද මායිමේ සිට කැපුම් තලයේ ආරම්භක ස්ථානයට අවම වශයෙන් මීටර් 1 ක දුරක් වෙන්කර තැබීමට කටයුතු කල යුතුය.

- ආනතියක් සහිත භූමියක බිම් කට්ටියක අවම විශාලත්වය සැලකීමේදී කලාපීකරණ රෙගුලාසි වල නියම කර ඇති බිම් කට්ටියක අවම විශාලත්වය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නියම කරනු ලබන බිම් කට්ටියක අවම විශාලත්වය යන දෙකෙන් වඩා වැඩි අගය බලපැවැත්වේ.
- ආනතියක් සහිත භූමියක භූමි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී අංක 2235/54-2021 ජූලි මස 03 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් සැලසුම් හා සංවර්ධන නියෝගයන්හි හා කලාපිකරන රෙගුලාසි මගින් නියම කර ඇති භූමි ආවරණ ප්‍රතිශතය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නියම කරනු ලබන භූමි ආවරණ ප්‍රතිශතය යන අගයන්ගෙන් වඩා අඩු අගය බල පැවැත්වේ.

xxvi. ප්‍රාදේශීය සභා සීමාව තුළ පවත්නා අඩි පාරවල් , පඩිපෙළ හා සියලුම මාර්ග වලට අදාළවන ගොඩනැගිලි සීමා හා යෝජිත අවම මාර්ග පළල ද ගංගා සහ ඇළ මාර්ගවලට අදාළ රක්ෂිත හෝ ගොඩනැගිලි සීමා ප්‍රදේශයන් ද 09 වන පරිච්ඡේදයට අනුකූල විය යුතුය. එමෙන්ම, ගංගා සහ ඇළ මාර්ගවලට අදාළ රක්ෂිත හෝ ගොඩනැගිලි සීමා සුදුසු ශාක වගාවන් සහිතව පවත්වා ගත යුතුය.

xxvii. බෑවුම් ආනතියක් සහිත භූමි භාගයක සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේ දී සංවර්ධන ස්ථානයේ භූ විෂමතාව සලකා බලා මීටර් 1.5 ක පළලකින් යුතු පියගැටපෙලකින් ප්‍රවේශකත්වය ලබා ගැනීම සලකා බලනු ලැබේ.

xxviii. යෝජිත කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන, සනීපාරක්ෂක කසළ මධ්‍යස්ථාන හෝ වෙනත් ඒ ආශ්‍රිත කාර්යයක් සඳහා යොදාගනු ලබන භූමියක මායිමේ සිට මීටර් 100ක් දක්වා ප්‍රදේශය හරිත වැටියක් ලෙස පවත්වාගත යුතු අතර එම හරිත වැටිය තුළ කිසිදු නේවාසික භාවිතයක් සඳහා අවසර ලබා නොදිය යුතුය.

xxix. කිසියම් සංවර්ධන කටයුත්තකට අදාළව අනුමැතිය ලබාදීමේදී කලාපිකරණ රෙගුලාසි තුල අවම බිම් ප්‍රමාණය සඳහන් කර නොමැති අවස්ථාවලදී බිම් කොටසක අවම විශාලත්වය පර්චස් 6 ක් විය යුතුය. එසේ වුවද, පොදු ජල සැපයුමක් නොමැති ප්‍රදේශවල අනුමැතිය සලකා බැලීම සඳහා අවම බිම් ප්‍රමාණය පර්චස් 10 ක් තිබිය යුතුය.

07 පරිච්ඡේදය
ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග නියාමනය

xxx. ජලාභිමුඛව සිදු කෙරෙන සියලු නේවාසික නොවන ඉදිකිරීම් කටයුතු සඳහා අවසර ලබාගැනීමේදී අපජල කළමනාකරණ සැලැස්මක් ඉදිරිපත් කළ යුතු අතර මා-ඔය හා රඹුක්කන් ඔය ආශ්‍රිතව සිදු කරන සංවර්ධන කටයුතුවලදී ගඟ ඉවුරේ සිට රක්ෂිත හෝ ගොඩනැගිලි සීමාව වශයෙන් පවත්වාගතයුතු භූමිය සඳහා වන භූ දර්ශන සැලැස්මක් අදාළ ගොඩනැගිලි සැලසුම් සමඟ ඉදිරිපත් කළ යුතුය.

සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

xxxi. ගංගාවක් හෝ ප්‍රධාන ඇළ මාර්ගයක් නොවන අවස්ථාවකදී අදාළ ආයතනයන්ගේ නිර්දේශයන්ට යටත්ව ඉවුරු බැමි ඉදිකිරීම සඳහා අවසර ලබාදෙනු ලබන අතර එකී බැමි මත මායිම් තාප්ප හෝ වෙනත් එවැනි නිර්මිත ඉදිකරන්නේ නම් ඉවුරු බැම්මේ කෙළවර සිට මීටර් 0.75 ක සීමාවක් පිටුපසට ගෙන ඉදිකිරීම් කළ යුතුය.

xxxii. කලාපිකරණය තුළින් අවසර ලබාදිය හැකි භාවිතයන් වුවද නේවාසික කලාපයන්හි සිදුකරනු ලබන නේවාසික නොවන සංවර්ධනයක් හේතුවෙන් ශබ්ද දූෂණය/ වායු දූෂණය/ භූගත හෝ මතුපිට ජලය දූෂණයට තුඩු දෙන්නා වූ සංවර්ධන කටයුතු වලදී මෙන්ම සමාජීය තත්ත්වයන්ට නොගැලපේ යැයි සමාජය තුලින්ම විරෝධතාවයක් මතුවේයැයි හැඟී යනු ලබන සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සලකා බලනු ලබන අතර එවැනි සංවර්ධන කටයුතු නියාමනය සඳහා කොන්දේසි පැනවීමේ බලය හා අවසර නොදීමේ බලය අධිකාරිය සතුවේ.

xxxiii. රඹුක්කන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ භදුනාගෙන ඇති ආකර්ෂණීය ස්ථානයන් නැරඹීම සඳහා නම්කර ඇති (අදාළ ඝණත්ව කලාපවල උපලේඛනවල සඳහන්) නැරඹුම් ස්ථානයන්හිදී දර්ශනපථය අවහිරවන ආකාරයේ කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර ලබානොදෙන අතර දර්ශනපථයට බාධාවක් නොවන ඉදිකිරීම් සඳහා මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව අවසර ලබාදීම සලකා බලනු ලැබේ.

ඉහත කරුණු වලට අමතරව ගැසට් පත්‍ර අංක 2235/54 යටතේ 2021.07.08 දින ප්‍රකාශ කරන ලද සැලසුම් හා ගොඩනැගිලි නියෝගයන්හි රෙගුලාසි අංක 55(3) සහ 73 රෙගුලාසිය සහ 10 වන උපලේඛනය රඹුක්කන ප්‍රාදේශීය සභා ප්‍රදේශයට අදාළ කර ගැනීමේදී පහත පරිදි අදාළ කරගත යුතුයි.

xxxiv. 10 වන උපලේඛනයේ අංක 2 යටතේ වන පළමු, දෙවන භාවිතයන් සඳහා සම්මත වාහන අවශ්‍යතාවය වර්ග මීටර් 100 ක් සඳහා එක් ඉඩකඩක් බැගින් විය යුතුය.

07 පරිච්ඡේදය
ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග නියාමනය

xxxv. 10 වන උපලේඛනයේ අංක 2 යටතේ 8 වන වාණිජ භාවිතය (සැලුන්/රූපලාවන්‍යාගාර/ පාරිභෝගික සේවා ස්ථාන/ බාබර් සාප්පු) සඳහා සම්මත වාහන අවශ්‍යතාව වර්ග මීටර් 50 ට එක් ඉඩකඩක් බැගින් විය යුතුයි.

සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමනා

xxxvi. වාහන නතර කිරීමේ පහසුකම යටතේ වන අංක 73 හි අනු අංක 08 හි (ආ) සහ (ඈ) හි සඳහන් ප්‍රවේශ මාර්ගයන්හි ඇලකරණය නැඹීමේදී අදාල දුර ප්‍රමාණයන් යෝජිත මාර්ග පළල හෝ මාර්ග පුළුල් කිරීමේ යෝජනාවෙහි ඇතුලත් මාර්ග පළලෙහි කෙළවර සිට තැබිය යුතුය.

xxxvii. වාහන නතර කිරීමේ පහසුකම යටතේ වන අංක 73 හි අනු අංක 16 (අ) යටතේ වන රථවාහන ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කිරීම ජාතික මාර්ග පද්ධතියෙන් ප්‍රවේශය ගනු ලබන හෝ එම මාර්ගයන්හි රථවාහන ගමනාගමනයට බලපෑමක් සිදු විය හැකි යැයි නිරීක්ෂණය වන අවස්ථාවක 16 (අ) යටතේ වන සංවර්ධනයන් සඳහා රථවාහන ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

xxxviii. 10 වන උපලේඛනයේ පරිදි කිසියම් සංවර්ධන කටයුත්තක් සඳහා සැපයිය යුතු වාහන නැවතුම් අවශ්‍යතාවය ගණනය කිරීමේදී ගොඩනැගිල්ලේ ගෙබිම් ප්‍රමාණය හෝ වාහන අවශ්‍යතා ගණනය කිරීමේදී ඉහිරිවන ගෙබිම් ප්‍රමාණය එක් වාහන අවශ්‍යතාවක් සඳහා වන ගෙබිම් ප්‍රමාණයෙන් 50% ක් හෝ ඊට අඩු වන අවස්ථාවක එම රථගාල් අවශ්‍යතාව සඳහා යෝජිත මාර්ග පළල හෝ මාර්ග පුළුල් කිරීමේ යෝජනාව ඇතුලත් මාර්ග රේඛාව සහ ගොඩනැගිලි සීමාව අතර පවත්නා ඉඩකඩද ඇතුලත්ව එක් වාහන ඉඩකඩක් සැලසුම් කිරීම සලකා බලනු ලැබේ.

xxxix. විවෘත ඉඩකඩ සහ ගොඩනැගිලි දුරස්ථ කිරීම යටතේ වන රෙගුලාසි අංක 55 හි අනු අංක 03 හි සඳහන් ගොඩනැගිලි දුරස්ථ කිරීම් පහත සඳහන් අවස්ථාවල හැර යම් ගොඩනැගිලි සීමාවක් හෝ වීථි රේඛාවක් හෝ වෙන යම් මාර්ග රක්ෂිතයක් නියම කර නොමැති අවස්ථාවක, මීටර් 1 ක ගොඩනැගිලි දුරස්ථ කිරීමක් එම මාර්ගයට / මාර්ග මායිමේ සිට තැබිය යුතුය.

(යම් මාර්ගයක් මීටර් 50 කට අඩු දුරකින් අවසන් වන ආවෘත මාර්ගයක් නම් හෝ එක් බිම් කට්ටියකට පමණක් ප්‍රවේශය ලබා ගනු ලබන අවස්ථාවක සහ අදාල ගොඩනැගිලි සැලසුම් කිරීමේදී ප්‍රවේශ මාර්ගයට අවභිරයක් නොවන ලෙස සහ වැසි ජලය ඍජුව මාර්ගයට නොවැටෙන ලෙස සැලසුම් කරන ගොඩනැගිලි වලදී.)

xl. සියලුම කලාපවල සිදුකෙරෙන බණ්ඩ කැණීම් කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් මූලික සැලසුම් නිරාකරණයක් ලබා ගත යුතු වේ.

07 පරිච්ඡේදය
ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග නියාමනය

xli. පියගැට පෙළකින් ප්‍රවේශකත්වය ගන්නා ඉඩම් සඳහා පහත පිරිවිතර අදාළ වේ.

- රඹුක්කන ප්‍රාදේශිය සභාව විසින් නඩත්තු කරනු ලබන පියගැටපේලි සහ පුද්ගලික පියගැටපේලි සඳහා ගොඩනැගිලි සීමාව පියගැටපෙල මායිමේ සිට මීටර 1ක් වේ.
  (අනුමත භාවිතයන්-නේවාසික, සංචාරක හා කෘෂිකාර්මික හා වර්ග මීටර 25ට අඩු වාණිජ ස්ථාන)
- පියගැටපෙලකින් ප්‍රවේශකත්වය ලබා ගන්නා ඉඩම් අනු බෙදුම් කිරීමට පෙර නා.සං.අ. මූ.සැ.නි ලබා ගත යුතුය.
- අනුබෙදුම් කළ හැකි උපරිම බිම් කට්ටි 4ක් සඳහා පමණි.
- පියගැටපෙලකින් ප්‍රවේශකත්වය ලබා ගන්නා වාණිජ හෝ සංචාරක ගොඩනැගිලි සඳහා අනුමැතීන් අයදුම් කිරීමට ප්‍රථම, නා.සං.අ. මු.සැ.නි ලබා ගත යුතුය.
- පියගැටපෙලකින් ප්‍රවේශකත්වය ලබන විට නේවාසික භාවිතාවය සඳහා රථ වාහන නැවතුම් ස්ථාන අවශ්‍ය නොවන අතර සංචාරක භාවිතය සඳහා පඩිපේලිය පටන් ගන්නා ස්ථානයේ සිට මීටර 250ක අරයක් තුල රථවාහන නැවතුම් ස්ථාන පෙන්විය යුතුය.
- මෙවැනි සංවර්ධන අවස්ථාවකදී ගිනි ආරක්ෂණය සඳහා සංවර්ධනකරු විසින් විශේෂ යෝජනාවක් ඉදිරිපත් කර පලාත් පාලන ආයතනයේ ගිනි නිවීමේ දෙපාර්තමේන්තුවේ හෝ බලයලත් ආයතනයකින් සහතික කරවා ගත යුතුය.
- පියගැටපෙලෙහි පිරිවිතර

සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

1	පඩිපෙළක අවම පළල	මීටර 1.8
2	පඩියක උපරිම උස	අඟල් 6
3	පඩියක අවම පළල	අඟල් 12
4	පඩි පේලියක උපරිම දිග	මීටර 300
5	පතනය	සෑම පඩි 20 කට වරක් (අවම මි 1.8* මි1)

xlii. බෑවුම් සහිත ප්‍රදේශවල සෑම විටම ගොඩනැගිලි ඉදිකිරීමේදී පවත්නා ස්වාභාවික බෑවුමට අනුගත වන සැලසුම් නිර්මාණය කළ යුතු වේ.

07 පරිච්ඡේදය
ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග නියාමනය

xliii. මායිම් තාප්පයක් පිහිටන භූමි භාගවල අයිතිකරුවන්ගේ අන්‍යෝන්‍ය කැමැත්ත ඇතිව ඉදිකරනු ලබන මායිම් තාප්පයක් සම්බන්ධයෙන් වන විට හැර, කිසිදු ගොඩනැගිල්ලක අත්තිවාරම් ඒ ගොඩනැගිලි ඉදිකැරෙන භූමිභාගයේ මායිම් රේඛාවලින් පිටතට ව්‍යාප්ත නොවිය යුතුය.

සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

xliv. යාබද දේපළ විෂයෙහි බරක් ඇති කරනු ලැබිය හැකි හෝ භූමියෙහි චලන ඇති කරනු ලැබිය හැකි හෝ යාබද දේපලෙහි කවරවුවද කොටසක ස්ථායිත්වය කෙරෙහි මොන අන්දමේ හෝ අහිතකර බලපෑමක් ඇති කරනු ලැබිය හැකි පයිල් ගැසීම, පස් තද කිරීම සහ බිම් කැණීම වැනි අත්තිවාරම් වැඩ නැතහොත් ඊට අදාල පස් වැඩ කිසිවක් වැඩ බිමෙහි ආරම්භ කිරීමට පෙර, මේ නියෝග යටතේ නියම කර ඇති පරිදි සැලැස්මවල් සහ සැලසුම් නිර්මාණ පිළියෙල කරනු ලබන අවස්ථාවේ දී සුදුසුකම් ලත් තැනැත්තා විසින් සුපරීක්ෂාකාරී ලෙස ඒවා ගැන සලකා බැලිය යුතු අතර සෑමවිටම විය හැකි හානි වලක්වාලීම සුදුසුකම්ලත් තැනැන්තාගේ සහ අයිතිකරුගේ වගකීම වන්නේය.

ජලාශ්‍රිත ප්‍රදේශ සඳහා පොදු නියමතා

7.5 ජලාශ්‍රිත ප්‍රදේශ සඳහා පොදු නියමතා

I. මා-ඔය, රඹුක්කන් ඔය හා කුඩා ඔය යන ජල මාර්ගවලට යාබදව ප්‍රධාන මාර්ග දෙපස පිහිටි ඉඩම් කොටස්වල ගොඩනැගිලි සැලසුම් කිරීමේදී එම ඉඩමේ මුහුණත පළලින් ¼ ක් ජල මූලාශ්‍රය දිස්වන පරිදී ඉතිරි කර පවත්වාගෙන යන්නේ නම් එයට සමාන ගෙබිම් ප්‍රමාණයක් අතිරේක වශයෙන් ලබාදීමට සලකා බලනු ලැබේ.

08 වන පරිච්ඡේදය

කලාපීකරණ නියමනා

08 පරිච්ඡේදය
කලාපීකරණ නියමතා

8.1 අධි ඝනත්ව නේවාසික කලාපය

වගු අංකය 8.1: අධි ඝනත්ව නේවාසික කලාපයේ කලාපීකරණ නියමතා

අධි ඝනත්ව නේවාසික කලාපය

ප්‍රධාන කලාපය	නේවාසික කලාපය
කලාප ලක්ෂණ	ප්‍රදේශයේ ප්‍රධාන වාණිජ නගරයට ආසන්නව අධි ඝනත්වයෙන් යුතු නේවාසික කලාපය ලෙස මෙය හඳුනාගෙන ඇත. යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගයේ සහ දුම්රිය ප්‍රවේශකත්වය ලබා ගත හැකි සුඛෝපභෝගී නේවාසික පහසුකම් සහිත කලාපයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.
කලාප මායිම්(භූ බණ්ඩාංක)	ඇමුණුම් 14 යටතේ ඉදිරිපත් කර ඇත.
උප කලාපය	අධි ඝනත්ව නේවාසික කලාපය
කලාප අංකය	R1
කලාප සංගුණකය	1.82
අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	8.11 උපලේඛණය I හි සඳහන් “අ” සහ “ආ” ආකෘති අනුව විය යුතුය
අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය	8.11 උපලේඛණය I හි සඳහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව විය යුතුය
විවෘත අවකාශයන් සහ උපරිම උස	8.11 උපලේඛණය I හි සඳහන් “ඉ” ආකෘතිය අනුව විය යුතුය
අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	ච.මීටර් 150
අවසරලත් භාවිතාවන්	උපලේඛණය IV හි සඳහන් "උ" ආකෘතිය අනුව විය යුතුය. ඉහත භාවිතාවන්ට අමතරව මෙම කලාපය තුළ පොල්ගහවෙල-කෑගල්ල ප්‍රධාන මාර්ගයට මුහුණලා පවතින බිම් කට්ටියක ඉඩමේ ප්‍රමාණය පර්චස් 40ක් හෝ ඊට වැඩිවනනේ නම් ගබඩා පහසුකම්, බෙදාහැරීමේ මධ්‍යස්ථාන, ප්‍රදර්ශනාගාර, සාප්පු සංකීර්ණ, ඉන්ධන පිරවුම්හල්, වාහන සේවා මධ්‍යස්ථාන වැනි භාවිත සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නිරවුල් සහතිකය ලබා ගැනීමට යටත්ව සලකා බලනු ලැබේ.
කලාපය සඳහා වන පොදු රෙගුලාසි	i. කුඩා ඉඩම් කොටස් ඒකාබද්ධ කර අනුමත කරගැනීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් එවැනි ඉඩම් කොටස් තුළ ඉදිකිරීමට යෝජිත

	ගොඩනැගිලි සැලසුම් සඳහා අනුමත ගෙබිම් ප්‍රමාණයට අතිරේඛව 10% ක අමතර ගෙබිම් ප්‍රමාණයක් ලබාදීමේ හැකියාව සලකා බලනු ලැබේ. ii. මෙම කලාපයේදී ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික ලබාදීමේදී විවෘත අවකාශයෙන් 50% ක භූමි ප්‍රමාණයක හරිතාවරණයක් පවත්වා ගත යුතුය. II. වැලි කැණීම/ ගල් කැඩීම/ පස් කැපීම සඳහා අවසර ලබා දීම ස්ථානීය පරීක්ෂාවක් අනුව සලකා බලනු ලැබේ.

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

08 පරිච්ඡේදය
කලාපීකරණ නියමතා

8.2 මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය

වගු අංකය 8.2: මධ්‍ය ඝනත්ව නේවාසික කලාපයේ කලාපීකරණ නියමතා

මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය

ප්‍රධාන කලාපය	නේවාසික කලාපය
කලාප ලක්ෂණ	කලාපය තුල පවතින නේවාසික අවශ්‍යතාවය/ඉල්ලුම සපුරාලීම සඳහා, පවතින ස්වභාවික පාරිසරික ලක්ෂණයන් සහ කෘෂිකාර්මික බිම් ආරක්ෂාකර ගනිමින් අවශ්‍ය යටිතල පහසුකම් සහිත මධ්‍යම ඝනත්වයෙන් යුතු නේවාසික කලාපයක් ලෙස සංවර්ධනය නියාමනය කිරීම අපේක්ෂා කෙරේ.
කලාප මායිම්	ඇමුණුම් 14 යටතේ ඉදිරිපත් කර ඇත.
උප කලාපය	මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය
කලාප අංකය	R2
කලාප සංගුණකය	1.21
අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	8.11 උපලේඛණය I හි සඳහන් “අ” සහ “ආ” ආකෘති අනුව විය යුතුය
අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය	8.11 උපලේඛණය I හි සඳහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව විය යුතුය
විවෘත අවකාශයන් සහ උපරිම උස	8.11 උපලේඛණය I හි සඳහන් “ඉ” ආකෘතිය අනුව විය යුතුය
අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	ච.මීටර් 250
අවසරලත් භාවිතාවන්	උපලේඛණය IV හි සඳහන් "උ" ආකෘතිය අනුව විය යුතුය. ඉහත භාවිතාවන්ට අමතරව මෙම කලාපය තුළ කොළඹ-මහනුවර මාර්ගය, මාවනැල්ල-රඹුක්කන මාර්ගය, නාරම්බැද්ද මාර්ගය, දුනුකේවල මාර්ගය හා නිල්වක්ක-රඹුක්කන මාර්ගය යන ප්‍රධාන මාර්ග වලට මුහුණලා පවතින බිම් කට්ටියක ඉඩමේ ප්‍රමාණය පර්චස් 40ක් හෝ ඊට වැඩිවනනේ නම් ගබඩා පහසුකම්, බෙදාහැරීමේ මධ්‍යස්ථාන, ප්‍රදර්ශනාගාර, සාප්පු සංකීර්ණ, ඉන්ධන පිරවුම්හල්, වාහන සේවා මධ්‍යස්ථාන හා පරිසර දූෂණය අවම කුඩා කර්මාන්ත වැනි භාවිත සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නිරවුල් සහතිකය ලබා ගැනීමට යටත්ව සලකා බලනු ලැබේ.
කලාපය සඳහා වන පොදු රෙගුලාසි	i. මෙම කලාපය තුළ නේවාසික කටයුතු සඳහා අවසර දෙනු ලබන අතර නේවාසික කටයුතු සඳහා අලුතින් ඉඩම් කොටස් කිරීමේදි බිම් කොටසක අවම ප්‍රමාණය පර්චස් 10 හෝ ඊට වැඩි විය යුතුය.

	ii. අක්කර 01 ට වඩා අඩු හෝ සමාන කෘෂිකාර්මික ඉඩම්වලින් (රබර් වතු සහ අනිකුත් උස් බිම් කෘෂිකර්මාන්ත) 10% කොටසක් පමණක් නේවාසික භාවිතයන්ට පරිවර්තනය කළ හැකි අතර, සමස්ථ භූමි ප්‍රමාණයෙන් 90% ක් පවතින භාවිතය සඳහා ආරක්ෂා කළ යුතුය. තවද මෙම සංවර්ධනය සඳහා අදාළ අධිකාරියේ /දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබාගත යුතුය. iii. අක්කර 01 ට වඩා වැඩි කෘෂිකාර්මික ඉඩම් වලින් (රබර් වතු සහ අනිකුත් උස් බිම් කෘෂිකාර්මාන්තයෙන්) 5%කොටසක් පමණක් නේවාසික කටයුතු සඳහා පරිවර්තනය කළ හැකි අතර. මුළු භූමි ප්‍රමාණයෙන් 95% ක් පවතින භාවිතය සඳහා ආරක්ෂා කළ යුතුය. ඒ සඳහා අදාළ අධිකාරියේ /දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබාගත යුතුය. iv. වැලි කැණීම/ ගල් කැඩීම/ පස් කැපීම සඳහා අවසර ලබා දීම ස්ථානීය පරීක්ෂාවක් අනුව සලකා බලනු ලැබේ.

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

08 පරිවිඡේදය
කලාපීකරණ නියමනා

8.3 අඩු ඝනත්ව නේවාසික කලාපය

වගු අංකය 8.3: අඩු ඝනත්ව නේවාසික කලාපයේ කලාපීකරණ නියමනා

අඩු ඝනත්ව නේවාසික කලාපය

ප්‍රධාන කලාපය	නේවාසික කලාපය
කලාප ලක්ෂණ	ප්‍රදේශයේ බහුල භූමි භාවිතයක් මෙන්ම ප්‍රධාන ආර්ථික අංශයද වන කෘෂිකර්මාන්තයට ප්‍රමුඛත්වය ලබාදීමත්, සංරක්ෂණය කළ යුතු පාරිසරික ස්ථානයන් එලෙසම පවත්වා ගනිමින් අවේනික වූ ග්‍රාමීය ලක්ෂණයන් ආරක්ෂා වන අඩු ඝනත්ව නේවාසික කලාපයක් ලෙස පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ.
කලාප මායිම්	ඇමුණුම් 14 යටතේ ඉදිරිපත් කර ඇත.
උප කලාපය	අඩු ඝනත්ව නේවාසික කලාපය
කලාප අංකය	R3
කලාප සංගුණකය	0.60
අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	8.11 උපලේඛණය I හි සඳහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය
අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය	8.11 උපලේඛණය I හි සඳහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය
විවෘත අවකාශයන් සහ උපරිම උස	8.11 උපලේඛණය I හි සඳහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය
අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	ව.මීටර් 375
අවසරලත් භාවිතාවන්	8.11 උපලේඛණය IV හි සඳහන් "උ" ආකෘතිය අනුව විය යුතුය ඉහත භාවිතාවන්ට අමතරව මෙම කලාපය තුළ කටුපිටිය-රඹුක්කන මාර්ගය, හේවාදිවල- රඹුක්කන, බුලුගොල්ල-දොඹේමඩ-වහව මාර්ගය, වල්ගම- රඹුක්කන මාර්ගය යන ප්‍රධාන මාර්ග වලට මුහුණලා පවතින බිම් කට්ටියක ඉඩමේ ප්‍රමාණය පර්චස් 40ක් හෝ ඊට වැඩිවනනේ නම් ගබඩා පහසුකම්, බෙදාහැරීමේ මධ්‍යස්ථාන, ප්‍රදර්ශනාගාර, සාප්පු සංකීර්ණ, ඉන්ධන පිරවුම්හල්, වාහන සේවා මධ්‍යස්ථාන හා පරිසර දූෂණය අවම කුඩා කර්මාන්ත වැනි භාවිත සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නිරවුල් සහතිකය ලබා ගැනීමට යටත්ව සලකා බලනු ලැබේ.

